205 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 205 - இல. 7
**Volume 205 - No. 7**

2011 දෙසැම්බර් 08 වන බ්‍රහස්පතින්දා
2011 டிசம்பர் 08, வியாழக்கிழமை
**Thursday, 08th December, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2012 – [දහහතරවන වෙන් කළ දිනය]**
[ශීර්ෂ 123, 309-311 (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම්); ශීර්ෂය 115 (ඛනිජ තෙල් කර්මාන්ත)] -කාරක සභාවේදී සලකා බලන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புக்கள்:**
நிலைக்குழு 'பி': மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012 : [ஒதுக்கப்பட்ட பதினான்காம் நாள்]**
[தலைப்புகள் 123, 309-311 (நிர்மாண பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள்); தலைப்பு 115 (பெற்றோலியக் கைத்தொழில்)] - குழுவில் ஆராயப்பட்டது

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Standing Committee "B": Additional Members

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2012 – [Fourteenth Allotted Day]
Considered in Committee – [Heads 123, 309 - 311 (Construction, Engineering Services, Housing and Common Amenities); Head 115 (Petroleum Industries)]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2011 දෙසැම්බර් 08 වන බ්‍රහස්පතින්දා*
*2011 டிசம்பர் 08, வியாழக்கிழமை*
*Thursday, 08th December, 2011*

---

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංක : ජීජේඑල්/308

2011 දෙසැම්බර් මස 06 වන දින
කොළඹ දී ය

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මවිසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති"

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### "බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
### நிலைக் குழு 'பி' : மேலதிக உறுப்பினர்கள்
### STANDING COMMITTEE "B": ADDITIONAL MEMBERS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා, 139 වැනි ස්ථාවර නියෝගය යටතේ මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, එම පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි. එම නාම ලේඛනය මම **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல் :*
*List tabled:*

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු බෂීර් සේගු ඩාවුඩ් මහතා
ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු සිවශක්ති ආනන්දන් මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු කනක හේරත් මහතා

மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த
மாண்புமிகு பந்துல குணவர்தன
மாண்புமிகு பசீர் சேகு தாவூத்
மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா
மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார
மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி
மாண்புமிகு அப்துல் ஹலீம்
மாண்புமிகு சிவசக்தி ஆனந்தன்
மாண்புமிகு தயாசிறி ஜயசேகர
மாண்புமிகு பா. அரியநேத்திரன்
மாண்புமிகு மனுஷ நாணாயக்கார
மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே
மாண்புமிகு சாந்த பண்டார
மாண்புமிகு ருவன் விஜயவர்தன
மாண்புமிகு கனக ஹேரத்

Hon. A.D. Susil Premajayantha
Hon. Bandula Gunawardane
Hon. Basheer Segu Dawood
Hon. Gamini Wijith Wijayamuni De Zoysa

[ගරු කථානායකතුමා]

Hon. R.M.Ranjith Madduma Bandara
Hon. Sunil Handunnetti
Hon. Abdul Haleem
Hon. Sivasakthi Ananthan
Hon. Dayasiri Jayasekara
Hon P. Ariyanethran
Hon. Manusha Nanayakkara
Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle
Hon. Shantha Bandara
Hon. Ruwan Wijayawardhana
Hon. Kanaka Herath)

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ කාර්ය සාධන වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8, 14, 18, 30, 42, 139 ඇ, 139 ඌ සහ 231 වැනි වගන්ති සමග කියවිය යුතු 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 09 දිනැති අංක 1722/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව:

(ii) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව: සහ

(iii) 2009 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே- விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා පරන්තන් කෙමිකල්ස් කම්පනි ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;

(ii) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2007 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2010 වර්ෂය සඳහා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මහතා - පැමිණ නැත.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු කථානායකතුමනි, මම ගලේවෙල, දමුණුමුල්ල, කලාවැව පාර, අජරගිරි පන්සල හන්දිය අසල පදිංචි එස්.එම්.එස්.ඒ.බී. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## අපනයන සංවර්ධන මණ්ඩලය : වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු
## ஏற்றுமதி அபிவிருத்திச் சபை : வர்த்தக மேம்பாடுகள்
## EXPORT DEVELOPMENT BOARD : TRADE PROMOTIONS

1067/'11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සිදු කර ඇති රටවල නම් කවරේද;

(ii) එම වෙළෙඳ ප්‍රවර්ධන කටයුතුවල සාර්ථකත්වය කවර මට්ටමක තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ රටවල රඳවා ඇති අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් සේවකයන්ගේ නම් සහ ඔවුන් රඳවා ඇති රටවල නම් කවරේද;

(iii) විදේශ රටවලට අපනයනය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලැබී ඇති වෙළෙඳ භාණ්ඩවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන්ට විදේශයන්හි සංචාරය කිරීම සඳහා සහාය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සහාය ලබා දුන් සමාගම්වල නම් සහ ඒ සඳහා 2009 සහ 2010 වර්ෂවලදී අපනයන සංවර්ධන මණ්ඩලය දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில், வாணிப அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வர்த்தக மேம்பாடுகள் மேற்கொள்ளப்பட்ட நாடுகளின் பெயர்கள் என்னவென்பதையும்;

(ii) அவ்விதம் வர்த்தக மேம்பாடுகள் எந்த மட்டத்திற்கு வெற்றியளித்துள்ளன என்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஆ) (i) வெளிநாடுகளில் தங்கியுள்ள ஏற்றுமதி அபிவிருத்திச் சபை ஊழியர்களின் எண்ணிக்கை என்னவென்பதையும்;

(ii) மேற்படி ஊழியர்களின் பெயர்கள் மற்றும் அவர்கள் தங்கியுள்ள நாடுகள் எவை என்பதையும்;

(iii) வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யும் பொருட்டு ஏற்றுமதி அபிவிருத்திச் சபை உதவி நல்கிய பொருட்களின் பெயர்கள் என்ன என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(இ) (i) ஏற்றுமதியாளர்கள் வெளிநாடுகளுக்கு பயணம் செய்வதற்கு ஏற்றுமதி அபிவிருத்திச் சபை உதவிகளை நல்கியதா என்பதையும்;

(ii) ஆமெனில், உதவிகள் வழங்கப்பட்ட கம்பனிகளின் பெயர்களையும் அதனால் 2009 மற்றும் 2010 ஆம் ஆண்டுகளில் ஏற்றுமதி அபிவிருத்திச் சபைக்கு ஏற்பட்ட செலவு எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he state-

(i) the names of the countries in which the trade promotions have been done; and

(ii) the level of success of those trade promotions?

(b) Will he also state-

(i) the number of Export Development Board (EDB) employees stationed overseas ;

(ii) the names of aforesaid employees and the countries that they are stationed; and

(iii) the names of the commodity items that the EDB has helped to export overseas?

(c) Will he inform this House-

(i) whether the EDB has assisted the exporters to travel overseas; and

(ii) if so, the name of companies assisted and cost incurred by EDB for the same in years 2009 and 2010?

(d) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පිටු 15ක පමණ ඉතාම දීර්ඝ පිළිතුරක් නිසා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ජර්මනිය, බෙල්ජියම, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, බ්‍රිතාන්‍ය, මාලදිවයින, නේපාලය, දකුණු කොරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, දකුණු අප්‍රිකාව, සිංගප්පූරුව, තායිලන්තය සහ නැගෙනහිර යුරෝපීය රටවල් කිහිපයක වෙළෙඳ පොළ ප්‍රවර්ධන වැඩසටහන් මෑත කාලය තුළ ක්‍රියාත්මක කර තිබේ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

(ii) මණ්ඩලය, ශ්‍රී ලංකික අපනයනකරුවන්ගේ භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳ පොළ අවස්ථා ලබා දීම, ද්විපාර්ශ්වීය/ කලාපීය වෙළෙඳ සහයෝගිතාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාව ගුණාත්මක භාණ්ඩ අපනයනය කරන විශ්වාසවන්ත සැපයුම්කරුවකු ලෙස ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගොඩ නැංවීමේ අරමුණින් වෙළෙඳ පොළ ප්‍රවර්ධන වැඩසටහන් රැසක් අපගේ ප්‍රධාන වෙළෙඳ පොළවල සහ නව වෙළෙඳ පොළවල පසු ගිය කාලය තුළ ක්‍රියාත්මක කර තිබේ. ජාත්‍යන්තර වෙළෙඳ සල්පිල්/ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කිරීම, දේශීයව හා විදේශීයව වෙළෙඳ දූත මෙහෙවර සංවිධානය කිරීම සහ අප භාණ්ඩ හා සේවා පිළිබඳ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ප්‍රචාරණ හා සන්නිවේදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ අතර ප්‍රධාන වේ.

මෙම වැඩසටහන් සඳහා සහභාගි වූ අපනයනකරුවන්ගෙන් ලද ඇගැයීම් වාර්තා සහ වෙළෙඳ සම්මේලන සහ අපනයන ප්‍රජාව මණ්ඩලය මඟින් සංවිධානය කරනු ලබන මෙම වැඩසටහන්වලට දක්වන උනන්දුව එහි සාර්ථකත්වය පෙන්නුම් කරනු ලබයි. මෙම වෙළෙඳ පොළ ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගි වීම තුළින් තම භාණ්ඩ හා සේවා ජාත්‍යන්තර වෙළෙඳ පොළවලට හඳුන්වා දීමටත්, වෙළෙඳ ඇණවුම් ලබා ගැනීමටත්, විදේශීය ගැනුම්කරුවන් සමඟ සාර්ථක වෙළෙඳ සම්බන්ධතා ගොඩ නඟා ගැනීමටත් අපනයනකරුවන්ට අවස්ථා සැලසුණි.

එමෙන්ම, මෙම අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශන සඳහා අනෙකුත් තරගකාරී සැපයුම්කරුවන්ද සහභාගි වන බැවින්, වෙළෙඳ පොළේ නව නිෂ්පාදිතයන්, වෙළෙඳ පොළ නව ප්‍රවණතා ආදිය පිළිබඳවද දැනුවත් වීමට ඔවුන්ට අවස්ථාව සැලසුණි. විශේෂයෙන්ම සහභාගි වූ සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට නව තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත්, අපනයන සැකසුම් සඳහා අවශ්‍ය යෙදවුම් සැපයුම්කරුවන් සමඟ සම්බන්ධතා ගොඩ නඟා ගැනීමටත් මෙමඟින් අවස්ථාව සැලසුණි.

මෙම වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන්වලට සමගාමීව අපගේ අදාළ විදේශ දූත මෙහෙවර නිලධාරින්ගේ සහාය ඇතිව වෙළෙඳ සම්මේලන සහ ප්‍රධාන ගැනුම්කරුවන් සමඟ සංවිධානය කරනු ලබන වෙළෙඳ හමුවීම්ද සාර්ථක ප්‍රතිඵල අත් කර ගෙන තිබේ. මණ්ඩලය මඟින් ශ්‍රී ලංකා වෙළෙඳ කුටිය තුළ සංවිධානය කරන තොරතුරු ඒකක, විදේශ ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු ලබා දීමෙහි ලා සුවිශේෂී මෙහෙවරක් ඉටු කරනු ලැබිය. මෙම සියලු ප්‍රවර්ධන කටයුතු එම වැඩසටහන්වලට සහභාගි වූ අපනයනකරුවන්ට ඔවුන්ගේ ස්වයං වෙළෙඳ ප්‍රවර්ධන උපාය මාර්ග සකසා ගැනීමට අවශ්‍ය අඩිතාලම සපයනු ලැබේ.

අපනයන සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කළ මෙම අපනයන වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්හි වෙළෙඳ ප්‍රවර්ධන ප්‍රයත්නයන්, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට අන්තර්ජාතික වෙළෙඳ පොළේ සාර්ථකත්වයට පත් වීමට ඉවහල් වූ අතර, පහත වගුවේ පෙන්නුම් කර ඇති පරිදි අපගේ අපනයන වෙළෙඳ පොළවල් තුළ සතුටුදායක ප්‍රගතියක් ලබා ගැනීමටත් දායක විය.

තෝරා ගත් ප්‍රධාන වෙළෙඳ පොළවල අපනයන ප්‍රගතිය -

2009, 2010 සහ 2011 පළමු භාගය

| | අපනයන ආදායම 2009 | අපනයන ආදායම 20110 | වර්ධන වේගය | අපනයන ආදායම 2011 ජනවාරි / ජූනි | වර්ධන වේගය (2010 ජනවාරි/ ජූනිවලට සාපේක්ෂව |
|---|---|---|---|---|---|
| මුළු අපනයන | **7084** | **8307** | **17.3 %** | **5106** | **40.1 %** |
| යුරෝපා සංගමය | 2735 | 2908 | 6.3% | 1866 | 48.8 % |
| අමෙරිකා එක්සත් ජනපදය | 1590 | 1768 | 11.2 % | 1060 | 35.4 % |
| එක්සත් රාජධානිය | 1024 | 1022 | -0.01 % | 667 | 51.2 % |
| ඉන්දියාව | 325 | 471 | 45 % | 259 | 22.6 % |
| ඉතාලිය | 438 | 463 | 5.7 % | 269 | 33.7 % |
| ජර්මනිය | 349 | 401 | 14.9 % | 258 | 45.2 % |
| බෙල්ජියම | 368 | 387 | 5.1 % | 271 | 53.3 % |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 211 | 246 | 16.5 % | 153 | 37.0 % |
| රුසියාව | 192 | 243 | 26.5 % | 129 | 19.2 % |
| සිංගප්පූරුව | 87 | 186 | 113 % | 115 | 74.0 % |
| නෙදර්ලන්තය | 156 | 185 | 18.5 % | 108 | 36.7 % |
| ජපානය | 141 | 169 | 19.8 % | 105 | 36.9 % |
| ප්‍රංශය | 144 | 159 | 10.4 % | 99 | 62.3 % |
| චීනය | 59 | 89 | 50.1 % | 52 | 58.7 % |
| තායිලන්තය | 63 | 84 | 33.3 % | 43 | 13.5 % |
| පකිස්තානය | 55 | 60 | 9 % | 39 | 30.7 % |
| මාල දිවයින | 34 | 46 | 35.3 % | 30 | 71.0 % |
| බංගලාදේශය | 26 | 36 | 38.5 % | 20 | 34.6 % |

මූලය - ශ්‍රී ලංකා රේගුව

වෙළෙඳ ප්‍රවර්ධන කටයුතුවලට අමතරව ආයෝජන අවස්ථා සඳහා සහ සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කිරීමටත් මෙම විදේශීය වෙළෙඳ ප්‍රදර්ශන සඳහා වූ ශ්‍රී ලංකා සහභාගිත්වය දායක විය.

(ආ) (i) මණ්ඩලය විදේශයන්හි සේවකයන් රඳවා නැත.

(ii) අදාළ නැත.

(iii)
- ඇඟලුම්
- තේ
- රබර් හා රබර් නිමි භාණ්ඩ
- දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සහ ව්‍යාපාර බාහිරකරණ සේවා
- ආහාර සහ බීම වර්ග
- කුළු බඩු සහ ආශ්‍රිත නිමැවුම්
- මත්ස්‍ය නිෂ්පාදිත
- පොල් ආශ්‍රිත නිමැවුම්
- විද්‍යුත් හා විදුලි නිෂ්පාදන
- කඩදාසි ආශ්‍රිත නිමැවුම්
- බෝට්ටු නිෂ්පාදනය
- වෘත්තිමය සේවා
- රසායනික සහ ප්ලාස්ටික් නිමැවුම්
- පිඟන් භාණ්ඩ හා අනෙකුත් ඛනිජ ආශ්‍රිත නිමැවුම්
- එළවලු හා පලතුරු
- සෙල්ලම් සහ ක්‍රීඩා උපකරණ
- ත්‍යාග සහ දිවිපැවැතුම් නිමැවුම්
- ලෝහ නිමැවුම්
- පාවහන් සහ සම් භාණ්ඩ
- දැව ආශ්‍රිත නිමැවුම්
- විසිතුරු පැළ සහ කැපූ මල්
- විසිතුරු මසුන්
- අත් යන්ත්‍ර රෙදි පිළි

(ඇ) (i) විදේශයන්හි වෙළෙඳ ප්‍රවර්ධන කටයුතුවලට සහභාගි වීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන්ට සහාය ලබා දී තිබේ.

(ii) 2009 සහ 2010 වසර තුළ මණ්ඩලය සංවිධානය කළ විදේශ අපනයන ප්‍රවර්ධන වැඩසටහන්, ඊට සහභාගි වූ අපනයනකරුවන් සහ මණ්ඩලය දරන ලද වියදම පහත ඇමුණුම I සහ II හි දක්වා ඇත.

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම - 1

2009

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| අම්බියන්තේ, ෆ්‍රැන්ක්ෆර්ට් 2009 | ජර්මනිය | ත්‍යාග භාණ්ඩ | 0.90 | 1. සිද්ධාලේප ආයුර්වේද එක්ස්පෝට් පුද්ගලික සමාගම<br>2. ලක්වුඩ් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම<br>3. ඇන්සෙල්<br>4. මරීෂා කොකෝ ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම |
| නියුරම්බර්ග් ජාත්‍යන්තර සෙල්ලම් බඩු වෙළඳපළ 2009 | ජර්මනිය | සෙල්ලම් බඩු | 1.45 | 1. ගෝල්ඩන් පාම් ක්‍රාෆ්ට් පුද්ගලික සමාගම<br>2. රෝස්වුඩ් ටෝයිස් පුද්ගලික සමාගම<br>3. ජවාතා ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම<br>4. පැපුස් ඉන්ටර්නැෂනල්<br>5. ජී.එස්. ලංකා එක්ස්පෝට්ස්<br>6. විග්ලිවු |
| ඉන්දියා ෆැෂන් ෆෝරම් 2009 | ඉන්දියාව | ඇඟළුම් | 0.175 | 1. සෙල්සන් ක්ලෝදින් පුද්ගලික සමාගම<br>2. ග්‍රෑන්ඩ් ඇපරල්ස් පුද්ගලික සමාගම<br>3. හවුස් ඔෆ් ඇපරල් පුද්ගලික සමාගම<br>4. ජර්ක්ස් ක්ලෝදින් පුද්ගලික සමාගම<br>5. මොන්ඩි |
| ඇක්වාරාමා 2009 වෙළඳ ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර මත්ස්‍ය තරඟය | සිංගප්පූරුව | විසිතුරු මසුන් | 1.309 | ප්‍රදර්ශනය<br>1. සිල්වර් ඩොලර් ඇක්වේරියම් පුද්ගලික සමාගම<br>2. ට්‍රොපිකල් ෆිෂ් සෙන්ටර් පුද්ගලික සමාගම<br>3. මරීනා ෆිෂ් ෆාම් පුද්ගලික සමාගම<br>4. සෙලින්කෝ ඕනමන්ටල් ෆිෂ් පුද්ගලික සමාගම<br>5. සංජීව ඇක්වේරියම්<br>තරඟය<br>6. වයම ඇක්වේරියම් ඕනමන්ටල් ෆිෂ් ෆාම්<br>7. ප්‍රියන්ත ඇක්වේරියම්<br>8. සදර්න් ඇක්වේරියම් ඉන්ටර්නැෂනල්<br>9. ඇක්වාවිල් ඇක්වේරියම්<br>10. නිසල ඇක්වේරියම් |

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| අයිඑෆ්ටී. ෆුඩ් එක්ස්පෝ 2009 | ඇමරිකා එක්සත් ජනපදය | කුළු බඩු සහ ආශ්‍රිත නිෂ්පාදන | 2.44 | 1. ජී.පී. ද සිල්වා<br>2. තොමැනික් ක්රැබ්<br>3. ඉන්ටර්නැෂනල් කොමෝඩිටි ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම<br>4. එල්.බී. ස්පයිස් ට්‍රේඩින් පුද්ගලික සමාගම<br>5. EOAS ඔගනික්<br>6. යූ10 සර්විෆයිඩ් |
| ෆුඩෙක්ස් 2009 | ජපානය | ආහාර සහ බීම වර්ග සකස් කරන ලද ආහාර | 0.35 | 1. ග්‍රීන්වේ ඒෂියා ලංකා පුද්ගලික සමාගම<br>2. රත්න නිෂ්පාදන සහ අපනයන පුද්ගලික සමාගම |
| විදේශ වෙළඳ දූත මෙහෙවර බුඩාපෙස්ට් | හංගේරියාව | විවිධ භාණ්ඩ නිෂ්පාදන | 1.0 | 1. සිලෝන් වැනිලා කම්පැනි<br>2. සෙල්සන් ක්ලෝදින් සහ සමාගම<br>3. වස්ගමුව ක්ලෝදින් පුද්ගලික සමාගම<br>4. රත්මුතු ජුවෙලර්ස්.<br>5. එම්.ජේ.එච්. ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>6. යූ.එච්.ජේ. එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම<br>7. සීමාසහිත සිලෝන් බිස්කට් සමාගම<br>8. යුනිසිල් මාර්කටින් සර්විසස් පුද්ගලික සමාගම<br>9. එම්.සී. එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම<br>10. සුයාමාස් ග්‍රූප් ඔෆ් කොම්පැණිස්<br>11. කඳුරට කුඩ නිෂ්පාදකයෝ<br>12. ජ්සීඑල් කේබල්ස්<br>13. ඇලුකොප් කේබල්ස්<br>14. ඉලෙක්ට්‍රො මෙටල් ප්‍රෙසිෂන්ස් පුද්ගලික සමාගම<br>15. සැම්සන් රබර් ප්‍රඩක්ස් පුද්ගලික සමාගම |
| ටෝකියෝ ජාත්‍යන්තර තෑගි භාණ්ඩ ප්‍රදර්ශනය ටෝකියෝ | ජපානය | තෑගි භාණ්ඩ | 1.4 | 1. අනුරාධ සෙරමික් පුද්ගලික සමාගම<br>2. ඒ.එල්. ඉන්ටර්නැෂනල්<br>3. සන්ටෙක් විවින් ඉන්ඩස්ට්‍රීස්<br>4. යූරෝනික්ස් එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. සිද්ධාලේප එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ් |
| මයිකරච්චි ජාත්‍යන්තර ප්‍රදර්ශනය | පකිස්ථානය | විවිධ අපනයන භාණ්ඩ | 1.87 | 1. අනුරාධ සෙරමික් පුද්ගලික සමාගම<br>2. ඒ.එල්. ඉන්ටර්නැෂනල්<br>3. සන්ටෙක් විවින් ඉන්ඩස්ට්‍රීස් |

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| | | | | 4. සිද්ධාලේප එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. යූරෝනික්ස් එක්ස්පෝට් පුද්ගලිකසමාගම<br>6. මැක්ස්සන්ස් ජෙන්ට් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>7. ඒ.එෆ් ජෝන්ස් (එක්ස්පෝටර්ස්) සිලෝන් පුද්ගලික සමාගම<br>8. කලර්ක්‍රාෆ්ට් ලංකා පුද්ගලික සමාගම<br>9. එස්.යූ. මොහොමඩ් හජ්ජියාර් පුද්ගලික සමාගම |
| දකුණු ආසියාතික රටවල්වල වෙළඳ ප්‍රදර්ශනය (SACIF) කුන්මින් | චීනය | විවිධ නිෂ්පාදන | 1.87 | ඇමුණුම (ඒ) බලන්න |
| ඉන්දියා ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | ඉන්දියාව | විවිධ අපනයන භාණ්ඩ | 1.2 | 1. ජැනෙට් ආයුර්වේදික් පුද්ගලික සමාගම<br>2. අර්ත් බවුන්ඩ් ක්‍රියේෂන්<br>3. ලිවොගෙන් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>4. ශ්‍රී ලංකා ජෙම් ඇන්ඩ් ජුවෙලරි ඒජන්සි<br>5. සෙන්ට්‍රල් ප්‍රොවින්ස් එක්ස්පෝටස් චේම්බර්<br>- සැලිජෙම්ස් කලම්බු<br>- ධර්මදාස ආර්ට්ස් ඇන්ඩ් ක්‍රාෆ්ට්ස්<br>- සමන් ප්‍රියා ලැකර් හැන්ඩ්ක්‍රාෆ්ට්ස්<br>- හඳුනිස් ජෙම්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| ඉන්දියා ෆැෂන් ෆෝරම් | ඉන්දියාව | ඇඟළුම් | 1.07 | 1. ජර්ක්ස් ක්ලෝදින් පුද්ගලික සමාගම (හම්ඩියා)<br>2. ලක් ෆැෂන් ගාමන්ට්ස් පුද්ගලික සමාගම<br>3. හවුස් ඔෆ් ඇපරල්ස් පුද්ගලික සමාගම<br>4. සෙල්සාන් ක්ලෝදින් කම්පැණි පුද්ගලික සමාගම<br>5. ග්‍රෑන්ඩ් ඇපරලස් පුද්ගලික සමාගම |
| යුරොපියන් සී ෆුඩ් එක්ස්පොසිෂන්, බ්‍රසල්ස් | බෙල්ජියම | මුහුදු ආහාර | 1.9 | 1. රේන්බෝ එන්ජිනියරින් ඇන්ඩ් සප්ලයිස්<br>2. ඕඑල්එස් ෆුඩ්ස් පුද්ගලික සමාගම<br>3. එස්එල්අයිසී ලංකා<br>4. ට්‍රොපිකල් ෆිෂරි සමාගම<br>5. ලිහිණි සීෆුඩ්ස් පුද්ගලික සමාගම<br>6. ඇක්වා හැවරිස් ලංකා පුද්ගලික සමාගම |

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| ඩකා ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | බංගලාදේශය | විවිධ අපනයන භාණ්ඩ | 3.72 | 1. ටී ඇන්ඩ් එස් බටන්ස් ලංකා පුද්ගලික සමාගම<br>2. වෙස්ටන් පේපර් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>3. වී.කේ. ඩෙවලොප්මන්ට්ස් කොම්පැණි<br>4. ඩෙමෙකෝ එන්ටර්ප්‍රයිසස්<br>5. ග්ලෝබල් හෑන්ඩ්ස්<br>6. සන්ප්ලාස්ට් පුද්ගලික සමාගම<br>7. මෙගා හිටර්ස් පුද්ගලික සමාගම<br>8. අයිස්මැන් ටෙක්නොලිජීස් පුද්ගලික සමාගම<br>9. සිලෝන් ඩිටර්ජන්ට් සප්ලයර්ස් පුද්ගලික සමාගම<br>10. කැලණි කේබල්ස් පීඑල්සී<br>11. සැලි ජෙම්ස් කලම්බු<br>12. මැක්ස්න්ස් ජෙන්ට් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>13. නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ්<br>14. මන්සුව ප්‍රඩක්ස් පුද්ගලික සමාගම<br>15. පුබුදු ඉන්ජිනියරින් පුද්ගලික සමාගම<br>16. මයික්‍රො පවර් එන්ජිනියරින් පුද්ගලික සමාගම<br>17. හිරෝ සිපර් මැනුෆැක්චර්ස් පුද්ගලික සමාගම<br>18. චාමර ප්‍රඩක්ස්<br>19. ෆැන්ටාසියා ඉලස්ටික්ස් පුද්ගලික සමාගම<br>20. වෙස්ටන් එයර්ඩක්ස් ලංකා පුද්ගලික සමාගම<br>21. වේම්බෝ (විඑස්බී) බිල්ඩින් සිස්ටම් පුද්ගලික සමාගම<br>22. තෝමාස් මැනුෆැක්චර්ස් පුද්ගලික සමාගම |
| ගල්ෆුඩ් හෝටල් සහ උපකරණ ප්‍රදර්ශනය ඩුබායි | එක්සත් ආරාබි එමීර් රාජ්‍යය | ආහාර හා පාන | 1.1 | 1. සිලෝන් බිස්කට්ස් සමාගම<br>2. සිලෝන් ෆ්‍රෙෂ් ටීස් පුද්ගලික සමාගම<br>3. බයෝ එක්ස්ට්‍රැක්ස් පුද්ගලික සමාගම<br>4. ඉන්ටර්නැෂනල් කොමඩිටි ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම<br>5. ඇඩම්ජී ලුක්මන්ජී ඇන්ඩ් සන්ස් සමාගම<br>6. නෙස්ලේ ලංකා පීඑල්සී<br>7. වෙම්බ්ලි කොමොඩිටීස් පුද්ගලික සමාගම<br>8. ඇඩම්එක්ස්පො |

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| අනුගා ජාත්‍යන්තර ආහාර වෙළඳපොළ | ජර්මනිය | ආහාර හා පාන | 3.0 | 1. සිලෝන් බිස්කට්ස් සමාගම<br>2. කොන්සොලිඩේටඩ් බිස්නස් සමාගම<br>3. රේණුකා ගාප් - කොකෝ ලංකා සමාගම<br>4. එස්.ජ්. සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා පුද්ගලික සමාගම<br>5. ඇඩමෙක්ස්පෝ<br>6. එක්ස්පෝ ලංකා සමාගම<br>7. වීවී ප්ලාන්ටේෂන්ස් කම්පැණි පුද්ගලික සමාගම<br>8. ඊම්ජ්එස් ඕගනික්ස් පුද්ගලික සමාගම<br>9. ග්‍රීන්වේ ජ්සියා ලංකා පුද්ගලික සමාගම<br>10. මෙඩෝ හිල්ස් එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම<br>11. වෙරුබියම් ප්‍රයිවට් ලිමිටඩ් |
| හෝට් පොයාර් ඇම්ස්ටර්ඩෑම් | නෙදර්ලන්තය | විසිතුරු මල්පැල | 2.1 | 1. ග්‍රීන් ස්කේප් කොයා එක්ස්පෝට්ස්<br>2. බ්‍රවුන් ඇන්ඩ් සිඑන් ලංකා පුද්ගලික සමාගම<br>3. ඔමෙගා ග්‍රීන් පුද්ගලික සමාගම<br>4. අනුරාධා ෆෝලියේජ්<br>5. ට්‍රොපිෆ්ලෝරා ලිමිටඩ්<br>6. සතුට ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් |
| පේපර්වර්ල්ඩ් ලිපිද්‍රව්‍ය වෙළඳ පොළ | ජර්මනිය | ලිපි ද්‍රව්‍ය | 3.0 | 1. මාධවී ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම<br>2. කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කලම්බු) පීඑල්සී<br>3. එඩිනා එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම<br>4. නාලක ස්ටේෂනරි<br>5. සොෆ්ට් වෙයාර් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් ප්‍රයිවට් ලිමිටඩ්<br>6. ග්‍රැෆික් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ්<br>7. බලිස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම<br>8. බැක්වූ අර්න්<br>9. ප්‍රින්ටෙල් පුද්ගලික සමාගම |
| 9 වැනි සාර්ක් වෙළඳ ප්‍රදර්ශනය, තිම්පු | භූතානය | විවිධ අපනයන භාණ්ඩ | 0.3 | 1. සැම්සන් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම<br>2. ද කැන්ඩියන් ආර්ට් ඇන්ඩ් ක්‍රාෆ්ට්ස්<br>3. යුනික් මල්ටි ආර්ට්ස්ට් |

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| අපනයනකරුවන්ගේ හා ගැනුම්කරුවන්ගේ හමුව | එක්සත් රාජධානිය | ඇඟළුම් (සුළු හා මධ්‍ය පරිමාණ) | 1.9 | 1. ජැකොලින් ක්ලෝදින් ප්‍රයිවට් ලිමිටඩ්<br>2. ඩයල් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ග්‍රෝවේස් ඇපරල්ස් ප්‍රයිවට් ලිමිඩට්<br>4. හවුස් ඔෆ් ඇපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. ඕනමෙන්ටෝ ඉන්ටිමෝ ප්‍රයිවට් ලිමිටඩ්<br>6. සෙල්ටා ප්‍රයිවට් ලිමිටඩ්<br>7. එමරල්ඩ් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>8. නෝඩ්ටෙක්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>9. ජ්නදාස බ්‍රදර්ස්<br>10. ට්‍රෙන්ඩෙක්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්<br>11. ටෙක්ස්ටයිල් ලංකා එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>12. ඩෙන්ෂාන් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් |
| අම්බියන්තේ ජාත්‍යන්තර තෑගි භාණ්ඩ ප්‍රදර්ශනය | ජර්මනිය | තෑගි භාණ්ඩ | 3.0 | 1. සිද්ධාලේප එක්ස්පෝට් ප්‍රයිවඩ් ලිමිටඩ්<br>2. ඩීඑස්එල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්<br>3. රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් ලිමිටඩ්<br>4. ශ්‍රී වෝයිස් එඩියුකේෂනල් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. ලක්රුව ප්‍රයිවට් ලිමිටඩ්<br>6. ක්‍රියේටිව් එක්ස්පෝට්ස්<br>7. ලන්ක්ට්‍රැඩ් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>8. මරීෂා කොකෝ ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ් |

ඇමුණුම - (ඒ)

**දකුණු ආසියාතික රටවල වෙළඳ ප්‍රදර්ශනය (SACTF) කුන්මින් චීනය සහභාගී වූ අපනයනකරුවන්**

1. ඉම්පීරියල් ටී එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
2. බිජීන් හෙවන්ලි ට්‍රේඩින් කම්පැණි ලිමිටඩ්
3. ඇග් මාස්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
4. සින්බැඩ් ප්‍රයිවට් ලිමිටඩ්
5. ජැපජ් ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
6. සන්ෂයින් ටී ප්‍රයිවට් ලිමිටඩ්
7. ඇලෝයි එක්ස්පෝ ප්‍රයිවට ලිමිටඩ්
8. වුක්සි සිටි ෂෙන් ඩු ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් කම්පැණි ලිමිටඩ්
9. රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් ලිමිටඩ්
10. ශ්‍රීන්කෝ එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්
11. අලුකොප් කේබල්ස් ලිමිටඩ්
12. ටෙක්නෝ ෆාම් ඉන්ඩස්ට්‍රීස්
13. ධර්මසිරි ටයර් හවුස් ප්‍රයිවට් ලිමිටඩ්
14. ප්‍රෙස්ටෝනා ටයිල්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
15. හයිනන් ලංකා කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්
16. යුනික් මල්ටි ආට්ස්ට්
17. නිල කලා බැටික්ස්
18. ෂාෂේන් ලෙදර් වර්ක්ස්
19. ඉන්දික දයානන්ද ඉන්ඩස්ට්‍රීස්
20. සමර්රිටන්
21. ග්ලෝබල් හැන්ඩ්ස්
22. සමන්ප්‍රිය ලැකර් හැන්ඩික්‍රාෆ්ට්ස්
23. සෙල්ටා ප්‍රයිවට් ලිමිටඩ්
24. පද්මි ගාමන්ට්ස්
25. නිඩිල් ක්‍රාෆ්ට්
26. ලක්රුව ප්‍රයිවට් ලිමිටඩ්
27. ඉසුරු බතික්
28. සුමිත් කොයා ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්
29. ගලික හයිඩ්‍රොපෝනික්ස් ප්‍රයිවට් ලිමිටඩ්
30. ගලික ලංකා එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
31. පී ඇන්ඩ් පී කොකෝ ප්‍රඩක්ස්
32. එම්.සී. එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්
33. සිද්ධාලේප එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
34. ලින්ක් නැචුරල් ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්
35. රත්න ප්‍රඩියුසස් සිනමන් එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
36. ශ්‍රී ලංකා ටුවරිස් බෝඩ්
37. සී.ආර්. එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
38. එක්ස්පෝ ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
39. ශ්‍රී ලංකා ජෙම් ඇන්ඩ් ජුවලරි ඒජන්සි
40. හේෂාන් ජෙම් ඇන්ඩ් සිල්වර් ජුවලරි
41. මල්ටි ජෙම්ස්
42. ෆෙඩොස්විස් ප්‍රයිවට් ලිමිටඩ්
43. එස්.එන්.කේ. ඉන්ටර්නැෂනල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
44. ට්‍රොපික් ෆ්‍රෝසන් ෆුඩ්ස් ලිමිටඩ්
45. රේන්බෝ ඉන්ජිනියරින් ඇන්ඩ් සප්ලයිස්
46. හසංග ජුවෙලර්ස්
47. දිව්‍යා ප්‍රඩක්ස්

ඇමුණුම 2

2010

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| ජයිටෙක්ස් ටෙක්නොලජ් වීක් 2010 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | මෘදුකාංග | 4.9 | 1. ජෝන් කීල්ස් කම්පියුටර් සර්විසස්<br>2. එච්සෙනිඩ් බිස්නස් සොලියුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ඩේටා මැනේජ්මන්ට් සිස්ටම්ස් ලිමිටඩ්<br>4. ඇක්ලෝ ඉන්ෆොමේෂන් ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. ජස්ට් ඉන් ටයිම් ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>6. ඩිනෝවා ඉන්ෆොමේෂන් ටෙක්නොලජ් ප්‍රයිවට් ලිමිටඩ්<br>7. අයි - කන්ටෙක්ස්ට් කන්ටෙන්ට් කන්වර්ජන්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| සයිටෙක්ස් 2010 | දකුණු අප්‍රිකාව | විවිධ භාණ්ඩ | 4.2 | 1. හැන්ඩ්ස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>2. කැලණි කේබල්ස් පීඑල්සී<br>3. සැම්සන් ඉන්ටර්නැෂනල් පීඑල්සී<br>4. සීන්වා මාකර්ටින් ප්‍රයිවට් ලිමිටඩ්<br>5. ලින්ක් නැචුරල් ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>6. හාඩ් එක්ස්පෝට් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්<br>7. යුනිසිල් මාකර්ටින්<br>8. ප්‍රේම්වර්ක් මෙටල් ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>9. ප්‍රින්ටෙල් ප්‍රයිවට් ලිමිටඩ්<br>10. එම්.සී. එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවෙට් ලිමිටඩ් |
| දකුණු ආසියාතික රටවල වෙළඳ ද්‍රව්‍ය ප්‍රදර්ශනය 2010 | චීනය | තෑගි භාණ්ඩ | 0.78 | 1. ඉසුරු සෙරමික්<br>2. ගැමි ශක්ති<br>3. ප්‍රතිවක්‍ර පිවිතුරු පදනම<br>4. ලුම්බිණි හැන්ඩික්‍රාෆ්ට්ස්<br>5. නේචර් ක්‍රාෆ්ට්ස්<br>6. ජී.එස්. ලංකා එක්ස්පෝට්ස්<br>7. කැන්ඩි ෆැබ්රික් ප්‍රයිවට් ලිමිටඩ්<br>8. සල්රුක් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් |

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| අම්බියන්තේ තෑගි භාණ්ඩ වෙළඳපල, ෆ්‍රෑන්ක්ෆර්ට් | ජර්මනිය | තෑගි භාණ්ඩ | 3.5 | 1. ඩීඑස්එල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්<br>2. ශ්‍රී ටෝයිස් එඩියුකේෂනල් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. මරීෂා කොකෝ ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>4. රෝයල් ෆර්න් වුඩ් පෝස්ලේන් ලිමිටඩ්<br>5. විසිකි ආර්ට් ගැලරි<br>6. ලක්ලෑන්ඩ් ජෙම් ක්‍රාෆ්ට් ප්‍රයිවට් ලිමිටඩ්<br>7. සිද්ධාලේප එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්<br>8. ලනක්වුඩ් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>9. එකෝ අයි |
| මයි කරච්චි ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | පකිස්ථානය | විවිධ භාණ්ඩ | 0.72 | 1. ස්වැසන් එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්<br>2. ඩීපීජේ බාකෝඩ් ඇන්ඩ් ලේබල් ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. මැක්සන්ස් ජේන්ට් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>4. ඒඑෆ් ජෝන්ස් (එක්ස්පෝටර්ස්) සිලෝන් ලිමිටඩ්<br>5. සැමසන් ඉන්ටර්නැෂනල් පීඑල්සී<br>6. තයිසි ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>7. කැලණි කේබල්ස් පීඑල්සී |
| විදේශ දූත මෙහෙවර මධ්‍යම යුරෝපය | ක්‍රොඒෂියා, ඔස්ට්‍රියාව, ස්ලෝවැකියාව , චෙක් ජනපදය | විවිධ භාණ්ඩ | 3.0 | 1. සීඑ්එල් එක්ස්පෝට්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්<br>2. ඇලුකොප් කේබල්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ලංකා මවුන්ට් කාසල්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>4. ඒ-ඩබ්ලිව් ඉන්ෆෝමේෂන් සිස්ටම් ලිමිටඩ්<br>5. ලංට්‍රැඩ් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>6. සින්බැඩ් ප්‍රයිවට් ලිමිටඩ්<br>7. ඒෂියා වීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>8. සෙලින් එක්ස්පෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>9. එස්එල්අයිසී ලංකා<br>10. ග්ලෝබල් සී ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| 11 වැනි බටහිර චීන ජාත්‍යන්තර වෙළඳ පොළ, චෙන්ගු, සිහුවාන් | චීනය | විවිධ භාණ්ඩ | 0.1 | ඇමුණුම (බී) බලන්න |

| ප්‍රවර්ධන වැඩ සටහනේ නම | පවත්වන ලද රට | නිෂ්පාදිතය | මණ්ඩලය දරන ලද වියදම රු. මිලියන | සහභාගී වූ අපනයනකරුවන්ගේ නම් |
|---|---|---|---|---|
| 10 වැනි සාර්ක් වෙළඳ පොළ, කත්මන්ඩු | නේපාල | විවිධ භාණ්ඩ | 0.06 | 1. සිද්ධාලේප එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>2. තයිසි ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. සියරා කේබල්ස් පීඑල්සී |
| දකුණු ආසියාතික රටවල වෙළඳ ප්‍රදර්ශනය, කුන්මින් | චීනය | විවිධ භාණ්ඩ | 2.05 | ඇමුණුම (සී) බලන්න |
| ජාත්‍යන්තර බොස්ටන් මුහුදු ආහාර ප්‍රදර්ශනය | ඇමරිකා එක්සත් ජනපදය | මුහුදු ආහාර | 1.7 | 1. ඇලෝයි එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්<br>2. ග්ලෝබල් සී ෆුඩ් ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ටොප්රා ෆ්‍රෝෂන් ෆුඩ් ලිමිටඩ්<br>4. රේන්බෝ ඉන්ජිනියරින් ඇන්ඩ් සප්ලයර්ස්<br>5. දේශාන් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් |

ඇමුණුම(බී)

**11 වන බටහිර චීන වෙළඳ ප්‍රදර්ශනය චෙන්ගු, සිහුවාන්, චීනය සහභාගී වූ අපනයනකරුවන්**

01. කොකෝ මික්ස් එක්ස්පෝටර්ස්
02. ඒසා ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්
03. ලින්ක් නැචුරල් ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්
04. ෆුඩ් ඇන්ඩ් නේචර් ප්‍රයිවට් ලිමිටඩ්
05. හයිසොන් ටීස් ප්‍රයිවට් ලිමිටඩ්
06. ඉම්පීරියල් ටී එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
07. මාබ්‍රොක් ටීස් ප්‍රයිවට් ලිමිටඩ්
08. සින්බැඩ් ශ්‍රී ලංකා
09. ෂන්සයින් ටී ප්‍රයිවට් ලිමිටඩ්
10. ඇල්ස්කා
11. ඩී.ඩී. ජෙම්ස්
12. දිප්ති ජුවෙලරි
13. යුරෝනික්ස් එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
14. හේෂානි ජෙම්ස් ඇන්ඩ් ජුවලරි
15. ජේ.සී.සී ජෙම් ඇන්ඩ් ජුවලරි
16. ජුවෙල් ඔෆ් අ මිලියන්
17. කේ.එල්.ඩබ්ලිව්. ගාමිණි එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
18. කරඳන ජෙම්ස් ඇන්ඩ් ටුවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
19. මල්ටි ජෙම්ස්
20. නව මිනි ඩොට් කොම් ප්‍රයිවට් ලිමිටඩ්
21. නිව් වර්ල්ඩ් ජෙම් ප්‍රයිවට් ලිමිටඩ්
22. ඔරියන්ටල් ජෙම් ක්‍රාෆ්ට්
23. පී.බී. ගුණදාස ඇන්ඩ් සන්ස්
24. ප්‍රසන්න ජුවලරි
25. ක්වීන් ලංකා ජෙම් ඇන්ඩ් ජුවලරි
26. රවී ජෙම්ස්
27. සිල්වර් ක්ලෙක්සන් ප්‍රයිවට් ලිමිටඩ්
28. එස්එන් කේ ඉන්ටර්නැෂනල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
29. ශ්‍රී ලංකා ජෙම් ඇන්ඩ් ජුවලරි ඒජන්සි
30. ශ්‍රී ලංකන් ජෙම් ඇන්ඩ් ජුවලරි
31. ද වොයිස්
32. ගැමි ශක්ති නිෂ්පාදන ආයතනය
33. ග්ලෝබල් හෑන්ඩ්ස්
34. ඉසුරු සෙරමික්ස
35. නැචුරලි යුවර්ස්
36. නිව් නිල කාල බතික්
37. සමන්ප්‍රිය ලෑකර් හෑන්ඩ්ක්‍රාෆ්ට්
38. ශ්‍රී ලංකා හෑන්ඩ්ක්‍රාෆ්ට්
39. සමර් රිටන්
40. විලි ලෙදර් ප්‍රඩක්ස්
41. වුඩ් ආර්ට් ලංකා
42. රේන්බෝ ඇපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ්
43. වැලේන්ජ් ඇපරල්ස් ප්‍රයිවට් ලිමිටඩ්
44. ෆෙඩරේෂන් ඔෆ් චේම්බර්ස් ඔෆ් කොමර්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රි ඔෆ් ශ්‍රී ලංකා

ඇමුණුම(සී)

**දකුණු ආසියාතික රටවල වෙළඳ ප්‍රදර්ශනය, කුන්මින්, චීනය - සහභාගී වූ අපනයනකරුවන්**

01. ඒසා ටෙක්නොලජීස්
02. ගලුකු හයිඩ්‍රොපෝනික් ප්‍රයිවට් ලිමිටඩ්
03. ගලුකු ලංකා එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
04. හේලීස් එක්ස්පෝට්ස් පීඑල්සී
05. ලිග්නොසෙල් ප්‍රයිවට් ලිමිටඩ්
06. රවී ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්
07. වොලන්කා එක්ස්පෝට් ලිමිටඩ්
08. ඇලෝයි එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්
09. සිලෝ ෆෙස් ටීස් ප්‍රයිවට් ලිමිටඩ්
10. ෆින්ලේස් කලම්බු පීඑල්සී
11. ෆුඩ් ඇන්ඩ් නේචර් ප්‍රයිවට් ලිමිටඩ්
12. එච්වීප් ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්
13. සින් බැඩ් ප්‍රයිවට් ලිමිටඩ්
14. මිෂෙල් වයිට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්
15. රෙසාස් සෙලානි ටී ප්‍රයිවට් ලිමිටඩ්
16. ලින්ක් නැචුරල් ප්‍රඩක්ස් ප්‍රයිවට් ලිමිටඩ්
17. ඇල්ස්කා
18. ක්‍රෙස්ජෙම්ස් ලිමිටඩ්
19. ඩී.ඩී. ජෙම්ස්
20. එක්ස්පෝ එන් ලංකා
21. පර්කන් අලි ඇන්ඩ් සන්ස්
22. හඳුනිස් ජෙම්ස් ඇන්ඩ් ජුවලරි එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
23. හසංගා ජුවලර්ස්
24. ජයරත්න ජෙම්ස් ඇන්ඩ් ලැපිඩරි ප්‍රයිවට් ලිමිටඩ්
25. ජගත් තිලන්ත ජෙම්ස් ඇන්ඩ් ලැපිඩරි
26. ජේසීසී ජෙම්ස් ඇන්ඩ් ජුවලරි
27. කී ජෙම්ස්
28. මල්ටි ජෙම්ස්
29. නිව් වර්ල්ඩ් ජෙම්ස් ප්‍රයිවට් ලිමිටඩ්
30. පියසිරි ජෙම්ස්
31. රවී ජෙම්ස්

32. රොජෙම්ටෝ ජෙම්
33. එස්.එන්කේ ඉන්ටර්නැෂනල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
34. සවුත් ලංකා ජෙම්ස් ඇන්ට් ජුවලරි
35. ස්පාකල් ජෙම්ස්
36. ශ්‍රී ලංකා ජෙම්ස් ඇන්ඩ් ජුවලරි ඒජන්සි
37. සත්රේ ජෙම්ස් ජුවලරි
38. සුවිනි ජුවලර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
39. ද වොයිස්
40. රිජන් ෆයින් ජුවෙල්ස්
41. හමීඩ් බ්‍රදර්ස් කලම්බු ප්‍රයිවට් ලිමිටඩ්
42. අනූජා ලේස් ඇන්ඩ් බැටික්ස්
43 දයා එම්බ්‍රොයිඩර්
44. ජී.එස්. ලංකා එක්ස්පෝට්ස්
45. ගිෆ්ට් ඔෆ් නේචර්
46. ග්ලෝබල් හැන්ඩ්ස්
47. කැන්ඩි ෆැබ්රික් ප්‍රයිවට් ලිමිටඩ්
48. ලක්රුව ප්‍රයිවට් ලිමිටඩ්
49. ලක්සල හැන්ලූම්ස්
50. ලුම්බිණි හැන්ඩික්‍රාෆ්ට්ස්
51. නැවූරලි යුවර්ස්
52. නේචර් ක්‍රාෆ්ට්ස්
53 නිලංකා ආර්ට්ස් ඇන්ට් බැටික්
54. ඕපාත
55. රම්‍ය නිෂ්පාදනය
56. සල්රුක් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්
57. සමන්ප්‍රියා ලැකර් හැන්ඩික්‍රාෆ්ට්ස්
58. ශ්‍රී ලංකා හැන්ඩික්‍රාෆ්ට්ස්
59. සමර් රිටන්
60. යුනික් මල්ටි ආට්ස්
61. වුඩ් ආර්ට් ලංකා
62. ඉසුරු සෙරමික්ස්
63. ගැමි ශක්ති නිෂ්පාදන ආයතනය
64. ජුවෙල් ඔෆ් අ මිලියන්
65. මිරැකල් ට්‍රේඩ් ඉන්ටර්නැෂනල්
66. එයිට්කන්ස්පෙන්ස් කාගෝ ප්‍රයිවට් ලිමිටඩ්

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. වෙනත් කරුණු දැන ගන්න අවශ්‍ය නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න.

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

අහන්න, මම උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ නිෂ්පාදනය කරලා අපනයනය කිරීම තමයි අති විශේෂ වැඩ කටයුත්ත.මේ සම්බන්ධයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය ව්‍යාපාරිකයන්ට දායකත්වය ලබා දෙන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන ඔබතුමා නියෝජ්‍ය ඇමති වශයෙන් අමාත්‍යාංශය වෙනුවෙන් උත්තර දෙන්න පුළුවන්ද?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමා මීට ඉස්සෙල්ලාත් ව්‍යාපාරිකයන් සම්බන්ධව අපනයන සංවර්ධන මණ්ඩලය ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව ඔය ප්‍රශ්නයම වෙනත් විධියකින් ඇහුවා. මේ සම්බන්ධව අපනයන සංවර්ධන මණ්ඩලය බොහොම පැහැදිලි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙන්නේ. මේ කාරණය ඔබතුමාට දීර්ඝ වශයෙන් උත්තර දෙන්න තිබෙන මාතෘකාවක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පහු ගිය වතාවේදීත් ඔබතුමා උත්තරයක් දුන්නා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මේක වෙනම ප්‍රශ්නයක් විධියට ඇහුවා නම් සවිස්තරාත්මක තොරතුරු වාර්තාවක් ඔබතුමාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම සංක්ෂිතව අපට කියන්න, පැහැදිලිව කටයුතු කරන මේ අමාත්‍යාංශය මොනවාද කරන්නේ කියා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බොහොම උගත්, බුද්ධිමත් මන්ත්‍රීතුමෙකු විධියට මම ඔබතුමාට කියන්න ඕනෑ, මේක බොහොම පුළුල් විෂයයක් බව. අපනයන සංවර්ධන මණ්ඩලය සහ එහි කටයුතු පිළිබඳව කතා කරනකොට විදේශ වෙළෙඳ පොළ, විදේශ වෙළෙඳ පොළත් එක්ක සම්බන්ධ විවිධ රටවල්, ජාත්‍යන්තර ගිවිසුම් ආදී ඒ සියලු කරුණු කාරණා එක්ක තමයි ඔබතුමාගේ ප්‍රශ්නයට සංක්ෂිප්ත පිළිතුරක් දෙන්න වෙන්නේ. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේක ප්‍රශ්නයක් විධියට යොමු කරන්නය කියා. එතකොට සියලු තොරතුරු ඔබතුමාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන්ද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? අපනයන සංවර්ධන මණ්ඩලය තුළින් තමයි මේ ව්‍යාපාරයට උදව් කරන්න පුළුවන් වෙන්නේ. අද තිබෙන දැවැන්තම ප්‍රශ්නය තමයි සම්පත් හිඟකම සහ ව්‍යාපාරිකයන්ට තිබෙන මුදල් ප්‍රශ්නය. මේ ව්‍යාපාරිකයන්ට දක්ෂතා තිබෙනවා; නිපුණත්වයක් තිබෙනවා; නමුත් මුදල් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් බැංකුවට ගියාම බැංකුවෙන් සියයට 20, සියයට 22 ගිනි පොලියට තමයි මුදල් ලබා ගන්න වෙන්නේ. සියයට 2, සියයට 3, සියයට 4 පොලියට ණය ලබා දෙන්න හැකියාව ඇති කරන්න අපනයන සංවර්ධන මණ්ඩලයට මොනවාද කරන්න පුළුවන් වෙන්නේ?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමනි, අපනයන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔබතුමා කථා කළත් මේක සෘජු වශයෙන්ම බලපාන්නේ මුදල් අමාත්‍යාංශය හා සම්බන්ධ බැංකු වැඩ පිළිවෙළටයි. නමුත් 2012 අය වැය ලේඛනයෙනුත් රජය බොහොම පැහැදිලිව මේ ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය සඳහා කරනු ලබන දායකත්වය පිළිබඳව පැහැදිලි කර තිබෙනවා. බැංකුවල පොලී අනුපාත විටින් විට උස් පහත් වෙනවා. ඒ නිසා මම හිතන්නේ මේ සම්බන්ධයෙන් එතරම්ම ගැටලුවක් නැහැ කියලායි. විධිමත් අයදුම් පතක් සමඟ ව්‍යාපාරික කටයුතු සඳහා ඉල්ලුම් කරන සියලු දෙනාටම - විශේෂයෙන්ම අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ උදවියට- වැඩි සහයෝගයක් දෙන්න රජය බලාපොරොත්තු වෙනවා.

ඔබතුමා පොදුවේ කථා කරන්නේ නැතුව මේ මේ ව්‍යාපාරිකයන්ට මේ මේ ගැටලු තිබෙනවාය කියලා අපට කරුණු ඉදිරිපත් කළොත් අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරින්ටත්, අපටත් පෞද්ගලිකව මැදිහත් වෙලා බාධක තිබෙනවා නම් ඒවා ඉවත් කර අවශ්‍ය සහන සලසන්න පුළුවන්ය කියන එකයි ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අවසාන අතුරු ප්‍රශ්නය විධියට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්නේ මේ ප්‍රශ්නයයි. ඔබතුමාට උත්තර දෙන්න අසීරු තත්ත්වයක් ඇති වෙන නිසා මම පුන පුනා අහන්නේ නැහැ. නමුත් අහන්න තිබෙන එකම දේ මෙයයි. ඉන්දියා-ලංකා මිත්‍ර ගිවිසුම තිබෙනවා. BIMSTEC මිත්‍ර ගිවිසුම තිබෙනවා. පාකිස්තාන-ලංකා මිත්‍ර ගිවිසුම තිබෙනවා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ප්‍රශ්නයෙන් අහන්නේ market share එක ගැනයි. ලංකාවත්, ඉන්දියාවත් අතර මිත්‍ර ගිවිසුමක් තිබුණාට අද අපනයනකරුවන්ට -මන්චි ආයතනය වෙන්න පුළුවන්.- ලංකාවේ තිබෙන භාණ්ඩ ඉන්දියාවට අපනයනය කරන කොට චෙන්නායිවලදී tax එකක් ගහනවා. කරුණාකරලා කියන්න පුළුවන්ද අඩු ගණනේ මේ මිත්‍රශීලී ගිවිසුම් ටික -අපි එදා හදලා දුන්නු මේ ගිවිසුම් ටික- ආරක්ෂා කරලා මේ බාධක ඉවත් කරන්න ආණ්ඩුවක් වශයෙන් හරි, අමාත්‍යාංශයක් වශයෙන් හරි ඔබතුමා මොනවාද කරන්නේ කියලා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැනත් බොහොම සවිස්තරාත්මක තොරතුරක් ඉල්ලන්නේ. කරුණාකරලා, ඔබතුමා අපේ උපදේශක කාරක සභාවට එන්න. ඇවිල්ලා මේ සම්බන්ධව අපත් එක්ක සාකච්ඡා කරන්න; යෝජනා කරන්න. ඔබතුමා ඔය කියන සහන සහ පහසුකම් පිළිබඳව අපේ රජයට, අපනයන සංවර්ධන මණ්ඩලයට දෙන්න පුළුවන් ඉඩ ප්‍රස්ථා සියල්ල අපි දෙන්න බලාපොරොත්තු වෙනවා; දෙන්න උත්සාහ කරනවා; දෙමින් ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඊට වඩා හොඳයිනේද, ආණ්ඩුවෙත්, විපක්ෂයෙත්-

## ක්‍රීඩා ගම්මාන සඳහා ඉඩම් පවරා ගැනීම : වන්දි

### விளையாட்டுத்துறைக் கிராமத்துக்காகச் காணி சுவீகரிப்பு : நட்டஈடு

### ACQUISITION OF LAND FOR GAMES VILLAGE : COMPENSATION

1354/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ක්‍රීඩා ගම්මානයන් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ආසන්නයේ ග්‍රාම නිලධාරී වසම් දෙකකට අයත් ජනතාව පදිංචි, කෘෂිකර්මාන්තයට යොදා ගත් අක්කර 5000ක පමණ භූමි ප්‍රදේශයක් රජයට පවරා ගැනීමේ සැලසුමක් තිබෙන බවත්;

(ii) මේ වන විට ඊට අදාළ මිනුම් කටයුතු ආරම්භ කර ඇති බවත්;

(iii) එම භූමිය තුළ වූ වැව් පහක් සහ රජයේ පාසල් දෙකක් තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් පවරා ගත් පසු එම පාසල් දෙක ඉහත ප්‍රදේශයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, නැවත ඒවා ස්ථාපිත කරනු ලබන ප්‍රදේශය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ඉඩම් පවරා ගැනීමෙන් නිවාස සහ ඉඩම් අහිමි වන ජනතාවට නැවත නිවාස සහ ඉඩම් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඉඩම් හා නිවාස ලබා දෙන ප්‍රදේශය කවරේද;

(iii) ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தின் சூரியவெவ கிரிக்கட் மைதானத்துக்கு அருகாமையில் இரண்டு கிராம உத்தியோகத்தர் பிரிவுகளுக்குரிய மக்கள் வதியும், கமத்தொழிலுக்குப் பயன்படுத்தப்பட்ட ஏறத்தாழ 5000 ஏக்கர் காணியை விளையாட்டுத்துறைக் கிராமமொன்றுக்காக அரசு சுவீகரிப்பதற்கு திட்டமிட்டுள்ளதென்பதையும்;

(ii) தற்போது அதனுடன் தொடர்புடைய நிலஅளவைப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ளதென்பதையும்;

(iii) இந்நிலப்பரப்பினுள் ஐந்து குளங்களும் இரண்டு அரசாங்கப் பாடசாலைகளும் உள்ளன என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) காணிகள் சுவீகரிக்கப்பட்டதன் பின்னர் அந்த இரண்டு பாடசாலைகளையும் அப்பிரதேசத்திலிருந்து அகற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா;

(ii) அவ்வாறெனின், அந்தப் பாடசாலைகள் மீண்டும் எங்கு நிறுவப்பட உள்ளன;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இக்காணிகள் சுவீகரிக்கப்படுவதன்மூலம் வீடுகள் மற்றும் காணிகளை இழக்கின்ற மக்களுக்கு மீண்டும் வீடுகளும் காணிகளும் வழங்கப்படுமா;

(ii) அவ்வாறெனின் காணிகள் மற்றும் வீடுகள் எந்தப் பிரதேசத்தில் வழங்கப்படும்;

(iii) இதற்காகப் பயன்படுத்தப்படும் முறைமையியல் யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Is he aware that-

(i) there is a move by the Government to take over an area of about 5,000 acres belonging to two Grama Niladhari Divisions close to Sooriyawewa Cricket Stadium in Hambanthota District, where people are residing and agricultural activities are carried out, for a Games Village;

(ii) the relevant surveying has been started by now; and

(iii) there are five tanks and two government schools within that area?

(b) Will he inform this House-

(i) whether measures will be taken to remove aforesaid schools after taking over the aforesaid lands; and

(ii) if so, of the areas where they will be relocated?

(c) Will he state-

(i) whether houses and lands will be provided again to those who will lose houses and lands due to taking over of the aforesaid lands;

(ii) if so, the area within which land and housing will be provided; and

(iii) the method that will be adopted for this purpose?

(d) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්කර 5,000ක භූමි ප්‍රමාණයක් ක්‍රීඩා ගම්මානයක් ඉදි කිරීම සඳහා රජයට පවරා ගැනීමට කටයුතු කර නොමැත.

(ii) අක්කර 1435ක පමණ භූමි ප්‍රමාණයක දළ අනු රේඛණයක් එම ප්‍රදේශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සකස් කරමින් පවතී.

(iii) එම භූමි ප්‍රදේශය තුළ වැව් 06ක් ඇති අතර රජයේ පාසල් නොමැත.

(ආ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ගරු ඇමතිතුමා සඳහන් කළා එම ප්‍රදේශය තුළ වැව් 06ක් තිබෙනවා කියලා. මේ ක්‍රීඩා ගම්මානය හැදෙනවාත් එක්කම මේ වැව් 06 තවදුරටත් කෘෂි කාර්මික කටයුතු සඳහා යොදා ගැනීමේ හැකියාවක් තිබෙනවාද? එහෙම නැත්නම් ඒ කටයුත්ත සඳහා යොදා ගැනීමේ හැකියාවක් නැද්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා ගම්මානය අස්සේ වැව් තියා ගන්න බැහැ නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඒ නිසා අනිවාර්යයෙන්ම අපි ඒ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් හදනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වැව් හරහා ජලය ලබා ගත් කෘෂි කාර්මික පද්ධතියක් තිබෙනවා. ඒ කෘෂි කාර්මික පද්ධතියත් මේ භූමියට අයිති වනවා නම් අනිවාර්යයෙන්ම ඒ කෘෂි කාර්මික පද්ධතියත් ඉවත් කරන්න සිද්ධ වනවාය කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, මේ ජාතික සැලැස්ම අනුව ඒ ප්‍රදේශයේ තිබෙන වාරි කර්මාන්තය ඇතුළු ඒ සියල්ලටම ප්‍රශ්නයක් පැන නොනඟින විධියට, ඒ ප්‍රදේශයේ ගොවීන්ට ප්‍රශ්නයක් පැන නොනඟින විධියට තමයි මේ ක්‍රීඩා ගම්මානය සකස් කරන්නේ. තවම අපි මේවායේ මැනුම් කටයුතු තමයි කරන්නේ. අපි කෘෂි කාර්මික වශයෙන් කිසිම කෙනකුට ප්‍රශ්නයක් ඇති නොවන විධියට වග බලා ගන්න කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය සහ දෙවැනි අතුරු ප්‍රශ්නය පිළිබඳව -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා ප්‍රශ්නය මගෙන් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම ගරු කථානායකතුමා දිහා බලා ගෙන ඇහුවාම එපායැ ඔබතුමා උත්තර දෙන්න.

මම අහන්නේ මේකයි. පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර වශයෙන් එතුමා සඳහන් කරන්නට යෙදුණා ක්‍රීඩා ගම්මානයත් එක්ක වැව් තියා ගන්න බැහැයි කියලා. දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලෙස කිව්වා ගොවීන්ට කෘෂි කාර්මික පද්ධතිය තුළ වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරනවා කියලා. මේ පිළිතුරු දෙක එකිනෙකට පරස්පරයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ මේකයි. මම ඔබතුමාට නැවතත් පැහැදිලි කරන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම අහන්නේ වාරි මාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා-මේ ගොවීන් තවදුරටත් තමන්ගේ ඔය කියන භූමියෙන් පිටතට ගෙන යනවා නම් ඔවුන්ට අර වැව්-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඒක තමයි මා ඔබතුමාට කිව්වේ. මෙතැන ලොකු සැලැස්මක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. ඒ ඉඩම් අත් පත් කර ගන්නා අයට විකල්ප ඉඩම් දෙනවා. ඒ අයට අවශ්‍ය වාරි කර්මාන්ත හදනවා. ඒවා සියල්ල ලැබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

එතකොට තව වැව් 06ක් අලුතින් හදනවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

එහෙම නැත්නම් වතුර කොහෙන්ද? තමුන්නාන්සේ මාතරින් ගෙනැවිත් දෙනවාද වතුර?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒක තමයි මම අහන්නේ. මාතරිනුත් වතුර ගෙන ඒමේ සැලැස්මක් තිබුණා, අම්පනාගල ජලාශයක් ඉදි කරලා. අම්පනාගල ජලාශයේ වතුරද මේ ගෙන යන්න හදන්නේ කියන එකයි මට තිබෙන ප්‍රශ්නය.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, ඔය ප්‍රශ්නය ඔබතුමාගේ නොවෙයිනේ. අනුන් වෙනුවෙන්නේ ඔබතුමා ඔය කඩේ යන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ පිළිතුර මටත් ප්‍රශ්නයක් ඇති කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අන්න, බලන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ නිසා මේක මීට වඩා සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

හොඳයි, ගරු කථානායකතුමනි-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒක තමයි. මේක බරපතළ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමාටත් ප්‍රශ්නයක් ඇති වෙනවා නම් දෙයියන්ගේම පිහිටයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මම නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ වැව් හඳලා තිබෙන්නේ බොහොම අමාරුවෙන්. කරුණාකර, ඒ ගැන නැවත ජනතාවගේ අදහස් විමසිය යුතුයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් කරලා කටයුතු කරන්නම්.

## පොලිස් ත්‍යාග අරමුදල : විස්තර

பொலிஸ் சன்மான நிதியம்: விபரம்

POLICE REWARDS FUND : DETAILS

1596/’11

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොලිස් ත්‍යාග අරමුදල සඳහා මුදල් ලැබෙන ආකාරය කවරේද;

(ii) එම අරමුදලේ මේ වන විට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම අරමුදලේ මූල්‍ය වත්කම් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට එම අරමුදලින් ත්‍යාග ලබාගත් පොලිස් නිලධාරින්ගේ නම් සහ ඔවුන්ට ලබා දී ඇති ත්‍යාග කවරේද;

(ii) මේ වන විට තෑගි ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்தசாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பொலிஸ் சன்மான நிதியத்திற்கு பணம் கிடைக்கும் வழிகள் யாதென்பதையும்;

(ii) மேற்படி நிதியத்தில் தற்போது காணப்படும் பணத்தொகை யாதென்பதையும்;

(iii) 2005ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை குறித்த நிதியத்தின் நிதிச் சொத்துக்களின் அளவு வருடாந்த ரீதியில் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2005ஆம் ஆண்டு தொடக்கம் மேற்படி நிதியத்திலிருந்து சன்மானம் பெற்ற பொலிஸ் உத்தியோகத்தர்களின் பெயர்கள் மற்றும் அவர்களுக்கு வழங்கப்பட்டுள்ள சன்மானங்கள் யாவை என்பதையும்;

(ii) தற்போது சன்மானம் பெற விண்ணப்பித்துள்ளோரின் எண்ணிக்கை யாதென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he inform this House-

(i) the way in which the Police Rewards Fund gets money;

(ii) the amount of money available in the aforesaid Fund at present ; and

(iii) separately of the amounts of financial assets of the aforesaid Fund in each of the years from year 2005 up to now?

(b) Will he state-

(i) the names of the police officers who received rewards from the monies of the aforesaid Fund since year 2005 and the types of rewards granted to them ; and

(ii) the number of persons who have applied for rewards by now?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா )
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පොලිස් නිලධාරින් විසින් සිදු කරනු ලබන අපරාධ මර්දන රාජකාරි සහ විවිධ වූ වැටලීම් රාජකාරිවලදී, අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරනු ලබන සැකකරුවන් සඳහා මෙරටේ අධිකරණයකින් නියම කරනු ලබන දඩ මුදල්වලින් අර්ධයක් හෝ වෙනයම් ප්‍රමාණාත්මක කොටසක් අධිකරණය විසින් පොලිස් ත්‍යාග අරමුදලට බැර කිරීම මඟින් මෙම අරමුදල පෝෂණය වේ. තවද, පොලිස් ත්‍යාග අරමුදලේ ඇති අතිරික්ත මුදල් රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලියද මෙම පොලිස් ත්‍යාග අරමුදලට බැරවෙයි.

(ii) ත්‍යාග අරමුදලේ දැනට ඇති මුදල - රු. 2,668, 245,893.08

(iii) 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ත්‍යාග අරමුදලේ මූල්‍ය වත්කම් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන්:

| වර්ෂය | මූල්‍ය වත්කම් |
|---|---|
| 2005 | 118,306,218.06 |
| 2006 | 110,032,456.84 |
| 2007 | 266,414,906.56 |
| 2008 | 261,148,238.43 |
| 2009 | 253,009,569.44 |
| 2010 | 245,509,832.14 |

(ආ) (i) 2005 වර්ෂයේ සිට පොලිස් ත්‍යාග අරමුදලින් මේ දක්වා ත්‍යාග ලබා ගත් නිලධාරින්ගේ නම් සහ ඔවුන්ට ලබා දී ඇති ත්‍යාග මුදල් වෙන් වෙන් වශයෙන් විමසා ඇති නමුත්, එම නිලධාරින් ලක්ෂ සංඛ්‍යාවක් සිටින බැවින්ද, නම් වශයෙන් ලැයිස්තුගත කර ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන බැවින්ද වර්ෂය අනුව නිලධාරින් සංඛ්‍යාව හා ගෙවූ මුළු මුදල ඉදිරිපත් කෙරේ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

| වර්ෂය | නිලධාරින් සංඛ්‍යාව | ගෙවූ මුළු මුදල |
|---|---|---|
| 2005 | 87,080 | 199,999,469.00 |
| 2006 | 1,03,852 | 259,229,437.00 |
| 2007 | 99,001 | 298,620,074.00 |
| 2008 | 86,956 | 327,924,080.00 |
| 2009 | 85,971 | 367,028,466.00 |
| 2010 | 90,926 | 457,924,995.00 |
| 2011.11.15 | 83,896 | 383,581,245.25 |

(ii) 80,057කි.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මේ තෑගි ලබා ගැනීමට ඉල්ලුම් කරලා තිබෙන අයගෙන් මට දැන ගන්න ලැබුණු විධියට, පසු ගිය මාස කීපය ඇතුළත මේ අරමුදලින් මුදල් ගෙවීම ප්‍රමාද වෙලා තිබෙනවා. ඉල්ලුම් පත්‍ර ලැබිලා තිබෙන සංඛ්‍යාව තමයි දැන් ගරු ඇමතිතුමා කිව්වේ. නමුත් පොලිස් තෑගි අරමුදලින් ගෙවලා තිබෙන ප්‍රමාණය ගත්තාම, ඊට වැඩිය අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. ඉතින් මම අපේ ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඉල්ලුම් කළ සියලු දෙනා වෙනුවෙන් මේ මුදල් ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද කියලා. නොලැබුණු අය විශාල පිරිසක් ඉන්නවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය උපදේශක කාරක සභාවේදී ඇහුවා නම් වඩාත් හොඳ උත්තරයක් ලබා ගන්න පුළුවන් වෙයි. මා දන්නා තරමින් ඒ ලැබෙන ඉල්ලුම් පත්‍ර විශ්ලේෂණයට භාජන කරලා, ඊට පස්සේ තමයි ඒ ගෙවීම් කරන්නේ. යම් ප්‍රමාදයක් තිබෙනවා කියලා ඔබතුමා කියනවා නම්, මම අමාත්‍යාංශයට දැනුම් දෙන්නම් ඒ පිළිබඳව ඉතා ඉක්මනින් කටයුතු කරලා ඒ ලැබිය යුතු අයට ඒ මුදල ලබා දීමට කටයුතු කරන්න කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි ගරු කථානායකතුමනි. ඒ පොලිස් ත්‍යාග අරමුදලේ තිබෙන මුදල් ප්‍රමාණය දැන් ආණ්ඩුවට පවරා ගන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා මේ විස්තරයේ බොහොම පැහැදිලිව තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
කොහේද තිබෙන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා ඒ මුදල පවරා ගන්න යනවා කියලා මේ පත්තරේ දාලා තිබෙනවා ඔක්කෝම විස්තර ටික.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, එක එක පත්තරවල තිබෙන ප්‍රවෘත්තිවලට ප්‍රතිචාර දක්වන්න පුළුවන්කමක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් "දිනමිණ" පත්තරෙත් බොරු.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවා නම් අපිට උත්තර දෙන්න පුළුවන්. එහෙම නැත්නම් රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට එන්න. ඒ උපදේශක කාරක සභාවට ආවට පසු -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකට ගියාම තර්ජනය කරනවා. ඒකයි වැඩේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම කොහෙවත් තර්ජන දමලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකට ගියාම තර්ජන තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ඇතුළේ තර්ජනය කළොත් කරුණාකර, මට දන්වන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම තර්ජනය කළාය කියා කිසිම පැමිණිල්ලක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තර්ජනය කරන්නේ නැත්නම් ඒක අපට අහ ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. පොලීසියට දෙන නිල ඇඳුම්වල විශාල අඩු පාඩුවක් තිබෙනවා. පසු ගිය කාල වකවානුව තුළත් තිබුණා. MSD එකට, රුපියල් 800ක් විතර වටිනා shirt එකක් කියලා තමයි දුන්නේ. ගරු කථානායකතුමනි, ඒක MSD කියලා ගහපු කහ පාට shirt එකක්. ඇත්තටම ඒ shirt එක රුපියල් 800ක් වටින්නෙත් නැහැ. මා කියන්න කැමැතියි, ඊට වඩා ටිකක් ගෞරවනීය විධියට දෙන්න කියලා. ඔබතුමාගේත් ආරක්ෂක භටයෝ ඉන්නවා නේ. ඇහුවාම තේරෙනවා ඇති නේ. ඒක හේදුවාම අඳින්න බැහැ. ඒක රුපියල් 800යි. මා කියන්න කැමැතියි, අඩුම තරමේ මීට වැඩිය හොඳ kit එකක් දෙන්න කියලා. අපි හරි මහලා දෙන්නම්. ඒක MSD කියලා කහ පාට අකුරු තුනක් ගහපු එකක්. ඒක පෙනෙන්නෙත් නැහැ; MSD කියා හඳුනා ගන්නත් බැහැ. ඒකට මොකක් හෝ විසඳුමක් දෙන්න කියා මා කියන්න කැමැතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
විපක්ෂයේ මන්ත්‍රීවරු ස්වෙච්ඡාවෙන් ඒවා මහලා දෙන්න සූදානම් නම්, අපි නියම කරනු ලබන ප්‍රමිතියකට මහලා දීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ප්‍රමිතියක් අනුව ලස්සනට හදන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක හදන්නම්. එතුමා කියනවා නම් මේ පිළිබඳ අඩු පාඩු තිබෙනවා කියා, ඒක මා අමාත්‍යාංශයේ අවධානයට යොමු කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක shirt එකයි දෙන්නේ. හේදුවාම වේලෙන තුරු ගෙදරට වෙලා ඉන්න ඕනෑ. ඒකයි වැඩේ.

## කලාපීය වෙළෙඳ ගිවිසුම් : විස්තර
### பிராந்திய வர்த்தக உடன்படிக்கைகள் : விபரம்
### REGIONAL TRADE AGREEMENTS : DETAILS

1068/'11

5. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාව සමඟ ඇති කරගෙන තිබෙන වරණීය, ද්විපාර්ශ්වීය සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නව ගිවිසුම් සම්බන්ධයෙන් වෙනත් කිසියම් රටක් සමඟ දැනට සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන්නේද;

(iii) ඇමරිකා එක්සත් ජනපදය සමග ඇතිකර ගත් වෙළෙඳ ආයෝජන සහ පාදක ව්‍යුහ ගිවිසුමහි (TIFA) වර්තමාන තත්ත්වය කවරේද;

(iv) වරණීය වෙළෙඳ ගිවිසුම් සම්බන්ධයෙන්කටයුතු කරන නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආසියානු රටවල් සමඟ ශ්‍රී ලංකාව ඵලදායී ලෙස වෙළෙඳ කටයුතුවල නොයෙදීමට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில், வாணிப அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையுடன் மேற்கொள்ளப்பட்டுள்ள விருப்பத்திற்குரிய, இருதரப்பு, பிராந்திய வர்த்தக உடன்படிக்கைகள் எவை என்பதைத் தனித்தனியாகவும்;

(ii) வேறு ஏதாவது நாடுகளுடன் புதிய உடன்படிக்கைகளை மேற்கொள்வதற்கான பேச்சுவார்த்தைகள் இடம்பெறுகின்றனவா என்பதையும்;

(iii) ஐக்கிய அமெரிக்காவுடன் ரி.ஐ.எப்.ஏ. (TIFA) தொடர்பிலான தற்போதைய நிலைமை என்ன என்பதையும்;

(iv) விருப்பத்திற்குரிய வர்த்தக உடன்படிக்கைகளை கையாளுகின்ற அதிகாரிகளின் பெயர்கள் என்ன என்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஆ) ஏன் ஆசிய நாடுகளுடன் வினைத்திறன்மிக்க முறையில் வர்த்தகத்தில் இலங்கை ஈடுபடவில்லை என்பதை அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he state-

(i) the preferential, bilateral and regional trade agreements that are in place with Sri Lanka separately;

(ii) whether there are ongoing negotiations on new agreements with any country;

(iii) the current situation on TIFA with USA; and

(iv) names of the officials handling the preferential trade agreements?

(v) Will he also state as to why Sri Lanka is not effectively pushing trade with the Asian countries?

(b) If not why?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) **වරණීය:** පොදු වරණ තීරුබදු ක්‍රමය (GSP) යටතේ පහත සඳහන් රටවල් විසින් තීරුබදු සහන ලබා දී තිබේ.

ඕස්ට්‍රේලියාව, කැනඩාව, යුරෝපා සංගමය, ජපානය. නවසීලන්තය, නෝර්වේ, ස්විට්සර්ලන්තය, තුර්කිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය.(2010 වර්ෂය අවසානයේ සිට ඇමෙරිකානු කොංග්‍රසය, එම රටේ පොදු වරණ තීරු බදු ක්‍රමය දීර්ඝ නොකිරීම නිසා එම ක්‍රමය යටතේ සියලුම රටවලට ලබා දුන් තීරු බදු සහන මේ වන විට නතර කර තිබේ.)

**ද්විපාර්ශ්වීය:** ඉන්දු-ශ්‍රී ලංකා සහ පාකිස්තානු-ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම්.

**කලාපීය:** ආසියා පැසිෆික් වෙළෙඳ ගිවිසුම (APTA)

දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)

ගෝලීය වෙළෙඳ වරණ ක්‍රමය(GSTP)

(ii) දැනට ශ්‍රී ලංකාව, ඉන්දියාව හා පාකිස්තානය සමඟ වෙළෙඳ සහ ආර්ථික සහයෝගිතා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඇති විභවයන් අධ්‍යයනය කරමින් පවතී. ඊට අමතරව ආසියා පැසිෆික් වෙළෙඳ ගිවිසුම (APTA) සහ දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA) යටතේ දැනට ලබා දී ඇති තීරු බදු සහන තවදුරටත් පුළුල් කිරීම පිණිස සාකච්ඡා පවත්වමින් සිටී.

[ගරු ජයරත්න හේරත් මහතා]

(iii) 2002 වසරෙහි අත්සන් කරන ලද වෙළෙඳ සහ ආයෝජන පාදක ව්‍යුහ ගිවිසුම (TIFA) යටතේ ඇමෙරිකාව හා ශ්‍රී ලංකාව අතර දැනට සාකච්ඡා වට 08ක් පවත්වා තිබෙන අතර, 09 වන වටය 2011 වසරේ නොවැම්බර් මසදී වොෂිංටනයේදී පැවැත්වීමට නියමිතව තිබිණි. වෙළෙඳ පොළ පිවිසුම, බුද්ධිමය දේපළ අයිතීන්, ආයෝජන ආරවුල්, කාර්මික සහයෝගිතාව ආදී පුළුල් පරාසයක් තුළ දිවෙන අන්‍යොන්‍ය වැදගත්කමකින් යුත් විෂයයන් රාශියක් සම්බන්ධයෙන් වෙළෙඳ සහ ආයෝජන පාදක ව්‍යුහ ගිවිසුම (TIFA) ක්‍රියාකාරී යාන්ත්‍රණයක් බවට පත්ව තිබේ. ඊට අමතරව දෙපාර්ශ්වයම වෙළෙඳ සහ ආයෝජන පාදක ව්‍යුහ ගිවිසුමේ ක්‍රියාකාරිත්වය හරහා (TIFA) රාජ්‍ය සහ පෞද්ගලික සාමාජිකත්ව වැඩසටහන යටතේ පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමට සමත් වී ඇත.

(iv) වාණිජ අධ්‍යක්ෂ ජනරාල් ගෝමි සේනාධීර මහතාගේ අධීක්ෂණය යටතේ පහත නම් සඳහන් නිලධාරීන් ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන නිදහස් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් සම්බන්ධයෙන් ක්‍රියා කරයි.

පොදු වරණ තීරුබදු ක්‍රමය (GSP)
- සංජීව පට්ටිවලමයා/සහකාර වාණිජ අධ්‍යක්ෂ

ඉන්දියා-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
- තවිෂා මුල්ලේගම්ගොඩ මහත්මිය/සහකාර වාණිජ අධ්‍යක්ෂ

පාකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
- පී. ජයකොඩි මහතා/සහකාර වාණිජ අධ්‍යක්ෂ

ආසියානු පැසිපික් වෙළෙඳ ගිවිසුම
- රුවන්ති ආරියරත්න මහත්මිය/සහකාර වාණිජ අධ්‍යක්ෂ

දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම
- පී.ඒ.එස්. පොන්නම්පෙරුම මහතා/ සහකාර වාණිජ අධ්‍යක්ෂ.

ගෝලීය වෙළෙඳ වරණ ක්‍රමය (GSTP)
- පී.ඒ.එස්. පොන්නම්පෙරුම මහතා/ සහකාර වාණිජ අධ්‍යක්ෂ.

(ආ) ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව ආසියානු කලාපය තුළ ප්‍රධාන වෙළෙඳ පොළවල් වන ඉන්දියාව, පාකිස්තානය, චීනය සහ දකුණු කොරියාව වැනි රටවල් සමඟ සක්‍රිය ලෙස විදේශ වෙළෙඳ සම්බන්ධතා ප්‍රවර්ධනය කර ගෙන යමින් සිටී.

ශ්‍රී ලංකාව ඉන්දියාව සහ පාකිස්තානය අතර ඇති කර ගත් නිදහස් වෙළෙඳ ගිවිසුම් එම වෙළෙඳ පොළවලට අපගේ අපනයන වැඩිදියුණු කර ගැනීමට උපකාරී වී ඇති අතර, ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම මඟින් චීන සහ කොරියානු වෙළෙඳ පොළ සඳහා අපගේ අපනයනයන් සැලකිය යුතු අන්දමින් වර්ධනය කර ගැනීමට උපකාරී වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියනවා TIFA වෙළෙඳ ගිවිසුම ඉදිරියට ගෙන යනවාය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තවත් ප්‍රශ්න දෙකක් තිබෙන නිසා අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

TIFA ගිවිසුම ඇමෙරිකාවත් එක්ක ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නම්, ඒකට සාධක තිබෙනවා. නමුත් ඒ සාධක සම්පූර්ණයෙන් නවත්වලා තිබෙනවා. Export facilitation එක සහ Sri Lanka Customs එකේ තිබෙන වැඩ පිළිවෙළ දැන් නවත්වලා තිබෙනවා. එක පැත්තකින් TIFA ගැන කථා කළාට, මේ සාධක ඉටු කළේ නැති වුණාම කථා කරලා වැඩක් නැහැ. ඇයි ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ගෙන යන්නේ නැත්තේ?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

දැනට අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සාකච්ඡා ගෙන යන්න බැහැ. මූලික පදනම් තිබෙනවා කරන්න. අපේ කාලයේ පටන් ගත්තා; කළා; ඉවර කළා. අපේ කාලයේ 2005 දී මේ වෙළෙඳ ගිවිසුම අපට ලැබෙන්න ගියා. ආණ්ඩු වෙනස් වීමෙන් නැති වුණා. දැන් ඔබතුමා ඒකට තිබෙන සාධක නැති කර ගෙන යනවා. ඉතින් කථා කරන්න බැහැ.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු කථානායකතුමනි, අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා බොහොම අසුබවාදීව තමයි අපනයන ක්ෂේත්‍රයේ ගිවිසුම් පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා කරන්නේ, කරුණු ඉදිරිපත් කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අසුබ නොවෙයි. කරුණා කරලා මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයට දෙන උත්තරය ගැන අසුබවාදී විධියට හිතන්න එපා. අහන්න මෙතැන ඉන්න-

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු කථානායකතුමනි, 2015 වෙන කොට අපනයන ක්ෂේත්‍රයෙන් ලබන ආදායම ඇමෙරිකන් ඩොලර් බිලියන 15 දක්වා ඉහළ නංවන්නට අපි උපාය මාර්ග සකස් කරලායි තිබෙන්නේ. මේ උපාය මාර්ග අනුව අපි ක්ෂේත්‍ර 4ක් හඳුනා ගෙන තිබෙනවා. එයින් පූර්ණ අපනයන අනුග්‍රහයෙන් සියයට 80කට වැඩිය උත්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මෙම ක්ෂේත්‍රයේ යම් කිසි ප්‍රගතියක් තිබෙනවා මිසක් මේකේ කිසිම පසුබෑසීමක් නැහැ. විශේෂයෙන්ම පසු ගිය කාලයේ පැවති යුද්ධයත් එක්ක ආපස්සට ගිය, කඩා වැටිච්ච මේ අපනයන ක්ෂේත්‍රයේ සියලු කටයුතුවල වර්ධනයක් සිදු විය යුතුයි. මෙහිදී අපට හිතකර වෙළෙඳ ගිවිසුම්වලට යන්නත් අප බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලාගේ කාලයේ අත්සන් කරපු, සාකච්ඡා කරපු

හුඟක් ඒවා තිබෙනවා. ඒවායින් අපට වඩාත් ප්‍රතිඵලදායක ගනුදෙනුවලට යනවා මිසක් ඔබතුමන්ලා කියන ඒවා කරන්න නම් ඉතින් අපේ ආණ්ඩුවක් තියෙන්න ඕනෑ නැහැ නේ. ඒ ආණ්ඩුවම තිබුණා නම් ඇති නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අප උදේ පාන්දර ප්‍රශ්නයක් අහන්නේ වැදගත් උත්තරයක් ලබා ගන්නයි. ඔබතුමන්ලා අවුරුදු 15ක්, 18ක් පාලනය කරලා තිබෙන ආණ්ඩුවක් වශයෙන් ගිය ආණ්ඩුවලට බණින්න එපා. [බාධා කිරීම්] ගිය අවුරුද්දේ වාර්තා අනුව අපනයන වර්ධනය සියයට 28යි; ආනයනය සියයට 51යි.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ කාලයේ පටන් ගත්ත ඒවා කරන්න නම් මේ අලුත් ආණ්ඩුවේ අලුත් ඇමතිවරු ඉන්න අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොනවාද මේ අපනයන සංවර්ධන අමාත්‍යාංශය ගැන කථා කරන්නේ? නොදැනුවත් නම් කියන්න අප වෙන වෙලාවක උත්තර දෙන්නම් කියලා. මොකද එක්සත් ජාතික පක්ෂයට එක එක ඒවා කියලා ඔබතුමාගේ ප්‍රශ්නයෙන් පැනලා යන්න එපා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
මේ ගිවිසුම් අත්සන් කරන කොට ඔබතුමන්ලා බොහොම පෞද්ගලිකව යම් යම් හේතු පාදක කර ගෙන තමයි තීන්දු තීරණ ගත්තේ. අපි රට වෙනුවෙන් බොහොම පුළුල් පරාසයකට ගිහිල්ලා මේ වැඩ පිළිවෙළ දිහා බලන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැතිව, වෙලාව නාස්ති කරන්නේ නැතිව කරුණාකරලා දන්නේ නැත්නම් "දන්නේ නැහැ" කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙලාව යනවා. ඒ නිසා වෙන වෙලාවක සාකච්ඡාවක් කරන්න.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු කථානායකතුමනි, අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ හිතේ පොඩි ඊර්ෂ්‍යාවක් තිබෙනවා. එතුමාගේ හිතේ පොඩි විචිකිච්ඡාවක් තිබෙනවා ආණ්ඩුව මේ වැඩ පිළිවෙළ ගෙන යන කොට එතුමාට නිකම් පොඩි -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර කථාවක් තිබෙනවා නේ, "ගොනා වුණාට කමක් නැහැ, උම්බෑ ගාන්න එපා" කියලා. එතකොට තමයි දන්නේ සැබෑ ගොනෙක් කියලා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා නිතරම වපර ඇහින් තමයි මේවා දිහා බලන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. වෙලාව අනුව අපි ඊළඟ ප්‍රශ්නවලට යමුද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලන්න ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ආණ්ඩුවෙන් අපි අහන්නේ අපනයනය වර්ධනය කිරීමේ ඉලක්ක තිබෙනවාද කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් ඇහුවාම දෙන පිළිතුර ඉතින් භාර ගන්න වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමාගේ වම් අත දන්නේ නැහැ දකුණු අත කරන්නේ මොනවාද කියලා.

## යාන්ත්‍රික පාබල බළඇණියේ සංගීත සංදර්ශනය : ටිකට් අළෙවිය

### இயந்திர காலாட் படையணியின் இசைநிகழ்ச்சி : அனுமதிச்சீட்டு விற்பனை

### MUSICAL SHOW OF MECHANICAL INFANTRY REGIMENT : SALE OF TICKETS

1355/'11

6. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යුධ හමුදා යාන්ත්‍රික පාබල බළඇණියේ සේවා වනිතා ඒකකය මඟින් සංගීත සංදර්ශනයක් පැවැත්වීම සඳහා එම රෙජිමේන්තුවේ එක් නිලධාරියෙකුගේ 2011 මාර්තු මාසයේ වැටුපෙන් රුපියල් පන්දහසක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්;

(ii) එම මුදල වැටුපෙන් අයකර ගනු ලබන විටත් එම මාසයේම රෙජිමේන්තුව මඟින් විකිණීමට දුන් ටිකට් පොත් වෙනුවෙන් රුපියල් හාරදහසක් පමණ මුදලක් එම සංගීත සංදර්ශනය වෙනුවෙන් ලබා දී තිබූ බවත්;

(iii) ඉහත පරිදි මාසික වැටුපෙන් එක්වර රුපියල් පන්දහසක මුදලක් අයකර ගැනීමෙන් යුද හමුදා පවුල්වල සාමාජිකයින් දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නේද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, சமய விவகார அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இராணுவ தரைப்படைக்குரிய இயந்திர காலாட்படையணியின் சேவா வனிதா பிரிவினால் இசைநிகழ்ச்சியொன்றை நடத்துவதற்காக அந்தப் படைப்பிரிவின் ஒவ்வொரு உத்தியோகத்தரினதும் 2011 மார்ச் மாத சம்பளத்திலிருந்து ரூபா ஐயாயிரம் அறவிடுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது என்பதையும்;

(ii) அப்பணம் சம்பளத்திலிருந்து அறவிடப்படுகின்றபோது அந்த மாதத்தில் படைப்பிரிவினால் விற்பனை செய்வதற்கு வழங்கப்பட்ட அனுமதிச்சீட்டுப் புத்தகங்களுக்காக ஏறத்தாழ ரூபா நாலாயிரம் பணத்தொகை அந்த இசை நிகழ்ச்சிக்காக வழங்கப்பட்டிருந்தது என்பதையும்;

(iii) மேற்கூறியவாறு மாதாந்த சம்பளத்திலிருந்து ஒரே தடைவையில் ரூபா ஐயாயிரம் பணத்தொகை அறவிடப்படுவதனால் இராணுவ தரைப் படையினரின் குடும்ப அங்கத்தவர்கள் கடும் பொருளாதார நெருக்கடிகளை எதிர்நோக்குகின்றனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இது தொடர்பாக முறைசார் விசாரணையொன்றை நடத்தி தவறிழைத்தவர்களுக்கு எதிராக ஒழுக்காற்று ரீதியில் நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறெனின் அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that-

(i) action has been taken to deduct a sum of Rupees five thousand from the 2011 March salary of each officer of the Sri Lanka Mechanical Infantry Regiment for holding a musical show by the Seva Vanitha Unit of the aforesaid regiment ;

(ii) even by the time the aforesaid amount was deducted from the salary, a sum of over Rs. four thousand had already been handed over for the aforesaid musical show from the sale of ticket books given by the regiment ; and

(iii) the members of families of army personnel face grave economic hardships as a result of deducting Rs. five thousand from the monthly salary in single installment as stated above?

(b) Will he inform this House-

(a) whether action will be taken to institute disciplinary action against offenders, having conducted a formal inquiry in this regard ; and

(b) if so, the period of time to be taken for the same?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா )
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) එවැනි මුදලක් අය කර නොමැත.

(ii ) රණවිරු මියැසිය සංගීත ප්‍රසංගය වෙනුවෙන් නිකුත් කරන ලද ටිකට් පත් විකිණීම සඳහා රෙජිමේන්තුවට අයත් නිලධාරීන් හට ලබා දී ඇත. තත් නිලධාරීන් විසින් එම ටිකට් පත් විකිණීමෙන් පසු මුදල් නිරවුල් කර ඇති අතර ටිකට් පත් වෙනුවෙන් එම මාසයේම රුපියල් 4,000.00 පමණ මුදලක් වැටුපෙන් අය කිරීමක් සිදු කර නොමැත.

(iii) ඉහත පරිදි මාසික වැටුපෙන් එකවර රුපියල් 5,000.00 ක මුදලක් අය කර නොමැති බැවින් යුද්ධ හමුදා පවුල්වල සාමාජිකයින් හට දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී නැත.

(ආ) (i) අදාළ නොවේ.

(ii ) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මතු කරන්නට ඕනෑ. දැන් ගරු ඇමතිතුමා කියන කාරණය සෛද්ධාන්තිකව බැලුවොත් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම කෙටියෙන් අහන්නේ. සෛද්ධාන්තිකව බැලුවොත් අය කර ගත් බව වාර්තා වෙන්නේ නැහැ. මෙහෙම උත්තරයක් දෙනකොට ඒ ගැන තොරතුරු දෙන්නේත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ ගැන සොයා බලන්න. ටිකට් පොත් ටික දෙනවාත් එක්කම කල්ඇතිව සල්ලි ගන්නවා. එහෙම දෙයක් තමයි මේ සිද්ධ කර තිබෙන්නේ. ඉතින් එහෙම වුණාම ටිකට්

විකිණුනත්, නැතත් හමුදා නිලධාරින් ඒ මුදල ගෙවන්න ඕනෑ. ඔබතුමා ඔය පිළිතුර එවන අයගේ පිළිතුර මතම සෑහීමකට පත් වන්නේ නැතිව කරුණාකර අමාත්‍යාංශයට උපදෙස් දෙනවා ද මේ ගැන සොයා බලන්න. ප්‍රභාකරන් ඇල්ලුව රටක, කේපීත් ඇල්ලුව රටක මේක හොයලා බලන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක එච්චර ප්‍රශ්නයක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හැබැයි ඉතින්, වැටුප් එහෙම ලබා ගන්න බැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය පදනම් වෙලා තිබෙන්නේ, "2011 මාර්තු මාසයේ වැටුපෙන් රුපියල් පන්දහසක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇති බවත්" යනුවෙන්. ඒ ප්‍රශ්නයට නේ අපි උත්තර දෙන්න ඕනෑ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ මිසක් ඔබතුමා කියලා නැහැ, මේ අයගෙන් කලින් මුදල් ගත්තා කියලා. ඒ කලින් මුදල් ගත්තාය කියන එකයි, මේ දැන් අහන ප්‍රශ්නයයි අතර විශාල පරස්පර විරෝධතාවක් තිබෙනවා නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. කිසිම පරස්පරතාවක් නැහැ, ගරු කථානායකතුමනි. මා කියන්නේ වැටුප ගෙවනකොට සල්ලි ටික අරගෙන.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මොකද නැත්තේ? ඔබතුමා කියනවා, මේ අයට ටිකට් පොත් ටික දීලා සල්ලි ඉල්ලා ගත්තා කියලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වැටුප් ගෙවන දවසේ තමයි ඒක කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමාට තේරුම් ගැනීමේ ප්‍රශ්නයක් තියෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා කිව්වා, 2011 මාර්තු වැටුපෙන් මුදල් කැපුවා කියලා. ඉතින් මේක හරි පරස්පර විරෝධතාවක් නේ. උසාවියට ගියා නම් නඩුව එතැනින් ඉවරයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කිසි පරස්පරයක් නැහැ. ගරු කථානායකතුමනි, වැටුප් දවසට මේ මුදල් ලබා ගැනීම පිළිබඳ කාරණයක් මා මතු කරන්නේ. මා කියන්නේ මේක සොයා බලන්න කියලා යි. එච්චරයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා මෙවැනි ප්‍රශ්නයක් අහනකොට එයට පාදක කර ගත් යම් තොරතුරක් ඇති නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්, තොරතුරක් තිබෙනවා. තොරතුරක් ඇතිවයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ රෙජිමේන්තුවේ අහවල් එක්කෙනාගේ මාර්තු මාසයේ වැටුපෙන් මෙච්චරක් කපලා තිබෙනවා කියලා තොරතුරක් ඇති නේ. ඒක ඉදිරිපත් කරන්න. එහෙම ඉදිරිපත් කළොත් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, එහෙම නම් ඒ තොරතුරු ටික ලබා දෙන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තොරතුරු ටික දුන්නොත් අපි පරීක්ෂණයක් පවත්වන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහනකොට කෙටියෙන් පැහැදිලිව අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, වැටුප් දවසට ටිකට් දීලා සල්ලි අය කර ගන්නවා. ඉතින් ඒකයි මේ කියන්නේ. මා කියපු කාරණයේ වෙනසක් නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමාව කවුරු හරි නොමඟ යවලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කිසිම නොමහ යැවීමක් නැහැ. වග කීමක් ඇතිව අහන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔය පක්ෂයේ කවුරු හරි ඔබතුමාව අමාරුවේ දැමීමට නොමහ යවලා තිබෙනවා. ඒවාට හසු වෙන්න එපා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නද, ගරු කථානායකතුමනි?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හරි, අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් අහන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමාව ටිකක් ටෙලිවිෂන් එකේ පෙන්වනවා දකින්න අපි ආසයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ සම්ප්‍රදාය හමුදාවේම අනෙකුත් බළඇණි සහ රෙජිමේන්තුවලට, ඒ වාගේම ගුවන්, නාවික හා පොලිස් යන අංශවලටත් පැතිරුණොත් මේක නරක පූර්වාදර්ශයක් බවට පත් වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මත ප්‍රකාශ කරන්නට බැහැ; අදහස් ප්‍රකාශ කරන්නට බැහැ. අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, අමාත්‍යාංශයට මේ පිළිබඳව උපදෙස් දෙන්න පුළුවන්ද? මෙවැනි ක්‍රියාකාරකම් සිදු නොවන චක්‍ර ලේඛයක් හෝ උපදේශන හෝ යම් කිසි දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එවැනි ක්‍රියාකාරකමක් සිදු වූ බවට පිළිගැනීමක් නැහැ නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඉතින් මා වග කීමක් ඇතිව කියනවා නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ නිසා අපට අනාගතය ගැන කල්පනා කරලා -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වග කීමක් ඇතිව මා කියනවා නේ. මා අසත්‍යයක් කියන්නේ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ අහන ප්‍රශ්නයට නේ උත්තර දෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් එවැනි දේවල් සිදු වෙලා නැති බව තමයි අමාත්‍යාංශය වාර්තා කරන්නේ. සිදු වෙලා නැති දෙයක් නැවත සිදුවේය කියලා ඔබතුමා උපකල්පනය කරනවා කියලා -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ සමහර වෙලාවට උත්තර දෙන්න පුළුවන්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මම අමාත්‍යාංශයට දන්වන්නම්, මෙහෙම දෙයක් කරන්න පුළුවන් කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, එහෙනම් ඔය ඇති දැන්.

## 2600 සම්බුද්ධත්ව ජයන්තිය : මුද්දර නිකුතුව
### 2600 ஆவது சம்புத்தத்வ ஜயந்தி: முத்திரை வெளியீடு
### 2600TH SAMBUDDHATHWA JAYANTHI : ISSUING OF STAMPS

1597/'11

7. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් හඳුන්වා දෙන ලද මුද්දර සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් මේ වන විට මුද්‍රණය කර ඇති මුද්දර සංඛ්‍යාව කොපමණද;

(iii) එම මුද්දර නිකුත් කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හඳුන්වා දෙන ලද එක් එක් මුද්දරයන්හි රූප අර්ථ ගැන්වීම් කවරේද;

(ii) එම මුද්දර නිර්මාණය කිරීමට පත් කළ කමිටුවේ හෝ සංස්කරණමණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) ඒ සඳහා ඔවුන්ට ඇති සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

தபால் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2600 ஆவது சம்புத்தத்வ ஜயந்தியை முன்னிட்டு அறிமுகம் செய்யப்பட்டுள்ள முத்திரைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவற்றில், தற்போது அச்சிடப்பட்டுள்ள முத்திரைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இந்த முத்திரைகளை வெளியிடுவதற்காக செலவு செய்யப்பட்ட பணத்தொகை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அறிமுகம் செய்யப்பட்ட ஒவ்வொரு முத்திரையினதும் படங்களின் பொருள்கோடல் யாதென்பதையும்;

(ii) மேற்படி முத்திரைகளை வடிவமைக்கவென நியமிக்கப்பட்ட குழுவின் அல்லது பதிப்புக் குழுவின் அங்கத்தவர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) இதற்கென அவர்களுக்குள்ள தகைமைகள் யாவையென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Postal Services:

(a) Will he inform this House -

(i) the number of stamps introduced for the 2600th "Sambuddhathwa Jayanthi" ;

(ii) the number of stamps that have been printed by now out of the number of stamps mentioned above ; and

(iii) the amount of money spent for issuing those stamps?

(b) Will he inform this House-

(i) the things depicted by the illustrations on each of the stamps introduced ;

(ii) the names of the members of the Committee or the Panel of Editors appointed to design those stamps ; and

(iii) the qualifications possessed by them to perform a task of that nature?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, තැපැල් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) * 2011.04.29 දින කොළඹ දී නිකුත් කරන ලද සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් - මුද්දර 06

* 2011.05.14 දින අනුරාධපුර උඩ මළුවේදී සම්බුද්ධත්ව ජයන්ති වෙසක් වෙනුවෙන් - මුද්දර 04

(ii) * සම්බුද්ධත්ව ජයන්ති මුද්දර වර්ග 06න් - 336,000

* සම්බුද්ධත්ව ජයන්ති වෙසක් මුද්දර 04න් - 1,000,000

(iii) ඇණවුම් කළ සම්පූර්ණ මුද්දර ප්‍රමාණය රජයේ මුද්‍රණාලයෙන් ලැබී නොමැති බැවින්, ඉන්වොයිස් ඉදිරිපත් කර නොමැත. එබැවින් සම්පූර්ණ වැය කළ මුදල දැනට ගණනය කළ නොහැක.

(ආ) (i) ඇමුණුම් 1 හා 2 හි දක්වා ඇත.

(ii) ඇමුණුම් 3 හි දක්වා ඇත. (**ඇමුණුම්*** සභාගත කරමි.)

(iii) 2600 සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් මුද්දර නිර්මාණය කිරීමට කමිටුව පත්කරන ලද්දේ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයෙනි.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ සල්ලි ටික සම්බන්ධයෙන් මුද්‍රණ දෙපාර්තමේන්තුවට පොල්ලක්ද වැටෙන්නේ ගරු කථානායකතුමනි?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

නැහැ. නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකද, තැපැල් දෙපාර්තමේන්තුව පාඩු ලබනවා. ඒ මුදල ගෙවන්න බැහැ. සල්ලි නැති හින්දා පොලු තමයි හම්බ වෙන්නේ අන්තිමට.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මුද්දර පොල්ලක්.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, රජයේ මුද්‍රණාලයට ඇණවුමක් කළාම අදාළ invoice එක ඉදිරිපත් කළාට පස්සේ තමයි මුදල් ගෙවන්නේ. තවම invoice එක ඉදිරිපත් කරලා නැහැ. ඉතින් හදිසි වෙන්න එපා ගරු මන්ත්‍රීතුමනි. Invoice එක ඉදිරිපත් කළාම මුදල් ගෙවනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ඔබතුමා බාර ගන්නවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වාරි මාර්ග අමාත්‍යාංශයෙන් හරි ගෙවාවි. 2600වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් මෙච්චර වියදමක් දරලා වැඩසටහන් ක්‍රියාත්මක කරන ආණ්ඩුව යටතේ තමයි මේ අවුරුද්දට මත්පැන් බලපත්‍ර 54ක් දීලා තිබෙන්නේ ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකත් මේකට අදාළද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මුද්දරයි මත්පැන් බලපත්‍රයි අතර සම්බන්ධතාවක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මා කිව්වේ සම්බුද්ධ ජයන්තියයි-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හැම වෙලාවේම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පීලි පනිනවා. ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය වාගේම තමයි ඔබතුමාගේ ක්‍රියා කලාපයත්. හරි පීල්ලේ යන්න කෝ ටිකක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා පීලි පැනලා ඉන්න හැටි අපි දන්නවා. පීලි පැන පැන, එහාට මෙහාට පැන පැන ඉන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. අපි පීලි පැනලා නැහැ. ආණ්ඩුව හරියට පීල්ලේ යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තේරෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තමුන්නාන්සේලා තමයි පීලි පැනලා තිබෙන්නේ. දෙපැත්තකට ගිය අය දැන් තුන් පැත්තකට යනවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා දැන් පීලි නොවෙයි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අපි දෙවන වටයට යමු. ප්‍රධාන කටයුතු ආරම්භ කිරීමත් ප්‍රමාද වෙලා තිබෙනවා. එතකොට අසාධාරණයක් වෙනවා.

## පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
## தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள்: நன்மைகள்
PROJECTS OF COCONUT DEVELOPMENT AND JANATHA ESTATE DEVELOPMENT : BENEFITS

1686/'11

4. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Eric Prasanna Weerawardhana)
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006 ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட

அபிவிருத்தித் துறையில் நடைமுறைப் படுத்தப்பட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தித் துறையில் நடைமுறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படும் நன்மைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he inform this House of-

(i) the development projects implemented in the field of Coconut Development and Janatha Estate Development during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of Coconut Development and Janatha Estate Development, in future;

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මම ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කාල සීමාව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

2006-2010

* පොල් ඉඩම්වල නව ප්‍රභේද නැවත වගා වැඩසටහන.
* පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන.
* ගෙවතුවල පොල් වගා කිරීමේ වැඩසටහන.
* පොල් පැළ සහනාධාර වැඩසටහන.
* පොල් ඉඩම්වල අතුරු බෝග වගා කිරීමේ වැඩසටහන. (කජු, ග්ලිරිසීඩියා, අන්නාසි, කිලෝපේර, බුැගන්ෆාට්, කෙසෙල්, සෝයා බෝංචි, තේක්ක, ගම්මිරිස්, රඹුටන්, කුරුඳු, පුවක්, ඉඟුරු, කහ)
* පොල් ඉඩම්වල වැසි ජල සංරක්ෂණ සහනාධාර වැඩසටහන.
* පොල් ඉඩම්වල කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ගව ගාල් ඉදි කිරීමේ වැඩසටහන.
* කොහු මෝල් නවීකරණය වැඩසටහන.
* පොල් කිරි හා කිරම ආශ්‍රිත කර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහන.
* වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන.
* ව්‍යාප්ති වැඩසටහන්.
* කප්රුක ආයෝජන ණය වැඩසටහන.

2010 සිට මේ දක්වා

* "කප්රුක පුරවර" වැඩසටහන.
* "කප්රුකයි - සිප් නැණයි" ශිෂ්‍යත්ව වැඩසටහන.
* වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන.
* පොල් මයිටා මර්දනය සඳහා විලෝපික මයිටාවන් ජනනය කරන විද්‍යාගාර ඇති කිරීම.
* දිවි නැගුම යටතේ පොල් පැළ විසිලක්ෂයක් සිටුවීමේ වැඩසටහන.
* පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන.
* ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය විශේෂ පොල් වගා වැඩසටහන.
* ව්‍යාප්ති වැඩ සටහන්.
* පොල් ඉඩම්වල නව ප්‍රභේද නැවත වගා වැඩසටහන.
* කප්රුක ආයෝජන ණය වැඩසටහන.
* කප්රුක වෙළඳ පොළ වර්ධන ව්‍යාපෘතිය පිහිටුවීම.
* දිසිඳි පොල් කර්මාන්තය, පොල් කෙඳි ආශ්‍රිත නිමි භාණ්ඩ කර්මාන්තය සංවර්ධනය කිරීම.
* පස් පරීක්ෂණ වාර්තා සැලකිල්ලට ගනිමින් "මහින්ද චින්තන කප්රුක දිරිය" පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
* පොල් ඉඩම්වල අතුරු බෝග වගා කිරීමේ වැඩසටහන. (කජු, ග්ලිරිසීඩියා, අන්නාසි, කිලෝපේර, බුැගන්ෆාට්, කෙසෙල්, සෝයා බෝංචි, තේක්ක, ගම්මිරිස්, රඹුටන්, කුරුඳු, පුවක්, ඉඟුරු, කහ)
* පොල් කිරි හා කිරම ආශ්‍රිත කර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහන.
* පොල් වගාවල අතුරු බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* පොල් ඉඩම්වල සත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* පොල් පැළ තවාන් සංවර්ධන වැඩසටහන.

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

* ගෙවතුවල පොල් වගා කිරීමේ වැඩසටහන.
* පොල් ඉඩම්වල වැසි ජල සංරක්ෂණ සහනාධාර වැඩසටහන.
* කොහු මෝල් නවීකරණය වැඩසටහන.

(ii) * පොල් ඉඩම් පුනරුත්ථාපන සහනාධාරය ක්‍රියාත්මක කිරීම සඳහා වගාකරුවන් 8,287කට (අටදහස් දෙසිය අසූහතකට) අක්කර 30,738ක් (තිස්දහස් හත්සිය තිස්අටක්) පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 130.24ක (එකසිය තිහයි දශම දෙකයි හතරක) මූල්‍ය සහනාධාර ලබා දීම.

* පවුලේ දෛනික පරිභෝජනයට අවශ්‍ය පොල් තම ගෙවත්තේ නිෂ්පාදනය කිරීමට යොමු කරවීම සඳහා තෝරා ගත් වගාකරුවන් 520,355ක් (පන්ලක්ෂ විසිදහස් තුන්සිය පනස්පහක්) සඳහා පොල් පැළ 2,767,323ක් (විසිහත්ලක්ෂ හැටහත්දහස් තුන්සිය විසිතුනක්) පොහොර පැකට් 169,767ක් (එක්ලක්ෂ හැටනවදහස් හත්සිය හැටහතක්) ලබා දී ඇති අතර ඒ සඳහා ගිය වියදම රුපියල් මිලියන 103.39කි. (එකසිය තුනයි දශම තුනයි නවයකි.)

* මහින්ද චින්තන විශේෂ පොල් පොහොර සහනාධාර වැඩසටහන යටතේ පොහොර මෙට්‍රික් ටොන් 14,316ක් (දාහතරදහස් තුන්සිය දහසයක්) පොල් වගාකරුවන්ට සහන මුදලට ලබා දීම.

* පොල් ඉඩම්වල ඵලදායීතාව වැඩි කිරීම සඳහා 2006-2010 දක්වා වගාකරුවන් 1,707ක් (එක්දහස් හත්සිය හතක්) පොල් අක්කර 1,961ක (එක්දහස් නවසිය හැටඑකක) අතුරු බෝග වගා කිරීම තුළින් අතිරේක ආදායම් මාර්ග උත්පාදනය කිරීම.

* 2006-2010 වර්ෂය දක්වා වගාකරුවන් 3,527ක් (තුන්දහස් පන්සිය විසිහතක්) අක්කර 3,900ක (තුන්දහස් නවසියයක) වගා කිරීම සඳහා කජු පැළ 113,235ක් (එක්ලක්ෂ දහතුන්දහස් දෙසිය තිස්පහක්) නිකුත් කර ඇත.

* පොල් වගා සංවර්ධන කටයුතු සඳහා අතුරු බෝග හා සත්ත්ව පාලනය ඇතුළත්ව ඵලදායී භූමි භාවිතය සඳහා අක්කර 13,494ක් (දහතුන්දහස් හාරසිය අනූහතරක්) සංවර්ධනය සඳහා රුපියල් මිලියන 594.05ක් (පන්සිය අනූහතරයි දශම බින්දුවයි පහක්) වගාකරුවන් 2,546කට (දෙදහස් පන්සිය හතළිස්හයකට) සහනදායී ණය යෝජනා ක්‍රම යටතේ ණය ලබා දීම.

* "දිවි නැගුම" වැඩසටහන යටතේ පොල් පැළ 692,839ක් (හයලක්ෂ අනූදෙදහස් අටසිය තිස්නවයක්) වගාකරුවන් 346,418කට (තුන්ලක්ෂ හතළිස් හයදහස් හාරසිය දහ අටකට) ලබා දීම.

* 2010 වසරේ ආදර්ශ ගෙවතු ඇති කර ඒවාට අවශ්‍ය බීජ වර්ග නොමිලේ සපයා හොඳම ගෙවතු තෝරා ත්‍යාග පිරිනැමීම.

* "කප්රුකයි - සිප්නැණයි" වැඩසටහන යටතේ පාසල් 1,339ක (එක්දහස් තුන්සිය තිස්නවයක) සිසුන් 51,477ක් (පනස්එක්දහස් හාරසිය හැත්තෑහතක්) සඳහා පොල් පැළ 102,954ක් (එක්ලක්ෂ දෙදහස් නවසිය පනස්හතරක්) නිකුත් කර ඇත.

* වේගයෙන් ඉහළ යන පොල් මිල නිසා ජනතාවට සිදු වන අපහසුතා පාලනය කිරීම සඳහා රජයට සහාය වීම පිණිස 2010 හා 2011 වර්ෂවල මාළු පොල් ගෙඩි සතොස, සමුපකාරය, කීල්ස් සහ කාගිල්ස් ආදී ආයතන මගින් ජනතාවට ලබා දීම.

* 2600 (දෙදහස් හයසියය) ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම සඳහා විහාරස්ථාන 2,600ක (දෙදහස් හයසියයක) පොල් පැළ වගා කිරීමේ වැඩසටහන යටතේ පොල් පැළ 12,688ක් (දොළොස්දහස් හයසිය අසූ අටක්) විහාරස්ථාන වෙත ලබා දී ඇත.

* කප්රුක පුරවර වැඩසටහන යටතේ දැනට ප්‍රාථමික සමිති 1,211ක්ද, (එක්දහස් දෙසිය එකොළහක්ද) කලාප සමිති 90ක්ද (අනූවක්ද) පිහිටුවා ඇත. පොල් පැළ ලබා ගැනීම සඳහා මව් ශාක 79,214ක් (හැත්තෑනවදහස් දෙසිය දහහතරක්) තෝරා ඇති අතර බීජ පොල් 334,511ක් (තුන්ලක්ෂ තිස්හතරදහස් පන්සිය එකොළහක්) තවාන් කර ඇත. ක්ෂේත්‍ර ආදර්ශන 6ක් ස්ථාපනය කර ඇත.

(iii) * කප්රුක පුරවර සංවර්ධන වැඩසටහන 2011 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 26ක ආරම්භ කර ඇති අතර එය අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 180ක් දක්වා ව්‍යාප්ත කිරීමට අදහස් කෙරේ. ඒ යටතේ ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහන් 11කි.

1. කප්රුක සමිති පිහිටුවීම
2. කප්රුක වගා වැඩසටහන
3. කප්රුක නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන
4. කප්රුක රැකියා උත්පාදන වැඩසටහන
5. කප්රුක පර්යේෂණ හා තොරතුරු ජාලය
6. කප්රුක අරමුදලක් ඇති කිරීම
7. කප්රුක රක්ෂණය
8. කප්රුක ණය යෝජනා ක්‍රමය
9. කප්රුක අළෙවි ප්‍රවර්ධන වැඩසටහන
10. කප්රුක සහනාධාර වැඩසටහන
11. කප්රුක සංචාරක ප්‍රවර්ධන වැඩසටහන

* "කප්රුකයි - සිප්නැණයි" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2011 වර්ෂයේ සිසුන් 150,000ක් (එක්ලක්ෂ පනස්දහසක්) සහභාගි කරවා ගනිමින් ආරම්භ කළ අතර 2016දී සිසුන් 900,000ක් (නවලක්ෂයක්) දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂිත අතර මේ තුළින් 2016 වන විට පොල් පැළ 18 ලක්ෂයක් සිටුවීමට අරමුණු කෙරේ.

* පොල් ගසට හානි කරන මයිටාවන් මර්දනය කිරීම සඳහා විලෝපික මයිටාවන් ජනනය කරන නව විද්‍යාගාර 08ක් ආරම්භ කර ඇති අතර එම විද්‍යාගාර සංඛ්‍යාව 19ක් දක්වා වැඩි කෙරේ.

* වැලිගම කොළ මැලවීමේ සහ කුණුවීමේ රෝග මර්දන වැඩසටහන යටතේ ආසාදිත ගස් මේ වසරේ ඔක්තෝබර් දක්වා 63,939ක් (හැටතුන්දහස් නවසිය තිස්නවයක්) ඉවත් කර ඇත. මේ වසර තුළ ආසාදිත ගස් 150,263ක් (එක්ලක්ෂ පනස්දහස් දෙසිය හැටතුනක්) සලකුණු කර ඇත. 2013 වන විට ආසාදිත සියලු ගස් ප්‍රමාණය, එනම් ගස් 345,000ක් (තුන්ලක්ෂ හතළිස් පන්දහසක්) ඉවත් කිරීමට සැලසුම් කර ඇත.

* පොල් පටක රෝපණය සඳහා විවිධ වර්ග පිරික්සුමට භාජනය කිරීමට හා වර්ධනයට රසායනාගාර ඇති කිරීමට පරීක්ෂණ පැවැත්වීම.

* විවිධ පොල් වර්ග දෙමුහුන් කර ඒවායෙන් උත්පාදිත ජනිතයන් ප්‍රභවයන් ක්ෂේත්‍ර ඇගයීමට ලක් කිරීම.

* ආදර්ශ ගොවි පළවල හා යාබද ප්‍රදේශවල ඉල්ලුම සැපයීම සඳහා වැඩිදියුණු කරන ලද රෝපණ ද්‍රව්‍යවල පැළ නිෂ්පාදනය.

* ගොවි පවුල්වල ගෘහස්ථ ආදායම වැඩි කිරීමට හා ග්‍රාමීය කාන්තා අභිවෘද්ධිය සඳහා පොල් මද, කොහු, කටු ආදිය ආශ්‍රිත කර්මාන්ත හඳුන්වා දීම.

* පොල් ඉඩම්වල සත්ත්ව පාලනය ප්‍රවර්ධනය.

* නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳ පොළ ප්‍රවර්ධනය හඳුන්වා දීම සහ වෙළඳ පොළ ප්‍රවිෂ්ටය වැඩි කිරීම.

* පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

* ළපටි පොල් වතුර අපනයනය වැඩි කිරීමට පොල් බීම නිෂ්පාදන සඳහා තැඹිලි හා වෙනත් කුන්දිරා වර්ග ප්‍රවර්ධනය.

* පොල් පර්යේෂණ ආයතනයේ විෂය පථය යටතේ හඳුනා ගෙන ඇති විවිධ පොල් පර්යේෂණ පැවැත්වීම පහසු කිරීම සඳහා එකී ආයතනය හා උපකාර්යාල පවත්වා ගෙන යාම.

* ගුණාත්මක තීව්‍රතාව සඳහා ප්‍රමිතීන් පැනවීමෙන් අපනයන අභිමුඛ කර්මාන්තවල කාර්යක්ෂමතාව වැඩි කිරීම.

* පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ප්‍රමාණය වැඩි කිරීම.

* පොල් වගා සහ සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමු කරනු වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධාන ලෙස සංවිධානගත කර ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිත කර දිළිඳුකම පිටු දැකීම.

* සත්ත්ව පාලන/අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායීතාව හා ගොවි පළ ආදායම වැඩි කිරීම.

* පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් ඵලදායී වන පොල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

* විදේශ විනිමය උපයා ගැනීම වැඩි කිරීම සඳහා ලෝක වෙළඳ පොළෙහි තරගකාරිත්වයට මුහුණ දීමට හැකි වන පරිදි, පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

* පොල් කර්මාන්තයෙහි වෙනස් වන අවශ්‍යතා සපුරා ලීම සඳහා නව තාක්ෂණ ක්‍රම උත්පාදනය සහ පවත්නා තාක්ෂණය වැඩිදියුණු කිරීම.

* පොල් ආශ්‍රිත කර්මාන්තවල විධිමත් හා අවිධිමත් අංශ විවිධාංගීකරණය කිරීමෙන් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම.

(iv) * හඳුනා ගත් කොට්ඨාස තුළ පොල් වගාව පවතින ඉඩම්වල භූමි ඵලදායීතාව වැඩි කිරීම.

* කොට්ඨාසය තුළ පොල් වගාව සඳහා විභවතාවක් ඇති ඉඩම්වල වගාව ව්‍යාප්ත කිරීම.

* හඳුනා ගත් කොට්ඨාස තුළ එක් පොල් ගසකින් ලබා ගන්නා වාර්ෂික පොල් අස්වැන්න ගෙඩි 100 දක්වා වැඩි කිරීම.

* පොල් ආශ්‍රිත කර්මාන්ත අවස්ථා හඳුනා ගෙන ප්‍රවර්ධනය කිරීම.

* පොල් ආශ්‍රිත නව රැකියා අවස්ථා හඳුන්වා දීම.

* මෙම වැඩසටහන යටතේ හඳුනා ගන්නා කොට්ඨාසයක් නියාමක ඒකකයක් ලෙස වැඩි දියුණු කිරීම.

* පොල් වගාව හා පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ පර්යේෂණ දැනුම කොට්ඨාසයේ ජනතාව වෙත ලබා දීම.

* පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවියට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

* පොල් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්තවලට යොමු වීමට කැමැත්තක් දක්වන අය සඳහා අවස්ථා සැලසීම.

* පාසල් ශිෂ්‍යයන් රටේ ආර්ථික සංවර්ධන හා ජාතික නිෂ්පාදනයේ පාර්ශ්වකරුවන් බවට පත් කිරීම.

* පොල් ගසෙහි වැදගත්කම හා එහි වර්ධනය සම්බන්ධයෙන් පාසල් සිසුන්ගේ මනස යොමු කරවීම.

* පාසල් සිසුන් දායක කර ගනිමින් 2011 වසරේදී අරඹා, ඉදිරි සය වසර තුළදී පොල් පැළ 18 ලක්ෂයක් වගා කිරීම හා නඩත්තුව.

* වැඩසටහනට සහභාගි වන සිසුන්ගේ දායකත්වය ඒකාබද්ධ කිරීම තුළින් පවුලේ සාමය, සමගිය හා සතුට වර්ධනය කිරීම.

* මෙම දරුවන්ගේ පවුල් ගෘහ ආර්ථික ඒකක දසලක්ෂයේ වැඩසටහනට ඇතුළත් කර දිවි නැගුම පවුල් ලෙස නගා සිටුවීම.

* අධ්‍යාපනික ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි සිසු දරුවන් ධනාත්මකව පෙළඹවීම.

* පවතින හා නව වෙළඳ පොළට පොල් ආශ්‍රිත නව හා විවිධ නිපැයුම් හඳුන්වා දීම තුළින් පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය.

* රටෙහි ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරා ලීම සඳහා (2011-2016) ඉදිරි සය වසර තුළදී පවත්නා පොල් වගා ඉඩම්වල පොල් නිෂ්පාදනය වසරකට ගෙඩි මිලියන 3,650 (තුන්දහස් හයසිය පනහ) දක්වා වැඩි කිරීම.

(ආ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රධාන කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත, 2012 - කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය : දෙසැම්බර් 07] [කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 07] [சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]*

*Considered further in Committee - [Progress: 07th December]*
[MR. SPEAKER in the Chair.]

**123 වන ශීර්ෂය.- ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 185,385,000

**தலைப்பு 123.- நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மீண்டுவருஞ் செலவு ரூபா 185,385,000

HEAD 123.- MINISTER OF CONSTRUCTION, ENGINEERING SERVICES, HOUSING AND COMMON AMENITIES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 185,385,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ශීර්ෂ 123, 309-311 -ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය- සලකා බැලීම පෙර වරු 10.00 සිට පස් වරු 12.30 දක්වා සහ ශීර්ෂ 115 -ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය- සලකා බැලීම පස් වරු 1.00 සිට පස් වරු 6.00 දක්වා.

[පූ.භා. 10.06]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, 2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 123, 309 සිට 311 දක්වා වන වැය ශීර්ෂයන්ගෙන් එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් සම්ප්‍රදායට අනුව රුපියල් 10කින් කපා හැරිය යුතු යැයි මම යෝජනා කරමි.

Hon. Chairman, first let me present my observations on the Ministry of Housing with a quote from late President Ranasinghe Premadasa, which basically encapsulates the true definition and essence of housing.

Addressing the 40th Anniversary Sessions of the United Nations General Assembly in October, 1985, he stated, I quote:

"When some people speak of housing and shelter, they tend to give a restrictive interpretation greatly underestimating its real benefits. To them housing and shelter mean only a mere roof above their heads. This is a misconception.

Housing not only provides protection from the elements but also shelters all the factors that go to improve the quality of life of individuals, who form the families. Families make up societies and societies build up nations. Nations finally

constitute the global community. That is why I consider housing to be not only a basic human need but also a key to human development. In essence, housing is central to the fulfillment of man's aspirations for a better life. Health and

sanitation, agriculture, industry, employment, water supply and environmental quality - all these factors which go to improve man's living conditions undergo qualitative changes with housing development. In this manner, housing will

provide the initiative and drive for total - development - both physical and human"

Mr. Chairman, housing provides any government or administration with an opportunity to have an integrated development approach, both for the individual and the household, and the country as a whole. It also acts as the focal point for an all encompassing strategy to promote human social development. Certainly, it can form the basis and fulcrum of all development activities that are crucial to the progress of a country, a state or a nation.

ගරු සභාපතිතුමනි, නිවාස සංවර්ධනය දිහා අපි පටු දෘෂ්ටි කෝණයකින් බැලිය යුතු නැහැ. ඇත්ත වශයෙන්ම නිවසක් ලබා දීම, හුදෙක්ම සෙවණක් ලබා දීමක් පමණක් නොව මුළුමහත් ජන ජීවිතයටම විප්ලවීය, ධනාත්මක, ගුණාත්මක, හරායාත්මක ශක්තියක් එකතු කරන ක්‍රියාවලියක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. හිසට සෙවණක් ලබා දීම තුළින් විශේෂයෙන්ම ඒ හිසට සෙවන ලබා දීමේ ක්‍රියාවලිය තුළ අන්තර්ගත වූ සංවර්ධන වැඩසටහන් තුළින් සැබෑ ලෙසින්ම හිතට නිවනක් ලබා දෙන්නට සියලු දෙනාටම හැකියාවක් ලැබෙනවා.

Mr. Chairman, one of the main axioms in politics is, when one examines the success of a governmental policy, we have to look at the divergences that exist between the declaratory policy and the action policy.

ගරු සභාපතිතුමනි, ආණ්ඩුවක යම්කිසි වැඩ පිළිවෙළක සාර්ථකත්වය සම්බන්ධයෙන් යම් ගවේෂණයක්, සමීක්ෂණයක් කරන කොට විශේෂයෙන්ම එම ආණ්ඩුවේ ප්‍රකාශනයක් හා ක්‍රියා පටිපාටි අතර යම්කිසි වෙනසක් තිබෙනවාද නැද්ද කියන එක එම ආණ්ඩුවේ සාර්ථකත්වයට ප්‍රධානතම මිනුම් දණ්ඩ බවට අපට උපයෝගී කර ගන්න පුළුවන්.

විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපයේ පරිණතභාවය, ඒ වාගේම විශිෂ්ටත්වය තීන්දු කරන්න පුළුවන් වන්නේ අන්න ඒ ආකාරයටයි. මෙය පදනම් කර ගෙන, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල වකවානුව තුළ නිවාස සංවර්ධනය වෙනුවෙන් එතුමාගේ ආණ්ඩුව හරහා ක්‍රියාත්මක වුණු ප්‍රකාශනයන් සහ සැබැවින්ම ක්‍රියාකාරීව නිවාස සංකල්පය සාක්ෂාත් කර ගන්නට ක්‍රියාත්මක කරපු ප්‍රායෝගික වැඩ පිළිවෙළත් අතර යම්කිසි පරස්පරයක් තිබෙනවාද කියන කරුණ පිළිබඳව මම මේ සභාවට කරුණු දක්වන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මහින්ද චින්තන-දිනවමු ශ්‍රීලංකා වැඩ පිළිවෙළ එතුමාගේ පළමුවන ජනාධිපතිවරණ වේදිකාවේ ක්‍රියාත්මක වුණු ප්‍රතිපත්ති ප්‍රකාශනයයි.

නිවාස සංකල්පය පිළිබඳව "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" පොතේ 21වැනි පිටුවේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

"නිවාස ඉදි කිරීම සඳහා බිම් කොටස් ලක්ෂයක් ලබා දෙන්නෙමි. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල රජයේ සේවකයින් වෙනුවෙන්

තට්ටු නිවාස යෝජනා ක්‍රම 4ක් ක්‍රියාත්මක කරමි. කොළඹ නගරය තුළ පැල්පත් හා සෙසු අවිධිමත් නිවාසවල වෙසෙන ජනතාව

සඳහා නිවාස 65,000ක් ඉදි කෙරෙනු ඇත. පළමු වසර පහේදී පොළිය පමණක් ගෙවීමේ ක්‍රමය සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක්

ඇති කිරීමට පියවර ගන්නෙමි. සෑම ගමකටම වසරකට, නිවාස 25 බැගින් ඉදි කෙරෙනු ඇත. මධ්‍යම පාන්තිකයින් සඳහා පහසු මිලට

තට්ටු නිවාස ඉදි කෙරෙනු ඇත. විදේශගත ශ්‍රමිකයින් සඳහා රජයෙන් 30% ක දායකත්වය ලබා දෙන නිවාස ණය ක්‍රමයක් සකස් කිරීමට

පියවර ගන්නෙමි. අඩු ආදායම් නාගරික ජනාවාස වැඩසටහන යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ

අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන්නෙමි. ඒ වෙනුවෙන් මුද්දර ගාස්තු හෝ ඔප්පු ගාස්තු අය කරනු නොලැබේ. නාගරික

මහල් නිවාස ඇතුළු රජයේ නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන්ට එම නිවාසවල සින්නක්කර අයිතිය ලබා දෙන්නෙමි. දියවර,

දියවර විසිරි, ජන උදාන, ගම් උදාන ආදී විවිධ නම්වලින් ඉදිකර ඇති නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොළියද

කපා හැර එම නිවෙස්වල සින්නක්කර අයිතිය ලබා දෙමි."

මෙන්න, "මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා" පොතේ 21වැනි පිටුවේ නිවාස වැඩ පිළිවෙළ වෙනුවෙන් රටට ඉදිරිපත් කරපු පොරොන්දු මාලාව! ගරු සභාපතිතුමනි, කනගාටුවෙන් කියන්න ඕනෑ, මේ කිසිම පොරොන්දුවක්වත් අකුරටම, තිතටම, ඉලක්ක සහගතව ක්‍රියාත්මක කරන්නට මහින්ද චින්තන වැඩ පිළිවෙළත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවත් කටයුතු කරලා නැහැය කියා. එ පමණක් නොවෙයි, මහින්ද චින්තන පළමු වැඩසටහනෙන් ඔබ්බට ගිය -"දිනවමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළෙනුත් ඔබ්බට ගිය- "මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩ පිළිවෙළෙනුත් තවත් පොරොන්දු මාලා රැසක් ඉදිරිපත් කරලා තිබෙනවා.

නිවාස ලක්ෂ 6ක් ඉදි කිරීම, උතුරු නැඟෙනහිර පළාත්වල නිවාස 1,50,000ක් ඉදි කිරීම, සෑම දිස්ත්‍රික්කයේම ප්‍රධාන නගරය පදනම් කර ගෙන රජයේ සේවක සහ රජයේ සංස්ථා සේවකයින්ට නිවාස ලබා දීම, විශ්වවිද්‍යාල ප්‍රජාව වෙනුවෙන් නිවාස 5,000ක් ඉදි කිරීම, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන් නිවාස 15,000ක් ලබා දීම, කොළඹ නගරයේ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලුව සඳහා නිවාස ඒකක 40,000කින් සමන්විත වූ තට්ටු නිවාස යෝජනා ක්‍රම 20ක් ලබා දීම, සෙවිලි තහඩු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ධීවර ප්‍රජාව වෙනුවෙන් වෙනමම නිවාස 30,000ක් ඉදි කිරීම, ඒ වාගේම වතුකරයේ නිවාස ප්‍රශ්නයට තිරසාර විසඳුම් ලබා දීම යනාදී වශයෙන් සුවිශාල වූ පොරොන්දු මාලාවක් මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ හරහා මුළු රටටම ඉදිරිපත් කළත්, ඒ ඉලක්කයන් කිසිවක් සපුරාලන්නට බැරි වුණු ආණ්ඩුවක් අද රට පාලනය කරනවා කියන එක කනගාටුවෙන් හෝ ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු මුදල් අමාත්‍යතුමාගේ 2007 අය වැය කථාවේ 23වැනි පිටුවේ, ඒ වාගේම 2008 අය වැය කථාවේ 22වැනි පිටුවේ, 2009 අය වැය කථාවේ 42වැනි පිටුවේ, 2010 අය වැය කථාවේ 23වැනි පිටුවේ, 2011 අය වැය කථාවේ 19වැනි පිටුවේ සහ 2012 අය වැය කථාවේ 20වැනි පිටුවේ නිවාස පිළිබඳව ලොකු කැක්කුමකින්, ලොකු කරුණාවකින්, ලොකු ආදරයකින් කථා කරලා, මේ මේ වැඩ කොටස් මේ මේ කාල වකවානුවල ක්‍රියාත්මක කරනවා කියලා ප්‍රකාශ කළාට, මගේ කථාවේ මුලදී කිව්වා වාගේ ප්‍රකාශවලට සමානව ප්‍රායෝගික ක්‍රියාකාරී සංවර්ධන වැඩ පිළිවෙළක් දියත් කරන්නට අසමත් වුණු පාලනයක් අද රටේ තිබෙනවාය කියන එක මම ප්‍රකාශ කරන්නට කැමැතියි. ගරු සභාපතිතුමනි, ප්‍රකාශ කර තිබෙන ඉලක්කම්, ක්‍රියාත්මක වුණු වැඩසටහනක් සමඟ අපි සංසන්දනාත්මකව බලන්නට ඕනෑ.

විශේෂයෙන්ම නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික සැලසුම් සපුරා ගත් ඉලක්ක පිළිබඳව ඒ වාර්ෂික වාර්තාවල සඳහන් වන ආකාරය මම කියන්නම්. මේ කරුණු කාරණා ගවේෂණය කරලා, සමීක්ෂණය කරලා අපට ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම ගැන පුස්තකාලයේ පර්යේෂණ අංශයට මම ස්තුතිවන්ත වනවා.

2007 වාර්තාවේ මොකක්ද කියන්නේ? රටේම ඉදි වුණේ නිවෙස් 15,597යි. 2008 වසරේ මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? මුළු රටේම ඉදි වෙලා තිබෙන්නේ නිවාස 12,068යි. 2009 වසරේ මුළු රටේම ඉදි වෙලා තිබෙන්නේ නිවෙස් 6,404යි. 2010 වසරේ මුළු රටේම ඉදි වෙලා තිබෙන්නේ නිවෙස් 1,789යි.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ මේ කරුණු කාරණාවලට පරස්පර මතයන් දරනවා නම්, ඒ ඒ අයගේ වෙලාව අර ගෙන ඒ කරුණු කාරණා පිළිබඳව පිළිතුරු සපයන්නය කියා මා ඉල්ලීමක් කරනවා. 2007, 2008, 2009, 2010 කියන වසර සියල්ලක්ම ගත් කල වර්තමාන පාලනය යටතේ මේ අවුරුදු හතරටම මුළු රටේම ඉදි වෙලා තිබෙන්නේ නිවෙස් 35,858ක් පමණයි. මේක තමයි යථාර්ථය.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාටත් මේ ගැන පැහැදිලි කරන්න ඕනෑ. මම මේ වර්තමාන ආණ්ඩුවේ අඩු පාඩුකම්, අඩු ලුහුඬුකම් ඉදිරිපත් කරන්නේ ද්වේෂයකින්, ඊර්ෂ්‍යාවකින්, ක්‍රෝධයකින් නොවෙයි. මා මේ කරන්නේ තොරතුරු, කරුණු, කාරණා දත්ත මත පදනම් වුණු අඩු පාඩුකම් පෙන්වා දීමක් පමණක් බව මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. 2012 අය වැය වාර්තාවේ 20වැනි පිටුවේ සඳහන් වනවා නාගරික පැල්පත්වාසීන්ගේ නිවාස ප්‍රශ්නය සඳහා තට්ටු නිවාස 50,000ක් ඉදි වෙනවාය කියා. නමුත් අය වැයෙන් ශත පහක්වත් වෙන් වෙලා නැහැ. ඒ වාගේම ප්‍රකාශ කර තිබෙනවා, ග්‍රාමීය ක්ෂේත්‍රයේ නිවාස 50,000ක් ඉදි කරන්නත් යොමු වනවාය කියලා. කොටින්ම කියනවා නම් වසර 6ක් තුළ නිවාස දස ලක්ෂයක් ඉදි කරන්නට මේ ආණ්ඩුව ප්‍රතිඥාවක් දීලා තිබෙනවා. දැන් අවුරුදු ගණනාවක් මුළුල්ලේ ඉදිරිපත් කළ ප්‍රකාශනවලට සමාන්තරව ඒ ඉලක්කයන් සපුරාලන්නට අපොහොසත් වුණු ආණ්ඩුව මෙදා පාර කියනවා, වසර හයකින් නිවාස දස ලක්ෂයක් හදනවා කියලා. ගරු සභාපතිතුමනි, වසර හයකින් නිවාස දස ලක්ෂයක් හදන්නට නම් අවුරුද්දකට ගෙවල් 1,66,666ක් හැදෙන්න ඕනෑ. මාසයකට ගෙවල් 13,888ක් හැදෙන්න ඕනෑ. දිනකට ගෙවල් 462ක් හැදෙන්න ඕනෑ. හැම පැයකටම ගෙවල් 19ක් හැදෙන්න ඕනෑ. දැන් මේ සියල්ලක්ම ක්‍රියාත්මක කරන්නට වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 700ක් පමණයි.

අපි පොඩ්ඩක් ආණ්ඩුව පැත්තට වාසි තියලා කියමු, රුපියල් ලක්ෂයක නිවාස ණයකුයි දෙන්නේ කියලා. එතකොට ගෙවල් එක්ලක්ෂ හැටහයදහසක ඉලක්කය සම්පූර්ණ කරන්නට වර්ෂයකට ගෙවල් හදන්න පුළුවන් 7000ක් පමණයි ගරු සභාපතිතුමනි. අපි තව පොඩ්ඩක් ආණ්ඩුවට වාසිය දීලා කියමු, නිවාස ණය රුපියල් ලක්ෂය නොවෙයි, පණස්දහසයි දෙන්නේ කියලා. එතකොට හදන්න පුළුවන් ගෙවල් 14,000ක් පමණයි. ආණ්ඩුවට තවත් පොඩි වාසියක් දෙමු, ණය මුදල පණස්දහස නොවෙයි, විසිපන්දහසයි කියලා. එතකොට ආණ්ඩුවට මේ වසරට හදන්න පුළුවන් ගෙවල් සංඛ්‍යාව 28,000යි. නමුත් අර ලක්ෂ 10 ඉලක්කයට වසර හයක් පුරාවටම යනකොට එක වසරකට හැදෙන්න ඕනෑ ගරු සභාපතිතුමනි, නිවාස එක්ලක්ෂ හැටහයදහසක්. මා ඔබතුමාට කරුණාවෙන් කියන්න කැමැතියි, මේ නිවාස සංකල්පය අද සංඛ්‍යා ලේඛන විජ්ජාවක් බවට පත් වෙලා තිබෙන බව.

අද වතුකර ක්ෂේත්‍රයේ හිසට වහලක් නොමැතිව, අව්වට වේළි වේළී, වැස්සට තෙමී තෙමී, ඉමහත් අසහනයෙන් ජීවත්වන ජන ප්‍රජාව දහස් ගණනින්, දසදහස් ගණනින් සිටිනවා. ඒ අයට තිරසාර නිවාස විසඳුමක් ලබා දෙන්නට මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා. උතුරු නැඟෙනහිර නිවාස ප්‍රශ්නය ප්‍රායෝගිකව,

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සක්‍රියව විසඳන්නට මේ ආණ්ඩුව කිසිම වැඩ පිළිවෙළක් දියත් කරලා නැහැ. මේ ආණ්ඩුවේ නිවාස ප්‍රතිපත්තිය කොච්චර නින්දා සහගතද කිව්වොත්, ගෙවල් 50,000ක් අපි හදලා දෙන්නම්, කරුණාකර ප්‍රතිලාභී ලැයිස්තුව ලබා දෙන්නය කියලා ඉන්දියානු රජයෙන් කියලා තිබෙනවා. දැනට ප්‍රතිලාභී ලැයිස්තුව සපයා තිබෙන්නේ නම් 1,000ක් සඳහා පමණයි. ඒ නිසා ගෙවල් 50,000න් ගෙවල් 1,000ක් පමණයි මේ වන විට ඉදි වෙලා තිබෙන්නේ. තව 49,000ක් ඉතුරු වෙලා තිබෙනවා. අපේ රජයේ සල්ලිවලින් නොවෙයි, රටේ ජනතාවගේ බදු සල්ලිවලින් නොවෙයි, ඉන්දියාවේ සල්ලිවලිනුයි ඉදි කරන්නේ. ඒ අය කියනවා, ප්‍රතිලාභී ලැයිස්තුව ඉදිරිපත් කරන්නය කියලා. නම් 1,000යි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ නිසා තමයි අකාර්යක්ෂම ආණ්ඩුවක් කියන එක කියන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් ඔබතුමා හරහා ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි, මේ රටේ උතුරු නැඟෙනහිර නිවාස ප්‍රශ්නයටත් අපි කඩිනම් විසඳුමක් ලබා දෙන්න ඕනෑය කියන එක. ඒ නිසා උතුරු පළාතෙත්, නැඟෙනහිර පළාතේත් නිවාස සංවර්ධන වැඩසටහන කාර්යක්ෂම කරවීම සඳහා නිවාස කාර්ය සාධක බල කායන් දෙකක් පළාත් මට්ටමින් බිහි කරලා, දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයුම් කමිටු බිහි කරලා උතුරු නැඟෙනහිර ප්‍රජාවගේ නිවාස ප්‍රශ්නයට තිරසාර, සක්‍රීය විසඳුමක් ලබා දෙන්නය කියලා මා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ නිවාස නොමැති ජනතාවට නිවාස ලබා දීමේ ප්‍රතිපත්තිය ගැන කථා කරන කොට, විශේෂයෙන්ම මේ ආණ්ඩුවට, මේ වර්තමාන පාලනයට යම් කිසි උත්තේජකයක්, එහෙමත් නැත්නම් ආදර්ශයක් හැටියට ගන්නට පුළුවන්, නිවාස සංකල්පයේ ස්වර්ණමය යුගය වන 1977-1994 කාල වකවානුව. ඒ කාල වකවානුව තුළ අපේ රටේ පළමුවන වතාවට නිවාස සංකල්පය ශක්තිමත් වැඩ පිළිවෙළක් හැටියට ක්‍රියාත්මක කරන්නට ඒ පාලන තන්ත්‍රයට හැකියාව ලැබුණා. 1970-1977 කාල වකවානුව තුළ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව යටතේ, ඒ මුළු අවුරුදු හතටම ඉදි වුණේ නිවාස 400ක් වැනි සොච්චමක් පමණයි. නමුත් 1977-1994 කාල වකවානුව තුළ නිවාස ලක්ෂයේ වැඩසටහන, නිවාස දසලක්ෂයේ වැඩසටහන, නිවාස පහළොස්ලක්ෂයේ වැඩසටහන යනාදී වැඩසටහන් තුළින් මේ රටේ දුගී දුප්පත්, ග්‍රාමීය, නාගරික ජනතාවට, අසහනයෙන් පෙළෙන ජනතාවට තිරසාර සෙවණක් ලබා දෙන්නට හැකියාව ලැබුණාය කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ නිවාස සංකල්පය ගැන කථා කරන විට -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද, සභාපතිතුමා?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට නියමිත කාලයෙන් විනාඩි 7ක් එතුමාට දෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, නිවාස සංකල්පය ගැන කථා කරන කොට විශේෂයෙන්ම වර්තමාන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන යම් කිසි අවබෝධයක් ලබා ගන්නට ඕනෑ. නිවාස සංකල්පයේ ස්වර්ණමය යුගයේ කොටස් තුනක් තිබෙනවා. පළමුවන කොටස තමයි, 1977 - 1983 කාල වකවානුවේ ක්‍රියාත්මක කළ නිවාස ලක්ෂයේ වැඩසටහන. ඒ නිවාස ලක්ෂයේ වැඩසටහන තුළින් ආණ්ඩුව සෘජුවම මැදිහත් වෙලා නිවාස ලක්ෂයක් හදා දුන්නා. ඒ බව අපේ අස්වර් මන්ත්‍රීතුමා හොඳාකාරව දන්නවා. මොකද, එතුමා මගේ පියාත් සමඟ රට වටේම ගිහින් ඒ නිවාස සංකල්පයට ජීවය - ප්‍රාණය- සහ ශක්තිය -ජවය- ලබා දෙන්නට කටයුතු කළ නිසා. ඒ බව මට හොඳාකාරව මතක් වනවා.

1977-1983 කාල වකවානුව තුළ ආණ්ඩුවේ සෘජු දායකත්වය මත නිවාස ලක්ෂය හැදුණාට පස්සේ, නිවාස දසලක්ෂය, පහළොස්ලක්ෂය වැඩසටහන ප්‍රායෝගිකව, සක්‍රීයව ක්‍රියාත්මක කරන්නට ඒ රජයට පුළුවන් වුණා. ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්: Minimal governmental intervention but maximum support by the State. Maximum improvement of the builder families - an enabling strategy was devised to ensure that higher targets were achieved in the housing policy of Sri Lanka.

ඉතාම උසස් මට්ටමකින් රජයේ නිවාස සංකල්පය ක්‍රියාත්මක කරන්නට එදා කටයුතු යෙදුණා. එපමණක් නොවෙයි, එක්සත් ජාතීන්ගේ සංවිධානය 1987 වසර ජගත් නිවාස වසර හැටියට නම් කරලා, අනිවාර්යයෙන්ම 2000 දී සැමට සෙවණ ලබා දෙන සංකල්පය ශ්‍රී ලාංකීය සංකල්පයක් පමණක් නොවෙයි, මුළු ජාත්‍යන්තර ප්‍රජාවම ඉහළින්ම පිළිගත් සංකල්පයක් බවට ක්‍රියාත්මක කරන්නට කටයුතු කළා. මේ කාල වකවානුවේ නිවෙස් හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට බාධා, දුක්, කම් කටුලු, විවිධ විවේචන, තර්ජන, ගර්ජන හා ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. වරෙක, එතුමාට නිවෙස් හදන්නට වෙන් වුණු මුදල් ප්‍රමාණය අඩු කරන්නට එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේම මුදල් ඇමතිතුමා කටයුතු කළත් එතුමා පසුබට වුණේ නැහැ. නමුත් එතුමා Habitat සංවිධානයේ Dr. Arcot Ramachandran මැතිතුමා සම්බන්ධ කර ගෙන වෙනමම ජාත්‍යන්තර ප්‍රතිපාදන ලබා ගෙන නිවාස සංකල්පය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නටකටයුතු කළා.

එපමණක් නෙවෙයි, සෙවණ ලොතරැයියක් ඇති කරලා, ඒ මඟින් සෙවණ අරමුදලක් ඇති කරලා, ඒ සෙවණ අරමුදල හරහා ඒ නිවාස සංකල්පය තවදුරටත් ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නට එතුමා කටයුතු කළාය කියන එක මම මේ ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමන්ගේ නිවාස

සංකල්පය පිළිබඳව ලොකුම සහතිකය දීලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ පුද්ගලයකු නොවන බව. 1996 තුර්කියේ පැවැති Habitat සම්මේලනයට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කරපු වාර්තාව මා අතේ තිබෙනවා. ඒ වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒ වාර්තාවේ එතුමා මෙසේ සඳහන් කරලා තිබෙනවා:

"This is recorded as the first wide-spread and well-coordinated support based national housing development programme which was an umbrella programme having six sub-programmes……."

කවුදමෙහෙම කියන්නේ? මම නොවෙයි; එක්සත් ජාතික පක්ෂයේ පුද්ගලයෙක් නොවෙයි. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තමයි Habitat ආයතනයට කියන්නේ, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ නිවාස සංකල්පය අපේ රටේ නිවාස ඉදි කිරීමේ ස්වර්ණමය යුගයයි කියන එක. වෙන කවුරුවත් නොවෙයි.

ගරු සභාපතිතුමනි, කෙටි කාලයක් තුළ මේ වාගේ පුළුල් මාතෘකාවක් පිළිබඳව කථා කරන්න බැරි වුණත්, විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට කාරණයක් මතක් කරන්න කැමැතියි. "මහින්ද චින්තන-දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ 22වන පිටුව බලන්න. එහි මෙන්න මෙහෙම සඳහන් වනවා:

" නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොලියද කපා හැර එම නිවෙස්වල සින්නක්කර අයිතිය ලබා දෙමි."

මෙහෙම කියන්නේ මම නොවෙයි, ගරු ජනාධිපතිතුමායි. නමුත් ගරු සභාපතිතුමනි, අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අද ඉන්න නිවාස සංවර්ධන නිලධාරින්ගේ වගකීම වෙලා තිබෙන්නේ ගෙවල් හදන එක නොවෙයි. නිවාස ණය ලබා දුන් අය පිටුපස ලුහු බැඳලා, තර්ජනය කරලා, ගර්ජනය කරලා, ඒ අහිංසක ජනතාවගේ කපා හැරි නිවාස ණය නැවතත් අය කරන දූර්දාන්ත ක්‍රමයක් අද මුළු රට පුරා උපදිසාපති කොට්ඨාසයක් කොට්ඨාසයක් පාසා ක්‍රියාත්මක වනවාය කියන එක මා කනගාටුවෙන් හෝ ඔබතුමාට මතක් කරන්න ඕනෑ. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සමයේ කපා හැරුණු ඒ නිවාස ණය, ඒ වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාව හරහා කපා හැරුණු නිවාස ණය නැවත වරක් අය නොකරන ලෙසට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

දිවංගත මගේ පියාණන් Massachusetts Institute of Technology - MIT - විශ්වවිද්‍යාලයේ පැවැති සම්මන්ත්‍රණයේදී කරපු ප්‍රකාශයක් සමඟම මගේ කථාව අවසන් කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, University College London මගේ පියාගේ නමින් ශිෂ්‍යත්ව දෙකක් වාර්ෂිකව ලබා දුන්නා, මේ රටේ නිවාස සංකල්පය අගය කරමින්. ඇමෙරිකාවේ Massachusetts Institute of Technology - MIT - කියන එම විශ්වවිද්‍යාලයත් අපේ නිවාස සංකල්පය අගය කරමින් වාර්ෂිකව ශිෂ්‍යත්ව දෙකක් ලබා දුන්නා. එවන් සම්මන්ත්‍රණයකට සහභාගි වුණ අවස්ථාවේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මෙලෙස ප්‍රකාශ කළා:

"Shelter is not charity. It is a necessity. Shelter must liberate, not suffocate. Shelter programme must create hope in dwellings, not allow people to dwell in hope. Shelter must mobilize the social dynamic against the dynamite in society".

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඒකේ සිංහල පරිවර්තනය මොකක්ද? "වාසස්ථාන ලබා දීම කියන්නේ පුණ්‍යාධාර දීමක් නොවෙයි. එය මිනිස් අවශ්‍යතාවක්. නිවාස දීමෙන් සිදු විය යුත්තේ මිනිසුන් නිදහස් කරවීම මිස මිනිසුන් හිර කරවීම නොවෙයි. නිවාස වැඩසටහන්වලින් නිවාස කෙරෙහි බලාපොරොත්තු ජනිත කරවිය යුතුය. නිවස තුළින් සමාජයේ බිහිසුණු පිපිරීම් සහ ප්‍රවණතාවලට එරෙහි සමාජ බලවේග කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුයි."

මේවා තමයි රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඒ නිවාස සංකල්පය පිළිබඳව ඉස්මතු කරපු ශ්‍රේෂ්ඨ වදන්.

අවසාන වශයෙන් මම පොඩි කාරණාවක් කියන්නට ඕනෑ. අපට පෙනෙනවා, ගරු විමල් වීරවංශ මැතිතුමාගේ අමාත්‍ය ධුරය තුළ මේ නිවාස සංකල්පය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්න එතුමා යම් උත්සාහයක් දරනවා කියලා. අපි යථාර්ථවාදීව කථා කරන්නට ඕනෑ. එදිරිවාදිකම් මුල් කර ගෙන අපි දේශපාලනය කරන්නේ නැහැ. ඇස් දෙකට පෙනෙන, කනට ඇහෙන, හදවතට දැනෙන දේශපාලනයක් අපි කරන්නේ. එතුමා උත්සාහයක් ගන්නවා, මේ නිවාස සංකල්පය ක්‍රමවත් අන්දමින් ක්‍රියාත්මක කරන්නට. එතුමාගේ උත්සාහයන් ඉලක්ක සහගතව ක්‍රියාත්මක කරන්නට නම් ආණ්ඩුවෙන් මීට වැඩිය සහයෝගයක් ලැබෙන්නට ඕනෑ; ආණ්ඩුවෙන් මීට වැඩිය ප්‍රතිපාදන වෙන් කරන්නට ඕනෑ. ඒ වාගේම ජනාධිපතිතුමාත් එක්ක අමාත්‍යතුමාගේ සමීප සම්බන්ධතාවක් තිබෙනවා. ආණ්ඩුව සල්ලි නොදුන්නත්, ඒ සමීප සම්බන්ධතාව උපයෝගී කර ගෙන සෙවණ ලොතරැයිය නැවත වරක් ආරම්භ කරලා, නිවෙස් නොමැතිව අව්වට වේලෙන වැස්සට තෙමෙන මේ රටේ ජනතාවට සෙවණ අරමුදල හරහා තිරසාර සෙවණක් ලබා දෙන්නට ඔබතුමාට ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
The next speaker is the Hon. S. Shritharan. You have 13 minutes.

[மு.ப. 10.34]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி தெரிவிக்கின்றேன். இலங்கையின் பொருளாதாரம் 8 சதவீதமான வளர்ச்சியைக் கொண்டுள்ளதென்று குறிப்பிடப்படுகின்ற அதேநேரத்தில், இந்நாட்டின் வடக்கு மாகாணம் 23 சதவீதமான வளர்ச்சியைக் கண்டுள்ளதாகவும் குறிப்பிடப்படுகிறது. ஆனால், இலங்கையின் வடக்கு, கிழக்குப் பகுதிகள் பூரணமாக யுத்தத்தால் பாதிக்கப்பட்ட பகுதிகளாகும். அந்தப் பகுதி மக்களுக்கான வீட்டுத்திட்டங்கள் மிகவும் மந்தகதியிலே நடைபெற்றுவருவதை நாங்கள் அனைவரும் அறிவோம். இந்திய அரசாங்கத்தின் 50,000 வீட்டுத்திட்டமானது வடக்கு, கிழக்குப் பகுதிகளிலே, குறிப்பாக வன்னியிலே, யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கெனக் கொண்டுவரப்பட்ட திட்டமாகும். எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் சஜித் பிரேமதாஸ அவர்கள் குறிப்பிட்டதுபோல, இதுவரை அதில் 1,000 வீடுகளைக்கூட அமைத்துக்கொடுக்க முடியவில்லை. அப்படியான வேலைத்திட்டங்களெதுவும் துரிதமாக நடைபெறுவதாக இல்லை. கிளிநொச்சி

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

மாவட்டத்தின் பச்சிலைப்பள்ளி பிரதேச சபையின் எல்லைக்குட்பட்ட பேராலை என்ற இடத்திலும் இந்திய உதவித்திட்டத்தினூடாக ஒரு தொகுதி வீடுகள் அமைக்கப்பட்டன. ஆனால், அந்த வீடுகள் இதுவரை அந்த மக்களுக்கு வழங்கப்படவில்லை. இத்தகைய நிலைதான் அங்கு காணப்படுகின்றது. அந்த மக்களுக்கான பொதுவசதிகளை ஏற்படுத்திக் கொடுக்கவேண்டியது அரசின் அடிப்படைக் கோட்பாடாக இருக்க வேண்டும்.

இந்த வரவு செலவுத் திட்டத்தில் 14,000 மில்லியன் ரூபாய் யுத்தத்தினால் பாதிக்கப்பட்ட படையினருக்கென ஒதுக்கப்பட்டிருக்கிறது. அதேநேரத்தில் வடக்கு, கிழக்கு பகுதிகளிலே யுத்தத்தால் பாதிக்கப்பட்டு அங்கவீனமுற்ற நிலையிலே இருப்பவர்களின் குடும்பங்களுக்கென எந்தவிதமான விசேட திட்டங்களோ அல்லது பொதுவசதித் திட்டங்களோ முன்வைக்கப்படவில்லை. உண்மையிலே பாதிக்கப்பட்டவர்கள் வடக்கு, கிழக்கிலே வாழுகின்றார்கள். குறிப்பாக முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்களைச் சேர்ந்த பெரும்பாலான மக்கள் யுத்தத்தினால் தங்களுடைய அனைத்து சொத்துக்களையும், அடிமட்ட வசதிகள் அத்தனையையும் இழந்த நிலையில்தான் அங்கு மீள்குடியேற்றம் செய்யப்பட்டார்கள். மேலும், இந்த இரண்டு மாவட்டங்களிலும் யுத்தம் காரணமாக 4,000 பேருக்குமேல் அங்கவீனமுற்றிருக்கின்றார்கள். இதைவிட, வட பகுதியின் ஏனைய மாவட்டங்களில் மீள்குடியேறி வாழ்கின்ற மக்களின் பொதுவசதிகளுக்கான அல்லது சலுகை அடிப்படையிலான ஏதாவது திட்டங்கள்கூட இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப்படவில்லையென்பதை இந்த இடத்தில் சுட்டிக்காட்ட வேண்டும்.

இம்முறை வரவு செலவுத் திட்டத்தில் பாதுகாப்புக்கென 23,000 கோடி ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது. முழுமையான பொருளாதாரத்தடை காரணமாக வன்னி மற்றும் மட்டக்களப்பின் பெரும்பாலான பகுதி மக்களும் யாழ்ப்பாணத்தின் ஒருசில பகுதி மக்களும் 20 வருடங்களுக்கும் மேலாகப் பாரிய துன்பங்களைச் சந்தித்து, 2009ஆம் ஆண்டுக்குப் பின்னர் மீள்குடியேறினார்கள். பாதுகாப்புக்கென இவ்வளவு பெருந்தொகை நிதி ஒதுக்கப்படும்போது, இவர்களது பொருளாதார நிலைமையில் மாற்றங்களைக் கொண்டுவரக்கூடிய வகையில் எந்தத் திட்டமுமே இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப்படவில்லை என்பதை நாங்கள் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றோம். அரசாங்கத்தின் பொருளாதாரத்தடை இருந்த காலத்தில்கூட, அந்த மக்கள் நிம்மதியோடு வாழ்ந்தார்கள். ஏ-9 வீதியைப் புனரமைப்பதன்மூலம், அல்லது புனரமைக்கப்பட்டு வருகின்ற ஏ-9 வீதியை உலக நாடுகளின் பிரதிநிதிகள் பார்ப்பதன்மூலம் மட்டும் நாட்டிலே அபிவிருத்தி நடைபெறுகின்றதென்று சொல்வதற்கில்லை. உள்ளூர்க் கிராமங்களும் சரி, அங்குள்ள ஒவ்வொரு மாவட்டமும் சரி, சரியான பொருளாதார வளர்ச்சியை அடையவில்லை. தேர்தல் காலங்களின்பொழுது ஒவ்வொரு கிராமங்களிலும் கொண்டுபோய்க் குவிக்கப்பட்ட மின்சாரக் கம்பங்கள் தேர்தல் முடிந்ததும் திரும்பவும் ஏற்றப்பட்டுவிட்டன. கிளிநொச்சி மாவட்டத்தின் நகரப்பகுதி மட்டும் ஒரு குறிப்பிட்டளவு மின்சாரத்தைப் பெற்று வருகின்றது. ஆனால், பெரும் நிலப்பரப்பினைக்கொண்ட அந்த மாவட்டத்தின் ஏனைய இடங்களிலுள்ள மக்கள் இன்னும் மின்சாரத்தையே காணாத ஒரு சூழலில்தான் இருக்கின்றார்கள். இந்த நிலையில் பொருளாதாரத்தினுடைய - [இடையீடு]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் சிறீதரன் அவர்களே, அந்த மின்கம்பங்கள் -

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

(மாண்புமிகு சி. சிறீதரன்)

(The Hon. S. Shritharan)

நீங்கள் தயவுசெய்து உட்காருங்கள்! நாங்கள் உங்களைக் கேட்கவில்லை; வரவு செலவுத்திட்டம் சம்பந்தமாக அரசாங்கத்தைத்தான் கேட்கின்றோம். நீங்கள் அரசாங்கத்தின் சார்பில் ஏதாவது கூறுவதானால் உங்களது நேரத்தில் விடையளியுங்கள்!

ஆகவே, இந்த மின்சார வசதி என்பது மக்களுக்கு மிக முக்கியமானது என்பதையும் இந்த இடங்களிலே மக்களுடைய பொருளாதாரத் தேவைகளைப் பூர்த்தி செய்யக்கூடிய வகையில் அவர்களுக்கான அடிப்படை வசதிகள் ஏற்படுத்தப்பட வேண்டும் என்பதையும் நாங்கள் குறிப்பிட விரும்புகின்றோம்.

வடக்கு, கிழக்குப் பகுதிகளிலே தங்களுடைய சொந்த உழைப்பில் நம்பிக்கை வைத்து, மிக முக்கியமாக சுயமுயற்சியிலே தலைநிமிர்ந்து வாழ்ந்துவந்த தமிழர்கள், இன்று கையேந்தி வாழ்கின்ற நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். ஆகவே, இந்த யுத்தத்தில் பாதிக்கப்பட்டவர்களுக்கும் மற்றும் தங்களுடைய சொத்துக்கள் இழப்பு உட்பட முழுமையான பாதிப்புக்களைக் கொண்டிருப்பவர்களுக்கும் ஏதாவது ஒரு விசேட திட்டத்தை அறிமுகப்படுத்த வேண்டும் என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன். மீள்குடியேற்றத்தின் பின்னர் கிளிநொச்சி மாவட்டத்தில் வீடு கட்டுவதற்காகப் பல திட்டங்கள் பல நிறுவனங்களுக்கூடாக அறிமுகப்படுத்தப் பட்டன. ஆனால், அங்குள்ள மக்களில் எத்தனை பேருக்கு அந்தத் திட்டங்கள் பயனளித்திருக்கின்றன என்பது கேள்விக்குறியாகத்தான் இருக்கின்றது என்பதை நாங்கள் இங்கு குறிப்பிட்டுக் காட்ட வேண்டியிருக்கின்றது.

அடுத்து, வேலையில்லாப் பிரச்சினை பற்றி இங்கு மிக முக்கியமாகக் குறிப்பிட வேண்டும். 2011ஆம் ஆண்டில் வேலைவாய்ப்பின்மை வீதம் 4.3 ஆக வீழ்ச்சி கண்டிருப்பதாக வரவு செலவுத் திட்ட அறிக்கையில் குறிப்பிடப்பட்டிருக்கின்ற போதிலும் வடக்கு, கிழக்கு மாகாணங்களின் தரவுகள் அதில் புகுத்தப்படவில்லை என்று குறித்த அறிக்கையில் காணப்படுகின்ற ஓர் அடிக்குறிப்பு தெரிவிக்கின்றது. கௌரவ சபாநாயகர் அவர்களே, வேலையற்ற ஓர் ஊழியப்படையை 4.3 வீதமாகக் குறைத்திருப்பதாகக் குறிப்பிடப்படுகின்ற வளர்ச்சியினுள் யுத்தத்தால் பாதிக்கப்பட்டு வேலைவாய்ப்பற்றிருக்கின்ற வடக்கு, கிழக்கைச் சேர்ந்த ஊழியப்படை உள்வாங்கப்படவில்லை என்பது மிக முக்கியமான விடயமாகும். அதாவது அந்த அடிக்குறிப்பின் மூலம் அனைத்து மாவட்டங்களினதும் தரவுகள் அதில் சேர்த்துக்கொள்ளப்படவில்லை என்பது தெளிவாகின்றது. அந்தவகையில் பல்வேறு தரவுகளும் முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி மாவட்டங்கள் நீங்கலாக என்றுதான் இங்கு தரப்பட்டிருக்கின்றன. ஆகவே, எங்களுடைய மக்களுக்கு வேலைவாய்ப்புக்கள் வழங்கப்படவில்லை என்பதை அரசே தன்னுடைய அறிக்கையின்மூலம் தெளிவுபடுத்தியிருக்கின்றது.

இன்று வடக்கு, கிழக்குப் பகுதிகளில் நிர்வாக சேவை உத்தியோகத்தர்களாக இருந்தாலும் சரி, அல்லது ஏனைய அதிகாரிகளாக இருந்தாலும் சரி, அந்தப் பகுதிகளைச் சார்ந்தவர்களைவிட, தென் பகுதியில் இருப்பவர்களைக் கொண்டுபோய் அங்கு பணிக்கு அமர்த்துகின்ற நடவடிக்கைகள் மிக வேமாக நடைபெறுகின்றன. யுத்தம் நடைபெற்ற காலங்களில் அந்த இடங்களிலே பொதுவசதிகள் உண்டாக்கப்பட்டு, உட்கட்டுமான வசதிகள் உண்டாக்கப் பட்டு, அந்த மக்களுக்கான வேலைவாய்ப்புக்கள் வழங்கப்படாத ஒரு சூழலில்தான் இன்று அந்த இடங்களில் இந்த வேலையின்மை வீதம் பெரிய அளவில் இருக்கின்றது. அதாவது, யுத்தத்தைக் காரணங்காட்டி, பொருளாதாரத் தடைகளைக் காரணங்காட்டி, அந்த இடங்களில் வேலைவாய்ப்புக்கள் வழங்கப்படாதிருந்ததன் காரணமாகத் தான் இன்று இலங்கை நிர்வாக சேவையாக அதிகாரிகளாக இருந்தாலும் சரி, இலங்கைக் கல்வி நிர்வாக சேவை அதிகாரிகளாக இருந்தாலும் சரி, அல்லது இளைஞர் சேவைகள் மன்ற உத்தியோகத்தர்களாக இருந்தாலும் சரி, விளையாட்டுத் துறை அதிகாரிகளாக இருந்தாலும் சரி, அனைத்துப் பதவிகளுக்கும் தென் பகுதியில் இருந்து உத்தியோகத்தர்களை அங்கு நியமிக்கின்ற ஒரு சந்தர்ப்பம் ஏற்பட்டிருக்கின்றது. ஆகவே, கௌரவ சபாநாயகர் அவர்களே, ஓர் உண்மையான அக்கறையுடன், விசேட கவனம் செலுத்தி, அங்குள்ள வேலையற்ற ஊழியப் படையைக் குறைக்கும்வகையில் அந்தப் பகுதி இளைஞர் யுவதிகளுக்கு வேலைவாய்ப்புக்களை வழங்கும் நிலையை உண்டாக்க வேண்டும் என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

மிக முக்கியமாக இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இந்த நூலின் ஊடாகப் பல வேலைத்திட்டங்களைப் பற்றி நாங்கள் தெளிவாகப் புரிந்துகொள்ள முடிகின்றது. 2011ஆம் ஆண்டில் ஒவ்வோர் இடங்களிலும் செயற்படுத்தி முடிக்கவேண்டிய கருத்திட்டங்கள் குறிப்பிடப்பட்டிருக்கின்றன. அவற்றில் மிக முக்கியமாக 68 கிலோ மீற்றர் நீளமான பாதைகளை அமைப்பதற்கான 636 கருத்திட்டங்கள் அம்பாந்தோட்டை மாவட்டத்திலே மேற்கொள்ளப்பட்டிருக்கின்றன. அதேபோல 56 கிலோ மீற்றர் நீளமான 332 கருத்திட்டங்கள் மாத்தறை மாவட்டத்தில் நடைமுறைப்படுத்தப்பட்டிருக்கின்றன. இதற்காக மாத்தறை மாவட்டத்துக்கு 425 மில்லியன் ரூபாயும் அம்பாந்தோட்டை மாவட்டத்துக்கு 297 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டிருக்கின்றது. இருந்தபோதிலும் நீங்கள் யாழ்ப்பாண மாவட்டத்தைப் பாருங்கள்! யாழ்ப்பாண மாவட்டத்தில் 3 கிலோ மீற்றர் நீளமான பாதைகள் அமைப்பதற்கு 4 கருத்திட்டங்களும், மன்னார் மாவட்டத்தில் 4 கிலோ மீற்றர் நீளமான பாதைகள் அமைப்பதற்கு 3 கருத்திட்டங்களும், வவுனியா மாவட்டத்தில் 3 கிலோ மீற்றர் நீளமான பாதைகள் அமைப்பதற்கு 2 கருத்திட்டங்களும் மேற்கொள்வதற்காக மட்டும் நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. அதேநேரம் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் பாதைகள் அமைப்பதற்கு எந்தவிதமான நிதியும் ஒதுக்கப்படாத நிலையில், மட்டக்களப்பில் 7 கிலோ மீற்றர் நீளமான பாதைகள் அமைப்பதற்கு 24 கருத்திட்டங்களும், அம்பாறையில் 22 கிலோ மீற்றர் நீளமான பாதைகள் அமைப்பதற்கு 272 கருத்திட்டங்களும் மேற்கொள்வதற்காக 2011இல் நிதி ஒதுக்கப்பட்டுள்ளது. இவ்வாறான கருத்திட்டங்களுக்கு நிதி ஒதுக்கீடு செய்கின்றபொழுது ஒரு மாவட்டத்துக்குக் கூடுதலாகவும் இன்னொரு மாவட்டத்துக்குக் குறைவாகவும் ஒதுக்குவதற்குக் காரணம் என்ன என்பதை நாங்கள் அறிந்து கொள்ள விரும்புகிறோம்.

கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு நாட்டினுடைய அபிவிருத்தி என்பது சேவைத்துறை வளர்ச்சியின்மூலம் கொண்டுவரப்படுவதில்லை. மிக முக்கியமாக ஒரு நாட்டின் விவசாயத்துறையில் ஏற்படுகின்ற அபிவிருத்தியின் வாயிலாகக் கைத்தொழில் துறையில் மாற்றத்தை ஏற்படுத்துவதன்மூலம் சேவைத்துறை வளர்ச்சியடைவதே அந்த நாட்டின் அபிவிருத்தியாகக் கருதப்படும். ஆனால், குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களை எடுத்துக்கொண்டால், அங்கே எவ்விடத்திலாவது தொழிற்சாலை ஆரம்பிக்கப்பட்டிருக்கிறதா? பரந்தன் இரசாயனத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதற்கான முயற்சிகள் எதுவும் இதுவரையில் மேற்கொள்ளப்படவில்லை. அதேபோன்று காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை ஆகியவற்றை ஆரம்பிப்பதற்குரிய முயற்சிகள் எதுவும் மேற்கொள்ளப்பட வில்லை. இவ்வாறு எமது பிரதேசங்களிலே தொழிற்சாலைகள் எதுவும் ஆரம்பிக்கப்படாமலும் விவசாய ரீதியான தொழில்முயற்சிகள் எதுவும் உருவாக்கப்படாமலும் இருக்கும்பொழுது, அங்குள்ள மக்களின் பொருளாதார நிலையில் எவ்வாறு மாற்றங்கள் ஏற்பட முடியும் எனக் கேட்கின்றேன்.

குறிப்பாக, இன்று யாழ்ப்பாண மண்ணை எடுத்துக்கொண்டால், அங்கு தடுக்கி விழுகின்ற இடங்களிலெல்லாம் காப்புறுதிக் கூட்டுத்தாபனங்களும் எழும்புகின்ற இடங்களிலெல்லாம் வங்கிகளுமாகவே காட்சியளிக்கின்றன. ஒரு சேவைத்துறையின் பெருவீக்கமானது ஒரு நாட்டினுடைய அபிவிருத்தியில் பெரும் பங்கைத் தரப்போவதில்லை. அது அந்த மக்களுக்கான வளர்ச்சியில் மாற்றங்களைத் தரவும் மாட்டாது. ஆகவே, ஒரு நாட்டில் பொருளாதாரம் வளர்ச்சிபெற வேண்டுமானால், அதுவும் கடந்த 30 ஆண்டுகளாக யுத்தத்தினால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மக்களுடைய வாழ்வாதாரத்தில் மாற்றத்தை ஏற்படுத்த வேண்டுமானால், நாங்கள் அவர்களுடைய விவசாயம், கைத்தொழில் ஆகிய துறைகளிலே வளர்ச்சிக்குரிய மாற்றங்களைப் புகுத்த வேண்டும்.

மாண்புமிகு வீடமைப்புத்துறை அமைச்சர் அவர்களும் இச்சபையிலே இருக்கின்றார். யுத்தத்தினால் பாதிக்கப்பட்டுள்ள பிரதேசத்தில் எமது மக்கள் வாழும் இடங்களிலே வீடமைப்புத் திட்டங்களை அமைக்கும் பணிகளை மேற்கொள்வதற்கு அவர் முயற்சித்து வருகிறார். ஆனால், கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் அங்குள்ள மக்கள் இன்றும் தறப்பாள் குடிசைகளுக்குள் வாழ்கின்ற சூழ்நிலையே காணப்படுகிறது. இதனை அமைச்சர் அவர்கள் நேரடியாகச் சென்று பார்வையிடலாம். யுத்தம் முடிவடைந்து கிட்டத்தட்ட மூன்றாவது வருடத்தை எட்டிப் பிடிக்க இருக்கிறோம்; வருகிற ஏப்பிரல் மாதம் வந்துவிட்டால் மூன்று வருடம் நிறைவடையப்போகிறது. ஆனால், அப்பிரதேசங்களைச் சேர்ந்த எமது மக்கள் தமது சொந்த இடங்களிலே, தாங்கள் வாழ்ந்த வீடுகளிலே மீளக்குடியேறி வாழ்வதற்குரிய வசதிகள் இன்னமும் ஏற்படுத்திக் கொடுக்கப்படவில்லை. குறிப்பாக, வடமராட்சி கிழக்கில் ஏற்கெனவே செஞ்சிலுவைச் சங்கத்தினாலும் சுவிஸ் நாட்டுச் செஞ்சிலுவைச் சங்கத்தினாலும் கட்டிக் கொடுக்கப்பட்ட சுனாமித்திட்ட வீடுகள் முழுமையாகவே அழிக்கப்பட்டுவிட்டன. அங்கு யுத்தம் நடைபெறவில்லை. அங்கிருந்த மக்களை இராணுவத்தினர்தான் அங்கிருந்து மீட்டுக்கொண்டு சென்றார்கள். ஆனால், அம்மக்கள் மீளவும் திரும்ப வந்து தமது வீடுகளைப் பார்த்தபொழுது வீடுகளுக்குரிய அத்திவாரம்கூட இல்லாமலிருந்தது. இன்று உடுத்துறை, தாழையடி, கட்டைக்காடு, வெற்றிலைக்கேணி ஆகிய பிரதேசங்களைச் சேர்ந்த எமது மக்கள் வெறும்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

கட்டாந்தரைகளில் மரங்களுக்குக்கீழ் தறப்பாள் குடிசைகளைக் கட்டி வாழ்கின்றனர். ஆகவே, அங்குள்ள வீட்டுத் திட்டங்கள் நத்தை வேகத்திலேயே நடைமுறைப்படுத்தப்படுகின்றன என்பதை நாங்கள் இச்சபையினூடாகத் தெரியப்படுத்த விரும்புகின்றோம். நாங்கள் அரசாங்கத்தைக் குறை கூறவோ அல்லது அரசு செய்கின்ற அனைத்துச் செயல்களிலும் பிழை கண்டுபிடிக்கவோ முயலவில்லை. ஆனால், நாம் மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் என்ற வகையில், அந்த மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகளை இச்சபையினூடாகத் தெரிவிக்க வேண்டிய பணி எங்களுக்கு உண்டு என்பதை இந்தச் சபை ஏற்றுக்கொள்ள வேண்டும். நான் அப்பிரதேசத்தின் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்டு இரண்டு வருடங்கள் முடிவடையப் போகின்றது. ஆனால், இன்றுவரையில் அப்பிரதேசத்தின் அபிவிருத்தி தொடர்பாக கிளிநொச்சி மாவட்டத்திலே நடைபெறுகின்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களிலோ அல்லது அப்பிரதேசங்களிலே நடைபெறுகின்ற பிரதேச மட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலோ கலந்துகொள்வதற்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்களாகிய எங்களுக்கு எதுவித அழைப்பும் விடுக்கப்பப்படவில்லை என்பதை கௌரவ சபாநாயகர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். கிளிநொச்சி மாவட்டத்தில் நடைபெற்ற பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்கும் பூநகரி, பச்சிலைப்பள்ளி, கரைச்சி, கண்டாவளை ஆகிய பிரதேச செயலகப் பிரிவுகளில் நடைபெற்ற ஒவ்வொரு ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்கும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்களுக்கு அழைப்பு விடுக்கக்கூடாதென அரசாங்கத்தில் அங்கம் வகிப்பவர்களால் கட்டாயக் கட்டளைகள் பிறப்பிக்கப்பட்டிருப்பதாக அறிகிறோம். ஆகவே, அங்குள்ள அபிவிருத்தி நடவடிக்கைகள் தொடர்பாக சரியான, தெளிவான நிலைமையை இச்சபைக்குத் தெரிவிக்க முடியாத நிலையில் நாங்கள் இருக்கின்றோம் என்பதையும் கௌரவ சபாநாயகர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

அதேபோன்று இந்த மாவட்டங்களில் உள்ள மக்களுடைய தேவைகளைக் குறிப்பிட வேண்டியவனாக இருக்கின்றேன். மிகவும் முக்கியமாக யுத்தத்தினால் பாதிக்கப்பட்டுச் சிறைகளில் வாடுகின்ற பல இளைஞர்களுடைய குடும்பங்கள், - அவர்களுடைய மனைவி, பிள்ளைகள் - வாழமுடியாத சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, மனிதாபிமான அடிப்படையில் அக்குடும்பங்களுக்கு ஏதாவது நிவாரணம் வழங்கக்கூடிய வகையில் ஒரு திட்டத்தை ஏற்படுத்த வேண்டுமென நான் இந்த அவையினூடாக மிகவும் விநயமாக வேண்டிக்கொள்கின்றேன். அதேபோன்று யுத்தத்தினால் பாதிக்கப்பட்டு கால், கைகளை இழந்த நிலையிலுள்ள அங்கவீனர்கள் வாழமுடியாத சூழ்நிலையில் மிகுந்த வேதனையின் மத்தியில் இருந்துகொண்டிருக்கின்றார்கள். இன்று பல பெண்கள் wheel chair என்ற முச்சக்கர நாற்காலிகளில் இருக்கின்றார்கள். அவர்களுக்கு பொதுவசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படல்வேண்டும்; அந்த மக்களுடைய வீட்டுத் திட்டங்கள் பூரணப்படுத்தப்படல் வேண்டும். ஆகவே, நீங்கள் இவற்றைக் கூடிய கவனத்திலெடுத்து இந்த மக்களுக்கு நிவாரணம் வழங்க வேண்டுமென இந்தச் சபையினூடாகக் கேட்டு, வாய்ப்புக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

[மு. ப. 10.50]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார்)
(The Hon. Murugesu Chandrakumar)

கௌரவ தவிசாளர் அவர்களே, நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு பொதுவசதிகள் அமைச்சு மற்றும் பெற்றோலியக் கைத்தொழில் அமைச்சு ஆகியவற்றுக்கான நிதி ஒதுக்கீடுகள் பற்றிய குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். முக்கியமாக இச்சந்தர்ப்பத்தில் வீடமைப்பு சம்பந்தமான சில விடயங்களை இச்சபையின் கவனத்துக்குக் கொண்டுவரலாமென நினைக்கின்றேன். யுத்தம் முடிவடைந்து கிட்டத்தட்ட இரண்டரை வருடங்கள் கடந்துள்ள நிலையில், அதனால் பாதிக்கப்பட்ட மக்கள் மீளக்குடியேறியுள்ள சூழ்நிலையில், யுத்தத்தினால் அழிவடைந்த, சேதமடைந்த வீடுகளைப் புனரமைத்தல் மற்றும் மீள நிர்மாணித்தல் நடவடிக்கைகளைத் துரிதப்படுத்த வேண்டியதன் அவசியத்தை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். குறிப்பாக, எனக்குக் கிடைத்துள்ள தரவுகளின்படி, யுத்த சூழ்நிலையாலும் மற்றும் பல்வேறு நிகழ்வுகளினாலும் முல்லைத்தீவு மாவட்டத்திலே 26,800 வீடுகளும் கிளிநொச்சி மாவட்டத்திலே 35,825 வீடுகளும் யாழ். மாவட்டத்திலே 54,786 வீடுகளும் சேதமடைந்துள்ளன. இதில் முல்லைத்தீவு மாவட்டத்தில் 7,581 வீடுகளும் கிளிநொச்சி மாவட்டத்தில் 8,990 வீடுகளும் யாழ். மாவட்டத்தில் 31,350 வீடுகளும் தற்பொழுது நிர்மாணிக்கப்பட்டுள்ளன. முல்லைத்தீவு மாவட்டத்தில் 18,868 வீடுகளும் கிளிநொச்சி மாவட்டத்தில் 18,900 வீடுகளும் யாழ். மாவட்டத்தில் வீடற்றவர்கள் உட்பட 60,842 வீடுகளும் மேலும் தேவையென இனங்காணப்பட்டுள்ளது. ஏனைய மாவட்டங்களுடன் ஒப்பிடும்பொழுது, வட மாகாணத்தின் வீட்டுத் தேவையானது அதிகமாக உள்ளதென்பதை இப்புள்ளிவிபரங்கள் எடுத்துக்காட்டுகின்றன. எனவே, இதற்குரிய நடவடிக்கைகளைத் துரிதப்படுத்த வேண்டுமென்று வலியுறுத்துகின்றேன்.

யுத்தத்தினால் பாதிக்கப்பட்ட மக்களுக்கு வீடுகள் கட்டிக்கொடுக்கப்படும் என அரசு உறுதியளித்தது. அதனடிப்படையில், 18 மாதங்களுக்கு முன்னர், இந்தியப் பிரதமர் அவர்கள் மேதகு ஜனாதிபதி அவர்களிடம் 50,000 வீடுகளை நன்கொடையாகத் தருவதாக கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களின் முன்னிலையில் உறுதியளித்திருந்தார். அவ்வீட்டுத் திட்டத்தினை நடைமுறைப்படுத்துவதில் ஏற்படுத்தப்பட்ட காலதாமதம்தான் இன்று வடக்கிலே வீடில்லாப் பிரச்சினை அதிகமாக இருப்பதற்குக் காரணமென்பதை எல்லோரும் ஏற்றுக்கொள்வார்கள். அந்தத் தாமதத்துக்குப் பல்வேறு காரணங்கள் குறிப்பிடப்படுகின்றன. முதலில் இந்திய அரசு அந்த வீடுகளை ஒப்பந்தக்காரார்களூடாக நிர்மாணித்துப் பயனாளிகளுக்குக் கொடுப்பதாகத் தெரிவிக்கப்பட்டது. எனினும், பல்வேறு பேச்சுவார்த்தைகள், மற்றும் நீண்டகால கலந்துரையாடல்களுக்குப் பிறகு தற்பொழுது இந்திய அரசு பயனாளிகளிடம் மூன்று கட்டமாக அந்நிதியைக் கையளித்து, வீடுகளை நிர்மாணிப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்வதென முடிவெடுத்துள்ளது. நான் நினைக்கின்றேன், சென்ற கிழமைதான் இந்திய அரசினுடைய மந்திரி சபையிலே இவ்வீட்டுத் திட்டத்துக்கு அங்கீகாரம் கிடைத்திருக்கின்றது என்று. இதில் ஏற்பட்ட காலதாமதத்துக்காகப் பல அரசியல்வாதிகள் பல்வேறு அரசியல் காரணங்களை வைத்து இலங்கை அரசைக் குற்றம் சாட்டினார்கள். அதில் எந்தவித

உண்மையும் இல்லை என்பதை நிஜங்கள் நிரூபித்திருக்கின்றன. மக்கள் மிகவும் எதிர்பார்ப்புடன் இருக்கின்ற இந்திய அரசின் 50,000 வீடுகளை அமைக்கும் திட்டத்தினை விரைவுபடுத்துவதன்மூலம் வீடில்லாப் பிரச்சினையைக் கணிசமான அளவு தீர்க்கக்கூடிய வாய்ப்பு இருக்கின்றது. தற்போதைய நிலையில் உலக வங்கி, "நேர்ப்" திட்டம், செஞ்சிலுவைச் சங்கம் மற்றும் தேசிய வீடமைப்பு அதிகார சபை என்பவற்றினூடாகவும் ஓரளவு வீடுகள் வழங்கப்பட்டிருக்கின்றபோதிலும், மக்களின் வீட்டுத் தேவை அதிகமாக இருப்பதனால் வீடற்றவர்களின் பிரச்சினை தொடர்ந்தும் பாரிய பிரச்சினையாக இருக்கின்றது.

அதேநேரம், இன்று மீள்குடியேறிய மக்களுக்குத் தற்காலிக வீடுகள் அமைத்துக் கொடுக்கப்பட்டது. ஆனால், ஆறு மாதம் அல்லது ஒன்பது மாதம் தற்காலிகமாக வசிப்பதற்கு என்ற அடிப்படையில் அமைக்கப்பட்ட அந்தத் தற்காலிக வீடுகளில் மக்கள் இரண்டரை வருடத்துக்கும் மேலாக இருக்க வேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இலங்கை அரசாங்கம் ஆறு வருடத்துக்குள் பத்து இலட்சம் வீடுகளை நிர்மாணிப்பது என்ற 'மஹிந்த சிந்தனை' அடிப்படையிலான வீட்டுத் திட்டத்தின்கீழ் வடக்கு மாகாணத்துக்கும் கிழக்கு மாகாணத்துக்கும் கணிசமான அளவு வீடுகளை ஒதுக்க வேண்டிய கட்டாயம் இன்று உணரப்பட்டிருக்கின்றது. அங்கு வீடற்றவர்களின் எண்ணிக்கையை, இலங்கையில் மொத்தமாக வீடற்றிருப்பவர்களின் எண்ணிக்கையுடன் ஒப்பிடும்போது, அது விகிதாசாரத்தில் அதிகமாக இருப்பதால், பத்து இலட்சம் வீட்டுத் திட்டத்தில் கணிசமான அளவு வீடுகளை வடக்கு, கிழக்குக்கு ஒதுக்க வேண்டிய தேவை உணரப்பட்டிருக்கின்றது. ஆகவே, அரசாங்கம் அதனையிட்டு உரிய நடவடிக்கைகள் எடுக்க வேண்டும்.

அதுபோல, இன்று மத்திய வகுப்பினரின் வீட்டுப் பிரச்சினை மிகப் பெரிய பிரச்சினையாக இருக்கின்றது. ஏனென்றால் இன்றைய மானிய அடிப்படையிலான வீட்டுத் திட்டத்தின்கீழ் வழங்கப்படும் வீடுகளின் பயனாளிகளாக அரச ஊழியர் அல்லது குடும்பத்தில் அரச ஊழியரான ஒருவர்கூடத் தெரிவு செய்யப்படாத நிலை இருக்கின்றது. ஆகவே, அவர்களுக்கு தேசிய வீடமைப்புத் திட்டத்தின்கீழ் வீடுகளை வழங்க வேண்டிய கட்டாயம் இருக்கின்றது என்பதையும் நான் இங்கு வலியுறுத்திக்கூற விரும்புகின்றேன். வீடமைப்புத் திட்டத்தில் ஒருவருக்கு இலகு கடன் அடிப்படையில் ஐந்து இலட்சம் ரூபாய் அளவில் நிதி வழங்குவதற்கு NHDA தீர்மானித்துள்ளது. ஆனால், உண்மையிலேயே இந்த நிதி போதுமானதாக இல்லை. அதேநேரம், இன்று சந்தையில் வீட்டுக் கட்டுமானப் பொருட்களுக்கான விலை மிக அதிகமாக இருக்கின்றது. குறிப்பாக கல், மணல், சீமெந்து, ஓடு போன்ற அவசியமான கட்டிடப் பொருட்களின் விலை இன்று சந்தையில் பன்மடங்காக அதிகரித்திருப்பதால் அந்தக் கடன் எல்லையை தேசிய வீடமைப்பு அதிகார சபை அதிகரிக்க வேண்டும். அதற்கூடாகத்தான் அவர்கள் மேலும் கடன்களைப் பெறாமல் ஒரு முழுமையான வீட்டை நிர்மாணிக்க முடியும் என்பதையும் நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

இந்தக் கட்டிட நிர்மாண நடவடிக்கைகளில் ஈடுபட்டிருக்கின்ற ஒப்பந்தக்காரர்களின் தகைமைகள் தொடர்பாகவும் நான் இந்த அவையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். இந்த அமைச்சின்கீழ் வரும் பொறியியல் நிர்மாண சேவைகள் திணைக்களம் இவர்களைக் கண்காணிக்க வேண்டும். ஏனென்றால், இந்தத் திணைக்களம்தான் கட்டிட நிர்மாண ஒப்பந்தக்காரர்களின் தரங்களை நிர்ணயித்துத் தகைமைச் சான்றிதழ் வழங்குகின்றது. இன்று அரசு கோடிக்கணக்கான நிதியை, குறிப்பாக வடக்கின் அபிவிருத்திக்குப் பல்வேறு கட்டுமானங்களை மேற்கொள்வதற்காக ஒதுக்கியிருக்கின்றது. ஆனால், அதன் உண்மையான பயனை அந்த மக்கள் அடையக்கூடிய நிலைமை ஏற்படுவதற்கு இந்தக் கட்டிட நிர்மாணத் துறையில் சம்பந்தப்பட்டவர்கள் மிகப்பெரும் தடையாக இருக்கின்றார்கள், அல்லது உரிய காலத்துக்குள் மக்கள் பயன் பெறுவதை உறுதிப்படுத்தக்கூடிய சூழலில் அவர்கள் இல்லை. இந்தக் கட்டிட ஒப்பந்தக்காரர்கள் குறைந்த மதிப்பீட்டைக் காட்டி open tenders க்கு ஊடாகக் குறித்த ஒப்பந்தத்தை இலகுவாகப் பெறுகின்றார்கள். இருந்தபோதிலும் அவர்களால் அதை உரிய காலத்திற்குள் நிர்மாணித்துத் தர முடிவதில்லை. இதனால் மக்கள் பயன்பெறுவது அநியாயமாகத் தடைப்படுகின்றது. ஆகவே, இன்று குறிப்பாக, வடக்கிலே நிர்மாணப் பணிகளில் ஈடுபட்டிருக்கும் ஒப்பந்தக்காரர்களின் தரங்கள் நிர்ணயிக்கப்பட வேண்டும். அவர்கள் குறித்த தரங்களுக்கு அப்பாற்பட்டவர்களாக இருந்தால், அவர்களைக் குறித்த ஒப்பந்தத்தில் இருந்து நீக்குவதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டும். அதுமட்டுமல்ல, இந்தத்துறை சார்ந்த அதிகாரிகள், குறிப்பாகத் தொழில்நுட்ப உத்தியோகத்தர்கள் மற்றும் பொறியியல்துறை அதிகாரிகள் ஆகியோருக்கும் இந்த ஒப்பந்தக்காரர்களுக்கும் இடையில் இருக்கக்கூடிய நெருக்கங்கள், மோசடிகள் இடம்பெறுவதற்கு வழிவகுக்கின்றன. அதுமட்டுமல்ல, ஒதுக்கிய நிதிக்குரிய ஒரு கட்டிடத்தின் உண்மையான தரத்தை உறுதிப்படுத்துவதற்கும் அது தடையாக இருக்கின்றது. ஆகவே, முறையாக அவை கண்காணிப்புச் செய்யப்பட வேண்டுமென்பதை நான் இச்சந்தர்ப்பத்திலே வலியுறுத்திக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சு தொடர்பாகவும் ஒருசில விடயங்களை நான் குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக, கடற்றொழிலாளர்கள் தங்களுடைய தொழில் தேவைகளுக்காக நீண்ட தூரம் சென்று எரிபொருளைக் கொள்வனவு செய்யவேண்டிய கட்டாயம் இருப்பதால், கடலோரங்களில், தொழில் மையங்களை அண்மித்த பகுதிகளில் பெற்றோல் நிரப்பும் நிலையங்களை அமைக்கவேண்டியது அவசியமாகும். குறிப்பாக, இலுப்பைக்கடவை, நாச்சிக்குடா, பளை, வடமராட்சி கிழக்கு, முல்லைத்தீவு, புதுக்குடியிருப்பு, தருமபுரம், வட்டக்கச்சி போன்ற பகுதிகளில் விவசாயிகள் மற்றும் கடற்றொழிலாளர்களின் நன்மை கருதி எரிபொருள் நிரப்பும் நிலையங்களைத் திறக்க வேண்டும். கடந்த யுத்த காலத்தில் எப்படி எரிபொருட்களைப் போத்தல்களில் நிரப்பி விற்றார்களோ அதேபோன்றுதான் இன்றும் அங்கு கடைகளில் எரிபொருளை விற்கின்றார்கள். ஆகவே, அந்த நிலைமையை மாற்றும்வகையில் அத்தகைய பகுதிகளில் எரிபொருள் நிலையங்களை அமைப்பதற்கு அமைச்சு உரிய நடவடிக்கையெடுக்க வேண்டும்.

கௌரவ உறுப்பினர் சிறீதரன் அவர்களால் குறிப்பிடப்பட்ட ஒரு விடயத்திற்கு நான் பதில் சொல்ல வேண்டும். அதாவது, தேர்தல் காலங்களில் மின்கம்பங்கள் கொண்டுவந்து இறக்கப்பட்டு, பிறகு திரும்பவும் அவை ஏற்றப்பட்டன என்ற அவரின் கூற்றை நான் மறுக்கின்றேன். கிளிநொச்சி மாவட்டத்தில் அப்படியான ஒரு நிகழ்வு நடைபெறவில்லை. மின்கம்பங்கள் நாட்டப்பட்டதென்பது உண்மை. துரதிஷ்டவசமாக cable போன்ற தேவையான ஏனைய உபகரணங்களைக் கொள்வனவு செய்வதிலே ஏற்பட்ட தாமதம் காரணமாகத்தான் மின்னிணைப்பை விரைவுபடுத்த முடியவில்லை. வெகு விரைவில் அக்குறைபாடு சீர்செய்யப்படுமென்பதைக் குறிப்பிட விரும்புகிறேன்.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar )
இங்கு நான் ஒழுங்குவிதிகளுக்குப் புறம்பாக ஒன்றும் சொல்லவில்லை. எனவே, point of Order எழுப்புவதற்கான விடயமொன்றல்ல இது. நீங்கள் பொய்யுரைக்காதீர்கள்!

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
There is a point of Order being raised by the Hon. S. Shritharan.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்தில் மின்கம்பங்கள் இறக்கப்பட்டு மீளவும் ஏற்றப்பட்ட இடங்களை ஆதாரபூர்வமாக எங்களால் நிரூபிக்க முடியும். கௌரவ உறுப்பினர் அவர்களே, தேர்தல் காலங்களில் மின்கம்பங்கள் இறக்குவதையும் பின்னர் ஏற்றுவதையும் தவிர்த்துக் கொள்ளுங்கள். நீங்கள் அரச தரப்புப் பிரதிநிதியாக இருக்கலாம். ஆனால்-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
That is not a point of Order.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar )
கௌரவ தவிசாளர் அவர்களே, மின்கம்பங்கள் திரும்பவும் ஏற்றப்பட்டதென்பது பொய்யான தகவல். அதை ஆதாரபூர்வமாக நிரூபிக்கும்போது உரிய நடவடிக்கை யெடுக்குமாறு நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்வேன். அப்படி நடந்ததாக இதுவரை தெரியவில்லை. கௌரவ உறுப்பினர் அவர்கள் மீள்குடியேற்றம் செய்யப்பட்ட இந்த மாவட்டத்திலே ஏற்படுத்தப்பட்ட முன்னேற்றங்கள் பற்றிச் சொல்லலாம், குறைகளையும் சுட்டிக்காட்டலாம்; அதை நான் ஏற்றுக்கொள்கின்றேன். ஆனால், அவர் ஒரு முன்னேற்றமும் அங்கு நடக்கவில்லையென்று பொய்யுரைத்து பத்திரிகைகளில் தலைப்புச் செய்தி வருவதற்கு இடமளிக்க வேண்டாமென்றும், பத்திரிகைகளில் செய்தி வரவேண்டுமென்பதற்காக அபாண்டமாகப் பொய்யுரைக்கக்கூடாதென்றும் கூறி, விடைபெறுகின்றேன்.

[පූ.භා. 11.02]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු සභාපතිතුමනි, අද අප සාකච්ඡා කරන අමාත්‍යාංශය -ඒ වැය ශීර්ෂ- මේ රටේ ජන ජීවිතයට විශාල වශයෙන් බලපාන අමාත්‍යාංශයක්. මෙහිදී මගේ මතකයට එන්නේ මේ අමාත්‍යාංශයේ තිබුණු ස්වර්ණමය යුගය. රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාල පරිච්ඡේදයේදී නිවාස, ඉදි කිරීම් අමාත්‍යාංශය කියලා කියන්නේ ජනතා ආකර්ෂණය වැඩිපුරම දිනා ගත්ත අමාත්‍යාංශයටයි. ඒ ජනතා ආකර්ෂණය දිනා ගත්ත අමාත්‍යාංශය යටතේ එතුමා මේ රටේ හිසට වහලක් නැති ජනතාව වෙනුවෙන් අතිමහත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න විවිධ ආකාරයෙන් පියවර ගත්තා. ඒවායේ ප්‍රතිඵල හැටියට මේ රටේ ලක්ෂ ගණනක් මහ ජනතාවට තමන්ගේ හිසට වහලක් ලැබීමෙන් ඒ සැනසීම ලබා ගන්න අවකාශය ලැබුණා. ගරු සභාපතිතුමනි, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ නිවාස ඇමතිවරයා හැටියට එදා මැතිවරණ නිවාස යෝජනා ක්‍රම ආරම්භ කරපු හැටි මට මතකයි. ඒ වාගේම නිවාස දස ලක්ෂයේ ව්‍යාපාරය, නිවාස ලක්ෂයේ ව්‍යාපාරය, උදාගම් වැඩසටහන්, ගම් උදා ව්‍යාපාරය, නිවාස පහළොස් ලක්ෂයේ ව්‍යාපාරය වැනි ජාතික තලයේ මහා පරිමාණ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරලා එතුමා එදා මේ රටේ ජනතාවට මහා විශාල මෙහෙවරක් ඉටු කළා. මේවා කරන කොට සමහර වෙලාවල, ගම් උදා ව්‍යාපාරය එහෙම කරන කොට විවිධ ආකාරයෙන් එදා එය විවේචනයට ලක් කරපු ආකාරය මට මතකයි. ඒ වාගේම එය සැණකෙළියක් කියලා හැඳින්වූවා. හැබැයි ගම් උදා ව්‍යාපාරය තුළින් කරපු ඒ වැඩ කොටස තමයි අදත් මේ රටේ නිවාස වැඩ පිළිවෙළ සිහි ගන්වන්න පළාත්වල තිබෙන ඓතිහාසික උරුමයන් කියලා මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මේ වැඩ පිළිවෙළ කොයි ආණ්ඩුවෙන් ආරම්භ කළත්, කොයි ආණ්ඩුවෙන් කෙරුවත් ඒවා ජනතාවට යහපතක් වෙන දේවල්. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ගම් උදා ව්‍යාපාරය ප්‍රේමදාස ජනාධිපතිතුමා ආරම්භ කෙරුවත් මේ මහා ගම් උදාව යටතේ ඇති කරපු ඒ ගම් උදා ස්ථාන -විශේෂයෙන්ම ඒ ගම් උදා ගම්මාන- අද හුදකලා වෙන්න ඇරලා තිබෙනවා. ඒවායේ නඩත්තු කටයුතු කරන්නේ නැහැ. නිවාස වැඩ පිළිවෙළවල්වල අද ඒ නිසි නඩත්තුව සිදු වන්නේ නැහැ. එදා විශේෂයෙන්ම ගම් උදා ව්‍යාපාරයේ සංවත්සර ගම් උදා උත්සව තියන කොට, ඒ යොදා ගත්ත ගම් උදා භූමි හැම වෙලාවකම වෙනත් වැඩ කටයුතු සඳහා යොදා ගැනීමේ අරමුණ ඇතිව තමයි ඒවා ආරම්භ කළේ. උදාහරණයක් හැටියට මට පල්ලෙකැලේ ගම් උදා භූමිය ගැන කියන්න පුළුවන්. මහනුවර පල්ලෙකැලේ ගම් උදා සංවත්සර උත්සවය පැවැත්වූවාට පස්සේ, ඒ ගම් උදා භූමිය නැවත ඒ පළාතේ ප්‍රධාන පරිපාලන කේන්ද්‍රය බවට පරිවර්තනය කෙරුවා. පළාත් සභාව ඒක ඇතුළේ පිහිටෙව්වා.

අද ඒ ගම් උදා භූමිය ඇතුළේ මහනුවර කච්චේරියේ පරිපාලන කේන්ද්‍රය බිහි වෙලා තිබෙනවා. මෙවැනි ආකාරයට තමයි එදා ගම්උදා භූමි පරිවර්තනය කළේ. එක් ඉලක්කයක් මත ගම් උදා වැඩ පිළිවෙළ කරන අතරතුර අනෙක් පැත්තෙන් සමාජ ප්‍රතිලාභ ලබා දීම සඳහා ජාතික මට්ටමේ ක්‍රියාවලියකට අවතීර්ණ වීම සිදු වුණා. මිහින්තලේ ගම් උදාව හදලා රජ රට විශ්වවිද්‍යාලය ඒක ඇතුළේ බිහි කළා. ඒ විතරක් නොවෙයි, දඹුල්ලේ ගම් උදාව හැදුවා. දඹුල්ල මහා ගම් උදා භූමියේ අභ්‍යන්තර ගොඩනැඟිලි පරිපාලන මධ්‍යස්ථානයක් සඳහා යොදා ගත්තා. මොනරාගල-බුත්තල ගම්උදාව හදලා, ඌව විශ්වවිද්‍යාලය ඒක ඇතුළේ පිහිටෙව්වා. මේ වාගේ තමයි ගම් උදා භූමි පිහිටුවූ හැම තැනකම, එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා ඒ වැඩ පිළිවෙළ ජනතාවට ළං කළේ.

මා අහන්නේ, "අද මේ නිවාස වැඩ පිළිවෙළට දීලා තිබෙන දායකත්වය මොකක්ද?" කියලායි.

විශේෂයෙන්ම මේ අය වැය ලේඛනයෙන් නිවාස වැඩ පිළිවෙළ සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. 2012 අය වැය කථාවට එන්න ඉස්සර වෙලා, 2009 අය වැය ගැන මා කියන්න කැමැතියි. 2009 අය වැයේ 23වැනි පිටුවේ නිවාස ශීර්ෂය යටතේ සඳහන් කර තිබෙනවා, ඒක පුද්ගල ආදායම ඩොලර් 4,000ක් වන විට සෑම පවුලකටම හොඳ නිවාසයක් ලබා

දීමට මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ කටයුතු කරනවාය කියලා. නමුත් 2009 දී ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න නිවාස 6,00,000ක් ඉදිකිරීමට පියවර ගන්නවාය කියලා අය වැය ලේඛනයෙන් ප්‍රතිඥා දුන්නා. එහි ප්‍රගතිය නැහැ. ඒ විතරක් නොවෙයි, 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ 10වැනි පිටුවේ, නිවාස ශීර්ෂය යටතේ සඳහන් කරලා තිබෙනවා, ඉදිරි වසර හයක කාලය තුළ නිවාස දස ලක්ෂයක් ඉදිකරන්නට වැඩ පිළිවෙළ යොදනවා කියලා. ඊට අමතරව එයට ඇතුළත් කරලා මුඩුක්කු හා පැල්පත් නිවාස 70,000ක්, ග්‍රාමීය වතු නිවාස 80,000ක් ඉදිකරන්නට පියවර ගන්නවාය කියලා තිබෙනවා.

දැන් 2012 වර්ෂය සඳහා වන අය වැය ලේඛනයේත් ඒ වාගේ කියලා තිබෙනවා. 2012 දී නාගරික පැල්පත් වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා තට්ටු නිවාස 50,000ක්, වැවිලි ප්‍රදේශවල සහ අර්ධ නාගරික ප්‍රදේශවල නිවාස 50,000ක් හදන්න ආධාර දෙනවාය කියලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සංඛ්‍යා ලේඛන සාර්ථක වෙලා නැහැ කියලා ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ. මේක මම කිව්වොත්, ඒ දේශපාලන වශයෙන් කියලා හිතනවා.

නමුත් මේ විෂය භාර ඇමතිතුමා හැටියට අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමා 2011 දෙසැම්බර් මාසයේ 08වැනි දා "ලංකාදීප" පත්‍රයට ප්‍රකාශයක් කර තිබෙනවා. එතුමා "ජන සෙවණ" නිවාස දස ලක්ෂයේ වැඩ පිළිවෙළ ගැන ප්‍රකාශයක් කරලා තිබුණා. ඒකේ කියනවා, මේ ඉලක්ක සම්පූර්ණ වෙලා නැති බව. එතුමා කියනවා, "ස්ථිර නිවසක් නොමැති පවුල් ලක්ෂ 15ක් පමණ දිවයින පුරා සිටිනවා" කියලා. 2011 වසරේ දී නිවාස 25,000ක්, 2010 වසරේ දී නිවාස 6,547ක්, 2009 වසරේ දී නිවාස 6,389ක් ඉදි කරලා තිබෙනවා කියලා එතුමා කියනවා. එතකොට දැන් මේ අය වැය මඟින් දුන්නු ඒ පොරොන්දු සහ ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට අවකාශය ලැබිලා නැහැ.

ගරු සභාපතිතුමනි, දැන් මේ අවුරුද්දේ 2012 දී තට්ටු නිවාස 50,000ක් ඉදි කරන්නටත්, ඒ වාගේම වැවිලි ප්‍රදේශවල සහ අර්ධ නාගරික ප්‍රදේශවල නිවාස 50,000ක් හදන්න විශේෂ ණය යෝජනා ක්‍රමයක් යටතේ දායකත්වය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා කියා සඳහන් වනවා. ඒ වාගේම නිවාස පහසුකම් ලබා ගැනීමට උනන්දු නොවෙන පිරිස් සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කිරීමට රුපියල් මිලියන 500කුත් වෙන් කරලා තිබෙනවා. මේ අය වැයෙන් වෙන් කරලා තිබෙන මේ මුදල ගණනය කරලා බැලුවොත්, එක නිවසකට වෙන් කර තිබෙන මුදල කොච්චරද? අඩු ගණනේ තට්ටු නිවාස 50,000ක් විතරයි ඉදි කරන්නේ කියලා කිව්වත්, එක නිවසකට රුපියල් 10,000යි. මේ ලක්ෂයම අරගෙන බැලුවත් මේකෙන් හදන්න පුළුවන් වන නිවාස ප්‍රමාණය කොච්චරද? දස ලක්ෂයක ඉලක්කයක් සැලසුම් කරනවා නම්, ඒ සැලසුම කරන්න අඩුම ගණනේ අවුරුද්දකට නිශ්චිත වශයෙන් ගෙවල් 1,66,000ක්වත් ඉදි වන්නට ඕනෑ. ඒ ඉලක්කයට යන්නට බැහැ. අවුරුදු හයකින් හදනවා නම් ඒ ඉලක්කය බෙදලා, ඒ සඳහා ජාතික අය වැයෙන් මුදල් වෙන් වන්නට ඕනෑ. එහෙම වෙලා නැහැ.

දැන් බලන්න, නිවාස වාගේ ජාතික වැඩ පිළිවෙළකට, ඒ වාගේම නිවාස වාගේ මහ ජනතාවට බැඳුණු වැඩ පිළිවෙළකට රුපියල් මිලියන 500ක් වෙන් කරනකොට, පසු ගිය අවුරුද්දේ "මිහින් එයාර්" ආයතනයේ පාඩුව පියවා ගන්න රුපියල් මිලියන 6,000ක් දුන්නා. ඒ විතරක් නොවෙයි, මෙවර "ශ්‍රීලන්කන්" ගුවන් සේවය "මිහින් එයාර්" සමඟ ඒකාබද්ධ කරන්න ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා. හැබැයි, රටේ ජාතික අවශ්‍යතාවක් වන මේ මහ ජනතාවගේ හිසට වහලක් දෙන්න, රුපියල් මිලියන 500ක් වෙන් කිරීමෙන් මේ වැඩ පිළිවෙළ මන්දගාමී කරන්න තමයි මේ ක්‍රියා කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ නිවාස වැඩ පිළිවෙළට වෙන් කරන සල්ලි ප්‍රමාණය මෙහෙම අඩු කරනකොට අනෙක් පැත්තෙන් මොකක්ද වෙලා තිබෙන්නේ? බලන්න, අඩු ගණනේ රජය මේ විශාල නාස්තිය අඩු කර ගන්නට ක්‍රියා කරනවාද කියලා. "හෙජින්" ගිවිසුමෙන් රුපියල් මිලියන 16,000ක් පාඩු සිදු වුණා. අඩු ගණනේ මේකෙන් රුපියල් මිලියන 1,000ක් එකතු කර ගන්නට පුළුවන් වුණා නම් මේ නිවාස ඉලක්කවලට යන්නට පුළුවන්. "හෙජින්" ගිවිසුමෙන් ඒ පාඩු වුණු රුපියල් මිලියන 16,000 අය කර ගැනීම ගැන, ඒකට වග කිව යුත්තන් ගැන කිසිම ක්‍රියා මාර්ගයක් නැහැ. තමුන්නාන්සේ දන්නවා, බාල පෙට්‍රල් ගෙනැල්ලා පසු ගිය කාලයේ මහා කථා බහක් තිබුණු බව. ඒකෙන් රුපියල් මිලියන 400ක පාඩුවක් සිදු වුණා. ඒ ගැන පසු ගිය කාලයේ පාර්ලිමේන්තුවේ නොයෙක් කථා කිව්වා. හැබැයි රුපියල් මිලියන 400ක පාඩුවක් වුණත් අදටත් ඒ ගැන කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ.

ගරු සභාපතිතුමනි, COPE එක ඉදිරිපත් කළ වාර්තාවක නිවාස අධිකාරිය පාඩු ලබන ආයතනයක් හැටියට සඳහන් කර තිබුණා මම දැක්කා. එක පැත්තකින් නිවාස අධිකාරියේ මේ පාඩුව කොයි විදියටද සිදු වෙලා තිබෙන්නේ කියන කාරණය විමර්ශනය කරනවාට වඩා මේ ආයතනය ජනතාවට සමීප ආයතනයක් හැටියට ක්‍රියා කරනවා නම් ඒ සඳහා ලබා දිය යුතු සහාය සහ උදව්ව ලබා දිය යුතුයි. එහෙම නැතිව මේ ගැන යම් කිසි මන්දෝත්සාහී බවක් ඇති කරන්න ක්‍රියා කිරීමෙන් අපේ ඉලක්කවලට යන්න බැහැ.

ගරු සභාපතිතුමනි, දැන් අනෙක් පැත්තට වෙලා තිබෙන දේ බලන්න. විශේෂයෙන්ම අද ආණ්ඩුවේ ගනුදෙනු ගැන තිබෙන මහා පරිමාණ දූෂණ පොඩ්ඩක් හරි අඩු කර ගන්න පුළුවන් වුණා නම් මේ දූෂිත ගනුදෙනු මාර්ගයෙන් ඉතිරි කර ගන්න මුදල් නිවාස සංවර්ධනය වාගේ ව්‍යාපාරවලට යොදවන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මම එක උදාහරණයක් කියන්න කැමැතියි. සේවක අර්ථ සාධක අරමුදලේ මහා විශාල වත්කම් ප්‍රමාණයක් තිබෙනවා. මේක ආණ්ඩුවේ මුදලක් නොවෙයි. මේක වැඩ කරන ජනතාවගේ මුදලක්. ගිණුම්ගත වත්කම්වලට අනුව රුපියල් බිලියන 1,050ක් තිබෙනවා. මේක රජයට අයිති නැහැ. වැඩ කරන ජනතාවටයි අයිතිය තිබෙන්නේ. 2011 අවුරුද්දේදී මේ අරමුදලෙන් සියයට 83ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරලා තිබෙනවා. ඒක සම්ප්‍රදායක් හැටියට තිබෙනවා. සියයට 10ක් ආණ්ඩුව ණය අර ගෙන තිබෙනවා. සියයට 7ක් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරලා තිබෙනවා. මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමවත්, ආණ්ඩුව ණය ගැනීමවත් නොවෙයි ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, සියයට 7ක් කියන්නේ මුළු වත්කම් ප්‍රමාණයෙන් බිලියන 75ක්. මේ රුපියල් බිලියන 75ක මුදල ආයෝජනය කරලා අද සේවක අර්ථ සාධක අරමුදල මහා අලාභයක් -රුපියල් මිලියන 1,300ක අලාභයක්- ලබලා තිබෙනවා. මේ රුපියල් මිලියන 1,300 ඉතිරි කර ගන්න පුළුවන් වුණා නම් විමල් වීරවංශ ඇමතිතුමාගේ නිවාස වැඩ පිළිවෙළට කොපමණ මුදලක් එකතු වෙනවාද? මේ වාගේ දෙගුණයක් වැඩ කරන්න තිබුණා; තුන් ගුණයක් වැඩ කරන්න තිබුණා. ඒ විතරක් නොවෙයි සේවකයන්ගේ අරමුදල් මේ ආකාරයෙන් වැරදි විදියට පරිහරණය කරමින් සේවක අර්ථ සාධක අරමුදලට මේ විදියට පාඩු සිදු කරන විට ඒවා පිළිබඳව කිසි වග කිව යුත්තෙක් නැහැ. සේවකයන්ගේ අරමුදල් සේවකයන් පඩියෙන් කපලා යවනවා. ඒවා ආයෝජනය කිරීම පිළිබඳව උපදේශක කමිටුවක් තිබෙනවා. උපදේශක කමිටුව වාගේම මහ බැංකුවට විශාල වග කීමක් තිබෙනවා. හැබැයි මහ බැංකුවට තිබෙන ඒ විශාල වගකීම ඉෂ්ට වෙලා නැති බව තමයි මේකෙන් පේන්නේ. මේක සේවක අරමුදල් මං කොල්ල කෑමක් හැටියට අපට පේනවා.

[ගරු තිස්ස අත්තනායක මහතා]

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම දැන ගැනීම සඳහා මේ එක ගනුදෙනුවක් ගැන මම කියන්නට කැමැතියි. ආයතන විශාල සංඛ්‍යාවක EPF මුදල් ආයෝජනය කර තිබෙනවා. මේ අතර, විශේෂයෙන්ම 2010 වර්ෂයේ අවසන් කාර්තුවේදී ආයෝජනය කර තිබෙන එක ව්‍යාපෘතියක් ගැන මම කියන්න කැමතියි. 2011 දී මේ මුදල් සියයට 10ක් ලාෆ් සමාගමේ ආයෝජනය කර තිබෙනවා. ලාෆ් සමාගමේ ආයෝජනය කරනකොට එක කොටසක් රුපියල් 48කට තමයි ගණනය කළේ. මේ ගණනය කිරීමට අනුව, EPF අරමුදලේ මිලියන 1,800ක් මේ ගනුදෙනුව සඳහා යෙදෙව්වා. ඒ යොදවන දිනයේ උදේ කොටසක මිල තිබුණේ රුපියල් 38ට. උදේ 11ට මේ කොටස් ගනුදෙනුව වෙනකොට කොටසක මිල රුපියල් 48ක් වුණා. හැබැයි, මේ ගනුදෙනුව අවසන් වෙලා පැයක් යනකොට කොටසක මිල රුපියල් 40ට අඩු වුණා. පැයක් ඇතුළත කොටසක මිල රුපියල් 8කින් අඩු වෙලා. කොටසක් ගන්නකොට රුපියල් 48 දක්වා වැඩි වෙලා. මේකෙන් සිදු වුණු පාඩුව විතරක් රුපියල් මිලියන 350යි. මේ මිලියන 350 ඉතිරි කර ගත්තා නම් මේ රටේ වැඩ කරන ජනතාවගේ නිවාස යෝජනා ක්‍රමයක් වෙනුවෙන්, Budget එකෙන් දුන්නා හා සමාන මුදලක් යොදවන්න තිබුණා. මෙවැනි අපරාධ රාජ්‍ය ආයතනවල සිදු වුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, COPE වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු කුණු බක්කියකට දාන්නේ නැතිව, රාජ්‍ය ආයතනවල සිදු වන දූෂණය නාස්තිය වළක්වා ගන්නට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා බොහොම වැදගත් කාරණා දෙකක් පෙන්වා දුන්නා. එකක් තමයි රාජ්‍ය ආයතන මූල්‍ය රෙගුලාසි නොසලකා හැරීම. අනෙක, විගණකාධිපතිවරයාගේ නියෝග සහ උපදෙස් පිළිනොපැදීම වාගේම,දේශපාලන ඇඟිලි ගැසීම් හා බලපෑම් නිසා මේ වැරදි රාජ්‍ය ආයතනවල සිදු වෙනවාය කියා එතුමා කිව්වා. මේ රාජ්‍ය ආයතනවල තිබෙන දූෂණ පෙන්වා දුන් පළමුවන COPE වාර්තාව නොවෙයි මේක. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මීට පෙර වාර්තාවක් ඉදිරිපත් කළා. ඊටත් පෙර තවත් වාර්තා ගණනාවක් ඉදිරිපත් වෙලා තිබුණා. ගරු ඩිව් ගුණසේකර මැතිතුමා පෙන්වා දී තිබෙන ඉතාම වැදගත් කාරණා කුණු කූඩයට දාන්නේ නැතිව, මේ නාස්තියට දූෂණයට වගකියන නිලධාරින්ට විරුද්ධව පියවර ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ. භා. 11.15]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු සභාපතිතුමනි, මම මේ අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව කරුණු පැහැදිලි කරන්නට ප්‍රථම COPE අනුකාරක සභාවේ සභාපතිවරයකු විධියට මේ කාරණය කියන්න ඕනෑ. දේශපාලන ඇඟිලි ගැසීම් නිසා ඒ ආයතන පාඩු ලබනවා කියලා ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා කිව්වාය කියලා ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එහෙම වචනයක් කිසිදු වාර්තාවකවත්, වාචිකවවත්, වෙනත් මොනම ආකාරයකින්වත් සඳහන් කරලා නැහැ. විශේෂයෙන් ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ COPE එකේ මේ සියලුම ආයතන කැඳවන්නේ අපට මේ ආයතන හදා ගන්නට ඕනෑ නිසායි. ඒ වාගේම එළි දැක් වූ වාර්තාවෙන් පාඩු ලබනවාය කියන නිවාස අධිකාරිය ලාභ ලබන්න නොවෙයි තිබෙන්නේ.

පාඩු ලබන ආයතන පිළිබඳව ඉතාම හොඳ විග්‍රහයක් ඊළඟ වාර්තාවේ තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය වෙන්න පුළුවන්, ලංගමය වෙන්න පුළුවන්, නිවාස අධිකාරිය වෙන්න පුළුවන් මේවායේ කටයුතුවල කාර්යක්ෂමතාව තවත් වැඩි කර ගැනීම පිළිබඳවයි අපි කරුණු පෙන්වා දී තිබෙන්නේ. අපි කරුණු 22ක් පෙන්නුවා. ඒ ආයතන හදා ගෙන ඒවා මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම තමයි අපේ කාර්ය භාරය කියන එක, ඒ සඳහා තමයි අපි ඒ කටයුතු කරන්නේ කියන එක ඉතාම වග කීමකින් යුතුව සඳහන් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අද මෙම අමාත්‍යාංශය යටතේ මට පෙර කථා කරපු මන්ත්‍රීවරුන්ගේ කථා ඇහුවාම මට එක වෙලාවක හිතුණා, අද ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ ශෝක යෝජනාව ගෙනෙන දවසද කියලා. එතුමා කරපු සේවය අපි අගයනවා. එතුමා විතරක් නොවෙයි, පීටර් කේනමන් ඇමතිතුමාගේ පටන් හිටපු සියලුම නිවාස අමාත්‍යවරු මේ ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කළා. අපි ඒක කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් සජිත් ප්‍රේමදාස මහත්මයා කථා කරන කොට ඇමතිවරයකුට උත්තරයක් දෙන්නවත් ඉඩ දෙන්නේ නැහැ. එතුමා කථා කරලා යනවා. පිළිතුරක් දෙන වෙලාවට ඇහුම්කන් දෙන්නවත් ඉන්නේ නැහැ. තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාගේත්, ඒ වාගේම සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේත් කථාවලදී කියැවුණා, මේ රටේ නිවාස පිළිබඳ ස්වර්ණමය යුගය ප්‍රේමදාස යුගය කියලා. ඒ සඳහා සංඛ්‍යා ලේඛනත් ඉදිරිපත් කළා. උදාහරණ විධියට කිව්වා, නිවාස දසලක්ෂයේ, නිවාස පහළොස් ලක්ෂයේ සහ නිවාස ලක්ෂයේ ව්‍යාපෘති ගැන. ඒකෙන් කියැවෙන්නේ නිවාස ලක්ෂ 26ක් හැදුවා කියන එකයි. එතුමන්ලා දෙදෙනාගේම කථාවලදී කිව්වේ, නිවාස පිළිබඳ ස්වර්ණමය යුගය ඒ යුගය කියලායි. ඒකට උදාහරණ ලෙස කිව්වේ, නිවාස පහළොස් ලක්ෂයේ, නිවාස දසලක්ෂයේ සහ නිවාස ලක්ෂයේ ව්‍යාපෘති. ඒක සම්පූර්ණ බොරුවක්.

1978 දී හදලා තිබෙන්නේ ගෙවල් 790යි. මේවා නිවාස අධිකාරියේ තිබෙන සංඛ්‍යාලේඛන. ඒ සමස්ත අවුරුදු දහයේම, ඒ ස්වර්ණමය යුගයේම හදලා තිබෙන්නේ -උළු වහු, ජනෙල් දාපු ඒවාත් එක්ක- නිවාස 6,36,202යි. ඒ වාගේම මේ මඟින් තවත් දෙයක් රටට පෙන්වනවා, ඒ නිවාස නිකම් දීපු ඒවා කියලා. නමුත් මේ එක ගෙයක්වත් නිකම් දුන්නේ නැහැ. අදත් ඒ සියලුම ගෙවල්වලට වාරික මුදල් ගෙවනවා. එම නිසා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා පියාගේ අඩි පාරේ යමින් ඉතාම හොඳ සංඛ්‍යා ලේඛන විජ්ජාවක් කරන්න හොඳ පුරුද්දක් ලබලා තිබෙන බව නම් අපට ඉතාම හොඳින් අවබෝධ වෙනවා. එතුමන්ලා අද මේ පාර්ලිමේන්තුවේදී සංඛ්‍යාලේඛන, කරුණු මොන ආකාරයෙන් ඉදිරිපත් කළත්, අපි මොන ආකාරයෙන් කරුණු කිව්වත්, මේවායේ අවසාන තීන්දු තීරණ ගන්නේ ජනතාව. ජනතාව ගන්නා තීන්දුව මනින්න පුළුවන් එකම ක්‍රමය, ඔවුන් මැතිවරණයකදී ලබා දෙන ඡන්දයයි කියන එක අපි නිහතමානීව පිළිගත යුතුව තිබෙනවා.

අපි අතීතයේ කරපු හොඳ වැඩ අගයනවා වාගේම, අමතක කරන්න හොඳ නැහැ අද රටේ තත්ත්වය ඉතාම වෙනස් බව. විපක්ෂයේ අය දැන් දශක එකහමාරකට ආසන්න කාලයක් විපක්ෂයේ හිටියේ. මීට අවුරුදු 15කට පෙර තිබුණු සමාජමය, ආර්ථිකමය, දේශපාලනමය සිතුම් පැතුම් නොවෙයි ජනතාවට අද තිබෙන්නේ. මේ පිළිබඳව විපක්ෂයේ ඔබතුමන්ලාට පැහැදිලි අවබෝධයක් නොමැති බවයි අපට ඉතාම හොඳින් අවබෝධ වන්නේ.

ගරු සභාපතිතුමනි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සිය කථාවේදී, එතුමාගේ පියා එංගලන්තයේ විශ්වවිද්‍යාලයකදී කරපු දේශනයක්

පිළිබඳව, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉදිරිපත් කරපු මතවාදය පිළිබඳව කරුණු කිව්වා. නමුත් බොහොම පැහැදිලිව, සරල ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ කියලා තිබෙන්නේ සෑම පවුලකටම නිවසක් හිමි විය යුතු බවයි. ඒ වාගේම මේ සමස්ත වැඩ පිළිවෙළේ මූලික සංකල්පය වෙලා තිබෙන්නේ පුද්ගලයා ගොඩ නඟලා, පවුල ගොඩ නඟලා, ගම ගොඩ නඟලා, රට ගොඩ නැඟිය යුතුයි කියන එකයි. ඒ සංකල්පය තුළයි මේ සෑම දෙයක්ම කෙරෙන්නේ. ජනාධිපතිතුමා මේ රටේ ජනතාවට කියලා තිබෙන්නේ එයයි.

ගරු සභාපතිතුමනි, අද විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්ගේ කථාවලදී අපි දැක්කා, මහින්ද චින්තන වැඩසටහන පිළිබඳව කරුණු කාරණා විමසනවා. මේ අය වැයකින් කියැවෙන්නේ එක අවුරුද්දක වැඩසටහන විතරයි. ඒ වාගේම මේ මහින්ද චින්තන වැඩසටහන තුළින් කියලා නැහැ, මේ අවුරුද්දේදී, එහෙම නැත්නම් පළමුවැනි අවුරුදු දෙකේදී මේ ඉලක්කයන් සපුරා ගන්නවා කියලා. මේ වැඩසටහන බොහොම පැහැදිලිව අවබෝධ කරගත යුතුයි. ඉදිරි අවුරුදු 10 සඳහා දැක්මක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අනුව අපි ඒ අවුරුදු 10 තුළ මේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය භාරයන් ඉටු කරන බවට ඉතාමත් පැහැදිලිව මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කරනවා වාගේම, අපි ඉතිහාසයේ ඉඳලා ගත්තොත් මේ ක්ෂේත්‍රය සඳහා වැඩිම මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තිබෙන්නේ මේ අය වැයෙන් බව බොහොම පැහැදිලියි. අපට බලන්න පුළුවන්. නිවාස විසිහයලක්ෂයක් හදලා තිබෙනවා නම් බලන්න පුළුවන්. අය වැයෙන් වෙන් කරලා ඇති, සල්ලි වියදම් කරලා තිබෙන්න ඕනෑ. ඒ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. 1978 මෙච්චරයි, 1979 මෙච්චරයි, භාණ්ඩාගාරයෙන් මෙන්න මෙච්චරයි මුදල් වියදම් කරලා තිබෙන්නේ කියලා. එම නිසා අපි බොහොම පැහැදිලිව කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ ක්ෂේත්‍රය සඳහා මෙවර අය වැයෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආරම්භ කළාට පස්සේ වැඩිම නිවාස ප්‍රමාණයක් ඉදි කිරීම සඳහා දායක වුණු අවුරුද්ද මේ අවුරුද්ද කියන එකත් අපි බොහොම පැහැදිලිව වගකීමකින් යුතුව මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. එම නිසා අපි මේ නිවාස ක්ෂේත්‍රය පිළිබඳව අද ඉතාමත් විප්ලවකාරී වෙනසක් ඇති කරමින් ජනතාවගේ සැබෑ අවශ්‍යතාවන් පිළිබඳව අවබෝධ කරගෙන ගරු විමල් වීරවංශ ඇමතිතුමාගේ නායකත්වයෙන් මේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකව ඉටු කරනවා කියන එක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. එතුමාගේ කථාවේදී ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කරයි. එම නිසා අපේ අමාත්‍යාංශය යටතට පැවරෙන කාර්ය භාරය වන්නේ ඉදි කිරීම් ක්ෂේත්‍රය හා නිවාස ක්ෂේත්‍රයයි. ඒ වාගේම මේ අවුරුද්දේ තුන්වැනි කාර්තුව ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉදි කිරීම් ක්ෂේත්‍රය සඳහා සියයට 11.3ක දායකත්වයක් ලබා දුන් වාර්තාගත අවුරුද්දක් වුණා. ඒ වාගේම මේ ක්ෂේත්‍රය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ඒ වාගේම රජයේ කර්මාන්තශාලාව වැනි ආයතන ගණනාවක් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. අද මේ සියලුම ආයතන සෑම අතින්ම ප්‍රගතියක් ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් මීට මාස කිහිපයකට පෙර අපේ රටේ ප්‍රථම වතාවට ජාතික භෞතික සැලැස්මක් එළි දැක්වුවා. ඒක සැලැස්මකට පමණක් සීමා කළේ නැහැ. ව්‍යාපෘති ඇතුළත්ව තමයි මේ ජාතික භෞතික සැලැස්ම අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්න කටයුතු කළේ.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පසු ගිය කාලයේ ලෝක ක්‍රිකට් තරගාවලිය පවත්වන්න කටයුතු කරන කොට විවිධ මතවාදයන් මේ රට තුළ තිබුණා. නමුත් දේශීය ඉංජිනේරුවෝ, දේශීය ශිල්පීන් පාවිච්චි කරලා මේ රටේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ඉදි කිරීමේ භාග්‍ය පසු ගිය කාල සීමාව තුළදී ලබා ගැනීමට කටයුතු කළා.

අද වන විට මහින්ද චින්තන වැඩසටහනින් පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටත්, ඒ වාගේම රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාවටත් මාර්ග කිලෝමීටර් 1,500කට ආසන්න ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ලබා දීලා තිබෙනවා. මුළු රටේම තිබෙන්නේ කිලෝ මීටර් 16,000යි. එයින් කිලෝමීටර් 3,000ක් පමණ සංවර්ධනය වෙලා තිබෙනවා. තවත් කිලෝමීටර්

ලබන අවුරුද්ද අවසාන වන විට මේ කිලෝමීටර් 13,000ම, අපේ රටේ සියලුම රාජ්‍ය ආයතන සම්බන්ධ වෙලා කාපට් යොදා සංවර්ධනය කිරීමේ කටයුත්ත අද ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත් විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ, මේ කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා රුපියල් බිලියන ගණනක් වටිනා සියලුම යන්ත්‍රෝපකරණ අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලට ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව.

පසු ගිය අවුරුදු දෙක-තුන තුළ ISO වැනි -ඉදි කිරීම් ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම ගම්පහ ගුවන් පාලම වැනි ඉදි කිරීම් වෙනුවෙන්- සම්මාන පවා ලබා ගන්නා මට්ටමින් කටයුතු කරන්නට අද රාජ්‍ය නිර්මාණ සහ ඉදිකිරීම් නීතිගත සංස්ථාව, රජයේ කර්මාන්තශාලාව ඇතුළු ඒ ආයතනවල කළමනාකාරිත්වය දක්ෂ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සහාධිපත්‍ය කළමනාකාර අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන පිහිටුවා තිබුණත් මෙතෙක් ඒ ආයතනවල අරමුණු හරියාකාරව ඉටු කර ගන්නට පුළුවන්කමක් ලැබී තිබුණේ නැහැ. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලැබී තිබුණේ නැහැ.

විශේෂයෙන්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු ආදායම් ලබන පවුල්වල ජනතාවගේ ආර්ථික මට්ටම ශක්තිමත් කිරීම සඳහා වන වැඩ පිළිවෙළවල් ඉතිහාසයේ ක්‍රියාත්මක කර තිබුණේ නැහැ. අද වන විට ඒ සියලුම ආයතනවල, නිවාස යෝජනා ක්‍රමවල සමිති සමාගම් පිහිටුවා ඒ අයගේ කලා කුසලතාවන් එළිදැක්වීම සඳහා අවස්ථාවන් ලබා දීලා, ඒ අයගේ ස්වයංරැකියා වැඩසටහන් සඳහා අවශ්‍ය ශක්තිය ලබා දීලා අද ඒ ආයතන විසින් විශාල වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ වාගේම මීට පෙර ගොඩනැඟිලි අයදුම් පත් සඳහා විතරක් තිබුණු සහාධිපත්‍ය කළමනාකාර අධිකාරිය නීතිමය අංශයෙන් පැවරී තිබෙන වගකීම් පවා භාර අරගෙන තිබෙනවා. කොළඹ නගරයට පමණක් සීමා වෙලා තිබුණු සහාධිපත්‍ය කළමනාකාර නිවාස යෝජනා ක්‍රම අද වෙනත් ප්‍රදේශවලට පවා ව්‍යාප්ත වෙලා, සාමාන්‍ය ජනතාවට මිල දී ගන්නට පුළුවන් මට්ටමේ රුපියල් ලක්ෂ දහයේ, දොළහේ මිල ගණන්වලට සහාධිපත්‍ය නිවාස ගම්මාන ඇති කිරීම් යනාදී වැඩසටහන් ගණනාවක් අද වන විට ක්‍රියාත්මක කර තිබෙනවා.

ඉතිහාසයේ සෑම අවස්ථාවකදීම අපේ රටේ නිවාස ක්ෂේත්‍රය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ හුදෙක්ම භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල්වලින් පමණක් නොවෙයි. අද වන විට ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශය යටතේ සමෘද්ධි ව්‍යාපාරය අද ඉතාමත් සාර්ථකව, දිළිඳු ජනතාවට නිවාස ඉදි කිරීමේ කාර්යය ක්‍රියාත්මක කරනවා. මෙවැනි අමාත්‍යාංශ 13ක සාමූහික වග කීමකින් යුතුවයි අද මේ අරමුණ මේ රට තුළ ක්‍රියාත්මක කිරීමට පටන් ගෙන තිබෙන්නේ. එම නිසා මේ සභාවේ අප සියලුම

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

දෙනා වග කීමකින් යුතුව කටයුතු කළ යුතුයි. සංඛ්‍යා ලේඛන විද්‍යාව තුළින් නිවාස ලක්ෂ 26ක් හදා තිබෙනවාය, ස්වර්ණමය යුගය ඒකයි කියා පට්ටපල් බොරු කියා මේ සභාව මුළා කරනවා. එහෙම නම් මේ රටේ අනාගතය පිළිබඳව කල්පනා කරන විට ඒ කියන අය පිළිබඳවත් අප අනිවාර්යයෙන්ම තීන්දු, තීරණ ගත යුතුයි. මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළ නිවාස දස ලක්ෂයේ "ජන සෙවණ" නිවාස වැඩසටහන අපේ ගරු අමාත්‍යතුමාගේ නායකත්වයෙන් අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන්ගේ සහ සියලුම දෙනාගේ සහභාගිත්වයෙන් යුතුව අපි ඉටු කරනවාය කියන එක වග කීමකින් යුතුව සඳහන් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.30]

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

ගරු සභාපතිතුමනි, ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය, අද ගරු විමල් වීරවංශ ඇමතිතුමා සහ ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමාගේ නායකත්වයෙන් ඉතාමත් විධිමත් වැඩ පිළිවෙළක් යටතේ ක්‍රියාත්මක වෙනවාය කියන එක මා ඉතා සතුටින් මතක් කරන්න ඕනෑ.

පසු ගිය කාලයේ ටිකක් නිද්‍රාශීලිව තිබිච්ච නිවාස සංවර්ධන අධිකාරිය ඉතාම ශක්තිමත් පදනමකට ගෙනැල්ලා අද සමස්ත රටේම වැඩ පිළිවෙළක් විධියට පුළුල් පරාසයක් තුළ ක්‍රියාත්මක කරන්න මේ අමාත්‍යාංශය වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඉදිරි කාල සීමාව තුළ අපට විශාල ප්‍රගතියක් අත් පත් කර ගන්න පුළුවන් වෙයි කියලා අපි අපේක්ෂා කරනවා.

අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නිවාස ඉදි කිරීම් සම්බන්ධව බොහොම පැහැදිලි විවරණයක් කෙරුවා. ඒ කථාව අහගෙන ඉන්න කොට මට හිතුණේ රණසිංහ ප්‍රේමදාස ශ්‍රීමතාණන්ගේ ගුණානුස්මරණ උත්සවයක්ද අද මේ සභාවේ තිබෙන්නේ කියලා. මොකද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේ විෂයට අදාළව නොවෙයි හුඟක් කථා කෙරුවේ. එතුමාගේ අභාවප්‍රාප්ත පියාණන් පිළිබඳව තමයි ගුණානුස්මරණයක යෙදුණේ. ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට, ඒ කාලයේ එතුමන්ලා මේක හරියට කළා නම් අපට ඒ තරමම කරන්න වැඩක් ඉතුරු වෙන්නේ නැහැ. 2001 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා. ඒ ආණ්ඩු කාලය, මේ නිවාස ඉදි කිරීම් කෙසේ වෙතත් ගඩොල් කැටයක් තියලා, අඩුම තරමින් සිමෙන්ති ටිකක් දාලා, බැම්මක් බැඳ ගන්න බැරි මට්ටමට තමුන්නාන්සේලා බොහොම දුර්මුඛ වෙච්ච යුගයක්; කාලපරිච්ඡේදයක්. ඒ කාලයේ තමුන්නාන්සේලා-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියමින් හිටියේ මේ අමාත්‍යාංශ විෂය පථය තුළ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළට අනුකූලව, "මහින්ද චින්තන" වැඩ පිළිවෙළට නතුව ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන කොට අද එක්සත් ජාතික පක්ෂයට මේක බලා ගෙන ඉන්න බැරුව, විඳ දරා ගන්න බැරුව ඒ ගොල්ලන්ගේ ඉතිහාසයේ ඉලක්කම් ටිකක් ගෙනැල්ලා මේ සභාව නොමඟ යවලා, අපේ වැඩ පිළිවෙළ අපහසුතාවට පත් කරන්න කටයුතු කරමින් ඉන්නවාය කියන එකයි. හැබැයි ඒ කාලය අපේ කාලය වාගේ නොවෙයි. අපේ ලසන්ත අලගියවන්න මැතිතුමාත් මේ පිළිබඳව කිව්වා. ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විතරක් නොවෙයි, අමාත්‍යාංශ 13ක සාමූහික ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ විවිධ විෂය පථයන් තුළ අද මේ රටේ නිවාස ඉදි කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

සමෘද්ධි අධිකාරිය හරහා එක පැත්තකින් නිවාස හදනවා. අනෙක් පැත්තෙන් තරුණ සේවා සභාව හරහා යෞවන සමාජවලින් කෙරෙනවා. අනෙක් පැත්තෙන් "දැයට කිරුළ" වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම් කටයුතු කෙරෙනවා. වතු කරයේ නිවාස වෙනම ඉදි වෙනවා. ඒ වාගේම ධීවර නිවාස ඉදි වෙනවා. සුනාමි ව්‍යසනයට ලක් වුණු ප්‍රදේශ අලලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. මේ විධියට විවිධ පැතිකඩ ඔස්සේ ඒ වැඩ පිළිවෙළක ක්‍රියාත්මක වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම "උතුරු වසන්තය", "නැඟෙනහිර නවෝදය" වගේ වැඩ පිළිවෙළවල් ඔක්කෝම එක්ක අපේ නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. හැබැයි අපේ නිවාස වැඩ පිළිවෙළයි, සජිත් ප්‍රේමදාස මැතිතුමා කියපු නිවාස වැඩ පිළිවෙළයි අතර හැබැවටම වෙනසක් තිබෙනවා. මොකද ඒ කාලයේ මඩකලපුවේ නිවාස 10ක් විවෘත කෙරුවොත් ඒකේ පෝස්ටරය කොළඹ, ගාල්ල, මාතරට යන කල් වදිනවා. ඒ උත්සවය බොහොම අලංකාර විධියට කරන්න, බොහොම ප්‍රචාරාත්මක වැඩ පිළිවෙළක් ඇතුව, හොඳ යාන්ත්‍රණයක් ඇතුව තමුන්නාන්සේලාගේ දේශපාලන වැඩ පිළිවෙළ තුළ තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කෙරුවේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අපේ ගම්වල, අපේ ආසනවල නිවාස හැදුවාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ඒ විධියට මහ ජන මුදල් නාස්ති කරමින්, කාබාසිනියා කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි, අපේ ආණ්ඩුවයි අතර තිබෙන වෙනස. මට මතකයි, ඒ කාලයේ නිවාස දස ලක්ෂය, පහළොස්ලක්ෂය කෙසේ වෙතත් අපේ පළාත්වල සමහර ගෙවල්වල ග්‍රාම නිලධාරින් හරහා පාරට මුහුණලා තිබෙන ගෙවල්වල බිත්තිවල හුණු ගාලා තමුන්නාන්සේලා ගණන් හදා ගත්තා, ඒවාත් තමුන්නාන්සේලා හදපු ගෙවල් කියලා. එහෙම මිථ්‍යා වැඩ පිළිවෙළවල්, එහෙම අසාර්ථක වැඩ පිළිවෙළවල්, එහෙම අසත්‍ය ප්‍රචාර, එහෙම කටයුතු මේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි සැබැවට සත්‍ය වැඩ පිළිවෙළක් ඇතුව, සත්‍ය කරුණු, සත්‍ය සංඛ්‍යා ලේඛන ඇතුව ක්‍රියාත්මක කරනවා මිසක් මේක හුදු දේශපාලන මාතෘකාවක්, එහෙම නැත්නම් මේක ප්‍රචාරාත්මකව පුම්බන වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපේ ආණ්ඩුව ඒ තරමම බාල විධියේ වැඩ පිළිවෙළකට යන්නේ නැහැය කියන එක විශේෂයෙන්ම අපි එක්සත් ජාතික පක්ෂයේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට මතක් කරනවා. මොකද, එතුමාගේ මුළු කථාව පුරාම බොහොම නිර්දය විධියට විවේචනය කළේ, ඒ ගොල්ලන්ගේ වැඩ පිළිවෙළ හොඳයි, අපේ වැඩ පිළිවෙළ නරකයි කියන එකයි. ඒක තමයි එතුමාගේ මුළු කථාවේම ගැබ් වුණේ. ඒ නිසා මම ඒ කථාව කියන්න ඕනෑ. එහෙම නැතිව ඒක මට මේ කථාවට ඒ තරම් විෂයගත කාරණයක් වන්නේ නැහැ; මම ඒකට උත්තර දෙන්න බලාපොරොත්තු වන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආණ්ඩුව බොහොම පැහැදිලි වැඩ පිළිවෙළක් ඇතිව තමයි මේවා ක්‍රියාත්මක කරන්නේ. ගරු විමල් වීරවංශ මැතිතුමා හොඳ ජවයක් තිබෙන තරුණ අමාත්‍යවරයකු විධියට, හොඳ දැක්මක් තිබෙන අමාත්‍යවරයකු විධියට බොහොම ප්‍රයෝගික විධියට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

මම නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල මැතිවරණ කොට්ඨාසය. පසු ගිය සතියේ අපේ ගරු විමල් වීරවංශ ඇමතිතුමා ඇවිල්ලා කුරුණෑගල නගරයේ ඉතාම දර්ශනීය මධ්‍යම පාන්තික මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහා මුල් ගල තියලා, ටෙන්ඩර්කරුවන් තෝරා ගෙන ටෙන්ඩර් ප්‍රදානය කරලා, අද වන විට එහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. අද සද්ද බද්ද නැති වුණාට මේ නිවාස වැඩ පිළිවෙළ ගම් මට්ටමේ ඉතාම හොඳ වැඩ පිළිවෙළක් හැටියට ක්‍රියාත්මක වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය කාලයේ පුවත් පත්වල මම දැක්කා, දීර්ඝ කාලයක් තිස්සේ කාක බෝධි පැළවෙලා, දුර්වර්ණ වෙලා, දියසෙවල බැඳිලා අපවිත්‍ර වෙලා තිබුණු කොළඹ නගරයේ මහල් නිවාස දැකුම්කළු භාවය නැවත ඇති කරන්නට විමල් වීරවංශ මැතිතුමා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබුණු බව. [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා අපට චෝදනා කළාට අපි බොහොම පැහැදිලි වැඩ පිළිවෙළක් ඇතිව තමයි මේවා ක්‍රියාත්මක කරන්නේ. ඒ පැහැදිලි වැඩ පිළිවෙළ නිසා තමයි, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපි පටන් ගත්ත දවසේ ඉඳලා ඡන්දෙන් ඡන්දෙට, ඡන්දෙන් ඡන්දෙට මිනිස්සු අපට ඡන්දය දෙන්නේ. බලහත්කාරයෙන් ඡන්ද මං කොල්ල කාලා නොවෙයි, මිනිස්සු දෙපයින් ඇවිද ගෙන, බෙහොම විවෘත මනසකින් ඡන්ද පොළට ගිහිල්ලා තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට ඡන්ද දුන්නේ. අපි බොරු කරනවා නම්, මිනිස්සුන්ට වැරදි ප්‍රචාරාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්- [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Sajith Premadasa, what is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -[බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is a point of Order being raised.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 84(7) ස්ථාවර නියෝගය යටතේ මම මේ කාරණය කියන්න කැමැතියි. මම සභාගත කළා, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා Habitat ආයතනයට ලබා දුන්න වාර්තාව. ඒ වාර්තාවේ එතුමාම කියනවා ගෙවල් ලක්ෂ 26ක් හැදුවා කියලා. [බාධා කිරීම්] ඒක එතුමාම කියනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි point of Order එක. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කියන්නේ ලක්ෂ 26ක්- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Jayarathna Herath, you can carry on with your speech.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට දැන් එල්ලෙන්න වැලක් නැහැ. එල්ලිච්ච වැල් සේරම දැන් කඩා වැටිලා.[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලයයි ගත වන්නේ. මට වැඩිපුර කාලය දෙන්න වනවා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට එල්ලෙන්න වැල් නැතිව- [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Members, please sit down.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
එතුමා අර නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ වාර්තාවක එල්ලිලා අසාර්ථක උත්සාහයක යෙදෙනවා, මේකෙන් එගොඩ වන්න පුළුවන් ද කියලා බලන්න. මෙතුමා අපට සංඛ්‍යා ලේඛන විජ්ජාවක් පෙන්නුවා. 1977 මෙහෙමයි, 1980 මෙහෙමයි, 1990 මෙහෙමයි කියලා අපට නිකම් අර අල්ලේ දඹදිව පෙන්වනවා වාගේ වැඩක් තමයි අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කළේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේවා අපි එතරම්ම ගණන් හදන මාතෘකා නොවෙයි. ඉතාම හොඳ විධිමත් වැඩ පිළිවෙළක් යටතේ අපේ නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සියලු වටාපිටාව සකස් කර තිබෙනවාය කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිවාස සංවර්ධන අධිකාරියට සම්බන්ධ කරුණු කාරණාවලට අමතරව ඉදි කිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ ඉංජිනේරු සේවා ආයතන ගණනාවක් මේ අමාත්‍යාංශයේ විෂය පථයට අයිති වනවා. විශේෂයෙන්ම රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - SD&CC- වාගේ ආයතන පසු ගිය කාලයේ බොහොම පාඩු ලැබූ නිසා පවත්වා ගෙන යන්න බැරිවයි තිබුණේ. ඒ සියල්ල අද නැවත සක්‍රිය කරලා අපේ රටේ සියලු ඉදි කිරීම් කටයුතුවලට අපේම රටේ දැනුම, අවබෝධය තිබෙන තාක්ෂණ නිලධාරින් අරගෙන අද ඉදි කිරීම් ක්ෂේත්‍රයේ විශාල විශ්වකර්ම වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කර ගෙන යනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

මට මතකයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දැවැන්ත ව්‍යාපෘති නොවෙයි, ගමේ ඇනිකට් එකක් බැන්දත් ඒක බඳින්න විශේෂඥ උපදෙස් ටික ඒ උදවිය ගත්තේ විදේශ රටවල්වලින් බව.

[ගරු ජයරත්න හේරත් මහතා]

එහෙන් තමයි කොන්ත්‍රාත්කරුවන් ගෙනාවේ. තාක්ෂණ දැනුම, අවබෝධය අපේ රටේ තිබියදී ඒ සියල්ල පැත්තකට තියලා කටයුතු කෙරුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මොරගහකන්ද ජලාශය ඉදි කෙරෙනවා. සියයට සියයක් දේශීය ඉංජිනේරුවරුන් තමයි මොරගහකන්ද ජලාශය ඉදි කරන්නේ. අපි සන්තෝෂ වනවා ඒ ගැන. ඒ වාගේම අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැදුරු ඔය ව්‍යාපෘතියේ අද සියයට අසූවක් වැඩ ඉවරයි. තව මාස තුන හතරකින් අපට ඒක ජනතා අයිතියට පවරන්න පුළුවන්. දැදුරු ඔය ව්‍යාපෘතියේ ඉදි කිරීම් ක්ෂේත්‍රයේ සියයට සියයක් ඉන්නේ අපේ රටේ අය. ඒ සියලුම ඉංජිනේරු මහත්වරු මේ රටේ උදවිය. කිසිම විදේශ උපදේශයක්, විදේශ සම්බන්ධයක්, විදේශ සහයෝගයක් නැතිවයි ඒක සිදු කෙරෙන්නේ. මේ දැදුරු ඔය ව්‍යාපෘතිය දැවැන්ත -පුළුල්- ජල ව්‍යාපෘතියක්. අද එහි ඉදි කිරීම් කටයුතු අවසන් කර ගෙන යනවා. ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේ රඹකැන් ඔය ව්‍යාපෘතිය ගත්තත් මෙවැනි මට්ටමක තිබෙන්නේ. ඒ නිසා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ ඉදි කිරීම් ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් අද ඇති වෙලා තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ තත්ත්වයත් එක්ක අපට අද විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා කවුරු කෙසේ කිව්වත් මේ අමාත්‍යාංශ විෂය පථය තුළ මේ ගරු අමාත්‍යතුමන්ලා ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒකට අපේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත්, අපේ ආශීර්වාදය පළ කරන බවත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The next speaker is the Hon. Sujeewa Senasinghe. You have five minutes.

[පූ.භා. 11.43]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි. දැන් කථා කළ ගරු නියෝජ්‍ය ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරය ගැන කථා කළා. ප්‍රචාරයට ප්‍රසිද්ධ ඔබතුමන්ලායි. මොරගහකන්ද ජලාශය ව්‍යාපෘතියේ මුල් ගල තැබීමේදී ප්‍රචාරක වැඩ සටහනට මිලියන 30ක් වියදම් කළා. ඒ වාගේම නැව් එන්නේ නැති හම්බන්තොට වරායේ බෙර ගහන්න විතරක් මිලියන 50කට අධික ප්‍රමාණයක් ඔබතුමන්ලා වියදම් කරලා තිබෙනවා. [බාධා කිරීම්] ප්‍රචාරය ගැන එක්සත් ජාතික පක්ෂයට දොස් කියන්න එපා. අපි ප්‍රචාරය කරන්නේ ගෙවල් ලක්ෂ 25ක් හදලායි. පෝස්ටරයක් ගැහුවාට ඒකේ ඇති වරදක් නැහැ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හිතේ දුකෙනුයි කථා කළේ. මේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා හිතේ දුකෙන් කථා කළේ. මොකද, කුරුණෑගල මාවතගමට දීලා තිබෙන්නේ ගෙවල් 10යි, ඉබ්බාගමුවට ගෙවල් 10යි, නිකවැරටියට ගෙවල් 10යි. මේවායින් වැසිකිළි හදන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමන්ලා මේ ආකාරයෙන් රටට කරන විනාශය බලන්න.

මේ ආණ්ඩුව දූෂණය ඉහ වහා ගිහිල්ලා තිබෙන ආණ්ඩුවක්. දූෂණය ගැන කථා කළොත්, බිලියන 100කට අධික ප්‍රමාණයක් දූෂණයට ලක් කර තිබෙනවා මේ ආණ්ඩුවේ ඇමතිවරුන් එකතු වෙලා. නිවාස සෑදීම වෙනුවෙන් ජනාධිපතිතුමා බිලියන දෙකයි වෙන් කරන්නේ. හැබැයි එතුමාගේ කථාවේ පිටු එක දෙක වෙන් කරනවා එතුමා ගෙවල් සෑදීම සම්බන්ධයෙන් කියන්න. නිවාස හදනවා කියලා සඳහන් කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අසම්පූර්ණ අසත්‍යයක්. බලන්න, එතුමාගේ ගිය වතාවේ අය වැය කථාවේ 19වැනි පිටුව. පිටුවක්ම තිබෙනවා ගෙවල් හදන ආකාරය සම්බන්ධව. ගෙවල් ලක්ෂයක්, දසලක්ෂයක් මේ ආකාරයෙන් හදනවා කියලා රටේ ජනතාව කඬේ යවනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක නොවෙයි අපි බලාපොරොත්තු වුණේ මුදල් ඇමතිතුමාගෙන්. යුද්ධය අවසන් කරලා තිබෙන අවස්ථාවේ රට සංවර්ධනය කරනවා නම් අපි බලාපොරොත්තු වන නිවාස ක්‍රමය මේක නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගරු විමල් වීරවංශ ඇමතිතුමා පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම කථා කරන, වැඩියෙන්ම විවේචනයන් කරන ඇමතිතුමා. හැබැයි එතුමාගේ කාර්ය භාරය මනාවට පෙන්වනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ කාරණාවලින්. 2007 දී ගෙවල් 15,000ක් හැදුණා. 2008 දී ගෙවල් 12,000ත් හැදුණා. 2009 දී ගෙවල් 6,000ක් හැදුණා. 2010 මෙතුමාගේ කාර්ය භාරය තුළ හදලා තිබෙන්නේ ගෙවල් 1,789යි. හැබැයි ගිය වතාවේ අය වැයේදී මුදල් ඇමතිතුමා සඳහන් කළා බිලියන දෙකක් වෙන් කරනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. 2007, 2008, 2009, 2010 වර්ෂවලත් බිලියන දෙකක ප්‍රමාණයක් තමයි වියදම් කළේ. තමන්ගේ ගෙවල් ටික හදා ගන්නවා මිසක්- [බාධා කිරීමක්]

එතුමාගේ නිවාස සංවර්ධන අධිකාරියේ දූෂණ ගැන අපි සඳහන් කළා. බලන්න, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මොකක්ද සිදු වෙන්නේ කියලා. මෙතුමාගේ දේශපාලන අධිකාරිය බවට පත් වෙලා තිබෙනවා අද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය. ජයන්ත සමරවීර, මුසම්මිල්, නිමල් ප්‍රේමවංශ, උදයශාන්ත ගුණසේකර, දීපාල් ගුණසේකර මේක දේශපාලන මණ්ඩලය බවට පත් කර ගෙන තිබෙනවා. ලසන්ත අලගියවන්න මැතිතුමා කියනවා, මේ ආයතනයේ දූෂණය තිබෙනවාය කියලා COPE වාර්තාවේ සඳහන් කරලා නැහැ කියලා. ඔය කෝප් එකේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, මම ඉන්නවා.

කළමනාකරණය හරියාකාරයෙන් සිදු නොවීම දූෂණය කියලා එතුමාට ලියන්න බැහැ. එතුමා අපට කිව්වා, ආණ්ඩුවේ ඇමතිවරයෙක් වශයෙන් දූෂණය කියලා ලියන්න අමාරුයි කියලා.

හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාර්ය භාරය ගැන ඔබතුමන්ලා ආඩම්බර වෙන්න. ප්‍රේමදාස මහත්මයා මේ රටේ විශාල කාර්ය භාරයක් ඉටු කළා. අපි විතරක් නොවෙයි. ඔබතුමන්ලාත් එතුමාට පින් දෙන්න. Habitat ආයතනයෙන් ඉදිරිපත් කරපු වාර්තාවේ සඳහන් වනවා, ගෙවල් ලක්ෂ 26ක් ඉදි කළාය කියලා. අපි නොවෙයි කියන්නේ. අසත්‍යයක් කියලා ඔබතුමන්ලා කියනවා නම්, ඒ සම්බන්ධයෙන් මේ වාර්තාවේ සඳහන් වන්නේ නැහැයි කියලා කියනවා නම් මේ වාර්තාව හොඳට කියවා බලන්න. මේ වාර්තාව එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් කරපු වාර්තාවක් නොවෙයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කරපු වාර්තාවක්. පිට රටට ගියාම ඉදිරිපත් කරනවා, මෙන්න මෙහෙමයි ලංකාවේ ගෙවල් ඉදි වන්නේ කියලා. ඒ ඉදි වුණේ එක්සත් ජාතික පක්ෂ රජය වකවානුවේදීයි.

මට නියමිතව තිබුණු කාලයෙන් විනාඩි 10ක් අපේ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට දෙන්න වුණු නිසා මට ඉතා අඩු වෙලාවක් තමයි තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා තව විනාඩි 10ක් ගන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කාගෙන්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා විනාඩි 10ක් ගන්න. මා කියන්නම්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආකාරයෙන් නිම කළ නිවාස සංඛ්‍යාව අම්පාර දිස්ත්‍රික්කයේ 194යි; මඩකලපුව දිස්ත්‍රික්කයේ 262යි; කළුතර දිස්ත්‍රික්කයේ 30යි; එකතුව 486යි. මෙන්න මේ ආකාරයෙන් තමයි නිවාස ඉදි කළේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඉතාමත් විශාල විනාශයක් කරලා තිබෙන්නේ. නිවාස සඳහා රුපියල් බිලියන 2ක් වැනි සුළු ප්‍රමාණයක් තමයි ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කරලා තිබෙන්නේ. මේ ආණ්ඩුවෙන් ඔබතුමාට ගරහනවාද දන්නේ නැහැ. හොඳ අමාත්‍යාංශයක් භාර දීලා ඔබතුමාට වෙන් කරලා තිබෙන්නේ මෙන්න මෙවැනි මුදල් ප්‍රමාණයක්.

ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් බිලියන 230ක් වෙන් කරනවා, ඇමතිතුමනි. එන්න එන්නම ආරක්ෂක අමාත්‍යාංශයේ වියදම් වැඩි වනවා. මේ රටේ යුද්ධය අවසන් වූ වෙලාවේ ඔබතුමන්ලා අපට කිව්වේ, ඒ මුදල් ප්‍රමාණය රටේ සංවර්ධනය සඳහා යොදන්න පුළුවන් කියලායි. හැබැයි බලන්න, ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2008 දී ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කළේ රුපියල් බිලියන 194යි. 2009 දී ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කළේ රුපියල් බිලියන 177යි. යුද්ධය තිබුණු කාලයේදී, වැඩියෙන්ම බෝම්බ පත්තු වුණු කාලයේ, වෙඩි උණ්ඩ පත්තු වුණු කාලයේ, රට විනාශ වුණු කාලයේ අපි වියදම් කළේ රුපියල් බිලියන 194යි. 2009 දී අපි ජයග්‍රහණය කළ කාලයේ, ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කළේ රුපියල් බිලියන 177යි. නිවාස අමාත්‍යාංශයට තව රුපියල් බිලියන 5ක් දුන්නා නම්, අඩුම ගණනේ ඔබතුමන්ලා ඔය කියන ගෙවල් 1,000ක් හදා ගන්න පුළුවන්. ගෙවල් 70,000ක් හදනවාය කියනවා. ගෙවල් 10,000ක් හදනවාය කියනවා. ගෙවල් 20,000ක් හදනවාය කියනවා.

ගෙවල්දසලක්ෂයේ වැඩ පිළිවෙළ ගැන කථා කරනවා. කොහේද, ඔය ගෙවල් හැදෙන්නේ? ඔය කථා කරන ගෙවල් හැදෙන්නේ නැහැ. ඔබතුමාගේ ආසනයේ, මා ඉන්න ආසනයේ, කඩුවෙල පවා ඔබතුමා හදා තිබෙන්නේ ගෙවල් ඉතා සුළු ප්‍රමාණයක්. මා ඒකත් ඉදිරිපත් කරන්නම්. ඉතාමත් අඩු ප්‍රමාණයක් තමයි හදලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ආකාරයෙන් ජනතාව මුළා කරලා, මේ රට විනාශ කරලා තිබෙනවා. ඔබතුමන්ලාට මහ ජනතාවගෙන් ඡන්දය ගන්න පුළුවන් ඇති, විජ්ජා කරලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ විනාශය නවත්වන්න ඔබතුමන්ලාට බැහැ. ඔය කථා කරන දියුණුව කොහේවත් නැහැ. දූෂණය ඉහ වහා ගිහිල්ලා. පොදු රාජ්‍ය මණ්ඩලයේ නැටුමට රුපියල් මිලියන 500ක් වියදම් කරනවා. ඒ මුදලින් ගෙවල් කීයක් හදන්න තිබුණාද?

අද බලන්න. ඔබතුමන්ලා සඳහන් කරනවා, රාජ්‍ය ආයතනවල දූෂණයෙන් රටට රුපියල් බිලියන 100කට වැඩි පාඩුවක් තිබෙනවාය කියලා. ඒ මුදල් ප්‍රමාණය පාවිච්චි කරලා ජනතාවට ගෙවල් හදා දෙන්න; මං මාවත් ඉදි කරන්න. අපි පිළිගන්නවා, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් පාරවල් ප්‍රමාණයක් හැදෙනවාය කියලා. හැබැයි දැන් අපි ඕක කිව්ව ගමන්ම රූපවාහිනියෙන් ප්‍රචාරය කරයි, පාරවල් හැදෙනවාය කියලා එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් කිව්වාය කියලා. මෙක නොවෙයි, සංවර්ධනය කියන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මා හිතන හැටියට හිටපු නිවාස ඇමතිතුමන්ලා එක්ක බැලුවොත් ඇමතිතුමනි, නිවාස ඉදි කිරීම සම්බන්ධයෙන් ඔබතුමා තමයි අඩු දායකත්වයක් ලබා දීලා තිබෙන්නේ. ඔබතුමාගේ විවේචනය හොඳයි. ඔබතුමාගේ කථාව හොඳයි. හැබැයි ඔබතුමාගේ කාර්ය භාරය බින්දුවයි. ඔබතුමා කථා කරපු ආකාරයට, ඔබතුමා කියලා තිබෙන ආකාරයට, ඔය ගැහුව කයිවාරුව අනුව ඔබතුමා නිවාස ඉදි කළා නම් ඇමතිතුමනි, මේ රටේ ඇමතිවරු ලජ්ජාවට පත් වෙලා අයින් වන්න ඕනෑ. හැබැයි ඒ කාර්ය භාරය ඔබතුමාගෙන් ඉටු වෙලා නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ඡන්දය ලබා ගත්ත ඔබතුමාගේ ආසනය වන කඩුවෙල ආසනයට ගෙවල් කීයක් දීලා තිබෙනවාද? [බාධා කිරීමක්] කඩුවෙල ආසනයට ගෙවල් 69යි දීලා තිබෙන්නේ. මේකත් ඇමතිතුමනි, ලජ්ජාසහගත තත්ත්වයක්. රුපියල් බිලියන ගණනක් වෙන් කරලා තිබියදී, ගිය අවුරුද්දේ මුළු රටටම ඔබතුමා දීලා තිබෙන ගෙවල් ප්‍රමාණය 1,789යි. ඔබතුමන්ලා ඉදිරි අනාගතයේදී නිවාස හදන්න යන්නේ මෙහෙමද?

හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයාගේ කාර්ය භාරය අගය කරන්න. වැඩ ඉගෙන ගන්න, වැඩ පුළුවන් මිනිසුන්ගෙන්. ඔබතුමන්ලා මේවා හොඳට කියවා බලන්න, ප්‍රේමදාස මහත්මයා කොයි ආකාරයෙන් ඒ කාර්ය භාරය සිදු කළාද කියලා. ඔබතුමන්ලා ගරහන්න එපා. ප්‍රේමදාස මහත්මයා ගැන අපි කථා කරන්නේ ප්‍රේමදාස මහත්මයා කරපු කාර්ය භාරයක් ගැන නොවෙයි. එතුමාගේ නිවාස වැඩ පිළිවෙළ අපි සියලු දෙනාම උදාහරණයට ගන්න ඕනෑ, ඇමතිතුමනි. අද ඒ කාර්ය භාරය සිදු වන්නේ නැහැ. ඔබතුමන්ලා ඇඟිල්ල දික් කරන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. ඔබතුමන්ලා ඇඟිල්ල දික් කළා, එක්සත් ජාතික පක්ෂයේ විවෘත ආර්ථිකයට. ඔබතුමන්ලා ඇඟිල්ල දික් කරනවා, එක්සත් ජාතික පක්ෂයේ ආයෝජනයට. හැබැයි ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, රට ඉදිරියට ගෙන යන්න ඕනෑ ආයෝජන ටික රටට ගෙන්වා ගන්න. ණය ගන්නේ සියයට 7.2 පොලියට. මේ පොලියට ණය අරගෙන අපි ගෙවල් හදන්නේ කොහොමද? පොලියට ණය අරගෙන අපි රට සංවර්ධනය කරන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? ණය අරගෙන ග්‍රීසියට, ස්පාඤ්ඤයට, ඉතාලියට සිදු වුණු දේ ඉදිරියේදී මේ රටටත් සිදු වනවා, අපි ආර්ථික වශයෙන්, මුදල් අතින් මනා කළමනාකරණයක් කළේ නැත්නම්.

අද අපට සිදු වෙලා තිබෙන්නේ ප්‍රේමදාස මහත්මයාගේ නිවාස ක්‍රමය ගැන කථා කිරීම පමණයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දූෂණය ගැන කථා කළොත්, දූෂණය නිසා අපේ ආර්ථික වර්ධන වේගයෙන් සියයට 2ක් අපි කැප කරනවාය කියන එකට බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් එකඟ වුණා. ඔබතුමන්ලා මේවා නවත්වන්න. ඔබතුමන්ලා මේවා නවත්වන්නේ නැහැ. ඔබතුමන්ලා ගමන් කරන්නේ හෙලිකොප්ටරයෙන්. ඔබතුමා මේ ළඟදී අම්පාරේ ගිහින් ආපසු ආවේ හෙලිකොප්ටරයෙන්.

හැබැයි, ඔබතුමන්ලා කථා කරන්නේ ධනවාදයට විරුද්ධව. මේ රටේ විනාශයට විරුද්ධව විශාල ලෙස කථා කරපු මන්ත්‍රීවරයා ඔබතුමා. හැබැයි, අද ඔබතුමාගේ නිවසේ air-conditioners 4ක් තිබෙනවා. ඒ වාගේම gym එකක් තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා මේ ආර්ථික සංවර්ධනය ගැන, තමන්ගේ වර්ධනය ගැන කථා කළා නම් අපි විරුද්ධ නැහැ. හැබැයි, දුකෙන් පෙළෙන ජනතාව ගැන කථා කරලා අද ඔබතුමාගේ නිවස හදා ගෙන තිබෙනවා. ඔබතුමා මේ රටේ නිවාස හදලා නැහැ ඇමතිතුමනි. මේක ලජ්ජා සහගතයි. ඔබතුමා වැඩ කරයි කියලා ජනතාව බලාපොරොත්තු වුණා. ඔබතුමා ජව සම්පන්නයි කිව්වා; තරුණයි කිව්වා; කටකාරයි කිව්වා. හැබැයි ඇමතිතුමනි, ඔබතුමාගේ වැඩ

[ගරු සුජීව සේනසිංහ මහතා]

අපට තවම පෙන්වලා නැහැ. ඔබතුමා මේ රටේ ඉන්න සියලුම ඇමතිවරු විවේචනය කරලා තිබෙනවා. ඔබතුමා සියලුම රජයන් විවේචනය කරලා තිබෙනවා. හැබැයි, ඔබතුමාගේ කාර්ය භාරය තවම ඉටු කරලා නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ ඇමතිතුමාට මේ ආණ්ඩුවෙනුත් විශාල පහර දීමක් සිදු කරලා තිබෙනවා කියලායි. මෙතුමාගේ නිවාස අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා තිබෙන්නේ ඉතා අඩු ප්‍රමාණයක්. ගරු ඇමතිතුමනි, මේ වාගේ මුදල් ප්‍රමාණයක් වෙන් කරලා ඔබතුමා බලාපොරොත්තු වන ඉලක්කය ඉටු කර ගන්නේ කොහොමද, ඔබතුමන්ලා නිවාස කීයක් ඉදි කරනවාද කියන එක පොඩ්ඩක් අපිට තේරුම් කරලා දෙන්න. මොකද, අපේ දැන ගැනීම පිණිස.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති Mews Road එකේ ගෙවල් 29ක අවුරුදු 70ක්, අවුරුදු 80ක් හිටපු උදවිය ඒ ගෙවල්වලින් බලෙන් ඇදලා එළියට දැම්ම අවස්ථාව. මම එතැනට ගියා. හමුදාවෙන් මට පහර දෙන්නත් ආවා. නිවාස ගැන කථා කරපු ඔබතුමා එදා මොනවාද කළේ? අද වන තුරු ඒ පිරිසට නිවාසයක් නැහැ. ඒ වාගේම බ්ලූමැන්ඩල්, Malay Street ආදී ප්‍රදේශවල තිබෙන නිවාස ඉවත් කරන්න පසු ගිය නගර සභා ඡන්දයට පෙර ඔබතුමන්ලා කටයුතු යොදලා තිබුණා. හැබැයි නගර සභා ඡන්දය නිසා ඒවා ඔක්කෝම නැවතුණා. ඔබතුමා කියන්න මේ අය වෙනුවෙන් ඔබතුමන්ලා ඉදිරිපත් කරපු යෝජනා ක්‍රමය මොකක්ද කියලා.

මහල් නිවාස ගැන කථා කරනවා. 50,000ක් ඉදි කරනවා කියනවා; 70,000ක් ඉදි කරනවා කියනවා. අපිට කියන්න කොහොමද මේ නිවාස ඉදි කරන්නේ, කොයි ස්ථානයේද ඉදි කරන්නේ, කොයි ආකාරයටද ඉදි කරන්නේ කියලා. එදා Muse Road එකේ පවුල් 29ක පිරිස ඉවත් කළා. පොඩි දරුවාගේ අතේ බත්පත තිබෙද්දී ගෙයින් එළියට ඇදලා දැම්මා. පොඩි දරුවා පාඩම් කරද්දී එළියට ඇදලා දැම්මා. අද ඔබතුමන්ලා මේ කථා කරන සංවර්ධනය නැහැ ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලාගේ කථාවට පමණක් සීමා කරපු ඒ සංවර්ධනය අපිට පෙන්වන්න.

එක්සත් ජාතික පක්ෂයේ අපි නිවාස පහළොස් ලක්ෂයක් හැදුවා. ලක්ෂයක් නොමිලේ දුන්නා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, නිවාස පමණක් නොවෙයි, අපි නිවාසවලට paint ගාලාත් දෙනවා කියලා. හැබැයි, ඔබතුමාට මම මතක් කරලා දෙන්න කැමැතියි එක්සත් ජාතික පක්ෂයේ ඩී.එස්. සේනානායක මහත්තයාගේ කාලයේත් අපි නිවාස හැදුව බව. හැබැයි, අපි හරියාකාරයෙන් නොමිලයේ නිවාසයක් දෙන්න පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ රණසිංහ ප්‍රේමදාස මහත්තයාගේ කාලයේයි. අපි ගෙවල් ලක්ෂයක් නොමිලේ දුන්නා. සියලු දේවල් අපිට නොමිලේ දෙන්න බැහැ. ඉන්දියාව බඩ ගාද්දී, චීනය බඩ ගාද්දී තමයි අපි මේ රට සංවර්ධනය කළේ. දැන් එහෙම නොවෙයි ආසියාව දියුණු වෙනවා.

ආසියාව ඉතා ශීඝ්‍ර සංවර්ධනයක් අත් කර ගන්නා මේ අවස්ථාවේ චීනයේ ආර්ථික වර්ධන වේගය සියයට 12.8යි. ඉන්දියාවේ සියයට 10.8යි. අද ඔබතුමන්ලාට මේ ලංකාව දියුණු කරන්න පුළුවන් හැකියාව ඉතා විශාලයි ඇමතිතුමනි. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ අපි ඒ කාලයේ යුද්ධ දෙකක් තිබෙද්දී, ඉන්දියාව, චීනය බඩ ගාද්දීයි මේ රට සංවර්ධනය කළේ. ඒ සංවර්ධනය රටේ ඇති කරන්න එක්සත් ජාතික පක්ෂයට හැකියාව තිබුණා. ඉදිරියේදී අපේ ආණ්ඩුවක් යටතේ අපි විශාල ආයෝජන ප්‍රමාණයක් මේ රටට ගෙනෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ප්‍රතිපත්තිය හරියට සකසා ගත්තොත් විශාල ආයෝජන මේ රටට ගෙනෙන්න පුළුවන්. හැබැයි, යුද්ධයෙන් පස්සේත් මේ රටට එන ආයෝජන අඩු වෙලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ආකාරයෙන් කටයුතු කරලා ඔබතුමන්ලා බලාපොරොත්තු වන සංවර්ධනයක් ලබා ගන්න බැහැ. ආයෝජනය අවශ්‍යයි. විශාල ආයෝජනයන් මේ රටට ගෙනෙන්න ඕනෑ. අප රට වටේ ඉන්න අනෙකුත් රටවල් වන බුරුමය, තායිලන්තය, මැලේසියාව හා ඉන්දියාව විශාල වශයෙන් ආයෝජන ආකර්ෂණය කර ගන්නවා. හැබැයි, අද අපිට හොඳ විදේශ ප්‍රතිපත්තියක් නැහැ. ජනාධිපතිතුමා අය වැය කථාවේ සඳහන් කරලා තිබෙනවා, අපේ විදේශ ප්‍රතිපත්තිය හරි නැහැ; ඒක හරි ගස්සා ගන්න ඕනෑ කියලා. අපි ඔබතුමන්ලාට කියන්නේ විදේශ ප්‍රතිපත්තිය හරි ගස්සා ගන්න. ඇමෙරිකාවෙන් හෝ වේවා චීනයෙන් හෝ වේවා ඉන්දියාවෙන් හෝ වේවා ඔබතුමන්ලාට ආධාර ලබා ගන්න පුළුවන් නම් ඒකට සහයෝගය එක්සත් ජාතික පක්ෂයෙන් අපි දෙනවා. ඒ, රටේ ජනතාව වෙනුවෙන්. අපි වෙනුවෙන් නොවෙයි.

අපි හිහා කන්නේ අපේ රටේ ජනතාව වෙනුවෙන්. මගේ පවුල වෙනුවෙන් නොවෙයි. මගේ ඉදිරිය සඳහා නොවෙයි. අපි ජාත්‍යන්තරය සමඟ කථා කළොත්, ඇමෙරිකාවට කථා කළොත්, එංගලන්තයට කථා කළොත්, ප්‍රංශයට කථා කළොත් ඒ අපි කථා කරන්නේ රටේ දුප්පත් ජනතාව, පාරේ ඉන්න ජනතාව වෙනුවෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නැත්නම් මගේ පවුල දියුණු කරන්න නොවෙයි. හැබැයි ඔබතුමන්ලා තමන්ගේ පවුල් දියුණු කර ගෙන රටේ ජනතාව වෙනුවෙන් ආධාරයක් ලබා ගන්න ගියාම කියනවා අපි පිට රටට හිහා කන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක හිහා කෑමක් නොවෙයි. අපි දුප්පත් නම්, අපේ රට ඉදිරියට යන්න ඕනෑ නම් ඒ සංවර්ධනය සඳහා ඔබතුමන්ලා මුදල් ලබා ගන්න; ආයෝජන ලබා ගන්න; ණය ලබා ගන්න; ආධාර ලබා ගන්න. හැබැයි ණය ලබා ගන්න ඕනෑ සියයට තුනේ, සියයට තුනයි දශම දෙකේ පොලියටයි. වාණිජ ණය නොවෙයි, සංවර්ධන ණය.

මම දන්නේ නැහැ මෙවර අය වැයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට මෙච්චර මුදලක් වෙන් කළේ මොකද කියලා. සමහර විට ඒකෙන් යම් කිසි සංවර්ධනයක් වෙන්න පුළුවන්. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යම් කිසි කාර්ය භාරයක් කොළඹ නගරයට කරනවා. හැබැයි මෙච්චර මුදලක් රාජ්‍ය ආරක්ෂ අමාත්‍යාංශයට වෙන් කරන්නේ මොකද කියන එක අද අපිට ප්‍රහේලිකාවක්. යම් කිසි වැඩ පිළිවෙළක් වෙනවා ඇති. හැබැයි අපිට හිතා ගන්න බැහැ, මොකක්ද වෙන්නේ කියලා. ඒකට බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන් වෙයි. හැබැයි, රුපියල් බිලියන 230ක් කියන්නේ සෙල්ලමක් නොවෙයි, ඇමතිතුමනි. මේ ප්‍රමාණය එන්න එන්න වැඩි වනවා. ආරක්ෂක අමාත්‍යාංශයට 2009 දී වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 170යි; 2010 දී රුපියල් බිලියන 202යි; 2011 දී රුපියල් බිලියන 215යි; 2012 දී රුපියල් බිලියන 230යි. ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අනුව බලන විට ඉන්දියාවේ තිබෙන යුද්ධයකටත් වියදම් කරන්න පුළුවන්. මේ මුදල් ප්‍රමාණය අඩු වෙන්න එපායැ. ඔබතුමන්ලා අපිට කිව්වේ, යුද්ධය අවසන් කළාට පසු යුද්ධයට ගිය මුදල්වලින් භාගයක් ඉතුරු කරලා මේ රටේ නිවාස හදා දෙන්න, මං මාවත් ඉදි කරන්න, රටේ සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කරන්න අවශ්‍ය මුදල් ප්‍රමාණය මේකෙන් ලබා දෙන්න පුළුවන් කියායි.

අද කියනවා, රටේ ආරක්ෂාවට තවත් මුදල් අවශ්‍යයි කියා. මේ මුදල් ප්‍රමාණයෙන් පඩි ගෙවන්නේ රුපියල් මිලියන 150ක් වාගේ ප්‍රමාණයක්. ඔබතුමන්ලාගේ විමල් වීරවංශ මහත්මයාට වැඩ පුළුවන්ද කියා බලන්නවත් අඩුම ගණනේ මේකෙන් රුපියල් බිලියන 10ක් දුන්නා නම් එතුමාට එහාට මෙහාට හැරිලා තව ගෙදරක් හදා ගෙන අඩු ගණනේ ජනතාවට ගෙවල් 10,000ක්වත් හදලා දෙන්න තිබුණා. හැබැයි, අද බලන්න. අපට ලජ්ජයි, ගරු

නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ආණ්ඩුවේ කයිවාරු විතරයි. අපිට කියනවා, බොරු කියනවා කියා.

ජනාධිපතිතුමාගේ පසු ගිය අය වැය කථාවේත් ගෙවල් සෑදීම සම්බන්ධයෙන් පිටුවක් පුරා සඳහන් වී තිබුණා. මෙවර අය වැය කථාවේ ගෙවල් සෑදීමට කීයක් වෙන් කරනවාද කියා සඳහන් කරලාත් නැහැ. රුපියල් මිලියන 500ක කථාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ වාගේ පට්ටපල් බොරු; රට මුළා කරන බොරු මේ ආණ්ඩුවෙන් වපුරලා තිබෙනවා. රට ඉදිරියට අරගෙන යන්නේ රට විකුණන සියයට 7.2 පොලියට ලබා ගත් ණයවලින්. මේ රට ඉදිරි අනාගතයේ කොංගෝවක් නැත්නම් සෝමාලියාවක් බවට පත් කිරීමට මේ ආණ්ඩුවට ඉඩ දෙන්නේ නැහැ කියන ප්‍රකාශය කරමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[පූ.භා. 11.56]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ ආර්ථිකයට ඒ වාගේම ජන ජීවිතයට බලපාන ඉතාම වැදගත් අමාත්‍යාංශයක් සම්බන්ධව විවාද කරන මේ අවස්ථාවේදී විෂයට අදාළව කරුණු ඉදිරිපත් කරන්න සූදානම් වෙලා හිටියත් අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කරන කථා දෙස බැලුවාම ඒවාට යම් උත්තරයක් දෙන්න ඕනෑ කියා කල්පනා කළා. මීට කලින් කථා කළ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඇහුවා, "දැන් යුද්ධය ඉවරයි. ඇයි, රුපියල් බිලියන 230ක් මේ ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කරන්නේ?" කියා. මෙක තමයි අද එක්සත් ජාතික පක්ෂයට හැදිලා තිබෙන ලෙඩේ. මේ රට ත්‍රස්තවාදයෙන් මුදවා ගන්න තම ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරපු ඒ රණවිරුවෝ, හමුදා සෙබළුන් එක් කෙනෙක්වත් ආපහු ගෙදර යැව්වේ නැහැ. ඒ අයට වැටුප් දෙන්න; ඒ අයට නිල ඇඳුම් දෙන්න; ඒ අයට ආහාර දෙන්න; ඒ අයට පහසුකම් සලසන්න තමයි රුපියල් බිලියන 203ක්ම අප වෙන් කර තිබෙන්නේ. තමුන්නාන්සේලා කියන්නේ යුද්ධය ඉවර කළාට පසු ඒ අය ගෙදර යවන්න කියලාද? ඒ අයට අවශ්‍ය සුබසාධනය සලසනවා වාගේම ආරක්ෂක අමාත්‍යාංශය හරහා නාගරික සංවර්ධන වැඩ පිළිවෙළ අද ඉතාම කාර්යක්ෂමව කර ගෙන යනවා. ඒ නිසා පුහු තර්ක ගෙනෙන්න එපාය කියා අපි විශේෂයෙන් මේ අයට කියන්න ඕනෑ.

විදේශ ප්‍රතිපත්තිය ගැන කිව්වා. පසු ගිය කාලයේ අපි දැක්කා, GSP, GSP Plus ගැන කියමින් පාර්ලිමේන්තුව දෙකක් වන තුරු කෑ ගැහුව හැටි. "මේ විදේශ ප්‍රතිපත්තිය වැරදියි. ඕවා වෙනස් කර ගන්න. දැන් GSP දෙන්නේ නැහැ. GSP Plus දෙන්නේ නැහැ. දැන් ආණ්ඩුව ඉවරයි. රට ඉවරයි" කියා කෑ ගැහුවා. විවාදවලදී හැමදාම කිව්වා; හැම තැනම කිව්වා; එළියෙත් කිව්වා; ඇතුළෙත් කිව්වා; හැම තැනම මාධ්‍ය සාකච්ඡා තියලා කිව්වා. මොකද වුණේ? GSP දුන්නේ නැද්ද? GSP දුන්නා; GSP Plus දුන්නා; ඒවා ඔක්කොම පස්සෙන් පන්නා ගෙන ඇවිත් දුන්නේ. තමුන්නාන්සේලා කියපු විධියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා GSP ගන්න ඕනෑ කියා GSP Plus ගන්න ඕනෑ කියා දණින් වැටුණේ නැහැ. එහෙම විදේශ ප්‍රතිපත්තියක් නොවෙයි අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ තිබෙන්නේ කියන එක තමුන්නාන්සේලා මතක තියා ගන්න. එහෙම දණින් වැටුණා නම්, ඒ අයට ඕනෑ විධියට විදේශ ප්‍රතිපත්තිවලට නැටුවා නම්, තවමත් අපි ඉන්නේ ත්‍රස්තවාදයෙන් පිරුණු රටකයි; යුද්ධය තිබෙන රටකයි. තමුන්නාන්සේලාගේ නායකයෝ වාගේ එහෙම නටන නායකයෙක් නොවෙයි අද මේ රටේ ඉන්නේ.

එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා දැන් කථා කළා. ඒ කථාවල හැටියට දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයෙක් නැහැ; රනිල් වික්‍රමසිංහ මහත්මයෙක්ගේ ආණ්ඩුවක් තිබුණෙත් නැහැ; රණසිංහ ප්‍රේමදාස මහත්මයා විතරයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කර තිබෙන්නේ. රණසිංහ ප්‍රේමදාස මහත්මයා ගැන විතරයි ඒ අය කථා කළේ. ඇයි, අර අහිංසක මනුෂ්‍යයා 2001 ඉඳලා 2004 දක්වා ආණ්ඩු කළා නේද? ඒ කාලයේ එක නිවසක්වත් හැදුවා කිව්වේ නැහැ. හදන්න නැතුව ඇති. එක නිවසක්වත් හැදුවා කිව්වේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මතක තියා ගන්න, මේ රටේ ඉන්නේ පවුල් ලක්ෂ 41ක් බව. මේ රටේ නිවාස ලක්ෂ 36ක් හැදුවා නම් අද මේ රටට නිවාස අමාත්‍යාංශයක් ඕනෑ නැහැ; නිවාස සංවර්ධන අධිකාරියක් ඕනෑ නැහැ. ඇයි, නිවාස ටික හදලා ඉවරයි. පවුල් ලක්ෂ 41යි ඉන්නේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නිවාස තිස්හය ලක්ෂයක් හැදුවාලු. මේවා තමයි විහිළු. ඕවා කිය කියා යන්න. එතකොට තියෙන ඡන්ද ටිකත් අඩු වනවා; ඔය පැත්තේ මන්ත්‍රීවරු ටිකත් අඩු වනවා.

ඊළඟට අපි විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මේ අමාත්‍යාංශය හරහා සිදු වන වැඩ කටයුතු ගැන අපි ඉතාම සතුටු වන බව. අපේ විමල් වීරවංශ මැතිතුමා මේ රටේ ජන විඥානය තේරුම් ගත්ත මහ ජන නියෝජිතයකු හැටියට ඉතාම හොඳින් තේරුම් අරගෙන, අතිගරු ජනාධිපතිතුමා එතුමාව නිවාස අමාත්‍යවරයා හැටියට පත් කර ගත්තා. ඒ වාගේම පළාත් සභාවේ ඉඳලා හොඳින් අත් දැකීම් ලබා ගත්ත, වගකීම් දැරිය හැකි ලසන්ත අලගියවන්න මැතිතුමාත් මේ අමාත්‍යාංශයට නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට පත් කරලා තිබෙනවා. එතුමාත් ඒ අවශ්‍ය කටයුතු ඉතාම හොඳින් කර ගෙන යනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඒ වාගේම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් 2011 අවුරුද්ද තුළ නිවාස 20,689ක් හදන්න අවශ්‍ය සහයෝගය ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම 2009 අවුරුද්දේ නිවාස 6,389ක් සහ 2010 අවුරුද්දේ නිවාස 6,547ක් හදන්න අමාත්‍යාංශය කටයුතු කර තිබෙන අතර, 2011 අවුරුද්දේ ඒ ප්‍රමාණයට වඩා නිවාස 14,142ක් ඉදිකරන්න කටයුතු කරලා තිබෙනවා.

සාමාන්‍යයෙන් බැංකු ණයක් ලබා ගන්න අපහසු අය ඉන්නවා. ප්‍රායෝගිකව ජනතාවත් එක්ක ඉන්න මහ ජන නියෝජිතයෝ හැටියට අපි දන්නවා, සමහර බැංකුවලට ගියාම ඒ ලියකියවිලි පුරවන්න, ඒ වාගේම තිබෙන වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කරන්න බැරි වීම නිසා නිවාස ණයක් ගන්න නොහැකිව ඉතාම අපහසුතාවට පත් වන ජන කොටසක් ඉන්නවා කියලා. අන්න ඒ අය වෙනුවෙනුත්, අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙනුත්, රාජ්‍ය සේවකයන් වෙනුවෙනුත්, "ජන සෙවණ උපහාර නිවාස ණය ව්‍යාපෘතිය" ආරම්භ කරලා ඒ සඳහා රුපියල් මිලියන 2,210ක් ලබා ගැනීමට කැබිනට් අනුමැතියද මේ වන කොට ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මහ ජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු ඒ බැංකුවල සහයෝගය ලබා ගෙන, නිවාස ණයක් අරගෙන නිවාසයක් හදන්න බැරි ඒ අහිංසක ජනතාවට නිවාස හදලා දෙන්න අපේ රජය විශේෂයෙන්ම වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා තිබෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

අපේ උතුරු නැඟෙනහිර ප්‍රදේශ නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා අද කථා කළා. ඒ ප්‍රදේශවල නිවාස හදන්න තියා ඒ ප්‍රදේශවලට යන්නවත් බැරිවයි තිබුණේ. දැන් තමයි ඒ අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්නේ. ඒ නිසා තමයි මුලතිව් දිස්ත්‍රික්කයේත්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල දෙකක් ආරම්භ කරලා ඒ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ඒ නිලධාරින් මඟින් කරවීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නේ. ඒ විතරක් නොවෙයි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේත් දිස්ත්‍රික් කාර්යාලයක් ආරම්භ කරලා ඒ නිලධාරින් යොදවලා ඒ ප්‍රදේශවල නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

අද එක්සත් ජාතික පක්ෂයෙන් කියනවා, "හැම තැනම නිවාස හැදුවා" කියලා. කොළඹ හැම තැනම පැල්පත්වලින් පිරිලා. ඒ පැල්පත් වාසීන්ටත් නිවාස ලබා දෙන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ අය වැය මඟින් වෙන් කරලා තිබෙනවා. මම ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා එක්ක එකඟ වන්නේ නැහැ. ඒ වාගේම ඒ ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන එක්ක එකඟ වන්නේත් නැහැ. තිස්ස අත්තනායක මැතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන එක්ක එකඟ වන්නේත් නැහැ. මොකද, අපි නිවාස හදන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් පමණක් නොවෙයි. ඒක ඉතාම පැහැදිලිව තේරුම් ගන්න. අපේ රටේ ආදි වාසීන් සඳහා ඉදි කෙරෙන නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම කලාකරුවන් වෙනුවෙන් ඉදි කෙරෙන නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශයත් එක්ක අත් වැල් බැඳ ගන්නවා, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය. ඒ වාගේම වතු නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් එක්ක අත් වැල් බැඳ ගෙන.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු හැටියට අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත් වීම මත "දිරිය පියස නිවාස වැඩසටහන" ක්‍රියාත්මක කරන බව. අපි මේ දෙන දේවල් එක්සත් ජාතික පක්ෂය දුන්නා වාගේ ණය නොවෙයි; ආධාර. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමන්ලාට අපි කියනවා, අපි මේ දෙන්නේ ආපහු ලබා ගන්නා ණය නොවෙයි, ඒවා දෙන්නේ ආධාර වශයෙන් කියලා. රුපියල් ලක්ෂයක ආධාරයක් දීලා, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දීලා සමෘද්ධි අධිකාරිය හරහා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් අද දිරිය පියස නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනවා. දිරිය පියස නිවාස වැඩසටහන යටතේ මේ වර්ෂය තුළ විතරක් නිවාස 24,916ක් හදන්න කටයුතු කරලා තිබෙනවා. ඒ දෙන මුදල්වලින් සතයක්වත් ආපහු ගන්නේ නැති ඒ නිවාස හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

ඒ විතරක් නොවෙයි, සමෘද්ධි අධිකාරිය හරහා රණ විරු නිවාස 1,683ක් මේ වර්ෂය තුළ ගොඩනඟන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ලොතරැයි අරමුදලක් ක්‍රියාත්මක කරලා, ඒ ලොතරැයි අරමුදලින් නිවාස 6,454ක් හදන වැඩ පිළිවෙළක් සමෘද්ධි අධිකාරිය හරහා ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ රට මුදවා ගන්න ලෙයින්, කඳුළින්, දහඩියෙන් කැපවීම් කරපු, ක්‍රියාන්විත රාජකාරියේ ඉන්න, ආබාධිත තත්ත්වයනට පත් වෙච්ච, ජීවිතක්ෂයට පත් වෙච්ච වීරෝදාර රණ විරුවන්ගේ පවුල් සඳහා නිවාස හදලා දෙන්න "අපි වෙනුවෙන් අපි" වැඩසටහන ක්‍රියාත්මක කරනවා, ආරක්ෂක ලේකම්තුමාගේ නායකත්වයෙන්. ඒ විතරක් නොවෙයි, රණ විරු සේවා අධිකාරිය හරහා රුපියල් ලක්ෂය බැගින් ආධාර 2,699ක් මේ වන කොට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම 2011.12.07 වන දින වන කොට රුපියල් ලක්ෂය බැගින් ආධාර 100ක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. නිවාස ණය යටතේ, ආබාධිත තත්ත්වයට පත් වෙච්ච අභිංසක රණ විරුවන් හාරසිය නව දෙනෙකුට රුපියල් මිලියන 99.9ක් මේ අවුරුද්ද තුළ වෙන් කරලා තිබෙනවාය කියන එක අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට අපි කියනවා, තමුන්නාන්සේලා ඒ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ ණය වැඩසටහන් යටතේ බව. නමුත් අපි ආධාර වැඩසටහන් යටතේත්, ණය වැඩසටහන් යටතේත් ඒ කටයුතු ක්‍රියාත්මක කරනවා.

අවසාන වශයෙන් මම ගරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යතුමාගේත්, ඒ වාගේම ඒ අමාත්‍යාංශයේ නිලධාරි මණ්ඩලයේත් අවධානය විශේෂ කරුණක් කෙරෙහි යොමු කරවන්න කැමැතියි. අපි දන්නවා, හැම කෙනකුගේ සිහිනය, එකම ප්‍රාර්ථනය නිවාසයක් බව. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි, අපට ලැබෙන විමධ්‍යගත මුදල්වලිනුත් ඒ සඳහා දායක වන්න කැමැතියි. නිවාස සංවර්ධන අධිකාරියට මගේ විමධ්‍යගත මුදල් බැර කරලා ඒ තුළින් වෙනම ණය යෝජනා ක්‍රමයක් මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනවා.

අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලයේදී කථා කරලා අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කරලා දෙන්න කියලා. අපි කැමැතියි, නිවසක් ගොඩ නඟා ගෙන එන අභිංසක මිනිසුන්ට අවශ්‍ය තහඩු ටික ලබා දෙන්න. විමධ්‍යගත මුදලින් අන්න ඒ තහඩු ටික ලබා දෙන්න පුළුවන් නම්, විමධ්‍යගත මුදලින් උළු ටිකක් ලබා දෙන්න පුළුවන් නම්, එහෙම නැත්නම් නිවාස සංවර්ධන අධිකාරිය මඟින් දෙන ආධාරයක් හැටියට තහඩු හෝ උළු දෙන්න පුළුවන් නම්, ඒ වාගේ ක්‍රමයක් හදනවා නම් ඉතාම වැදගත් වෙනවා කියන එක මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

අද කාර්මික නිලධාරින්ගේ සහ ඉංජිනේරුවන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අතිවිශාල මුදල් ප්‍රමාණයක් අපේ දිස්ත්‍රික්කවලට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ලබා දුන්නත්, අපට තිබෙන ලොකුම බාධාව වෙලා තිබෙන්නේ ඉංජිනේරුවන්ගේ සහ කාර්මික නිලධාරින්ගේ හිඟකමයි. ඒ නිසා ඒ සම්බන්ධව පුළුල්ව හිතලා ඒ ඉංජිනේරුවන් පිට රට යන එක නවත්වන්න, ඒ වාගේම ඔවුන් පෞද්ගලික අංශයට ඇදී යන වැඩ පිළිවෙළ නවත්වන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. ඔවුන්ගේ සුබසාධන කටයුතු වැඩි කරලා හෝ රාජ්‍ය ඉදිකිරීම් ක්ෂේත්‍රය තව දුරටත් ශක්තිමත් කරන්න - දැනට ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා- කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මා සඳහන් කරන්නේ මෙයයි. විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව වන්නේ හැම පවුලකටම ස්ථිර නිවසක් හදා දෙන්න, ඒ පවුලට අවශ්‍ය පානීය ජලය ලබා දෙන්න, ඒ පවුලට අවශ්‍ය විදුලිය ලබා දෙන්න, ඒ පවුලේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න, ඒ පවුලට හොඳ සෞඛ්‍ය තත්ත්වයක් ගොඩ නඟලා දෙන්න, ඒ නිවසට, ඒ ගමට යන පාර හදලා දීලා පුද්ගලයා ගොඩ නඟලා ඒ තුළින් පවුල ශක්තිමත් කිරීමයි; ඒ පවුල ගොඩ නඟලා, ගම හදලා ඒ තුළින් රට ගොඩ නඟලා ලෝකය දිනන්නයි. මේ රට ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් කරන ගමන අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළින් ඉදිරියට යනවා. ඒකයි අපේ ජාතික වැඩ පිළිවෙළ කියන එක මතක් කරමින්, ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුම නිලධාරින්ට ජනතා සිතුම් පැතුම් ඉටු කරන්නට මේ වර්ෂයේ ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 12.08]

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ලක් කෙරෙන මේ වෙලාවේ ඊට අදාළව කරුණු කීපයක් මේ ගරු

සභාවේ අවධානයට යොමු කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමන් 2005 ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කිරීමත් සමඟ "මහින්ද චින්තන- දිනවමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ මඟිනුත්, ඒ වාගේම ඉන් අනතුරුව එළැඹි ජනාධිපතිවරණයේදී "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළිනුත් මේ රටේ නිවාස සංවර්ධනය වෙනුවෙන් එතුමාගේ තිබෙන වුවමනාව සහ උනන්දුව මනා ලෙස සනාථ කොට තිබෙනවා. වෙනත් කිසිදු මැතිවරණ ප්‍රකාශනයක නොතිබූ ආකාරයට, අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුව විසඳීමත්, ඒ වාගේම නාගරික අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුව විසඳීමත්, මේ රටේ හැම පවුලක්ම තමන්ගේම වූ නිවසක හිමිකම තිබෙන පවුලක් බවට පරිවර්තනය කිරීමේ වැදගත්කමත් එතුමා අවධාරණය කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යැමෙහිලා යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යවශ්‍ය වන්නා සේම, රටේ ජනතාවගේ ආදායම් වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වන්නා සේම, තමන්ගේම වූ හොඳ නිවසක ජීවත් වන පවුලක් බවට ඒ පවුල පරිවර්තනය කිරීම ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන කොන්දේසියක්, අත්‍යවශ්‍ය සැපිරිය යුතු කොන්දේසියක් හැටියට එතුමා පිළිගෙන තිබෙනවා. ඒ නිසාම තමයි නිවාස දසලක්ෂයේ වැඩ පිළිවෙළක් එතුමා ප්‍රකාශයට පත් කළේ. ඒ වාගේම ඒ කටයුත්තට උර දීලා, ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන ගොස් ඒ ඉලක්ක සාක්ෂාත් කිරීම සඳහා අපේ අමාත්‍යාංශයටත්, තවත් අමාත්‍යාංශ ගණනාවකටත් එතුමා ඒ කටයුතු භාර දීලා තිබෙනවා.

මම මුලින්ම සඳහන් කරන්න කැමැතියි, මේ නිවාස දස ලක්ෂයේ වැඩ පිළිවෙළ, මේ රටේ පොදු ජනතාවගේ, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුවට විසඳුම් සැපයීමේ වැඩපිළිවෙළ, අපේ අමාත්‍යාංශය මඟින් පමණක් සිදු කරන වැඩ පිළිවෙළක් නොවන බව. අපේ අමාත්‍යාංශය ඒ කටයුත්තේ ප්‍රධාන කාර්ය භාරයකට උරදෙන අතරම, තවත් සමාන්තර රේඛීය අමාත්‍යාංශ ගණනාවක් ඒ ඒ ක්ෂේත්‍ර ඉලක්ක කොට ගෙන මේ වැඩ පිළිවෙළ ස්වාධීනව දියත් කරනවා. මේ සියලු දෙනාගේම දායකත්වයෙන්, එකතුවෙන් තමයි ජනාධිපතිතුමන් බලාපොරොත්තු වන ඉලක්කය සාක්ෂාත් වෙන්නේ. මේ ගරු සභාවේ කරුණු සාකච්ඡා කළ විරුද්ධ පක්ෂයේ ගොඩක් මන්ත්‍රීතුමන්ලාට වැරදුණු ප්‍රධාන දේ තමයි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා ලේඛන පමණක් උපුටා දක්වමින් මේ නිවාස වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කරන්නට පෙළැඹීම. ඒ වාගේම අපේ අමාත්‍යාංශයට වෙන් වී ඇති මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය ගැන සලකා බලමින් එතුමන්ලා මේ නිවාස වැඩ පිළිවෙළේ සාර්ථක, අසාර්ථකභාවය මනින්න පටන් ගත්තා. නමුත් ඒ ක්‍රමවේදයම වැරැදියි. එතුමන්ලාට මම මෙන්න මේ කාරණය මතක් කරන්න කැමැතියි. එතුමන්ලා සඳහන් කළා රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා නිවාස ඇමතිවරයා හැටියට කටයුතු කරපු කාලයේ ඉතා විශාල නිවාස වැඩිදියුණු වීමක්, එහෙම නැත්නම් නිවාස තොගයක් මේ රටට එකතු වුණා කියලා.

මුලින්ම නිවාස ලක්ෂයේ වැඩ පිළිවෙළ, ඊළඟට නිවාස දස ලක්ෂයේ වැඩ පිළිවෙළ, ඊළඟට නිවාස පහළොස් ලක්ෂයේ වැඩ පිළිවෙළ ගැන එතුමන්ලා කිව්වා. ඒ ඔක්කොම එතුමන්ලා කියන විධියට හරියට වුණා, ඒ අනුව ගෙවල් ලක්ෂ 26ක් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ, එතුමා නිවාස ඇමති වෙලා හිටපු කාලයේ මේ රටේ හැදුවා කියලා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප දන්නවා මේ රටේ පවුල් ලක්ෂ 41ක් පමණ තමයි ජීවත් වන්නේ කියලා. එක පවුලකට එක ගෙයක් වශයෙන් අප උපකල්පනය කරලා බැලුවොත් නිවාස ලක්ෂ 41ක් ඕනෑ. ඒකෙන් නිවාස ලක්ෂ 26ක් එතුමන්ලා හදලා. ඒ කියන්නේ සාමාන්‍යයෙන් හැම පවුල් හතරකටම ගෙවල් තුනක් එතුමන්ලාගේ කාලයේ හදලා තිබෙනවා. ඒ කියන්නේ මේ සභාවේ ගරු මන්ත්‍රීවරු 225ක් ඉන්නවා. එතකොට මෙතැන ඉන්න අපටත් ඔය හතරට තුන අනුපාතයෙන් අපටත් ගෙවල් දීලා තිබෙන්න ඕනෑ ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ. ගැලරියේ ඉන්න අර මහත්ම මහත්මීන්ටත් ඒ හතරට තුන අනුපාතය යටතේ ගෙවල් දීලා තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්] ඔබතුමන්ලා කරුණාකරලා මම කියන එක අහගෙන ඉන්න. ඔබතුමන්ලා මම කියන එක අහගෙන හිටියා නේ. පොඩ්ඩක් ඉන්නකෝ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද පත්තරේ පළ වෙලා තිබුණා ලොකු කළු ගලක් එක පාරට මහ සද්දයක් නැඟිලා දෙකට පැළිලා කියලා. මම අනිවාර්යයෙන් විශ්වාස කරනවා, තමුන්නාන්සේලා කවුරු හරි පට්ටපල් බොරු -ගල් පැළෙන බොරු- කියමින් ඒ කිට්ටුවෙන් ගිහිල්ලා තිබෙනවා කියලා. ඒක තමයි ඒ ගල පැළෙන්න එකම හේතුව. අද බලන්න පත්තරයේ එහෙම පළ වෙලා තිබෙනවා. අනිවාර්යයෙන්ම සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා හරි කවුරු හරි ඒ කිට්ටුවෙන් ගිහිල්ලා තිබෙනවා. ඒකයි එහෙම වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඒ කෙරුවාව ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. ඒ කෙරුවාව දැන් අතීතයට එකතු වෙලා ඉවරයි. එදා නිකම් උළුවස්සක් හදා ගන්න මුදල් දුන්නත් එය ගෙයක් දීපු හැටියට සැලකුවා. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ දුන්න වැඩිම නිවාස ණය ප්‍රමාණය රුපියල් 15,000යි. රුපියල් 7,500 තමයි වැඩි දෙනෙකුට දුන්නේ. ගෙදරක උළුවස්ස හදා ගන්න රුපියල් 3,000ක් දුන්නා. ඒකත් ගෙයක් දීපු හැටියට ගණන් ගත්තා. එහෙම දීලා හරි ආපු සංඛ්‍යා ලේඛනවල මොකක්ද තිබෙන්නේ? ඔය කියන කාලයේ මොන තරම් ගෙවල් ප්‍රමාණයක් හැදුවා කියලාද ඒ සංඛ්‍යා ලේඛනවල තිබෙන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ ගණන් පෙන්වන්නම්.

1984 දී -ඒ මුළු අවුරුද්දටම- නිවාස සංවර්ධන අධිකාරිය හරහා නිවාස 43,213යි. ඒ කියන්නේ උළුවහු හදන්න දීපු ඒවාත් ඇතුළුව. ඊළඟට, 1985 දී 43,663යි. ඔය විධියට ගත්තොත්, මුළු නිවාස අධිකාරිය යටතේම තමුන්නාන්සේලා ඔය කියන අවුරුදු හතර-පහ ඇතුළත ලක්ෂ පහ හයකට වඩා ගෙවල් හදලා නැහැ. මම කියන්නේ ගෙවල්වලට උළුවහු හදන්න දීපු ආධාර මුදලුත් ඇතුළුවයි.

අනික් කාරණය මේකයි. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේත් ඒ අමාත්‍යාංශය හරහා විතරක් නෙවෙයි නිවාස වැඩ පිළිවෙළ ගියේ. මහවැලි සංවර්ධන අධිකාරිය වාගේ ආයතන පැත්තෙනුත් ඒවා කළා. මේක ඒ කාලයේත් ඒ සමාන්තර අමාත්‍යාංශ ඔක්කොම එකට එකතු වෙලා ගෙන ගිය ව්‍යාපෘතියක්. එහෙම නැතිව රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබිච්ච ආයතනවලින් පමණක් නොවෙයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාලයේ භාණ්ඩාගාරය දීලා තිබෙන මුදල් ප්‍රමාණයත් බලන්න. අප තමුන්නාන්සේලාට ඉතාම අභීතව කියනවා මුළු ඉතිහාසයම පරීක්ෂා කරලා බැලුවොත් මේ රටේ නිවාස සංවර්ධනය වෙනුවෙන් රජයක් හැටියට වැඩිම මුදලක් ආයෝජනය කරපු අවුරුද්ද 2011 වර්ෂය බව. මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන සල්ලිවලින් විතරක් මේ වැඩේ කරන්න නොවෙයි අතිගරු ජනාධිපතිතුමා අපට මේ වගකීම් පවරලා තිබෙන්නේ. රාජ්‍ය බැංකු හරහා බිලියන 2.5කට ආසන්න මුදලක් මේ රටේ නිවාස සංවර්ධනය වෙනුවෙන්, අඩු ආදායම්ලාභී දුප්පත් ජනතාව වෙනුවෙන් යොදවන්න අපට පුළුවන් වුණා. අපේ අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳ ගත්ත ඔක්කොම ආයතන එකතු කරලා ගත්තාම, සමස්තයක් හැටියට බිලියන හතකට ආසන්න මුදලක් 2011 අවුරුද්දේ යොදවන්න අපට පුළුවන් වුණා. මහත්තයෝ, බිලියන හතකට ආසන්න මුදලක් කියන්නේ ලොකු

[ගරු විමල් වීරවංශ මහතා]

මුදලක්. ඒ නිසා තමුන්නාන්සේලා අර බජට් ඇස්තමේන්තුව අරගෙන ඒකේ තිබෙන ගණන් මිනුම් විතරක් ගණන් කර කර ඉන්න. අප ඒ ගණන්වලට සීමා වන්නේ නැහැ. ගන්න පුළුවන් හැම ක්‍රමවේදයෙන්ම මුදල් හොයාගෙන මේ රටේ අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුව විසඳීමේ වැඩ පිළිවෙළ අප සකස් කර තිබෙනවා. අප තමුන්නාන්සේලාට කියනවා, නිවාස සංවර්ධන අධිකාරිය හරහාත්, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හරහාත් මේ අවුරුද්දේදී 20,000 ඉක්මවන නිවාස තොගයක් මේ රටට එකතු කරන්න අපට පුළුවන් වුණු බව.

ඒ විතරක් නොවෙයි, නාගරික සංවර්ධන අධිකාරිය අද මහල් නිවාස යෝජනා ක්‍රම ගණනාවක් ආරම්භ කර තිබෙනවා. අපිත් මහල් නිවාස යෝජනා ක්‍රම ගණනාවක් ආරම්භ කර තිබෙනවා. බොරැල්ලේ මහල් නිවාස යෝජනා ක්‍රම දෙකක් අප පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම මොරටුව, රාවතාවත්ත ආදී හැම තැනම ඒ වැඩ පිළිවෙළ ඉදිරියට යනවා.

තමුන්නාන්සේලාට මේක බලා ගෙන ඉන්න බැරිව තමුන්නනන්සේලා මොන මොනවා හෝ කියනවා. ඒ කියන එක හැර තමුන්නාන්සේලාට වෙන කරන්නට දෙයක් නැහැ. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා නම් කඩුවෙල ආසනයේ මනුෂ්‍යයා නිසා ඒ මොකක් හෝ කෝන්තරයක් බේරා ගන්න ආවේ. [බාධා කිරීම්] මම ඉතාමත්ම කැමැතියි තමුන්නාන්සේලාට මේ කාරණය අවධාරණය කරන්න. [බාධා කිරීමක්] මා ඔබතුමාට අවසර දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප ඉතාමත් ඕනෑකමින් කියන්නට ඕනෑ, මේ රටේ නිවාස යෝජනා ක්‍රම තිබුණාය කියලා. මහ ජනතාවට ජීවත් වන්නට බැරි තරම් නුසුදුසු වාතාවරණයක තිබෙන නිවස යොජනා ක්‍රම තිබුණා. ඒ නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කරන්න අවුරුදු තිහකට හතළිහකට පස්සෙ මහින්ද රජපක්ෂ ජනාධිපතිතුමා තමයි මුදල් වෙන් කළේ. නැත්නම් හැම දාම හැම ආණ්ඩුවක්ම කිව්වේ, ඔය පරණ කසිකබල් නිවාස යෝජනා ක්‍රමවලට මුදල් වෙන් කරන්න ඕනෑ නැහැ කියායි. ඒ මිනිස්සු නරාවලක වාගේ ජීවත් වුණා. ඒවා කිසිම ආකාරයක ප්‍රතිසංස්කරණයක් කර තිබුණේ නැහැ. මිලියන 300කට වැඩි මුදලක් මේ අවුරුදු දෙක තුන ඇතුළත යොදවා, ඒ සියලුම පැරණි මහල් නිවාස යෝජනා ක්‍රම ජීවත් වන්නට සුදුසු වාසස්ථාන බවට පත් කිරීමේ වැඩ පිළිවෙළත් අපට පටන් ගන්න පුළුවන් වුණා. මේක කෙරෙන කොට තමයි තමුන්නාන්සේලාට මේ රුදාව ඇතිවෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කියන විධියට මේකේ මොකුත් කෙරෙන්නේ නැත්නම් තමුන්නාන්සේලා මේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන්න අද එන්නේත් නැහැ. ඔය කවුරු හරි පතෝලයෙක් දාලා මොනවා හරි කියවලා ඒක ඉවර කරනවා. යමක් කෙරෙනකොට තමයි තමුන්නාන්සේලාට රුදාව වැඩි. බලන්න, තිස්ස අත්තනායක මහත්තයා, මහ ලේකම්තුමා. කරු ජයසූරිය මහත්තයා අද හිටියේ නැහැ. මා හිතනවා, අර ලියුම ලියනවා ඇති කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමා වෙන්න නායකතුමා; ඩබ්ලිව් නායකතුමා. මේ හැමෝම අවේ, අප මේ අරමුණ වෙනුවෙන් කැප වී වැඩ කරන නිසා. මොකක්වත් වෙන්නේ නැත්නම් සුජීව සේනසිංහ මහත්තයෝ තමුන්නාන්සේ මේ හදිස්සියේ උදේ පාන්දර ෆයිල් මිටියක් අරගෙන මෙතැනට එනවාද? මම දැක්කා, ෆයිල් මිටිය අමාරුවෙන් උස්සා ගෙන ආව හැටි. ඒ රුදාව එන්නේ මේ ඉලක්කය සාක්ෂාත් කරන්න, මේ අරමුණු මුදුන්පත් කර ගන්න අප ආණ්ඩුවක් හැටියට එකට වැඩ කරන නිසා.

අද සමෘද්ධි අධිකාරිය හරහා නිවාස වැඩ පිළිවෙළ එහෙන් දියත් වෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය හරහා කොළඹ නාගරික වතු ආශ්‍රිත ජනතාවගේ නිවාස ගැටලුවලට විසඳුම් දෙනවා. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හරහා ඒ පැල්පත් වාසී ජනතාව නඟා සිටුවීමෙ වැඩ පිළිවෙළ දියත් වෙනවා. ධීවර අමාත්‍යාංශය හරහා ධීවරයන් වෙනුවෙන් නිවාස වැඩ පිළිවෙළ දියත් වෙනවා. ඒ විතරක් නොවෙයි. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හරහා මේ රටේ යෞවන සමාජ බළ මුළු එකතු කරලා අසරණ වෙච්ච යෞවන සමාජ සාමාජිකයන්ගේ පවුල්වලට නිවස ලබා දීමේ වැඩ පිළිවෙළ දියත් වෙනවා. මේ විධියට මේ රටේ ආයතන රැසක්; මුළු ආණ්ඩුවක් එකට එකතු වෙලායි මේ රටේ නිවාස අහිමි ජනතාවගේ නිවාස ගැටලුවලට අපි විසඳුම් දෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is a point of Order being raised. Hon. Member, what is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, ඔබතුමාගෙන් මා අහන්න හැදුවේ මෙයයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
මූලාසනයට කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කියන්නකෝ එහෙම නම්. කටාර්වල හදනවාය කිව්ව නිවාස ව්‍යාපෘතියට මොකද වුණේ කියායි මම අහන්නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Minister, you carry on with your speech.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අප ඉතාම ඕනෑකමින් කියන්නට ඕනෑ, මේ වැඩ පිළිවෙළ ගැන තමුන්නාන්සේලා දක්වන කුහක ප්‍රතිපත්තිය අප හෙළා දකින බව. ඉතාම පැහැදිලියි, 2012 අවුරුද්ද ගැන තමුන්නාන්සේලා බොහොම කනගාටුවෙන් කථා කළා. තමුන්නාන්සේලා කියනවා, 2012 අවුරුද්දට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් වෙලා නැහැ කියා. මෙවර අය වැයෙන් 2012 අවුරුද්ද වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා මේ ක්ෂේත්‍රය නඟා සිටුවන්නට මොන විධියේ ප්‍රතිපත්තිමය තීරණය ගත්තාද කියා මම කියන්නට කැමැතියි.

එකක් තමයි අවම ආදායම්ලාභී දුප්පත් ජනතාව වෙනුවෙන් "ජන සෙවණ" ආධාර නිවාස වැඩසටහන දියත් කරන්නට අවශ්‍ය සහයෝගය ලැබී තිබෙනවා. ඔබතුමා "සෙවණ" අරමුදල ගැන

කිව්වා. "සෙවණ" අරමුදලෙන් 2011 වර්ෂයේ තමයි මෑත ඉතිහාසයේ වාර්තාගත මුදලක් යෙදවුණේ, නිවාස අහිමි ජනතාවට නිවාස ආධාර ලබා දෙන්න. සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් පටන් ගත් "සසුනෙන් සෙවණට" වැඩසටහන යන්නේ සම්පූර්ණයෙන් "සෙවණ" අරමුදලේ මුදල්වලින්. ඒක කෙළින්ම දෙන්නේ ආධාරයක්. සියලුම අරමුදල් තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය යටතේයි. [බාධා කිරීම්] ඒක රජයේ ප්‍රතිපත්තියක්. පරිපාලනය එතැන තිබුණාට අපට ඒ මුදල් ප්‍රමාණය ලබා දෙනවා, මේ රටේ දිළිඳු ජනතාවට නිවාස ආධාර ලබා දෙන්න. ඒක කොහේ තිබුණත් අපට කමක් නැහැ. මුදල් ලැබෙනවා, මේ රටේ අහිංසක දුගී දුප්පත් ජනතාවට නිවාස ආධාර ලබා දෙන්න. පන්සල් ආශ්‍රිතව ඒ වැඩ පිළිවෙළ යන්නේ ඒ මුදලින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද රණවිරු අධිකාරිය මේ රටේ රණවිරුවන් වෙනුවෙන් නිවාස වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට යනවා. තමුන්නාන්සේලා ඒවා ගැන මොකුත් කථාවක් කරන්නේ නැතිව, අද මෙතැන තමන්ට බොහොම වාසිදායක උපුටා ගැනීම් විතරක් ඉදිරිපත් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මෙම විවාදය ආරම්භ කරද්දී කිව්වා, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා එදා -1994 දී- ආණ්ඩුව බලයට පත් වුණු ගමන්ම - 1996 දී - ගිය සමුළුවකදී කරපු කථාවක් ගැන. ඇත්ත, එතුමා එහෙම කියලා තිබෙනවා. මොකද, එතුමා වග කිව යුතු රාජ්‍ය තාන්ත්‍රිකයෙක්. රාජ්‍ය තාන්ත්‍රිකයෙක් දේශපාලනය කරන විධියයි, දේශපාළුවෙක් දේශපාලනය කරන විධියයි වෙනස්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා. ඒ ආණ්ඩුවේ නිවාස වැඩ පිළිවෙළ ඔය කියන තරම් කළේ නැහැ යි කියලා අපි දන්නවා. රුපියල් 3,000ක් දීලා උළුවහු ආපු එකත් දන්නවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න, මම කියනකම් ඉන්න. [බාධා කිරීම්] මම කියනකම් ඉන්න. [බාධා කිරීම්] මම කියනකම් ඉන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මේ රටේ ප්‍රශ්න ලෝකයට ගිහින් කිව්වේ නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Sujeewa Senasinghe, වාඩි වෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා ලෝකයට ගිහින් කිව්වේ නැහැ, හිටපු නියෝජ්‍ය ඇමති බොරු කාරයෙක්. හිටපු නිවාස ඇමති බොරුකාරයෙක්, බොරු ගණන් විජ්ජා පෙන්නපු බොරු කාරයෙක් කියලා. එහෙම ගිහින් කිව්වේ නැහැ. එහෙම කියන්න බැහැ. රාජ්‍ය තාන්ත්‍රිකයෙක් වැඩ කරන විධියයි, දේශපාළුවෙක් වැඩ කරන විධියයි අතර වෙනසක් තිබෙනවා. තමුන්නාන්සේලා තමයි මේ රටේ තිබෙන හැම දෙයක් ගැනම පිට රටට ගිහිල්ලා ගතු කේලම් කියන තත්ත්වයට පත් වෙලා සිටින්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
There is a point of Order being raised by the Hon. Dayasiri Jayasekara.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්ථාවර නියෝග 84. (vii) යටතේ මෙතුමා සභාව නොමඟ යවමින් සිටිනවා. එතුමා -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
84. (vii) කියලා එකක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හතේ හත. දයාසිරි මන්ත්‍රීතුමා හතේ හත. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා විහිළුකාරයෙක් වෙලා. [බාධා කිරීමක්] අපි මේ රටේ ජනතාවට බොරු කියන්න බයයි. රට වෙනුවෙන් පිට රටට බොරුවක් කියන්න ඕනෑ නම් ඒක කිව්වාට ප්‍රශ්නයක් නැහැ, රට වෙනුවෙන්. හැබැයි, රටේ ජනතාවට බොරු කියන්නේ නැතිව. තමුන්නාන්සේලා බොරු කියන්නේ රටේ ජනතාවට. ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ ගෙවල් ලක්ෂ 26ක් හැදුවා නම්, අද සිටින්නේ පවුල් ලක්ෂ 41 නම්, පවුලකට එක ගෙයක් ගානේ දුන්නා නම් 4:3 අනුපාතයට ගෙවල් තිබෙන්න ඕනෑ. [බාධා කිරීමක්] පලංසූරිය මහත්මයා ඉන්නවා, නිලධාරි කුටියේ. පලංසූරිය මහත්මයා තමයි මට මේ සංඛ්‍යා ලේඛන දුන්නේ. ඔහු තමයි මට මේ සංඛ්‍යා ලේඛන දුන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා නිකම් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අපි අද ගැන කථා කරමු. මේ වැඩ පිළිවෙළේ අද ප්‍රශ්න තිබෙනවා නම් ඒවා ගැන කථා කරමු. මේක කොහොමද හොඳට කරන්නේ කියලා කථා කරමු. විරුද්ධ පක්ෂය කොහොමද මේකට දායක වන්නේ කියලා කථා කරමු. එහෙම කථා කරලා මේ රටේ අහිංසක අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගැටලුව විසඳන්නට පුළුවන් සහයෝගය දෙන විධිය තමුන්නාන්සේලා බලන්න. එහෙම නැතිව -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා බොරුවක්ද කිව්වේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා නොවෙයි බොරුකාරයා, තමුන්නාන්සේගේ තාත්තා. තමුන්නාන්සේගේ තාත්තයි බොරුකාරයා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පීටර් කෙනමන් ඇමතිතුමා මේ රටේ නිවාස වැඩ පිළිවෙළ ආරම්භ කරපු ඇමති කෙනෙක්. පීටර් කෙනමන් ඇමතිතුමා එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ එතුමා තමයි නිවාස අධිකාරියේ ගොඩනැගිල්ල පවා හැදුවේ. තමුන්නාන්සේ නිකම් පීටර් කෙනමන් යුගය ගැන අසත්‍ය ප්‍රකාශ කරන්න එන්න එපා. හරිද? අද යාපනයට ගියත් නල්ලූර්වල තිබෙන නිවාස යෝජනා ක්‍රමය පීටර් කෙනමන් මහත්මයාගේ කාලයේ හදපු එකක්. නිවාස අධිකාරියේ

[ගරු විමල් වීරවංශ මහතා]

ගොඩනැඟිල්ලත් පීටර් කෙනමන් මහත්මයාගේ කාලයේ හදපු එකක්. මේ කොළඹ නගරයේ තිබෙනවා, තව ඕනෑ තරම් ඒ කාලයේ පටන් ගත් නිවාස යෝජනා ක්‍රම. ඒවා ඔක්කොම වහලා මේ ප්‍රේමදාස යුගය තමයි- [බාධා කිරීමක්] ඔව්, Anderson Flats හැදුවේ කොයි කාලයේද? කොයි කාලයේද Anderson Flats හැදුවේ? [බාධා කිරීමක්] මේ වැඩ පිළිවෙළ යටතේ විවිධ ඇමතිවරුන් ආපු කාලවල විවිධ වැඩ කරලා තිබෙනවා. ඒ හැමෝම මේ වැඩ පිළිවෙළවල් ඉස්සරහට ගෙන යන්න දායක වෙලා තිබෙනවා; සමහරුන් විශාල වශයෙන්, සමහරුන් මධ්‍යම ප්‍රමාණයෙන්, සමහරුන් අඩුවෙන්. ඒ නිසා එක්කෙනෙක් ගැන විතරක් කථා කරන්න තමුන්නාන්සේලාට ඕනෑ වුණාට අපිට ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉතා ඕනෑකමින් කියන්නට ඕනෑ, අද අපේ රටේ ඉදි කිරීම් කර්මාන්තයේ ඇති වෙමින් තිබෙන වර්ධනය ගැන. අතිගරු ජනාධිපතිතුමන්, රණවිරුවන් කැප වෙලා මේ රටට සාමය උදා කිරීමත් එක්ක අද රාජ්‍ය ඉදි කිරීම් ආයතන ටික නැඟිටින්නට පටන් ගෙන තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ "Regaining Sri Lanka" සැලැස්මේ සඳහන් කරලා තිබුණේ, නිවාස අධිකාරිය වසා දැමිය යුතු ආයතනයක් හැටියටයි.

මේ සජිත් මන්ත්‍රීතුමනි, කෝ, ප්‍රේමදාස මහත්මයාගේ කාලය ගැන විතර නේ කථා කළේ. තමුන්නාන්සේලාගේ වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ, 2001 ඉඳලා තිබුණා නේ වික්‍රමසිංහ යුගයක්. ඒ යුගයේ "Regaining Sri Lanka" වැඩ පිළිවෙළේ තිබුණේ නිවාස අධිකාරිය වහාම වසා දැමිය යුතු ආයතනයක් හැටියටයි. "Regaining Sri Lanka" සැලැස්මට අනුව ඒ කාලයේ හදපු ගෙයක් නැහැ. එහෙම වහලා දමන්න බංකොලොත් කරලා තිබුණු ආයතනයක් තමයි අද නැවත ඒ කාර්ය මණ්ඩල වැඩි කරන්නේ නැතිව, සේවක සංඛ්‍යාව වැඩි කරන්නේ නැතිව, ඒ යාන්ත්‍රණයෙන්ම තමයි අපි මේ වැඩ පිළිවෙළවල් අද ඉදිරියට ගෙනියලා තිබෙන්නේ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වැහෙන්න ගියා. ඒ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කාර්ය භාරය නැති වුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලය ගත්තාට පසුව තමයි රටේ ජාතික ඉදි කිරීම් කර්මාන්තයේ විශාල අවස්ථා මේ රටේ රාජ්‍ය ඉදි කිරීම් ආයතනවලට ලබා දීලා ඒවා ශක්තිමත් කරලා නැවත පණ ගන්වලා ගත්තේ.

තමුන්නාන්සේලා ඒවා දකින්නේ නැහැ. එදා අසරණ වෙලා තිබ්බ්ච ඒ රාජ්‍ය ඉදි කිරීම් ආයතන අද නැඟිටිනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා පොදු කැබිනට් පත්‍රිකාවක් දමලා අනුමැතිය ගත්තා තරගකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව රාජ්‍ය ඉදි කිරීම් ආයතනවලට ඒ අවස්ථාව දෙන්න. ඒ නිසා මේ ආණ්ඩුව රාජ්‍යය ශක්තිමත් කරන ආණ්ඩුවක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හදලා තිබෙන්නේ ගෙවල් 1,789යි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කොයි අවුරුද්දේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගිය අවුරුද්දේ. නිවාස සංවර්ධන අධිකාරියේ වාර්තාවලට අනුකූලව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා සම්පූර්ණ වැරැදියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අර පලංසූරිය මහත්මයාගෙන් අහන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි -රජය- ත්‍රිකුණාමලයේ හදලා තිබෙනවා ඊට වඩා වැඩි ප්‍රමාණයක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
2010ද කියන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පලංසූරිය මහත්මයාගෙන් අහන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා මෙතැනට ගෙන්වන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඕනෑ නම් ගෙන්වන්න. මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට මොකක්ද පලංසූරිය මහත්මයාත් එක්ක තිබෙන ඔච්චරම-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමා තමයි මගේ පියාත් සමඟ-

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
එතුමායි ලියලා දීලා තිබෙන්නේ. [බාධා කිරීම්] මේ, එතුමා නේ ලියලා දීලා තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා ඔබතුමාට එකයි, මට එකයි කියලා දෙකක් දීලා නැහැ. දෙනවා නම් දෙදෙනාටම දෙන්නේ එකයි. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ මනුස්සයා ගෙදර යවාවිද දන්නේ නැහැ හෙට උදේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
2010 දී නිවාස 5,145යි හදලා තිබෙන්නේ. අපි පිළිගන්නවා. නිවාස 5,145යි. මේ තිබෙනවා, මා ගාව සම්පූර්ණ නිල වාර්තාව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිවාස 1,789යි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔය වැරැදියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේවා වැරැදිද? මේ පොත වැරැදිද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නිවාස 5,145යි. හැබැයි 2010 මැයිවල තමයි අප මේ අමාත්‍යාංශය භාර ගත්තේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොත වැරැදිද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉතාම ඕනෑකමින් කියනවා, 2011දී ඒ ප්‍රමාණය 20,000ට වැඩි නිවාස තොගයක් දක්වා වැඩිදියුණු කරන්න අපට පුළුවන් වූ බව. මේ අවුරුද්දේදී පුළුවන් වුණා, දිස්ත්‍රික්ක තුනක් ඇරෙන්න අනෙක් හැම දිස්ත්‍රික්කයකටම නිවාස 1,000කට වඩා වැඩි තොගයක් එකතු කරන්න. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට පෙන්වන්නම්, තමුන්නාන්සේලා බොහොම ලොකුවට කිව්වාට-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අර, කපපු නිවාස ණය-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එදා වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! Hon. Minister, you have only two more minutes. We have to suspend the House at 12.30 p.m.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ තමුන්නාන්සේලා- [බාධා කිරීමක්] අනේ, මට විනාඩි දෙකයි තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් යෝජනා කරපු වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා අපි කැප වෙලා වැඩ කරනවා. අපේ අමාත්‍යාංශය යටතේ අපට භාර දීපු වගකීම අප මැනවින් ඉටු කරනවා විතරක් නොවෙයි, අපේ හැම ආයතනයක්ම ශක්තිමත් කරලා කාර්යක්ෂම තත්ත්වයකට ගෙනැල්ලා තිබෙනවා පැවැති තත්ත්වයේ ඉඳලා. ඒ විතරක් නොවෙයි. නිවාස අධිකාරිය කාර්යක්ෂම කරලා තිබෙනවා, එහි cadre එකේ ප්‍රශ්න තිබියදී පවා. වෙන දා සාමාන්‍යයෙන් උපරිම 7,000ක පමණ නිවාස තොගයක් අවුරුද්දකට ඉදි කරපු ආයතනයක් වූ එය අද 20,000 ඉක්මවන නිවාස තොගයක් රටට ඉදි කර දීම සඳහා කැප වූ ආයතනයක් බවට පරිවර්තනය කර තිබෙනවා. තමුන්නාන්සේලා වික්‍රමසිංහ මහත්මයාගේ යුගය ගැන කථා නොකර ප්‍රේමදාස මහත්මයකුගේ යුගයක් ගැන විතරක් කථා කරමින් ව්‍යාජ සංඛ්‍යා ලේඛන ගෙනැල්ලා, බොරු කියලා, ගල් පැලෙන බොරු කියලා, ඒවා සන්සන්දනය කරලා පෙන්වන්න උත්සාහ ගන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේවා අසත්‍යද? මේ පොත අසත්‍ය එකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපි ඉතාම ඕනෑකමින් කියනවා, ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ නිවාස සංවර්ධනය වෙනුවෙන් යෙදෙව්වාට වඩා වැඩි මුදලක් යොදවපු අවුරුද්දක් තමයි 2011 අවුරුද්ද කියන එක. අපි 2012, ඊටත් වඩා වැඩි මුදලක් ඒ වෙනුවෙන් යොදවන අවුරුද්දක් බවට පරිවර්තනය කරනවා. එසේ පරිවර්තනය කරලා මේ නිවාස වැඩ පිළිවෙළ නිවාස 50,000ක් ඉක්මවන ඉලක්කයකට ගෙන යනවා. අපි විශ්වාස කරනවා, ජනවාරි පෙබරවාරි වෙන කොට ඒ සංඛ්‍යා ලේඛන එළි දක්වන්න- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට ගණන් හදලා පෙන්වන්නම්. නිවාස අධිකාරියේ වාර්තාවලට අනුව දසලක්ෂය කියපු අවුරුදු හතරේ පහේ නිවාස අධිකාරිය දසලක්ෂයක් හදලා නැහැ. පහළොස් ලක්ෂය කියපු එකේ පහළොස් ලක්ෂයක් හදලා නැහැ. නිවාස අධිකාරිය හදලා තිබෙන්නේ ලක්ෂ දෙකතුනයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක බොරුද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මොකක්ද අනේ ඔය බොරුද කියලා අහන්නේ?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Now, wind up please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක තමයි වාර්තාව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මොන වාර්තාවද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Habitat වාර්තාව.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Sajith Premadasa, කරුණාකර වාඩි වෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Habitat වාර්තාව,- [බාධා කිරීමක්] ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, "මේ රට ඇතුළේ බොරු කාරයෙක් හිටියා නිවාස ඇමති කියලා. ඒ බොරුකාරයා මෙන්න මේ බොරු ගණන් කිව්වා." කියලා ලෝකයට ගිහින් කියනවාද? හිටපු නිවාස ඇමති ගැන -හිටපු ජනාධිපති ගැන- එහෙම කියනවාද අපි?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආ, ඒ කියන්නේ එතුමා බොරුකාරයෙක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හිටපු ජනාධිපති බොරුකාරයෙක්.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please!

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හැබැයි ලෝකයට ගිහිල්ලා කියන්නේ නැහැ "ඔහු බොරුකාරයෙක්"කියලා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු ඇමතිතුමා, කථාව දැන් අවසාන කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මොනවා වුණත් එතුමා මේ රටේ හිටපු ජනාධිපති හන්දායි, එහෙම නොකරන්නේ. අන්න ඒ ලක්ෂණය අප ළඟ තිබෙනවා. තමුන්නාන්සේලා ළඟ ඒක නැහැ. ඒක තේරෙන්නේ නැහැ තමුන්නාන්සේලාට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන්, මම ස්තුතිවන්ත වෙනවා මේ කටයුතු කර ගෙන යෑම සඳහා අතිගරු ජනාධිපතිතුමා අපට ලබා දෙන දැවැන්ත නායකත්වයට. ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, මුදල් අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරුන්, සියලුම නිලධාරීන්, ඒ වාගේම අපේ ආයතනවල සභාපතිතුමන්ලා, සාමාන්‍යාධිකාරිතුමන්ලා, සියලුම ආයතනවල සේවක මහත්ම මහත්මීන්, මේ සියලු දෙනාම දැවැන්ත කැපවීමකින්, උනන්දුවකින්, උද්‍යෝගයකින් ඒ වැඩ පිළිවෙළ සාර්ථක කරන්න දායක වෙනවා.

ඒ සියලු දෙනාටම මගේ කෘතවේදීත්වය පිරිනමන ගමන්, ඉදිරි අවුරුදු 6 ඇතුළත නිවාස දසලක්ෂයේ වැඩ පිළිවෙළ සාර්ථක කරලා තමුන්නාන්සේලාට පෙන්වනවා කියන සහතිකය දෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

"123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.185,385,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 9,375,000

"123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 9,375,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 131,500,000

"123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 131,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 2,030,200,000

"123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,030,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

123 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයි නියෝග කරන ලදී.

**309 වන ශීර්ෂය. - ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව**

"309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 63,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 3,370,000

"309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,370,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 139,675,000

"309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම, රු. 139,675,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 16,775,000

"309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම, රු. 16,775,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

309 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 310 වන ශීර්ෂය. - රජයේ කර්මාන්ත ශාලාව

"310 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 26,440,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 4,675,000

"310 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.4,675,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 22,000,000

"310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම, රු. 22,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.9,550,000

"310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම, රු. 9,550,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

310 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 311 වන ශීර්ෂය. - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

"311 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 144,135,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

311 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,175,000

"311 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,175,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

311 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 185,385,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 9,375,000

"தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 9,375,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 131,500,000

"தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 131,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,030,200,000

"தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 2,030,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 123, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 309.- கட்டிடங்கள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 63,350,000

"தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 63,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 3,370,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 3,370,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 139,675,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ்செலவுக்கான ரூபா 139,675,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 16,775,000

“தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 16,775,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 309, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 310.- அரசாங்க தொழிற்சாலை**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 26,440,000

“தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 26,440,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 4,675,000

“தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 4,675,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 22,000,000

“தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 22,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 9,550,000

“தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 9,550,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 310, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 311.- தேசிய பௌதிகத் திட்டமிடல் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 144,135,000

“தலைப்பு 311, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ்செலவுக்கான ரூபா 144,135,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 311, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 1,175,000

“தலைப்பு 311, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,175,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 311, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs.185,385,000, for Head 123, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 9,375,000

Question, "That the sum of Rs.9,375,000, for Head 123, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 123, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 131,500,000

Question, "That the sum of Rs. 131,500,000, for Head 123, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 2,030,200,000

Question, "That the sum of Rs. 2,030,200,000, for Head 123, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 123, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 309 - DEPARTMENT OF BUILDINGS

Programme 01. - Operational Activities - Recurrent Expenditure
Rs. 63,350,000

Question, "That the sum of Rs. 63,350,000, for Head 309, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 3,370,000

Question, "That the sum of Rs. 3,370,000, for Head 309, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure
Rs. 139,675,000

Question, "That the sum of Rs. 139,675,000, for Head 309, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 16,775,000

Question, "That the sum of Rs. 16,775,000, for Head 309, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 309, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 310 - GOVERNMENT FACTORY

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 26,440,000

Question, "That the sum of Rs. 26,440,000, for Head 310, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 4,675,000

Question, "That the sum of Rs. 4,675,000, for Head 310, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 22,000,000

Question, "That the sum of Rs. 22,000,000, for Head 310, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 9,550,000

Question, "That the sum of Rs. 9,550,000, for Head 310, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 310, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 311 - DEPARTMENT OF NATIONAL PHYSICAL PLANNING

Programme 01. - Operational Activities - Recurrent Expenditure,
Rs. 144,135,000

Question, "That the sum of Rs.144,135,000, for Head 311, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 311, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 1,175,000

Question, "That the sum of Rs. 1,175,000, for Head 311, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 311, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00 ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Now, we take up the Votes of the Ministry of Petroleum Industries - Head 115.

115 වන ශීර්ෂය.- ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 101,000,000

**தலைப்பு 115.- பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 101,000,000

HEAD 115.- MINISTER OF PETROLEUM INDUSTRIES

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 101,000,000

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
I call upon the Hon. Dayasiri Jayasekara to move the cut.

[අ.භා. 1.00]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "115වන වැය ශීර්ෂය යටතේ ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල හා ආයතනවල සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරනවා.

මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ කතාව කරන්න ලැබීම ගැන. අද රටේ වැදගත්ම අමාත්‍යාංශයක්, ඒ වාගේම කතාබහට ලක් වන අමාත්‍යාංශයක් තමයි ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය. ජනතාවගෙන් අති බහුතරයක් මේ පිළිබඳව බලා ගෙන ඉන්නා නිසාත්, එදිනෙදා ජීවිතයේ සියලු කාරණා තීරණය කරන ප්‍රධාන සාධකයක් නිසාත්, භාණ්ඩ මිලේ ඉඳලා හැම දෙයකටම ඛනිජ තෙල් බලපාන නිසාත් මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ඉතාම වැදගත් වෙනවා.

පහු ගිය කාලයේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, "රට විනාශ කරන රාක්ෂයෝ පස් දෙනෙක් ඉන්නවා"ය කියා. අද අපට මුහුණ දෙන්න වෙලා තිබෙන තත්ත්වය අනුව එයින් එකක් තමයි තෙල් සංස්ථාව. පහු ගිය කාල වකවානුවේ -2010දී- Ceylon Petroleum Corporation එකට මිලියන 256ක ආදායමක් ලැබී තිබුණා. 2011 අගෝස්තු මාසය වන කොට මිලියන 222ක ආදායමක් ලැබී තිබුණා. 2010දී පාඩුව මිලියන 26ක් බවට පත් වෙලා තිබුණා. මිලියන 256ක ආදායමක් තිබුණු එකෙන් මිලියන 26.922ක් පාඩු ලබා තිබුණා. 2011 වෙනකොට සමස්ත ආදායම මිලියන 222.204ක් වුණත් 2011 වර්ෂයේ අගෝස්තු මාසය වන කොට පාඩුව මිලියන 53,687ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. මේ පාඩුව ගෙවන්නේ අපේම රටේ මිනිස්සුයි. අපේම රටේ මිනිස්සුන්ට කරුමයක් බවට පත් වෙලා තිබෙන මෙවැනි ආයතන ගණනාවක් තිබෙනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, Mihin Lanka , ලංගම, SriLankan Airlines, ලංකා විදුලිබල මණ්ඩලය, - Ceylon Electricity Board,- සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව ඒ අතර වෙනවා. වරාය අධිකාරිය 2010 දී පාඩු ලබා තිබුණා. 2011 වන කොට නම් ලාබයක් පෙන්නුම් කර තිබෙනවා. මේ ආයතනවලින් දැවැන්ත පාඩුවක් සිදු වන තත්ත්වයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසාම තමයි අපට හැම විටම මේ පිළිබඳව සාකච්ඡා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

පහු ගිය කාල වකවානුවේදී අපි මේ පාර්ලිමේන්තුවේදී හෙජින් ගිවිසුම ගැන කතා කළා. අපි එදා හෙජින් ගිවිසුම ගැන කතා කරන කොට ඒ කාලයේ අමාත්‍යාංශය භාරව හිටපු ෆවුසි ඇමතිතුමා ඉතාම විහිළු සහගත ආකාරයෙන් තමයි මට උත්තර දුන්නේ.

මම ඒත් එතුමාට එදා කිව්වා, ඔබතුමාගේ ඇඳුම් ටික ගලවලා තමයි අපට අනාගතයේ මේ ගණන ගෙවන්න වෙන්නේ කියලා. 2004 ආණ්ඩුව ආවට පස්සේ 2008 දී තමයි ඔය ප්‍රශ්නය පටන් ගත්තේ. නමුත් එතුමා එදා ඒක ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් විධියට අද වන කොට දළ වශයෙන් කෝටි 1,668ක් පාඩුයි කියලායි අපට තිබෙන ආරංචි අනුව දැන ගන්නට තිබෙන්නේ. තවම මෙහි බේරුම්කරණ ක්‍රියාවලිය අවසන් වෙලා නැහැ. මේ සියලු කාරණා ගත්තාම මේ හෙජින් ගිවිසුමෙත් විශාල ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මේක භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවේ ප්‍රධානියාත් එක්ක කථා කරලා, හොඳින් අධ්‍යයනය කරලා කරපු දෙයක් නොවෙයි. ඔහු සමාන යෝජනා ඉදිරිපත් කර තිබුණු කථාවක් තමයි අවසාන වශයෙන් ඉදිරිපත් වුණේ. ඒ වාගේම අපි දකිනවා, මේ හෙජින් ගිවිසුමේ ගනුදෙනුවට -ඉදිරි දැකුම් ගනුදෙනුවට- අදාළ ලිපි ගොනු කිසිම වෙලාවක විගණනයට ඉදිරිපත් කෙරුවේ නැති බව. ඒක ඇත්ත වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමක් ලෙස තමයි අපි දකින්නේ. මේ සම්බන්ධව තිබිච්ච විගණන විමසුම්වලට කිසිම වෙලාවක තෙල් සංස්ථාවෙන් -ඉතිහාසයේ හිටපු සභාපතිවරයා ගැනයි මම කියන්නේ- පිළිතුරු ඉදිරිපත් කළේ නැහැ. ඒ සම්බන්ධව මම සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට නොවෙයි චෝදනා කරන්නේ. ඒ කාලයේ කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරුන්ටයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මේ ජාත්‍යන්තර හුවමාරු ගිවිසුම අත්සන් කරන්න කලින් නීතිපතිවරයාගේ අනුමැතිය අරගෙන තිබුණේ නැහැ. ඒ විතරක් නොවෙයි, 2008 වර්ෂයේ තනි තනිවම එළැඹුණු ගිවිසුම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියවත්, කැබිනට් මණ්ඩලයේ අනුමැතියවත් අරගෙන තිබුණේ නැහැ. අද මහ බැංකුවේ සභාපතිවරයා විධියට ඉන්න නිවාඩ් කබ්රාල් මහතාගේ උපදෙස් සහ අනුදැනුම මත ඇත්ත වශයෙන්ම කැබිනට් මණ්ඩලය යම් කිසි වැඩ පිළිවෙළකට අනුමැතිය දීම පමණයි සිදු වුණේ. එතැනින් පස්සේ තනි තනි ගිවිසුම් ගැන කිසිම වෙලාවක අධ්‍යක්ෂ මණ්ඩලය කථා කරලා තිබුණෙත් නැහැ. ඒ විතරක් නොවෙයි. කැබිනට් මණ්ඩලයට මේක දාල තිබුණෙත් නැහැ. ඒ වාගේම බැංකු සමඟ කොන්ත්‍රාත්වලට එළඹෙද්දී මිල ගණන් කැඳවීම සිදු කරන ලෙස කැබිනට් මණ්ඩලය උපදෙස් දීලා තිබුණා. ඒ මිල ගණන් කැඳවන්නේ නැතුව තමයි මේ හෙජින් ගිවිසුම එහෙම පිටින්ම ඉදිරිපත් කරලා තිබුණේ. ඒ වාගේම මේ අවාසි සහගත ගිවිසුම් අත්සන් කිරීමේදී නීතිපතිවරයා ලවා හරිහමන් විධියට මේ සම්බන්ධව පැහැදිලි කරවා ගත යුතුයි කියලා තිබුණා. නමුත් ඒවා එකක්වත් පිළිපැදලා තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අමතර, නාවික බොර තෙල් තොගයක් මේ ඉදිරි දැකුම් මිල ගණන්වලට එරෙහිව මේ වැඩේ යන කොටම 2008 ඔක්තෝබර් මස ප්‍රසම්පාදනය කරලා තිබුණා. ඒ නාවික බොර තෙල් තොගය 2008 දෙසැම්බර් 31 වන දිනට ඉතිරි තොගයට ඇතුළත් වෙලා තිබුණේ නැහැ. මේ අමතර, නාවික තෙල් තොගය මිලදී ගැනීමේ පාඩුව විතරක් ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 28.7ක් බවට පත් වී තිබුණා. මේ පාඩුවත් මේකට අදාළ වන කාරණයක් විධියට තමයි තිබෙන්නේ. ඒ වාගේම සංස්ථාවට පවරා ඇති මූල්‍ය බලතලවලට පටහැනිව තමයි මේ ගිවිසුම අත්සන් කරලා තිබුණේ.

ඒ විතරක් නොවෙයි. පසු ගිය කාල වකවානුව ගත්තාම ඉදිරි දැකුම් ගනුදෙනු සඳහා කිසිම පාලන ගිණුමක් තෙල් සංස්ථාවෙන් පවත්වා ගෙන ගියේ නැහැ. මේ සියල්ලම එකට එකතු කරලා ගත්තාම 2009 මාර්තු 31 දක්වා මේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට සිදු වුණා නම්, ඇස්තමේන්තුගත පාඩුව ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 390ක් බවට පත් වනවා. එතකොට මෙවැනි දැවැන්ත පාඩුවක් සහිතව රටේ ජනතාවගේ ජාතික ධනය විනාශ කරපු, ඒ වාගේම රටේ ජනතාවට තමන්ගේ එදිනෙදා ජීවත් වන මුදලින්, බත් පතින් ගෙවන්න වන පාඩුවක් සිද්ධ කරපු නිලධාරින්ට විරුද්ධව දැනට අරන් තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් තවම බේරුම්කරණ ක්‍රියාවලින් යනවා. අපි දන්නවා. බේරුම්කරණ ක්‍රියාවලින් යන්න තරම් ප්‍රශ්න ඇති කරපු නිලධාරින් අද නිදැල්ලේ තමන්ගේ ක්‍රියාකාරකම් ටික කර ගෙන, තමන්ට අවශ්‍ය කරන වාතාවරණය සකස් කර ගෙන යනවා. නමුත් මේ දැවැන්ත වංචාවට වරදකරු වුණු කිසිම කෙනෙකුට විරුද්ධව අද වන තුරු පියවර අරගෙන නැහැ.

මේක තමයි අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය. අපි දන්නවා, ඒ වැට් වංචාව සම්බන්ධව වරදකරු වුණු අය අද නිදැල්ලේ එළියට වෙලා ඉන්නා බව. වැරැදිකරුවන්ව අත් අඩංගුවට ගන්නේ නැතුව, ඔවුන්ට දඬුවම් කරන්නේ නැතුව තියා ගෙන ඉන්න තත්ත්වයක් තමයි අද තෙල් සංස්ථාව තුළත් ඇති වෙමින් තිබෙන්නේ. කරුණාකරලා මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, නීතිය දන්නා අමාත්‍යවරයෙක් විධියට, නීතියට ගරු කරන කෙනෙක් විධියට හිටපු සභාපතිවරයා, ඒ අධ්‍යක්ෂ මණ්ඩලය, ඒකට තීන්දු දුන් අනෙකුත් පුද්ගලයන් සම්බන්ධයෙන් ගත් පියවර මොකක්ද කියලා.

මම බොහොම පැහැදිලිව කිව්වා, එවකට තිබුණු කැබිනට් මණ්ඩලයේ සාමාන්‍ය අනුමැතිය මේ ක්‍රමයට දුන්නා මිසක්, ගනුදෙනු කරන කොට එකින් එක අරගෙන ගිහිල්ලා කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර ගත්තේ නැහැ කියලා. එහෙම කරන්න තිබුණා. නමුත් ඒවා කරලා නැහැ. එසේ නොකර තනිවම ගිහිල්ලා තමන්ට වුවමනා විධියට මේවා කරන්න අවශ්‍ය කරන වාතාවරණය සකස් කළ නිලධාරින් කවුද කියලා හොයලා බලලා ඉතාම ඉක්මනින් ඒ අයට විරුද්ධව පියවර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලන්න කැමැතියි.

අපි දන්නවා ඊ ළඟට හෙජින් සුදුවෙන් පටන් අරගෙන ලංකාවට බාල තෙල් එන තෙක් මේ ප්‍රශ්නය දිගින් දිගටම ඇදිලා ආවාය කියන එක. අපි දන්නවා, "මොකක්ද වුණේ?" කියලා. බාල තෙල් ගෙනැල්ලා මේ රටේ දහස් ගණන් වාහන සම්පූර්ණයෙන් විනාශ මුඛයට පත් වුණා විතරක් නොවෙයි, එක එක අමාත්‍යවරු ඒකට විවිධ කථා කිව්වා. ඔබතුමාත් එක එක විධියේ කථා කියලා තිබුණා. නමුත් අවසාන වශයෙන් බලපුවාම ඒකේ විනාශය දරන්න සිද්ධ වුණේ අපේ ලංකාවේ මිනිස්සුන්ට. රුපියල් කෝටි 45කට අධික මුදලක් අපේ රටේම මිනිස්සුන්ටයි ගෙවන්න සිද්ධ වුණේ. ඒකයි අපි අහන්නේ. මේවාට වග කියන්න ඕනෑ නිලධාරින් ඉන්නවා. එම ආයතනවලට සභාපතිවරුන් පත් කරලා තිබෙන කොට, තෙල් ගෙන්වන්න අවශ්‍ය කමිටු පත් කරලා තිබෙන කොට, ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන කොට ඒ වැඩ පිළිවෙළට එහා ගිහින් කටයුතු කළාම 101, 102, 103, 104, 105 දක්වා මුදල් රෙගුලාසි - FR - අනුව දඬුවම් කරන්න පුළුවන් බව ඔබතුමාම දන්නවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, "මේ වන තුරු ඒ අය වෙනුවෙන් ගත් පියවර මොකක්ද?" කියලා. බාල තෙල් ගෙන්වීම පිළිබඳව දවස ගානේ ඒ කාරණා එකින් එක අපි කථා කළා.

ඒ බාල තෙල් ගෙන්වපු අය -Vitol Asia (Pvt.) Limited කියන ආයතනය- මීට කලින් 2009.08.28 සහ 29 තව තෙල් තොගයක් ගෙනාවා. ඒ තෙල් තොගය නිසා ලංකාවේ තිබුණු විදුලි බලය නිෂ්පාදනය කරන ආයතනවලට දැවැන්ත පාඩුවක් සිද්ධ වුණා. මම කියන්නම් ඒකේ පාඩුව කොච්චරද කියලා. Ace Power Embilipitiya (Pvt.) Limited එකට සිද්ධ වුණු පාඩුව රුපියල් මිලියන 224යි. Ace Power Generation Horana (Pvt.) Limited එකට සිදු වුණු පාඩුව රුපියල් මිලියන 50යි. රුපියල් මිලියන 50ට වැඩි පාඩුවක් සිදු වුණා. Ace Power Matara (Pvt.) Limited එකට රුපියල් මිලියන 54ක් පාඩුයි. Lakdhanavi (Pvt.) Limited එකට රුපියල් මිලියන 84ක් පාඩුයි. Heladhanavi කොම්පැනියට රුපියල් මිලියන 120ක් පාඩු වුණා. මේ රුපියල් මිලියන ගණනාවක පාඩුව සඳහන් කර තිබෙන නීතිපතිතුමාගේ "Reference No. C/442/09/CPC" කියන 2009 ඔක්තෝබර් 27 දිනැති ලිපිය අනුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් කියනවා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කරන පියවර ගන්න කියලා. ඒ කාලයේ මේජර් ජනරාල් අශෝක තෝරදෙනිය මහත්මයා මෙකට ලිපියක් යවලා තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
*නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවපු ලිපියේ දිනය කවදාද?*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

2009 ඔක්තෝබර් මාසයේ 27වැනි දා. ඒ ලිපියට අරගෙන තිබෙන පියවර මොකක්ද කියලා මම අහනවා. මේක තහනම් කළා. තහනම් කරලා ටිකක් කල් ඉඳලා නැවතත් තහනම අයින් කරලා තමයි Vitol Asia (Pvt.) Limited එකෙන් බාල තෙල් ටික ගෙනාවේ. එදා මේක තහනම් කරලා තිබුණා නම් මේ රුපියල් කෝටි 45 විනාශය අද අපේ ලංකාවට සිද්ධ වන්නේ නැහැ. ඇයි, මේක blacklist කරලා තිබුණ කොම්පැනියක්. මේ කොම්පැනිය blacklist එකෙන් remove කරලා -ඉවත් කරලා- තමයි මේවා ගෙන්වන්න අවසර දුන්නේ. මේක කළේ තමන්ගේ පාඩුව දරා ගන්න ද කියලා මම දන්නේ නැහැ. ඇත්තටම මේ ආයතනයෙන් අය කර ගත්තාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. Vitol Asia (Pvt.) Limited කියන ආයතනය ගෙන්වූ තෙල් පාවිච්චි කරලා විදුලි බලය නිෂ්පාදනය කිරීමෙන් ඒ ආයතනවලට සිද්ධ වුණ පාඩුව දැනට අය කර ගෙන තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්න කැමැතියි. මොකද, මේකේ වියදම රුපියල් කෝටි එකසිය ගණනක් තිබෙනවා. මම ඔබතුමාට පෙන්වලා දෙන්න හදන්නේ මේකයි. මේ ආයතන පාඩු වන්නේ නැහැ; ඔබතුමා සමහර ඒවා දන්නේ නැහැ. සමහර ඒවා ඔබතුමාට කියන්නේ නැහැ. සමහර ඒවා එහෙම පිටින්ම ඇතුළේ හිර වෙලා තිබෙනවා. ඇමතිවරු පැත්තකට දමලා වෙනත් අය එක්ක උඩින් ගිහිල්ලා deal දැම්මාම තමයි අවසාන ප්‍රතිඵලය හැටියට ඇමතිවරු අමාරුවේ වැටෙන්නේ. ඒ නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. මේවාට ගත්ත විසඳුම් සම්බන්ධයෙන් කරුණාකර මේ ගරු සභාවට වාර්තා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට සිද්ධ වෙලා තිබෙන දේ බලන්න. ඛනිජ තෙල් සංස්ථාව ඩීසල් මිල දී ගැනීම සඳහා 2011 අගෝස්තු මාසයේ 29වැනි දා ටෙන්ඩර් කැඳවනවා. ඩීසල් මෙට්‍රික් ටොන් 2,40,000ක් මිල දී ගන්න ටෙන්ඩර් කැඳවලා ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා. මාස හයකට මෙට්‍රික් ටොන් 2,40,000ක්. අවසානයේ මොකක්ද වන්නේ? ඒ ගැන විස්තරයක් මා ළඟ තිබෙනවා. මම ඒ විස්තරය **සභාගත*** කරනවා. එය හැන්සාඩ්ගත කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ ලේඛනයේ කොම්පැනි ගණනාවක නම් තිබෙනවා. Philippine කියලා කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 1.67යි. Glencore කියලා කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 1.78යි. BB Energy කියලා කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 1.94යි. Enco කියලා කොම්පැනියක් තිබුණා; ඒක premium එක 1.95යි. Trafigura කියලා තවත් කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 1.98යි. Vitol කියලා කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 1.98යි. Daewoo කියලා තවත් කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 2.13යි. Itochu කියලා කොම්පැනියක් තිබුණා; ඒකේ premium එක 2.49යි. මේ ගොල්ලන් මේකේ premium එක දමලා තිබුණා. Interest එක 2.07 ඉඳලා සියයට

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දයාසිරි ජයසේකර මහතා]

4.75 දක්වා වන පරාසයක තිබුණා. මම ඒ විස්තරය ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. මේ ටෙන්ඩර් පටිපාටියට අදාළ නොවුණු PetroVietnam කියන කොම්පැනියකට කථා කරලා අමාත්‍ය මණ්ඩලයේ අනු කමිටුව තීරණය කරනවා, කිසිම ටෙන්ඩර් පටිපාටියකට ඉදිරිපත් නොවුණු කොම්පැනියක් වුණු PetroVietnam සමාගමේ -ඒ කොම්පැනියේ- ටෙන්ඩර් ලන්සුව භාර ගන්නට. ඒ කොම්පැනිය ටෙන්ඩර් ඉදිරිපත් කරලා නැහැ. නමුත් අමාත්‍යාංශ ලේකම්වරයාට කියනවා ඒක භාර ගන්න කියලා. ඒ ටෙන්ඩරයේ මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 225ක් හෙවත් රුපියල් 10,24,750ක්. දැනට මිල දී ගන්නේ බැරලයක් සඳහා ඇමෙරිකානු ඩොලර් 1.6ක් ගෙවලායි. ඒ සඳහා වාරික පොලිය සියයට 2.70යි. මෙතැන සිදු කර තිබෙන වංචාව මොකක්ද? PetroVietnam සමාගමේ තෙල් බැරලයක් වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1.58ක් ගෙවනවා. ශත දෙකක ලාභයක් පෙන්වනවා. [බාධා කිරීමක්] ඔව්, premium එක. එතැනින් ශත දෙකක ලාභයක් පෙන්වනවා.

ඔබතුමාට මම තවත් කාරණයක් කියන්නම්. එතැන ශත දෙකක ලාභයක් පෙන්වනවා. නමුත් වාරික සඳහා පොලිය ඇමෙරිකානු ඩොලර් 2.70 සිට 2.75 දක්වා වැඩි කරනවා. මෙතැන අනෙක් ඒවා ගණන් ගත්තේ නැති වුණත්, ඔක්කොම තිබෙන්නේ 1.58ට වැඩි ඒවා. හැබැයි, 1.58ට දමනවා. එහෙම දමලා LIBOR interest එක ඇමෙරිකානු ඩොලර් 2.70 ඉඳලා 2.75 දක්වා වැඩි කරනවා. ඒකෙන් ශත පහක් උපයා ගෙන තිබෙනවා කියලා පෙන්නුම් කරනවා. ඇත්ත වශයෙන්ම තෙල් බැරලයකින් ශත තුනක් ගහලා තිබෙනවා. [බාධා කිරීමක්] හරි, premium එක 2.75යි. [බාධා කිරීමක්] ඔබතුමා බලන්න, ඒකෙන් ශතයක්වත් ලැබිලා නැහැ. මම මේක තර්කයක් විධියට ඉදිරිපත් කරන්නේ. ඒක අපි කථා කර ගනිමු. මම බොහොම පැහැදිලිව කියනවා- [බාධා කිරීමක්] ඇයි මේ අයගෙන් ටෙන්ඩර් කැඳෙව්වේ නැත්තේ? [බාධා කිරීමක්] අපටත් පුළුවන් කථා කරන්න. නමුත් සාමාන්‍යයෙන් ටෙන්ඩර් පටිපාටියක් තිබෙනවා. ඒකයි මම ඔබතුමන්ලාට කියන්නේ. කොහේ හරි, මේ ගනුදෙනුවෙන් ගසා කන මිනිහෙක් ඉන්නවා. මම ඒකයි කියන්නේ. මා ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. මේක පැහැදිලිවම ටෙන්ඩර් කමිටුවේ ප්‍රශ්නයක්. මේ ගැන නඩුවක් දැම්මා නම් අපට කියන්න පුළුවන්, ටෙන්ඩර් කැඳවීමක් කරන්නේ නැතිව මේ ගනුදෙනු සිදු වෙලා තිබෙන බව. කොහෙන්ද මේවා ගෙනැල්ලා දුන්නේ කියන එකයි අපි අහන්නේ. මේ පාඩුව දරන්නේ ජනතාව. මේ ශත දෙක, ශත තුන කිව්වාට ඒවා ඩොලර්වලින් තිබෙන්නේ. ඒ ගණන රුපියල්වලට එනකොට අපි දන්නවා ගණන කොච්චරද කියලා. ඒක එක කාරණයක්.

ඊළඟට, මේ ඊයේ පෙරේදා Petro Vietnam එක ජනාධිපතිතුමා හම්බ වෙලා ගියා. එතැනින් පස්සේ ජනාධිපතිතුමාගේ නම විකුණමින් වෙන කවුරු හෝ මේවා කරනවාද කියලා මම දන්නේ නැහැ. නිලධාරින් කරනවාද, වෙන කවුරු හෝ කරනවාද කියලා මම දන්නේ නැහැ. ඒකයි මම මේ කියන්නේ. ජනාධිපතිතුමාව හමු වෙලා ගියා වියට්නාමයේ ජනාධිපතිතුමා. ඉතින් ඒ අනුව වියට්නාමයෙන් තෙල් ගෙන්වන එක වාසියි කියලා කවුරු හරි හිතනවාද කියලා මම දන්නේ නැහැ.

දැන් මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? මේ ගනුදෙනුවල ටෙන්ඩර් පටිපාටියක් නැහැ. ආයෙත් unsolicited offer එකක් ගෙන්වා ගන්නවා. ඒක ගෙන්වා ගෙන මොකක්ද කරන්නේ? සාමාන්‍යයෙන් ඔබතුමන්ලා ළඟ ටෙන්ඩර්කරුවන් 60ක්, 70ක් ඉන්නවානේ. 60ක් විතර ඇති මා හිතන විධියට. ඒ ටෙන්ඩර්කරුවන්ගෙන් අයැදුම් පත් කැඳවන්නේ නැතිව, කිසිම කෙනකුගෙන් අයැදුම් පත් කැඳවන්නේ නැතිව කෙළින්ම unsolicited proposal එකක් කරන්නේ. ඒ කියන්නේ, කෙළින්ම Petro Vietnam එකට කථා කරලා, මෙන්න මේ ගණනට තෙල් ගෙනැල්ලා දෙන්න කියනවා. එහෙම ගෙනාපුවාම අපි දන්නේ නැහැ ඒවා කීයට දෙන්න පුළුවන්ද කියලා. [බාධා කිරීමක්] අලුත් ගනුදෙනුව ගැන මම මේ කියන්නේ. ඒකෙන් ඩීසල් ගෙන්වන්නයි කටයුතු කරන්නේ. ඔබතුමා හොයලා බලන්න. දැන් මේ සම්බන්ධයෙන් කරුණු මා ඔබතුමාට කියන්නම්.

අපි දන්න විධියට "හදිසියි" කියලා තමයි මේ ගනුදෙනු ඔක්කෝම කරන්නේ. මෙහිදී ටෙන්ඩර් කොමිටිය එකතු වෙලා දානවා කැබිනට් එකට කැබිනට් පත්‍රිකාවක්. කැබිනට් පත්‍රිකාවේ දමන්නේ කොහොමද? හදිසි නිසා මේවා ගෙන්වන්න අවශ්‍යයි කියලා දමනවා. තෙල්වල මිල ගණන් අපි දන්නේ නැහැ. මාස හයකට තෙල් ගෙන්වනවා නම්, යම් කිසි විධියකට මිල අඩු කරලා, වෙනස් කරලා සාධාරණ විධියට ගනුදෙනු කරලා ගෙන්වන්න පුළුවන්. නමුත් මෙතැන මොකද වෙන්නේ? මේ තෙල් ගෙනෙන්න vessel එකක් නැහැ; නැවක් නැහැ. තෙල් ගෙන්වන්න තෝරා ගත්ත නැවේ නම "Miss Krissy." ඒ නැවේ ගාස්තු මම ඔබතුමාට කියන්නම්. යූඑස් ඩොලර් 400 දක්වා පමණයි ඔවුන්ගේ රක්ෂණය දෙන්නේ. හැබැයි "Natalie"කියලා තව කොම්පැනියක් තිබෙනවා. ඒ කොම්පැනිය යූඑස් ඩොලර් 600 දක්වා ආරක්ෂාව අපට දෙනවා. ඒ කියන්නේ bunker කරන කොට තිබෙන risk එක, ඒවා මේවා ඔක්කෝම ඒ අය ගන්නවා. හැබැයි යූඑස් ඩොලර් 400ට පමණයි මේ "Miss Krissy" කියන නැව රක්ෂණය ලබා දෙන්නේ. එහෙම වුණත් "Miss Krissy" කියන එක තමයි මේ අය තෙල් ප්‍රවාහනයට යොදා ගන්නේ. අපට ඩොලර් 600ක් දක්වා ආරක්ෂාව දෙන "Natalie" නැව ගෙන්වා ගන්නේ නැතිව, "Miss Krissy" නැව ගෙන්වා ගැනීම තුළ අත යට ගනුදෙනුවක් සිද්ධ වන බවයි මට කියන්න තිබෙන්නේ. [බාධා කිරීමක්]ඒක තමයි මම කියන්නේ. ඇයි ඔබතුමන්ලාට බැරි, මේ ටෙන්ඩර්කරුවන්ගෙන් ටෙන්ඩර්පත් කැඳවලා මේ ගනුදෙනු කරන්න? ඒ ක්‍රමයට අනුව ඕනෑ කෙනකුට තෙල් ගෙනෙන්න අවස්ථාව දෙන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. එහෙම නැතිව, හදිසියි කියලා මෙහෙම තෙල් ගෙන්වූවාම අපටත් ප්‍රශ්න කරන්න පුළුවන් පාර්ලිමේන්තුවේ, "මොකක්ද මේ කරන්නේ?" කියලා. ඒකෙන් ඔබතුමන්ලාටත් චෝදනාවක් එනවා. අපට මේ චෝදනාවලින් බේරිලා තෙල් ගෙන්වීම කරන්න පුළුවන්. එතකොට කිසි ගැටලුවක් නැහැ. ඒකයි මම කියන්නේ.

ඒ නිසා මේ වංචාවට සම්බන්ධ කවුද කියලා කරුණාකර හොයලා බලන්න. මොකද, මේවා සිද්ධ වුණාට පස්සේ, "අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා දමනවා වාගේ" තමයි වෙන්නේ. දැන් සිද්ධ වෙලා තිබෙන දේ දන්නවානේ. වැරදි කරපු හිටපු නිලධාරින්ට විරුද්ධව කරපු දෙයක් නැහැ. ඒ ගොල්ලන් අනිවාර්ය නිවාඩු යවලා තිබෙන්නේ. අනිවාර්ය නිවාඩු කියන්නේ, ඒ ගොල්ලන් පඩි අරගෙන ගෙදර ඉන්නවා කියන එක. ඊට වැඩිය හොඳයි මෙතැනම වැඩ කරන්න කිව්වා නම්. එතකොට අඩුම තරමින් කරන වැඩකට තමයි පඩියක් ගන්නේ. දැන් ඒ අය ඔක්කෝම අනිවාර්ය නිවාඩු යවලායි තිබෙන්නේ. ඒක නිකම් ප්‍රසූත නිවාඩු වාගෙයි. ඒ ගොල්ලන් මොනවත් වරදක් කරලා නැහැ වාගෙයි. නිවාඩු අරගෙන ගෙදරට වෙලා ඉන්නවා. නමුත් ඒ අය කෝටි ගණනක වැරදි කරලා, රටේ ජාතික ධනය කොල්ල කාලා තිබෙන්නේ. හැබැයි ඒ ගොල්ලන්ට විරුද්ධව ගත්ත තීන්දු තීරණ සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙළක් මේ වන තුරු හදලා නැහැ. මා ඒකයි කියන්නේ.

මේ සිද්ධ වෙන අලාභ ගෙවන්නේ අපේ අහිංසක, දුප්පත් මිනිසුන්ගේ සල්ලිවලින්. කෝටි 45ක් පාඩු වුණාම කියනවා, "ලෝකයේ තෙල් මිල වැඩියි, ඒ නිසා තෙල් මිල වැඩි කරන්න වෙනවා" කියලා. හැබැයි සමහර වෙලාවට ලෝකයේ තෙල් මිල අඩුයි. ඒ වුණාට අපේ අහිංසක දුප්පත් මිනිසුන්ට තමයි තෙල් සංස්ථාවේ පාඩුව ගෙවන්න වෙන්නේ. මේ සංස්ථාවේ පාඩුව ගෙවන්න ඕනෑ කවුරුවත් නොවෙයි, මේ අහිංසක දුප්පත්

ජනතාව. මේ ඉන්න නිලධාරින්වත්, ඇමතිවරයාවත්, ආණ්ඩුවවත්, කැබිනට් එකවත් මේ මුදල් ගෙදරින් ගෙනැල්ලා දෙන්නේ නැහැනේ. මේ මුදල් අහිංසක දුප්පත් මිනිසුන්ගෙන් ගන්නේ. ඒකයි අපි මේක ප්‍රශ්න කරන්නේ.

දැන් බලන්න. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තාම අපට කියන්න කාරණා ගණනාවක් තිබෙනවා. ඔබතුමන්ලා 2008 දී මේ පිරිපහදුව හදන්න කථා කළා. බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ, 1962 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පටන් ගෙන ක්‍රියාත්මක කර ගෙන ගියා. 1965 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ඩඩ්ලි සේනානායක මැතිතුමා තෙල් පිරිපහදුව පටන් ගත්තා. ඒ කාලයේ ලෝකයේ එකම එක තෙල් පිරිපහදුවයි තිබුණේ. ඒක තමයි ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා පිරිපහදුව. ඒ ගොල්ලෝ සාමාන්‍යයෙන් බැරල් ලක්ෂ 2ක් පිරිපහදු කළා. අපි බැරල් 35,000න් පටන් ගෙන ඉදිරියට ගෙන ගියා. බලන්න, දැන් ඒ පිරිපහදුවේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. ඒ පිළිබඳව අපි සියලු දෙනාටම වඩා ඇමතිතුමා බොහොම පැහැදිලිව දන්නවා. මේ තෙල් පිරිපහදුව නිසි ලෙස ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලයක් විධියට ඩීසල් හා භූමිතෙල් සියයට 55ක් ලැබෙන අතර, තාර සහ furnace oil සියයට 45ක් ලැබෙනවා. ඉරානෙන් බොර තෙල් ගෙනැවිත් පිරිපහදු කරන කොට bottom product එකක් විධියට තාර සහ furnace oil සියයට 45ක් හම්බ වනවා. Naphtha, ඩීසල් හා භූමිතෙල් කියන ඒවා සියයට 55ක් හම්බ වනවා. දැන් බලන්න, ඉන්දියාවේ Reliance Company එක. ඉන්දියාවේ Reliance Company එකේ නිෂ්පාදනයෙන් තාර සහ furnace oil එන්නේම නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක latest එක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Latest එක තමයි මා කියන්නේ. මා ඒකයි කියන්නේ. 2001-2004 ආණ්ඩුව කාලයේ ඇමෙරිකානු කම්පැනියක් එක්ක කථා කරලා, ඩොලර් මිලියන 840ක් දීලා අපි මේ තෙල් පිරිපහදුව හදන්න හැදුවා. එතකොට ඔබතුමන්ලා මොකක්ද කළේ? ඒක නතර කළා. [බාධා කිරීමක්] ඔව්. බීඕටී. ඒකේ ගණනත් මා කියන්නම්. හැබැයි අවුරුදු 20කින් අපට වියදමක් නැතිව ගන්න තිබුණා. වියදම ශත 05ක්වත් තිබුණේ නැහැ. අපට තිබෙන පිරිපහදුවත් නොමිලේ හදා දෙන්න ඒ ගොල්ලෝ සූදානම් වුණා. එහෙමයි ගිවිසුම තිබුණේ. ඒකට ප්‍රශ්නය ඇති වුණේ ඇමතිතුමාගෙන් නොවෙයි. එදා ඩොලර් මිලියන 840කට අලුත් තෙල් පිරිපහදුවක් හදලා, තිබෙන තෙල් පිරිපහදුවත් ශුද්ධ කරලා හදන්නයි හැදුවේ. එතකොට අපටම කියලා පිරිපහදුවකුත් තිබෙනවා; වෙනම පිරිපහදුවකුත් තිබෙනවා. ඒක හදලා ඒ ගොල්ලෝ අවුරුදු ගණනකින් යන්න හිටියේ. ඒක හදලා සමහර විට පිට රටවලට ආපසු දෙන්න තිබුණා. එහිදී යම් කිසි ක්‍රියා මාර්ග අපට ගන්න තිබුණා. මේ සියල්ලම පැත්තකින් තියලා ඔබතුමන්ලා මොකක්ද කළේ ? ඔබතුමන්ලා බලයට ආපු ගමන් ඩොලර් මිලියන 840 වැඩේ නතර කරලා දැම්මා. දැන් අලුත් එකක් හදන්න යනවා. මා ඒකේ ගණනත් කියන්නම්.

Reliance Company එක බලන්න. ඒකේ bottom products ඇත්තේම නැහැ. ඒ පිරිපහදුව ඉතාම අලුත්ම ක්‍රමවේදයකට හදලා තිබෙනවා. අන්තිමේදී කිසිම අතුරු නිෂ්පාදනයක් නැති තත්ත්වයක් තිබෙන්නේ. මා කියන්නේ නැහැ, Reliance Company එකේ තරමට අපේ පිරිපහදුව ගෙනෙන්න කියලා. Reliance Company එකට වඩා අඩු වුණත් මේ අලුත් technology එක දැම්මාම තිබෙන වටිනාකමයි මා මේ කියන්නේ. අපේ කාලයේ ඒක කරන්න හදනකොට ඔබතුමන්ලා ප්‍රමාද කරපු එකේ ප්‍රතිඵලයයි මා මේ කියන්නේ. අපි බලයේ ඉන්න කොට, 2001 දී ඒ පිරිපහදුව හදන්න දුන්නා නම්, අද වන කොට අලුත් පිරිපහදුවක් අපට තිබෙනවා. තිබෙන පිරිපහදුවත් අලුත්වැඩියා කරලා පටන් ගන්න තිබුණා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ.

2001 දී අපි කරන්න ගිය දේ ඔබතුමන්ලා අවලංගු කරලා, "කැහි ගැනි දීලා හොටු ගැනි ගත්තා වාගේ" වැඩක් තමයි දැන් කරන්න යන්නේ. ඒ කියන්නේ තිබුණු එකට වඩා නරක එකක් තමයි දැන් හදන්න යන්නේ. එදා ඔබතුමන්ලා ඒ අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න දුන්නා නම්, අද මේ ප්‍රශ්නය ඇති වන්නේ නැහැ. මේ පිරිපහදුවෙන් තමයි අද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැවැන්තම පාඩුව ලබන්නේ. ඒක තමයි අද ලොකුම ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ. මා ඒකයි ඔබතුමාට කියා ගෙන ආවේ.

අපට දිනකට ගෑස් මෙට්‍රික් ටොන් 550ක් අවශ්‍ය වනවා. නමුත් අපි මේ පිරිපහදුවේ නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික් ටොන් 60යි. නමුත් අපි ගිය අවුරුද්දේ දිනකට මෙට්‍රික් ටොන් 90ක්, 100ක් නිෂ්පාදනය කළා. නමුත් දැන් දවසකට නිෂ්පාදනය කරන්න පුළුවන් ප්‍රමාණය මෙට්‍රික්ටොන් 60ත්, 70ත් අතර ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා. එන්න එන්නම පිරිපහදුව කඩා ගෙන වැටෙනවා; වැඩක් කර ගන්න බැරි තත්ත්වයකට එනවා. මෙම පිරිපහදුවෙන් ඔක්ටේන් නිපදවන්න බැහැ. ඒ නිසා අද වන කොට ඔක්ටේන් 88 නිෂ්පාදනය කරලා ඒකට පිට රටින් ගෙන්වන ඔක්ටේන් 92 කලවම් කරලා අපට දෙනවා. මේක තමයි දැන් අද ඔබතුමන්ලා කරන්නේ. ඔබතුමන්ලා පිට රටින් බොර තෙල් ගෙනැවිත්, ඒකෙන් එන නිෂ්පාදන ටිකක් ගන්නවා. අනික් නිෂ්පාදනත් එතැනින්ම ගත්තා නම් ඇති වන ප්‍රශ්නය මොකක්ද? මොකුත් ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ නේ. එතකොට අපට අවශ්‍ය දේ නිකම්ම ලැබෙනවා. නමුත් දැන් ඒක වන්නේ නැහැ. අපි දවසකට පෙට්‍රල් නිපදවන්නේ මෙට්‍රික් ටොන් 600යි. නමුත් දවසකට පෙට්‍රල් මෙට්‍රික් ටොන් 1,900ක අවශ්‍යතාවක් තිබෙනවා. ඉතිරි ඒවා අපි පිට රටින් ගෙන්වනවා.

අපි දන්නවා බොර තෙල්වලින් කොමිස් ගහන්න බැහැ කියලා. බොර තෙල් ගෙනාවාම අපිට අනෙක් products ටික නිකම්ම ඇති වෙනවා. නමුත් පිරිපහදු කරපු තෙල් ගෙනෙන කොට තමයි commission එක එන්නේ. මම ඒකයි අහන්නේ, "commission එකටද බොර තෙල් ගෙනෙන එක නතර කරන්නේ, නැත්නම් වෙනත් කාරණයකටද?" කියලා. මොකද, අපි අඩු මිලට බොර තෙල් ගෙනැල්ලා ඒක පිරිපහදු කරන කොට ඒකෙන් naphtha එකේ සිට තාර ටික දක්වා බඩු ටික අපේ අතට ලැබෙනවා. ඒවා මුකුත් නැතුව අපිට සියයට සියයක් හොඳ පිරිසිදු තෙල් ටික ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත් ඒක දැන් ගෙන්වන්න විධියක් නැහැ. දැන් බලන්න 2009දී මෙට්‍රික්ටොන් 20,000 බර පන්තිය 1,500ක් ගෙනාවා. ඒකේ ගෙන්දගම් වැඩි වෙලා ඒ අලාභයත් අපිට ගෙවන්න සිද්ධ වුණා. අපි දන්නවා පිරිපහදු තෙල් වරායට ගෙනාවාම ගාස්තු විධියට ඩොලර් 3.7 දක්වා ගණනක් අපි ගෙවන්න ඕනෑ කියලා. නමුත් බොර තෙල්වලට වරාය ගාස්තු අපි ගෙවන්න අවශ්‍ය නැහැ. අපි ශත පහක්වත් ගෙවන්න ඕනෑ නැහැ. ඇත්ත කථාව ඒකයි.

දැන් අපේ ඩීසල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 4,500යි. අපි නිපදවන්නේ මෙට්‍රික් ටොන් 1,800යි. මම කියන්නේ ඒකයි. මේ පිරිපහදුවේ ප්‍රශ්නය නිසා තමයි අපි රටක් විධියට දැවැන්ත අර්බුදයකට පත් වෙලා තිබෙන්නේ. දැන් දුරකථනයෙන් තෙල් ආනයනය කරන තැනට ගිහිල්ලා තිබෙනවා. මම ඔබතුමාට පෙන්වූයේ ඒක නේ. මේ tendersවලට කැඳවන්නේ phone එකෙන්. ඒකයි මම ඔබතුමාට කියන්නේ. හරිද? මම කාටවත් දෝෂාරෝපණය කරන්නේ නැහැ. නමුත් සොයා බලන්න කවුද

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මෙහෙම කරන්නේ කියලා. ඇමතිතුමා වශයෙන් අවසානයේ දෝෂාරෝපණය එන්නේ ඔබතුමාටයි. මම ඒකයි කියන්නේ. කවුරු හෝ මේක කරනවා. මම අරයාට, මෙයාට ඇඟිල්ල දිග් කරන්න සූදානම් නැහැ. මම ඒකයි කිව්වේ මේක නතර කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, දැන් බලන්න අපි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනවා නම්, අපේ සාමාන්‍ය ක්‍රමවේදය තමයි 1961 බණ්ඩාරනායක මැතිනිය ගෙනාපු පනතේ බොහොම පැහැදිලිව තිබෙනවා, දින 45කට පෙර තොග රැස්වීමක් පවත්වන්න ඕනෑ කියලා. ඒකට එන්න කියනවා මුතුරාජවෙල කළමනාකරුට. ඒකට එන්න කියනවා කොලොන්නාවේ කළමනාකරුට. ඒ ඔක්කෝටම එන්න කියලා කොමිටියක් තියලා කොමිටියෙන් තමයි තීන්දුව ගන්නේ කොච්චර ප්‍රමාණයක්, කොච්චර දින ගණනකට අපි ගෙන්වන්න ඕනෑද කියලා. දැන් ඒ කොමිටිය රැස් වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒකයි මම කිව්වේ. දැන් රැස් වෙන්නේ ඔබතුමන්ලාගේ කොමිටිය; ඇමතිවරුන්ගේ කොමිටිය. මම කියන්නේ ඒකයි. එක කොමිටියක් එහේ දානවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දැන් රැස්වෙන්නේ SCARC එක විතරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ ඒක තමයි. ඒකටවත් බලයක් නැති තැනකට කොමිටිය පත් කරලා. කොමිටි රැස්වෙනවා. කොමිටි රැස් වුණාට කොමිටියට බලය නැහැ. Phone එකෙන් call කරලා ගෙන්න ගන්නවා තෙල් ටික. ඒකයි මේ තිබෙන ප්‍රශ්නය. එතකොට දැන් මොකද වෙන්නේ? හදිසියේ ගෙන්වන්නේ. හදිසියේ නැවිත් නැහැ; තෙලුත් නැහැ. නැවිත් නැත්නම් තෙලුත් නැත්නම් ඕනෑ තැනකට කථා කළා, ගණන අහ ගත්තා, ටක් ගාලා බඩු ටික ගත්තා ඉවරයි. ඒක නේ මේ කරන්නේ. ඒකයි මම ඔබතුමන්ලාට කියන්නේ.

දැන් බලන්න භූමි තෙල් සම්බන්ධයෙන්. අපට භූමි තෙල් අවශ්‍යතාව තිබෙන්නේ මෙට්‍රික් ටොන් 300යි. අපි හදනවා 800ක්. එතකොට අපි දැන් මොකද කරන්නේ ඒක සිංගප්පූරුවේ- [බාධා කිරීමක්]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හදනවා නොවෙයි හැදෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හැදෙනවා. හදනවා නොවෙයි හැදෙනවා. එතකොට මේකට මොකද තමුන්නාන්සේලා කරන්නේ? මේක අරගෙන සිංගප්පූරුවේ ගණන් ටික දාලා, ඒකේ ගණන් මෙච්චරයි කියලා ගුවන් යානාවලට තෙල් ලබා දෙනවා. දැන් ඔබතුමන්ලා බලන්න ඒකේ පාඩුව කොච්චරද කියලා. මම ඔබතුමන්ලාට කියන්නම් මේ ගුවන් යානාවලට තෙල් ලබා දීම නිසා දවස ගණනේ කොච්චර පාඩුවක් වෙලා තිබෙනවාද කියලා. මම ඊ ළඟට එන්නම් එතැනට. මම ඊට කලින් යනවා මෙන්න මේ කාරණයට. අපි දන්නවා අද ලංකාවේ සියයට 60ක් විදුලිය නිෂ්පාදනය කරන්නේ තෙල්වලින් කියලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
සියයට 80ක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, දැන් සියයට 80ක් වෙලා ඇති. ඒ කියන්නේ බලන්න අපි කොච්චර විනාශයකට යනවාද කියලා. මම ඒකයි කියන්නේ. ඔබතුමා පිළිගන්නවා. ඔබතුමාට මේකේ බැරෑරුම්කම තේරෙනවා ඇති. සියයට 80ක් ලංකාවේ විදුලිය නිෂ්පාදනය කරන්නේ තෙල්වලින්. එතකොට අපි බොර තෙල් ගෙනෙන්නේ නැහැ. අපේ පිරිපහදුවත් කැඩිලා. අපිට එතකොට පිරිසිදු තෙල්, පිරිපහදු තෙල් ගෙනෙන්න වෙලා තිබෙනවා. පිරිපහදු තෙල් බොර තෙල්වලට වඩා ගණන්. එතකොට ඒ ගණන්වලට තෙල් ගෙනැල්ලා මෙහේ විදුලිය නිෂ්පාදනය කළාම විදුලි බිල වැඩි වෙනවා. ඉතින් මේක කථා කරන්න දෙයක් නොවෙයි. ඒක ජාතික අපරාධයක්. මේක දවස ගණනේ පරක්කු කරන්න, පරක්කු කරන්න මොකද වෙන්නේ. අපි ලොකු ප්‍රශ්නයකට යන්නේ. මම ඒකයි කිව්වේ. මම මේ කාරණය ගැන පාර්ලිමේන්තුවේ දිගින් දිගටම කථා කරපු නිසා ආපහු ගන්නේ නැහැ.

2008 ඉරානයේ ජනාධිපතිතුමා ඇවිල්ලා මේ ව්‍යාපෘතියට මුල් ගල් තිබ්බා. තමුන්නාන්සේලා උත්සව සේරම තියලා හම්බන්තොට නොවෙයි, පඬුවස්නුවරත් ලොකු කටවුට් ගහල තිබුණා. ඔබතුමා නොවෙයි, වෙන ඇමති කෙනෙක් හිටියේ. හැබැයි, තවම කටවුට් ටික තිබෙනවා. ගලත් නැහැ. මුල් ගලත් නැහැ. පඬුවස්නුවර ලොකු බෝඩ් එකක් තියෙනවා. [බාධා කිරීමක්] තෙල් තිබෙනවාද කියා බලන්න ඒක පහළට යවන්න තමයි තිබෙන්නේ. [බාධා කිරීමක්]

දැන් ඉරානයේ එක්කෙනා බැහැයි කියනවා. දැන් වැඩය නතර වෙලා. දැන් වෙනත් උදවිය හොයනවා. [බාධා කිරීමක්] කවුරු කවුරු ගාවටද ගිහින් තිබෙන්නේ කියා මා කියන්නම්. ඒ උදවිය ගිහින් තිබෙන්නේ අලුත් තෙල් පිරිපහදුව හදන්න. ඔබතුමා දන්නවාද නොදන්නවාද කියා මා දන්නේ නැහැ. දැනට ලංකාවේ තෙල් පිරිපහදුව නවීකරණය කරලා හදන්න යන වියදම ඩොලර් මිලියන 2,200යි. ඒක දැවැන්ත වියදමක්. ඩොලර් මිලියන 840 තිබුණු එක මේ අවුරුදු තුන හතරට ඩොලර් මිලියන 2,200ක මේ රටේ සල්ලි වියදම් කරන්න තමයි තමුන්නාන්සේලා හදන්නේ. දිනකට පිරිපහදු කරන්න පුළුවන් බැරල් 35,000යි. ඒක බැරල් 1,00,000 දක්වා වැඩි කරන්න තමයි අපි කථා කර ගත්තේ. අද ඒක කරන්න බැහැ. ඒකයි මා ඔබතුමාට කියන්නේ. කරුණාකර, මේ අපරාධය නතර කරන්න. මේ පිරිපහදුව පුළුල් කිරීමට, ඩොලර් මිලියන 1,500කට තමයි ඉරානය ඇස්තමේන්තු කර තිබුණේ. මේක ඩොලර් මිලියන 2,200ට දෙනවා. සමාගම් හතරක් ඇවිත් තිබුණා. භාණ්ඩාගාරයේ වාර්තාවත් දීලා තිබුණා. වැඩිම එක ඩොලර් මිලියන 2,200ට දීලා තිබුණේ Huanqui කියන චීන සමාගමට. ඒ වාර්තාවේ පිටු හතරයි තිබුණේ. අනෙක් උදවිය වාර්තා තොග ගණන් හදලා තිබුණා. ඒ ගොල්ලන්ට දුන්නේ නැහැ. දැන් ඩොලර් මිලියන 2, 200කට තමයි දෙන්න හදන්නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔය කිසිම සමාගමක් යෝජනා ඉදිරිපත් කළයි කියා දෙන්න බැහැ. ඒකට විශාල ක්‍රියා දාමයක් තිබෙනවා. ඒ ක්‍රියා දාමයේ කිසිම ආරම්භයක් කර නැහැ. එන වාර්තා ටික SCARC එකට යවලා තියෙන එක විතරයි කර තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක උත්තරයක් විධියට ඔබතුමා කියනවා නම් මා පිළිගන්නවා. අද තීරණය වන්නේ එහෙම නොවෙයි. ඇමතිවරු ඉන්නවා. ඇමතිවරු ළඟ ෆෝන් එකක් තිබෙනවා. ඊයේ පෙරේදා ඇමතිතුමෙක් මට කිව්වා, "මචං තියෙන්නේ කොඩියයි ෆෝන් එකයි කාර් එකයි විතරයි" කියා. අපේ යාළුවෝ තමයි කිව්වේ. කොඩියයි ෆෝන් එකයි තමයි තියෙන්නේ. ඉතුරු දෙයක් මොකුත් නැහැ කිව්වා. මේ තීන්දු ගන්නේ කවුද? මම ඒකයි අහන්නේ. මේකේ ඇමතිකම් දරනවාට වැඩිය හොඳයි, අපේ සූරියප්පෙරුම මැතිතුමනි, කොහේ හරි ගිහින් තේ කඩයක් දමා ගෙන ඉන්නවා නම්. [බාධා කිරීමක්] ඔබතුමා නොවෙයි, වෙන කෙනෙක් කිව්වේ. ඒකයි මා කියන්නේ. Huanqui කියන සමාගමට Build, Operation and Transfer - BOT -වර්ගයේ ගනුදෙනුවකට තමයි ඔබතුමන්ලා යන්න හදන්නේ. ලංකාවට මේක අවුරුදු පහක් හයක් ඇතුළත ගෙවන්න වනවා. මේකේ තිබෙන තොරතුරුත් සමඟයි මා ඔබතුමාට කියන්නේ. මේක කෙළින්ම commercial loan එකකට යන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, you have only one more minute.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

විනාඩි 40ම ගිහිල්ලා ඉවරද? මේක standard Cabinet-Appointed Review Committee එකකටවත් ගිහින් නැහැ. මේක දෙන්න තීරණය කර ඉවරයි. ඔබතුමාට දැන් මා මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමාට කැට තියලා කියන්නම්. ඔබතුමා මොන ඇමති වුණත් ඔබතුමාට එරෙහිව මේක දෙන්න හදනවා.

මා ඊළඟ කාරණයට එන්නම්. එක විනාඩියක් මට දෙන්න.

අපි දැන් මේවා නිෂ්පාදනය කරනවා. මේක ඔබතුමා කියෙව්වොත් හොඳයි. නිෂ්පාදනය කරන ඒවාත් අඩු මිලට ලබා දීලා හැම එකෙන්ම දැවැන්ත පාඩුවක් සිදු වී තිබෙනවා. මේකේ අවසාන ප්‍රතිඵලය ලබන්නේ කවුද? කෘෂි රසායනවල විකුණුම් මිල රුපියල් දස ලක්ෂ 153යි. විකුණුම් පිරිවැය රුපියල් දස ලක්ෂ 184යි. ද්‍රාවක විකුණුම් මිල රුපියල් මිලියන 1,921යි. විකුණුම් පිරිවැය 1,992යි. සම්පීඩක දියර වායු විකුණුම් වටිනාකම 10,711යි. විකුණුම් පිරිවැය 14,321යි. දැවැන්ත දළ අලාභයක් තිබෙනවා. විශේෂයෙන් දියර වායු නැත්නම් ගෑස්වලට ඇති වෙලා තිබෙන තත්ත්වය මේකයි. කරුණාකර, මේවා ගැන හොයන්න.

ඊළඟට, අපේ හැරී ජයවර්ධන මැතිතුමා ගනිමු. ඔබතුමන්ලා ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත ගෙනාවා. [බාධා කිරීමක්] මට එක විනාඩියක් දෙන්න. එම පනත් කෙටුම්පතේ එක සමාගමක් තමයි පැල්වත්ත සීනි සමාගම.

පැල්වත්ත සීනි සමාගම ගැන ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? ඒක ඌන උපයෝජිත ආයතනයක්ය, ඒ කියන්නේ හරියට වැඩ කෙරෙන්නේ නැහැ; නැත්නම් පාඩු ලබනවා කියලා කිව්වා. එහෙම නේ? දැන් මේ පාඩු ලබන සංස්ථාවේ සභාපතිතුමා කවුද? හැරී ජයවර්ධන මහත්තයා. ඉතින් හැරී ජයවර්ධන මහත්තයා ඉන්න පැල්වත්ත සීනි සමාගම පාඩු ලබනවායි කියලා ඔබතුමන්ලා පවරා ගන්නවා. ඛනිජ තෙල් සංස්ථාවේ සභාපති හැටියට එතුමාව දා ගෙන ඉන්නවා. [බාධා කිරීම්] පොඩ්ඩක් කෑ ගහන්නේ නැතුව ඉන්න. [බාධා කිරීම්] මම කියන දේ අහ ගන්න. එක්කෝ පැල්වත්ත සීනි සමාගම එතුමාට දෙන්න. නැත්නම් එතුමා තෙල් සංස්ථාවෙන් අයින් කරන්න. දෙකෙන් එකක් නේ කරන්න තිබෙන්නේ. මම ඒකයි කියන්නේ. ඒ නිසා මේ ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙත මට තේරෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මොකද, එතුමා කීර්තිමත් ව්‍යාපාරිකයෙක්. එතුමා පැල්වත්ත සීනි සමාගමට හොඳ නැහැ, එතුමාට තෙල් සංස්ථාව දෙනවා. මම අහන්නේ, මොකක්ද, මේ ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙළ කියලායි. ඒ කරුණ වාගේම ඔබතුමාට මම කියපු තව කාරණා ගණනාවක් තිබෙනවා. මගේ වෙලාව සීමා වුණු හින්දා මගේ කථාව මම නතර කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාරණා සම්බන්ධව අමාත්‍යතුමාට උත්තර දෙන්න පුළුවන් නම් හොඳයි කියමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 1.41]

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගන්නා මේ මොහොතේ ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ඉතිහාසය ගැන යමක් මතක් කරන්නට ඕනෑ. ඒ මොකද, අපේ රට යටත් කර ගෙන, අපේ ලේ සාරය උරා ගෙන බීපු විදේශීය අධිරාජ්‍යවාදීන් ඒ කාලය තුළ තව තවත් අපේ රට හූරාගෙන කන්නට කැල්ටෙක්ස්, මොබිල් ඔයිල්, ෂෙල් ආදී සමාගම් ඇති කරලා රටේ සියලුම දෙනා සූරා ගෙන කෑමේ තත්ත්වයකට පත් කර ගෙන සිටියා. ඒ අවස්ථාවේදී අපේ රටේ ශ්‍රේෂ්ඨ නායිකාවක් වෙච්ච ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය වන ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, කැනඩාව ඇමෙරිකාව ඇතුළු තෙල් රාජ්‍යයේ බලවතුන්ගේ බලපෑම්වලට යටත් නොවී ඒ ගොල්ලන්ගේ අභියෝග තර්ජන මැද්දේ තෙල් සමාගම් රජය සතු කරලා, ඒ අවස්ථාවේදී අපේ රටේ අනන්‍යතාව මතු කර ගෙන කටයුතු කරපු එක ගැන අපි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට අපේ ගෞරව ස්තුතිය පුද කරන්නට ඕනෑ.

ඇමෙරිකාව වැනි ඒ තෙල් රාජ්‍යවල තර්ජන නිසා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විශේෂ වාසියක් වුණා. ඒ ඇයි? ලෝකයේ මුස්ලිම් තෙල් බලවතුන් එක්ක සම්බන්ධතාවන් ඇති කර ගෙන, ඒ මුස්ලිම් රාජ්‍යයන් තුළින් පහසුවට තෙල් ලබා ගෙන අපේ රටේ, තෙල් බෙදා දෙන්න පුළුවන්කම එතුමියට ලැබුණා. ඊටත් වඩා මුළු ලෝකයේම ප්‍රබල මුස්ලිම් රාජ්‍යයන් සමඟ ඉතා හිතවත් හිතමිතුරුකමක් ගොඩ නඟා ගන්න එතුමියට පුළුවන් වුණා. ඒ සම්බන්ධතාව තමයි අදත් අපි ඒ මුස්ලිම් රාජ්‍යයන් සමඟ ගොඩ නඟා ගෙන තිබෙන්නේ.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සම්බන්ධතාවන් අද ඉතාම ඉහළම තත්ත්වයකට ගෙනැල්ලා තිබෙනවා. පසු ගිය කාලයේ තිබුණු යුද වාතාවරණය තුළ අධිරාජ්‍යවාදීන් අපට සම්බාධක පනවන්න සූදානම් වෙද්දී අරාබිකරයේ රටවල් සමඟ එදා තිබුණු සම්බන්ධතාව එතුමා තවත් වැඩි කර ගත්ත නිසා අපිට යුද සමය තුළ කිසිම අඩු පාඩුවකින් තොරව ඉන්ධන ලබා ගැනීමේ පහසුව ඇති වුණා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි අපේ තිබෙන විශ්වාසය තවත් වැඩි කර ගන්නට ඕනෑයි කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ඒ වෙලාවේදී ලෝකයේ ප්‍රබල රාජ්‍යවල්වලට හිස නැමුවා නම්, ඒ ගොල්ලන්ගේ සම්බාධකවලට අපි අනුකූලතාව දැක් වූවා නම් අපේ රටේ විශාල ඉන්ධන හිඟයක් ඇති වෙලා, අපේ යුද්ධය අඩ පණ වෙලා, ජන ජීවිත අඩ පණ වෙලා, සම්පූර්ණයෙන්ම

[ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා]

කොටියාට ඕනෑ කරන තැන ලබා දෙන්නට තිබුණා. ඒකට උල්පන්දම් දෙන්නට, ඒකට උඩ ගෙඩි දෙන්නට, එදා තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු සම්පූර්ණයෙන් කටයුතු කෙරුවායි කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

මේ විධියට ඛනිජ තෙල් කටයුතු අපේ රටේ කර ගෙන යද්දී ඔය දැන් කථා කරන, ඔය කරුණු ඉදිරිපත් කරන අය මැරිලා ඉපදිච්ච මිනිසුන් වාගේ මොකවත් දන්නේ නැති මිනිසුන් වාගේ කථා කරනවා. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තමයි දහම් විමලසේන කියන සභාපතිවරයා අපේ රටේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ තිබුණු ඛනිජ සම්පත් ටිකත්, අපේ ඛනිජ තෙල් සංස්ථාවත් IOC සමාගමට විකුණලා මහා පාවාදීමක් සිද්ධ කළේ කියන එක අපි කියන්නට ඕනෑ.

ත්‍රිකුණාමලයේ, China Bayවල තමයි Ceypetco සමාගමට අයිති ඛනිජ තෙල් සංස්ථාවේ වැඩ පොළ තිබුණේ. ඒකෙන් තමයි ලංකාව පුරාම -උතුරට, උතුරු මැදට, නැඟෙනහිරට, වයඹට ආදී සෑම ප්‍රදේශයකටම- තෙල් බෙදා හැරියේ. ඒ ස්ථානය වටිනා තෙල් ටැංකිත් එක්ක, මුළු ලෝකයම ඇහැ ගහ ගෙන හිටපු තෙල් ටැංකිත් එක්ක අයිඕසී සමාගමට පාවලා දුන්නා. ඒකෙන් තමයි අපේ රටේ ඛනිජ තෙල් සංස්ථාවේ වැඩ කටයුතු අඩ පණ වුණේ කියන එක මම විශේෂයෙන් ත්‍රිකුණාමලයේ වැසියෙක් හැටියට සඳහන් කරනවා. ඒ වාගේම අපේ ඛනිජ තෙල් සංස්ථාවේ ත්‍රිකුණාමලයේ වැඩ කළ සේවක සහෝදරවරුන්ගේ අයිතිවාසිකම් අයිඕසී සමාගම බිලි ගත්තා කියන එකත් කියන්නට ඕනෑ. තෙල් සමාගමත් එක්ක අපේ සේවක සහෝදරවරුන්ව පාවා දීපු එක අමතක කරලා දැන් සමහරු කථා කරන්නේ අද තිබෙන තත්ත්වය ගැන පමණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා පිට රටවලින් තෙල් ලබා ගන්න විට ඒ රටවල් නියම කරන මිල, ලෝක වෙළෙඳ පොළේ පවතින තෙල් බැරලයක මිල අනුව අපට මිල අඩු වැඩි කරන්න සිදු වන බව. ඒක අපි පිළිගන්නට ඕනෑ. ඒක අද ලෝකයේ විශාල වශයෙන් තිබෙන ප්‍රශ්නයක්. තෙල් තිබෙන රටවල ලාභයට දුන්නාට, අපි තෙල් මෙහාට ගෙනැල්ලා බෙදා හරින විට අපට අඩුවට දෙන්න ලැබෙන්නේ නැහැ. ලංකාවට පෙට්‍රල් ලීටරයක් ගේන විට බදුවලින් තොරව රුපියල් 100ක මුදලක් වැය වෙනවා. ඒ අතර තුර ඒවාට අවශ්‍ය කරන බදු පැන වෙන විට අද තිබෙන මුදලට දෙන්න සිද්ධ වෙනවා. නමුත් අපේ සංස්ථාව මිල වැඩි කිරීමක් කළේ අවුරුදු දෙකකට පසුවයි. එහෙම නැතිව අපේ සංස්ථාව මීට පෙර මිල වැඩි කළේ නැහැ. ඒ නිසා අපි කථා කරන විට කරුණු අවබෝධ කර ගෙන කථා කළ යුතු වෙනවා. නොයෙක් විට කියන්නේ අපේ ආණ්ඩුව ආවාට පසුව විතරයි පාඩු වුණේ, මේ ආණ්ඩුව ආවාට පසුවයි මේවායේ දූෂණ සිදු වුණේ කියලායි. අපි දන්නවා, අපි නම්, ගම් මතක් කරන්නේ නැහැ, මිය ගිය අයට අපි අවලාද කියන්නේ නැහැ. ඛනිජ තෙල් සම්බන්ධව සිටිය සමහර ඇමතිවරුන්ට ඔපෙක් සංවිධානයෙන් කෝටි ගණන්වල ත්‍යාග ලැබුණ බව එදා ඒ රජය තිබෙන කාලයේ ප්‍රචාරය වුණා; හැන්සාඩ් ගත වෙලා තිබෙනවා. එහෙම තියෙද්දී විශේෂයෙන් ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා විශාල කාර්ය භාරයක් කරමින්, එවැනි වංචාවන් හෝ දූෂණයන්ට සම්බන්ධ නොවී ඉතා අවංක සේවාවක් කිරීම ගැන මම බොහොම සන්තෝෂයෙන් මතක් කරනවා. අපි ඒ ගැන අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ළඟ ඉන්න නිසා නොවෙයි, ගමේ නිසා නොවෙයි, සම්බන්ධකම් තිබෙන නිසා නොවෙයි නියෝජ්‍ය අමාත්‍ය ගරු සරණ ගුණවර්ධන මැතිතුමාත් එතුමාට සහයෝගය දක්වමින් මේ වැඩ කටයුතු ටික ඉතා හොඳින් කර ගෙන යනවා කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අතරතුර කොයි වෙලාවේත් කථා බහට ලක් වුණා, බාල පෙට්‍රල් ගෙන්වීම සම්බන්ධව. එදා තිබුණ පෙට්‍රල් හිඟය, ඉන්ධන හිඟය පිරිමහ ගන්නට ඉතාමත් හදිසියේ තෙල් ගෙන්වන්නට ඕනෑකම තිබුණා. ඒ අවස්ථාවේදී බාල පෙට්‍රල් ලැබුණ එක සංස්ථාව පිළිඅරගෙන ඒ වෙනුවෙන් වන්දි ලබා දෙන්න කටයුතු කර ගෙන යනවා. මේ වන විට පැමිණිලි 3,336ක් සංස්ථාවට ලැබිලා තිබෙනවා. ඒ අතුරින් 1,435ක් පරීක්ෂණ සම්බන්ධව උනන්දු වන අයගේ පැමිණිලි. 1,901ක් දැනට විභාග කරමින් යනවා. ඒ වාගේම පැමිණිලි 334ක් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ මොකද, නියම කරුණු කාරණා නොමැතිව, ඔප්පු කරන්න පුළුවන් කරුණු නැතිව පැමිණිලි පමණක් ඉදිරිපත් කිරීම සහ එක එක්කෙනාගේ උසි ගැන්වීම් බස්වලට බොරු චෝදනා ඉදිරිපත් කළ ඒවා ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් දස ලක්ෂ 352ක තරම් ප්‍රමාණයක් ගෙවන්න කටයුතු කර ගෙන යනවා. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඇති කළ යුතු නැහැ. මොකද, ඒ පාඩුව, අලාභය ඒ අයට ගෙවන්න කටයුතු කරලා තිබෙනවා. අපේ ප්‍රදේශවල තෙල් ගබඩාවලට දැන් ඒ අලාභය ලැබී ගෙන යනවා කියන එක කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම 1970 අපේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ සිට පේසාලෙන් තෙල් ගන්න කථාවක් තිබුණා. එදා සිට ඒ පරීක්ෂණ කර ගෙන ආවා. ඒ අතරතුර අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ අපේ රට ස්වයංපෝෂිත කිරීමේ ප්‍රධාන බලාපොරොත්තුව තුළින් ඛනිජ තෙල් නිධි නැවත පරීක්ෂණයට ලක් කරමින් යනවා. ඒ වාගේම ඉන්දියාවේ තිබෙන ස්කොට්ලන්තයට අයිති ඉන්දියන් කෙයාන් සමාගම මඟින් පරීක්ෂණ කරලා තෙල් තිබෙන බවට සාක්ෂි ලබා ගෙන ඒ සම්බන්ධව වැඩි දුර කටයුතු දැන් සංස්ථාව කර ගෙන යනවා.

ගෑස් නිධි තිබෙන බවට සාක්ෂි තිබෙනවා. ඒ ගෑස් ලබා ගත්තාම අපට මීට වඩා අඩු මිලකට හා පහසුවෙන් ඒවා දෙන්න පුළුවන්කම තිබෙනවා. මන්නාරමේ පමණක් නොවෙයි, දකුණු මුහුදු තීරය දක්වාම ඒ තෙල් නිධි පවතින බව සඳහන් වෙනවා. දැනට ඒ පරීක්ෂණ කර ගෙන යනවා. ඒ පරීක්ෂණවලින් පසුව කවදා හරි කාලෙක අපේ රටේ තිබෙන මේ තෙල් සම්පත හොයා ගත්තාම මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වෙයි. අපේ රටේ සංවර්ධනය සඳහා විශාලම බාධාවක්ව තිබෙන ඉන්ධන ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වුණොත් අපට කාටවත් ඔළුව පහත් කරන්නේ නැතිව තිබෙන සියලු පාඩු ලාභ බවට පත් කර ගන්න පුළුවන් වෙනවා. පිට රටවල් සමඟ ගනුදෙනු කරන කොට ඔවුන් ඉන්ධන මිල වැඩි කරද්දී, දෙන ඉන්ධන ප්‍රමාණය අඩු කරද්දී අපටත් ඒ පාඩු ඒ විධියටම විඳින්න සිද්ධ වෙනවා. නමුත් හැම තිස්සේම භූමිතෙල් සහ ඩීසල්වලට බදු අය කරන්නේ නැතිව ඒවා දෙන්න පුළුවන් අන්තිම අඩු මිලටයි මේ ලබා දෙන්නේ. අප මේක දේශපාලන වශයෙන් කථා කරමින්, තෙල් මිල මෙච්චරයි කියමින් තිබෙන රජයකට අපවාද නඟලා වැඩක් නැහැ. ඒ ඉන්න මැති ඇමතිවරුන්ට, ජනාධිපතිවරයාට අවලාද නඟන එකේ තේරුමකුත් නැහැ. මොකද මෙය අපේ රටේ නිෂ්පාදනය කරනු ලබන තේ, පොල්, රබර් වාගේ දෙයක් නොවෙයි. ඒවා පිට රටවලින් ලැබෙන කොට ඒ රටවල තීන්දු, නියාමකයන් පිළිගන්න අපට සිද්ධ වෙනවා. ඒ අනුවයි මේ කටයුතු කරන්නේ කියන එක අප මේ අවස්ථාවේ විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තෙල් සංස්ථාවේ අතුරු නිෂ්පාදනවලින් අද කෘෂි කර්මාන්තයට අවශ්‍ය කරන කෘෂි රසායන ද්‍රව්‍ය, ඒ වාගේම මහා මාර්ග සඳහා අවශ්‍ය කරන තාර වාගේ දේවල්, කාර්මික සේවයට අවශ්‍ය කරන ග්‍රීස් සහ එන්ජින් ඔයිල් ආදී දේවල් සපයා ගනු ලබනවා. ඒවායිනුත් අපට සැහෙන පහසුවක් තිබෙනවා කියන එක අප මතක තියා ගන්න ඕනෑ. අනික අපේ රටේ දේ අප අගය කරන්න ඕනෑ. අපේ රටේ

නිෂ්පාදනවල යම් යම් අඩු පාඩු තිබෙන්න පුළුවන්. සමහර විට ලෝකයත් එක්ක අප ගනුදෙනු කරන විට අපට පාඩු සිද්ධ වන අවස්ථා තිබෙනවා. ඒ අතරතුර එක්කෙනෙක් දෙන්නෙක් දූෂණ වැඩ නොකරනවා නොවෙයි. මේ කාලය තුළ විතරක් නොවෙයි, ඉස්සර ඉඳන් මේ රටේ ඒ වාගේ දේවල් තිබුණා. නමුත් අද ඒවා ඉතාමත් අඩු කරමින්, අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ, ගරු ඇමතිතුමාගේ සම්පූර්ණ පරීක්ෂාව යටතේ -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඒවා දෙන්න පුළුවන් ඉහළම තත්ත්වයෙන් ලබා දීමට කටයුතු කර ගෙන යනවා. ඒ සම්බන්ධවත් ප්‍රසාදය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! The next speaker is Hon. Sujeewa Senasinghe. Before that, the Hon. Alhaj A.H.M. Azwer will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 1.54]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

මට කථා කරන්න තිබුණේ අන්තිමටයි. කමක් නැහැ, ඊට කලින් මගේ ආසනයේ අපේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා. ඒ වාගේම අපේ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය ඇමතිතුමා ශිෂ්‍යත්වයක් සඳහා ගොස් නැවත මේ ගරු සභාවට පැමිණ සිටිනවා. එතුමාගේ හැසිරීමේ තත්ත්වය අගය කරලා අපේ ගරු කථානායකතුමා එතුමාට එංගලන්තයේ සංචාරයක් සඳහා සතියක කාලයක් ලබා දුන්නාට පස්සේ එතුමා ආපසු ඇවිල්ලා ඉන්නවා. සුමානයකින් පස්සේ එතුමා ආපහු දැක බලා ගන්න ලැබීම අපට ලොකු සන්තෝෂයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත්, ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් යටතේ ඇති මේ අමාත්‍යාංශය පිළිබඳව අද අපට කථා කරන්න බොහෝ දේවල් තිබෙනවා.

විශේෂයෙන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉතා විස්තරාත්මකව අදහස් දැක්වූවා, අද රටේ ජනතාව පත් වෙලා තිබෙන ඉරණම ගැන. රට දුවන්නේ ප්‍රධානම සාධකය වන මේ තෙල් හරහායි. මේක හරියට කළමනාකරණය කර ගත්තේ නැත්නම් මේ ආණ්ඩුව බලාපොරොත්තු වන ආසියාවේ ආශ්චර්යය නොවෙයි, ආසියාවේ අගාධය බවට ඉදිරි අනාගතයේ මේ රට පත් වනවා. ඉදිරි අනාගතයේ මේ ගරු ඇමතිවරු යම් කිසි කාර්ය භාරයක් කළොත් ඒක වළක්වා ගන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා, මෙහි පාඩුව. විශාල පාඩුවක් ලබනවා, මෙම අමාත්‍යාංශය. ඒකට හේතුව වශයෙන් මූල්‍ය කළමනාකරණය සහ අනෙකුත් දූෂණ විශේෂ කාරණා හැටියට දක්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ hedging ගනුදෙනුව නිසා අපට විශාලම පාඩුවක් සිදු වුණා. කොයි පුද්ගලයා කොයි ආකාරයෙන් මේක විග්‍රහ කරන්නට හැදුවත් hedging ගනුදෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් පාඩු වෙලා තිබෙනවා. සූදුව පෞද්ගලික දෙයක් වුණත් ආණ්ඩුවත් මේ සූදුවට සහභාගි වන ආකාරය hedging ගනුදෙනුවෙන් මනාව පැහැදිලි වෙනවා. Hedging ගනුදෙනුව සම්බන්ධව නඩු තුනක් තිබෙනවා. මේ නඩු තුනෙන් අපට ඉතාමත් අහිතකර තත්ත්වයක් තිබෙන්නේ. 2011 ජූලි 17 වැනි දින "The Sunday Times" පත්තරයේ දක්වා තිබෙනවා, "Losing a major battle in a British Court" කියා. මා එය **සභාගත*** කරනවා.

මේ hedging ගනුදෙනුවෙන් අපට අත් වන ඉරණම එහි සඳහන් වෙනවා. විශාල මුදල් ප්‍රමාණයක්, ඩොලර් මිලියන 500ක මුදල් ප්‍රමාණයක් අහිමි වෙනවා.

අපේ රටේ ජනතාවගේ අනාගතය වෙනුවෙන් ශුභ සාධනය, යටිතල පහසුකම්, නිවාස, මහාමාර්ග, පෝෂණ ක්‍රම, පාසල් යන මේවාට වියදම් කරන්නට තිබුණු මුදල් ප්‍රමාණයක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ සෙල්ලක්කාරයින් විසින් හිතා මතා, නීතිරීතිවලට පටහැනිව සූදුවට ලක් කිරීම නිසා පිට රටවලට ගෙවීමට ආණ්ඩුවට සිද්ධ වී තිබෙන්නේ. මේ පාඩුව ගැන කථා කරන්නේ නැහැ. පෝෂණය ගැන කථා කරනවා, වියදම රුපියල් මිලියන 300යි, රුපියල් මිලියන 350යි කියා. මේ පාඩු වුණු මුදල තිබුණා නම් මුළු සමෘද්ධි ව්‍යාපාරයම වෙනස් වෙනවා. ගරු ජනාධිපතිතුමා කථා කරනවා, රටේ දුප්පත් ජනතාව ගැන. පෝෂණය ගැන, පාසල්වලට වෙන් කරන මුදල ගැන, සංවර්ධන කටයුතු ගැන. හැබැයි hedging ගනුදෙනුවෙන් කෝටි 5000ක් නිකම් විනාශ කරනවා. නිකම් ගිනි තියලා දැම්මා වාගේ විනාශ කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ යම් පුද්ගලයෙක් කෙසෙල් ඇවරියක් හොරෙන් කැපුවොත්, සුළු වරදක් කළොත් අනිවාර්යයෙන්ම කිසිම සහනයක් නැතිව අවුරුදු දෙක තුනක් හිරේ විලංගුවේ දමනවා. මහේස්ත්‍රාත් අධිකරණවල කටයුතු කරන විට මම නීතිඥයෙකු වශයෙන් දන්නවා, දුප්පත්ම ජනතාව රුපියල් සියයක, දෙසියයක, රුපියල් පන්සියයක ඉතා සුළු වරදකට, හොරකමකට ඇප ගෙවා ගන්නට බැරිව අවුරුදු දෙක තුනක් හිරේ විලංගුවේ ලගින බව. හැබැයි අපේ දුප්පත් ජනතාවගේ මුදල් කෝටි 5000ක් විනාශ කළ පුද්ගලයින්ට එරෙහිව අද වන තුරු නීතිමය පියවර ක්‍රියාත්මක වෙලා නැහැ.

ගරු ජනාධිපතිතුමා කථා කරනවා, ආසියාවේ ආශ්චර්යය ගැන. ඒ වාගේම සාමය තිබෙන රටක් ගැන. ඉදිරි අනගතය සඳහා මානව හිමිකම් දර්ශකය ඉතා ඉහළම තැනකට අරගෙන එනවාය කියනවා, මතට තිත තියනවාය කියනවා. මේ ආකාරයේ සුරංගනා ලෝකයක් මැව්වාට ඒවා අපට ලැබෙන්නේ නැහැ, මේ වාගේ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුජීව සේනසිංහ මහතා]

දූෂණයට රට ලක් වන කොට. කෝටි 5000ක් කියන්නේ සුළුපටු ප්‍රමාණයක් නොවෙයි. හැබැයි, මේකට වග කියන කිසිවෙකු අද වන තුරු අධිකරණයට ඉදිරිපත් කර නැහැ.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ එක වංචාවක් පමණයි. ප්‍රමිතියකින් තොර බොර තෙල් මෙට්‍රික් ටොන් 2,600ක් ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. එහිදී සඳහන් කළා, අර කලින් ගෙනා කිසිම ප්‍රමිතියකට නැති තෙල් මෙට්‍රික් ටොන් 20,000 ගැන. ඒ සම්බන්ධයෙන් රටේ විශාල සෝෂාවක් නැගුණා. අප කිව්වා, මේ වාගේ බොර තෙල් ප්‍රමාණයක් ලංකාවට ඇවිත් තිබෙනවාය කියා. බොර තෙල් නොවෙයි, හොර තෙල්. කිසිම ක්‍රියා පටිපාටියකට අනුගත වන්නේ නැතිව, මේ තෙල් ප්‍රමාණය ලංකාවට ආවාට පස්සේ, අප ගරු කරන ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාටත් බොරු කියන්නට සිදු වුණා.

ඔය ගොඩාක් තීන්දුවලට එතුමා සම්බන්ධ වුණේ නැහැයි කියලා එතුමා අපට පසුව සඳහන් කළා. මෙහිදි ත්‍රිපුද්ගල කමිටුවෙන් කිව්වේ මෙට්‍රික් ටොන් 513යි කියලායි, ඇමතිතුමනි. හැබැයි අවසානයේ ත්‍රිපුද්ගල කමිටුවෙන් ඒ සඳහන් කරපු දේවල්වලටත් නීතිමය වශයෙන් කිසිම තීන්දුවක් අරගෙන නැහැ; කිසිම දඬුවමක් දීලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මෙච්චර වරදක් වෙලා තිබෙනවා. හොර තෙල් ගෙනාවා නම්, මේ රටට වැරැදි තෙල් ගෙනාවා නම්, ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වන්නට ඕනෑ. අපි කඩයකට හරි පොඩි හොර බඩුවක් ගෙනාවා නම් අනිවාර්යෙන්ම ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වනවා. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙලා, ඒ පිරිස අධිකරණයට ඉදිරිපත් කරලා දඬුවම් ලබා දෙනවා. හැබැයි, මේ පුද්ලයන්ට මොනවාද කරලා තිබෙන්නේ? ආයතන සංග්‍රහයේ නීති තිබෙනවා. ඒ කිසිවක් අනුගමනය කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ගනුදෙනුව සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන් රුපියල් මිලියන ගණනක් කොමිෂන් ගන්නට ඇති. ඒ තෙල් ප්‍රමාණය ගෙනැල්ලා, ඒවා වාහන සඳහා පාවිච්චි කිරීම නිසා ඒ වාහන අතර මඟ නැවතුණා. වාහන විතරක් නොවෙයි, තණකොළ කපන මැෂින් පවා ක්‍රියාත්මක නොවී නැවතුණා. ගොඩාක් වාහනවල තෙල් ටැංකියේ හිල් ඇති වුණා. මේ ගෙන්වපු තෙල් ජාතිය මොකක්ද කියලා අපි දන්නෙත් නැහැ. හැබැයි, මේ ඔක්කොම විනාශය වුණාට පසුවත් අද රටේ ජනාධිපතිතුමා යටතේ වග කියන කිසිවෙක් අධිකරණයට ඉදිරිපත් කරලා නැහැ. දුප්පත් ජනතාව විශාල පිරිසක් අද සිර ගෙවල්වල ලගිනවා, ඒ කරපු සුළු වරදකට. කෙසෙල් ඇවරියක් හොරෙන් කපපු මනුෂ්‍යයෙක්, නැත්නම් පොඩි බඩුවක් සොරකම් කරපු මනුෂ්‍යයෙක් අද හිරේ විලංගුවේ ලගිනවා, අවුරුදු දෙකක්-තුනක්, නැත්නම් අවුරුදු හතර-පහක්. නමුත් මේ මහා පරිමාණයේ සොරකම්වලට සම්බන්ධ වුණු කිසිවකු අද වන තුරු අධිකරණයට ඉදිරිපත් කරලා නැහැ.

මීට පෙර මේ සම්බන්ධයෙන් කථා කළ අවස්ථාවකදී අපි ඇමතිතුමාට මේ ගැන කිව්වා. එතුමාට කියන්න සිදු වුණා, මේ මුදල් ප්‍රමාණය ගෙවන එක වළක්වනවා කියලා. හැබැයි, ඊට පසුව සභාව කල් තැබීමේ යෝජනාවක් සම්බන්ධයෙන් පැවති විවාදයක් අවස්ථාවකදී එතුමා කිව්වා එහෙම කරන්න බැහැයි කියලා. ගනුදෙනුව ආරම්භ කළාට පසුව ඒ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවීම නවත්වන්න විධියක් නැහැ කියලා කිව්වා. හැබැයි පසුව අපට දැනුම් දුන්නා, ඒ මුදල් ප්‍රමාණය ගෙවීම නැවැත්තුවා කියලා. නමුත් ඒක අසත්‍යයක් බවත් පසුව ප්‍රසිද්ධ වුණා. ඉතින් මේ ආකාරයට ඉතිරි වුණු මේ හොර තෙල් මෙට්‍රික් ටොන් 2600ක් ආපසු වෙළෙඳ පොළට ඉදිරිපත් වුණා. හැබැයි, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළාට පසුව - ඒ නිසා නොවෙයි. - ඇමතිතුමා සඳහන් කළා, මේ ටෙන්ඩරය නැවැත්තුවා කියලා. එතකොට ඒ ටෙන්ඩරය ඉදිරිපත් කරන අවස්ථාවේදී පවා තිබුණු විශේෂත්වය නම්, මේ තෙල් මෙට්‍රික් ටොන් 2600 ගත්තත් පෞද්ගලික ගැනුම්කරුවෙකුට තැන්පත් කරන්න තැනක් තිබුණේ නැති එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණය සම්බන්ධයෙන්වත් සැලකිල්ලක් දක්වා තිබුණේ නැහැ. දැන් මේ තෙල් ප්‍රමාණය ගන්න පුද්ගලයාට තැන්පත් කරන්නට තැනක් තිබෙන්නට එපායැ. කොහේ හරි කරන වෙළෙඳාමක් සම්බන්ධයෙන් කොන්දේසි ඇතුළත් වන්නට ඕනෑ. ආපසු පිට රට පටවනවාද, වෙනත් රටකට ගෙනියලා වෙනත් දේවල් හදනවාද කියන කිසිවක් නැතිව ඇමතිතුමා වග කීමෙන් යුතුව සඳහන් කළා, එතුමා නැති අවස්ථාවක ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා මේ නීති විරෝධී කටයුත්ත කර තිබෙනවා කියලා.

මේ කාර්ය භාරය සම්බන්ධයෙන් කියනවා නම්, මේක සුළු පටු කාර්ය භාරයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙයට නිලධාරින් සම්බන්ධයි. රටේ විනිමය ප්‍රතිපත්තිය මෙයට ඇතුළත් වෙනවා. අනිවාර්යෙන්ම මෙයට සම්බන්ධ හොරු නැත්නම් වංචාකාරයන් සිටිනවා නම් ඒකට වග කියන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තීන්දුවක් ගත්තා නම්, අනිවාර්යෙන්ම ඒ පුද්ගලයන් අධිකරණය ඉදිරියට ගෙනෙන්නට ඕනෑ, ඇමතිතුමනි. එහෙම කළේ නැත්නම් ඔබතුමන්ලා බලාපොරොත්තු වන, අපි බලාපොරොත්තු වන, අපට පසුව එන ජනතාව බලාපොරොත්තු වන මේ රටේ ඉදිරි අනාගතය හදන්න බැහැ. ආසියාව දියුණු වනවා. ඔබතුමා ඒක දන්නවා. චීනයේ ආර්ථික වර්ධන වේගය සියයට 12.2යි, ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 10.8යි. මේ රටවල නැට්ටේ එල්ලුනත් ලංකාව දියුණු කරන්නට පුළුවන්. විශේෂ කාර්ය භාරයක් කරන්නට ඕනෑ නැහැ. අද යුරෝපයේ අපි නැති හින්දා අපට ඉතා වාසිසහගත තත්ත්වයක් තිබෙනවා. ආසියාව දියුණු වනවා. හැබැයි මේ තත්ත්වය ඇති කරන්නට නම්, ඔබතුමන්ලා හරියට නීතිරීති ක්‍රියාත්මක කරන්නට ඕනෑ. රටේ යහ පාලනයක් තිබෙන්නට ඕනෑ. අධිකරණ ක්‍රමය ක්‍රියාත්මක වන්නට ඕනෑ. ඒ වාගේම රාජ්‍ය තාන්ත්‍රය, රජයේ කටයුතු නීත්‍යානුකූලව ක්‍රියාත්මක වන්නට ඕනෑ.

ගරු ඇමතිතුමනි, දූෂණය ගැන සඳහන් වෙලා තිබුණා, ඔබතුමා දකින්නට ඇති. දූෂණයට අපේ රටේ ආර්ථික වර්ධන වේගයෙන් වර්ෂයකට සියයට 2ක් කැප කරනවා. සියයට 2ක් කියන්නේ සුළුපටු ප්‍රමාණයක් නොවෙයි. සියයට 6ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා නම්, අපට ඒක සියයට 8ක් කර ගන්න පුළුවන්, දූෂණයට සියයට 2ක් කැප කරන්නේ නැත්නම්. WikiLeaks තොරතුරුවල සඳහන් කරලා තිබෙනවා, දූෂණයට අපේ රට ආර්ථික වර්ධන වේගයෙන් සියයට 2ක කැප කිරීමක් කරනවායි කියලා. ඒ දූෂණය ඇතුළත් වෙන්නේ මෙන්න මේ ක්‍රියාකාරකම්වලින් ඇමතිතුමනි. ඒ වාගේම මේ නිලධාරින් සම්බන්ධයෙන් අද වන තුරු කිසිම දඬුවමක් නැහැ. ඇමතිතුමනි, දූෂණ සම්බන්ධයෙන් කථා කරනවා නම් මේ දූෂණය නිසා රුපියල් මිලියන 80,000ක් පාඩු විඳිනවා කියලා සඳහන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපිට ආදායමක් නැති නිසා, හරියාකාරව කළමනාකරණයක් නැති නිසා ණයවර ලිපිවලින් තමයි ගොඩාක් ගනු දෙනු වන්නේ. මේ ණයවර ලිපි ඉදිරිපත් කරද්දි විශාල පොලියක් ගෙවන්නට සිදු වනවා, ඇමතිතුමනි. ඒ විශාල පොලිය ගෙවන්නට සිදු වන්නේ ඔබතුමාටවත්, මටවත් පෞද්ගලිකව නොවෙයි, මේ රටේ ජනතාවටයි. එපමණක් නොවෙයි වෙලාවට ණයවර ලිපි ඉදිරිපත් නොකිරීම නිසා රුපියල් මිලියන 54ක් පාඩු ලබනවා කියලා මෙහි සඳහන් වනවා, අමාත්‍යතුමනි.

ඒ විතරක් නොවෙයි. වැරැදි කළමනාකරණය නිසා රුපියල් දසලක්ෂ 500ක් අහිමියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි, 2011 සැප්තැම්බර් මස 11වැනි දා "ලංකාදීප" පත්තරයේ හොඳ ලිපියක් පළ වෙලා තිබුණා. "තෙල් සංස්ථාවට ඇති චෝදනා" කියන ශීර්ෂය යටතේ ඒ ලිපිය ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් දසලක්ෂ 500ක් වැරැදි කළමනාකරණය නිසා කැප කරනවා කියලා මෙහි ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. ඒ වාගේම පෞද්ගලික නීතිඥ මහත්වරුන් සඳහා රුපියල් මිලියන 25ක වාගේ ප්‍රමාණයක් මේ වන කොට වියදම් කර තිබෙනවා. අපිත් පෞද්ගලික නීතිඥවරුන් වශයෙන් ක්‍රියා කරනවා ගරු ඇමතිතුමනි. එම ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

"රාජ්‍ය ආයතනයකට පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවාව ලබා ගැනීම සඳහා නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.

එහෙත් සංස්ථාව නීතිපතිවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව, ඉහළ ගාස්තු ගෙවමින් 2007 වර්ෂයේ සිට 2011 දක්වාම

පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවාව ලබා ගෙන ඇත. ඒ අනුව අදාළ වර්ෂවල පෞද්ගලික නීතිඥයන් සඳහා ගෙවන ලද ගාස්තුව

මෙසේය. වර්ෂ 2007දී ලක්ෂ 5යි. වර්ෂ 2008දී දසලක්ෂ 10යි. වර්ෂ 2009දී දසලක්ෂ 5යි. වර්ෂ 2010දී දසලක්ෂ 3.5යි.

වර්ෂ 2011දී දසලක්ෂ 2.11ක් වශයෙන්."

අපි මේවා ගැන දන්නවා. මොකද, අපිත් පෞද්ගලික නීතිඥ වෘත්තියේ ඉන්නවා. පරතලිංගම් මැතිතුමා, රොමේෂ් ද සිල්වා මැතිතුමා, ඉක්‍රාම් මොහොමඩ් මැතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ නීතිඥවරු ඉන්නවා. අපිත් සිවිල් අධිකරණයේ වැඩ කරන නීතිඥවරු. සමහර නීතිඥවරු කෙසේවත් උසුලන්න බැරි ආකාරයේ ගාස්තු ප්‍රමාණයන් දමනවා. විශේෂයෙන්ම රජයේ ආයතනයක් වුණාම කිසිම දැනුමකින් තොරව තමන්ට ඕනෑ ප්‍රමාණයන් ඔවුන් දමනවා. වෙනත් පුද්ගලයන්ටත් මේවායේ ආදායම ගලා ගෙන යනවා ගරු ඇමතිතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්න. නීතිපතිතුමාගේ අනුමැතිය මේ සඳහා ලබා ගන්න ඕනෑ කියලා මෙහි පැහැදිලිව තිබෙනවා. හැබැයි එහෙම දෙයක් අද සිදු වන්නේ නැහැ. අප කථා කරන්නේ මෙන්න මේ දේවල් ගැන. විරුද්ධ පක්ෂය ලෙස අප විවේචනයක් කරන කොට ඔබතුමන්ලා කියනවා අප හැම වෙලේම ආවේගශීලීව, වෛරයෙන් ඒ විවේචනය කරන්නේ කියලා. නැහැ. වරදක් තිබෙනවා නම් ඔබතුමන්ලා ඒ වැරැදි හදා ගන්න ඕනෑ. මේවා අපේ රටේ ජනතාවගේ සල්ලි. ඔබතුමාගේ පෞද්ගලික සල්ලිවත්, මගේ පෞද්ගලික සල්ලිවත්, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ සල්ලිවත් නොවෙයි. අපි හොඳට ජීවත් වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපට වරප්‍රසාද තිබෙනවා. ඒ වාගේම අපේ පෞද්ගලික ව්‍යාපාර තිබෙනවා.

හැබැයි රටේ ජනතාවගෙන් සියයට 40ක් අද ජීවත් වන්නේ රුපියල් 200කට අඩු ආදායම් ප්‍රමාණයක් ලබලායි. මේ පිරිස ජීවත් වන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිරිසගේ මුදල් තමයි මේ හිතුමතයට, තමන්ට අවශ්‍ය ලෙස, මේ ආකාරයට විනාශ කරන්නේ. තමන්ට ඇමතිකම් තිබුණාට, නිලධාරින්ට ඒ සම්බන්ධයෙන් බලය තිබුණාට මේ රටේ මුදල් විනාශ කරන්න අයිතියක් නැහැ. වෙන රටක නම්; එංගලන්තයේ නම්, ඇමෙරිකාවේ නම්, නීතිය හරියට ක්‍රියාත්මක වන රටක නම් මේ සියලු නිලධාරින් හිරේයි ඉන්න ඕනෑ. අද හිරේ තියා ඒ එක නිලධාරියකුටවත් විරුද්ධව නඩු මාර්ගයට ගියා කියලාවත් අපට කිසිම ආරංචියක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක අප රට ඉදිරියට යන ගමන් මාර්ගයට විශාල බාධාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අඩුම ගණනේ නිලධාරින් පස්හයදෙනෙක් මේ කියන වංචා, දූෂණ සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කරන්න. අධිකරණය බලා ගනීවි. ඔබතුමන්ලාට තිබෙන්නේ ඉදිරිපත් කරන්නයි.

ගරු ඇමතිතුමනි, බාල පෙට්‍රල් මෙට්‍රික් ටොන් 2,600ක් සම්බන්ධයෙන් අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා පසු ගිය දිනක ගෙනාපු කල් තැබීමේ යෝජනාව අවස්ථාවේදීත් ඔබතුමා කිව්වා, එහෙම වරදක් සිදු වෙලා තිබෙනවා, ඒක වළක්වා ගත්තා කියලා. වරදක් සිදු වෙලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ සඳහා වග කිව යුතු පුද්ගලයන් ඉන්නවා; නිලධාරින් ඉන්නවා. ඒ නිලධාරින්ට දඬුවම් කරන්න. නීතියෙන් දඬුවම් කරන්න. එහෙම නීතියෙන් දඬුවම් කළොත් අපේ රටේ අනෙක් පිරිස අනිවාර්යයෙන්ම කෙළින් යන්න පටන් ගනීවි. එහෙම නැත්නම් ඔබතුමන්ලාට කවදාවත් බැහැ ඔබතුමන්ලා බලාපොරොත්තු වන ආසියාවේ ආශ්චර්යය මේ රටේ ඇති කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, මේ ආණ්ඩුවට තවම තෙල් පිරිපහදුවක් හදා ගන්න බැරි වුණා කියලා. අපි ඔබතුමන්ලාට හැම වෙලේම මේ ගැන කිව්වා. 1965 දී එක්සත් ජාතික පක්ෂය ඩොලර් මිලියන 190ක් වාගේ ප්‍රමාණයක් වියදම් කරලා ඒ තෙල් පිරිපහදුව හැදුවා. ඒ ගණන හරිද දන්නේ නැහැ. මට ඒක හරියටම කියන්න බැහැ. මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා එහි නිවැරැදි කිරීමක් තිබෙනවා නම් කරන්න කියලා. මට ලැබුණු වාර්තාව අනුව, ඩොලර් මිලියන 190කින් අපි ඒ තෙල් පිරිපහදුව නිම කර තිබෙනවා. බලන්න ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට තවම එවැන්නක් කරන්න බැරි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට හැකියාවක් තිබෙනවා. ඔබතුමා කළොත් තමයි මේක කරන්න පුළුවන් වන්නේ. හැබැයි ඔබතුමාට එවැනි සහයෝගයක් දක්වන්නේ නැහැ. ඔබතුමන්ලා ඉරානයෙන් මුදලක් බලාපොරොත්තු වුණා. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා යම් යම් ගණන් හිලව් කිව්වා. මමත් ගණන් හිලව් ඉදිරිපත් කරනවා. සමහර වෙලාවට මා කියන ගණන් එහා මෙහා වෙන්න පුළුවන්, පරස්පර වෙන්න පුළුවන්. මට ලැබුණු වාර්තා අනුවයි මා කියන්නේ. මා හිතන හැටියට සපුගස්කන්ද තෙල් පිරිපහදුව සඳහා ඩොලර් මිලියන 2,000ක් පමණ යනවා කියලා නියම කරලා තිබුණා. ගරු ඇමතිතුමනි, මා නිවැරැදිද කියලා ඔබතුමා කියන්න. ඉරානයෙන් ඩොලර් මිලියන 1,500ක් අපට දෙනවා කිව්වා. අපට ඩොලර් මිලියන 500යි වියදම් කරන්න තිබුණේ. හැබැයි අපි ඒ කාර්ය භාරය ඉටු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය සම්බන්ධ ඇමතිතුමා හම්බන්තොට වරාය ගැන කථා කළා. එතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂයත් හම්බන්තොට වරාය ඉදි කරන්න තීන්දු කළා කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරායක් හදන්න නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ අපි ඒ අවස්ථාවේ තීන්දු කළේ bunkering port එකක් හදන්නයි. ඔබතුමා දන්නවා ලෝකයේ විශාල නැව් ප්‍රමාණයක් ඒ ප්‍රදේශයෙන් ගමන් කරනවා කියා. හැබැයි ඒවා සඳහා තෙල් ලබා දෙන්න අපට තවම පහසුකම් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපිට ඒක කරන්න ලැබුණා නම් අද විශාල ආදායමක් ලබා ගත හැකිව තිබුණා. නමුත් අද හම්බන්තොට වරාය ඊට සුදුසු නොවන ආකාරයේ වරායක් බවට පත් කිරීම නිසා විශාල මුදල් ප්‍රමාණයක් -රුපියල් බිලියන ගණනක මුදල් ප්‍රමාණයක්- අපේ රට පාඩු ලබනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන තෙක් ඒ වරායට වෙළෙඳ නෞකාවක් හරියාකාරව ඇතුළු කර ගන්න බැරි වෙලා

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුජීව සේනසිංහ මහතා]

තිබෙනවා. අපි බලාපොරොත්තු වුණු ආකාරයට හම්බන්තොට Bunkering Port එකක් හැදුවා නම්, අද වෙන කොට මේ රට විශාල ආදායමක් ලබලා. ඒ කාර්ය භාරය අපට කර ගන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ තෙල් පිරිපහදුවත් හරියාකාරයෙන් ක්‍රියාත්මක නොවීම නිසා අද සිදු වන සියලුම අලාභවලට වගකියන්න සිදු වෙලා තිබෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, බොර තෙල්වලට කොමිස් මුදල් අය කරන්න බැහැ කියලා. හැබැයි, පිරිපහදු තෙල්වලට අනිවාර්යයෙන්ම කොමිස් අය කරන්න පුළුවන්. තෙල් පිරිපහදුව හරියාකාරයෙන් ක්‍රියාත්මක කරලා ඒ පහසුකම ලබා ගන්නේ නැත්තේ දිගින් දිගටම කොමිස් ලබා ගන්න තිබෙන වුවමනාවද කියන සැකය තමයි අපට තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් දැන් ඉරානය මොකක්ද කරන්නේ කියලා සද්දයක්වත් නැහැ. අපි අපේ ක්‍රියාදාමය ඉටු කළේ නැහැ. ඒ අය අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් ලබා දෙනවා කිව්වා. එය සුළු පටු මුදලක් නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට ඒ පහසුකම ඉරානයෙන් ලැබෙන්නේ නැහැ. ඒකත් අපි විනාශ කර ගත්තා. ආණ්ඩු පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු කියනවා, "අපි ඔහේ කෑ ගහනවා" කියලා. අපි ඔහේ කෑ ගහනවා නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500 ඉරානයෙන් ලබා ගන්න පුළුවන් වුණා නම්, ඒ තෙල් පිරිපහදුව අපට නිර්මාණය කර ගන්න පුළුවන් වුණා නම් මේ රටේ ජනතාවට ඉතා අඩු මුදලකට තෙල් ටික දෙන්න පුළුවන්කම තිබුණා; අපේ දුප්පත් ජනතාවට ඒ සහනය දෙන්න තිබුණා. හැබැයි, කළමනාකරණය හොඳ නැති හන්දා, තමන්ගේ බඩ ගැන පමණක් හිතන ආණ්ඩුවක් හන්දා, මේ ක්‍රියාදාමය අද වන තෙක් ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ අපි ජනසවිය, ගම් උදාව, මහපොළ, ඇඟලුම් කර්මාන්තය ආදී දේවල් කළේ ආසියාවේ අනෙක් රටවල් ඒවාට ගොඩක් පසුපසින් සිටියදී. මුළු ආසියාවම අඳුරු තත්ත්වයක තිබියදී තමයි එක්සත් ජාතික පක්ෂය ඒ කාර්ය භාරය කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට මේ ආණ්ඩු බලය ලැබුණා නම්, අපට කරන්න පුළුවන් ක්‍රියා බොහෝයි. ඒ සහතිකය අපි ඔබතුමන්ලාට දෙනවා. ඒවා කරන හැටිත් අපි ඔබතුමන්ලාට කියනවා, මෙන්න මේ ආකාරයෙන් අපි සංවර්ධන කටයුතු,- [බාධා කිරීමක්]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමා ඒකට ඉඩක් ගන්න කෝ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි ඒ ඉඩ ගන්නවා. ඒක බලෙන් හරි ගන්නවා.

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)
පෞද්ගලීකරණය කළේ කවුද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පෞද්ගලීකරණය කරන්නේ ඔබතුමන්ලා නේ. පෞද්ගලීකරණය කරන්නේ බැසිල් රාජපක්ෂ මැතිතුමා. පෞද්ගලීකරණය කරන හැටි ඔබතුමා හොඳට අහගන්න. ලංකාවේ ඉඩම් කවුරුවත් වික්කේ නැහැ. Galle Face එකේ ඉඩම් විකුණුවේ කවුද? ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති දන්නේත් නැහැ. ඒකයි තත්ත්වය. සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමන්ලා නම් දන්නවා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා ගිය නිසා. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට තේරෙනවා. හැබැයි, ඔය පැත්තේ කොටසක් ඉන්නවා, පෞද්ගලීකරණයට විරුද්ධව කෑ ගහන. ඒ අයට පෞද්ගලීකරණය ගැන අහගන්න බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට කියලා පැය දෙකකවත් Class එකක් දමන්න ඕනෑ. ඔබතුමන්ලා බලන්න, කඩදාසි කම්හල් පෞද්ගලීකරණය කරන්න එතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනා කොහොමද කියලා. [බාධා කිරීමක්] වික්කා, ඉඩම් වික්කා. මේ රටේ ඉඩම් සින්නක්කරේට වික්ක එකම ආණ්ඩුව, දැන් පෞද්ගලීකරණය ගැන කථා කරනවා. [බාධා කිරීමක්] ෂැන්ග්‍රි-ලා ආයතනයට කවුද ඉඩම් වික්කේ?

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
ගිහිල්ලා ඔප්පුව බලන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔප්පුව බලන්න දෙයක් නැහැ නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාව සුමානයක් ගෙදර යැව්වා නේ. ඔබතුමාට ඒ කාලය තුළ මේවා ඉගෙන ගන්න තිබුණා. ඔබතුමාගේ දක්ෂ හැසිරීම නිසා තමයි ගෙදර යැව්වේ. ඔබතුමා ඒවා කියවලා එන්න. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බලන්න මෙතුමා,- [බාධා කිරීමක්] ඔබතුමා ආපහු සුමානයකට ගෙදර යවයි. වැඩිය කෑ ගහන්න එපා. මූලාසනයේ ගරු මන්ත්‍රීතුමා බලාගෙන ඉන්නවා. ඒ වාගේම,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මම බලා ගෙන ඉන්නවා ඔබතුමාව.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තත්ත්පර 5ක් දෙන්න. මට බාධා කරනවා නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලාෆ් ගෑස් සහ ලිට්‍රෝ ගෑස් අරගෙන බලන්න. තෙල් සංස්ථාව ගෑස් මෙට්‍රික් ටොන් 60ක් නිෂ්පාදනය කරනවා. හැබැයි, ලිට්‍රෝ සහ ලාෆ් සමාගම් මඟින් එකම ගණනකට තමයි ගෑස් දෙන්නේ. ලිට්‍රෝ සමාගම තෙල් සංස්ථාවේ නිෂ්පාදනය කරන ටික අරගන්න නිසා අපි තරගකාරිත්වයක් බලාපොරොත්තු වුණා. හැබැයි, එහෙම කාර්ය භාරයක් සිදු වෙන්නේ නැහැ. පුළුවන් තරම් ඉහළ ලන්සුවට, ඉහළ මිලට තමයි ඒ අය ගෑස් මිල නියම කරන්නේ.

ඔබතුමන්ලා අද ලෝක තෙල් මිල ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක තෙල් මිල ගණන් සම්බන්ධයෙන් මට ඉදිරිපත් කරන්න බැරි වුණු ගොඩක් කාරණා තිබෙනවා. ඒ පිළිබඳ ලේඛනය මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

පාකිස්තානය බොර තෙල් ගැලුමකට ඩොලර් 3යි ගෙවන්නේ. අපි 4ක් ගෙවනවා. මේ ආකාරයෙන් විශාල වෙනසක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පෙට්‍රල් ලීටරයක් සඳහා අපට වැය වන්නේ රුපියල් 80යි. නමුත් අපි විකුණන්නේ රුපියල් 135ට. ඩීසල් ලීටරයකින් රුපියල් 12ක පාඩුවක් ලබන බව කියලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරියට කළමනාකරණය කළොත් අපට ඒවායින් ලාභයක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ වාගේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සම්බන්ධයෙන් මට ඉදිරිපත් කරන්න බැරි වුණු සියලු කරුණු සහිත ලියවිල්ල මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි. ඉදිරි අනාගතයේදී හරියට වැඩක් කරයි කියලා ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා යන දෙදෙනාගෙන්ම බලාපොරොත්තු වෙනවා.

[பி.ப. 2.15]

**ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பசீர் சேகு தாவூத் - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Basheer Segu Dawood - Deputy Minister of Co-operatives and Internal Trade)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான இன்றைய குழுநிலை விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். எரிபொருள் துறை எந்தவொரு நாட்டினது அபிவிருத்திக்கும் முதன்மையான ஒன்றாகும். அதேபோன்று, இந்த நாட்டின் அபிவிருத்திக்குத் துணைநிற்கின்ற முக்கிய துறையாகவும் அது இருக்கின்றது. அதேநேரம், எரிபொருள் விலைகளில் ஏற்படுகின்ற மாற்றமானது சாதாரண மக்களுடைய வாழ்க்கைத் தரத்திலும் மாற்றங்களைக் கொண்டுவரக் கூடியதாகவே காணப்படுகின்றது. இவ்வாறானதொரு சூழ்நிலையிலேதான் நாங்கள் இன்று இந்த விவாதத்திலே கலந்துகொள்கிறோம். புரட்சிகரமான மாற்றத்துக்கான விதைகள் தூவப்பட்டிருக்கின்ற மத்திய கிழக்குப் பகுதியிலிருந்துதான் பெருமளவில் எரிபொருள்கள் கிடைக்கின்றன. சருவதேச ரீதியாக மசகு எண்ணெயில் ஏற்படுகின்ற விலையேற்றம், உலகம் முழுவதிலும் எண்ணெய்க்காக ஏற்பட்டிருக்கின்ற போட்டி நிலைமை, மத்திய கிழக்கு நாடுகளிலே இன்றிருக்கின்ற சூழ்நிலைகள் என்பவற்றுக்கு இந்த நாடு முகங்கொடுத்த வண்ணமிருந்தாலும், ஏனைய உலக நாடுகளோடு ஒப்பிடுகின்றபொழுது இந்த நாட்டிலே எரிபொருட்களின் விலையேற்றமானது ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய வழிகாட்டுதலில் மிகக் குறைந்தளவிலேயே இடம்பெற்றுவருவதை இந்த இடத்திலே சுட்டிக்காட்ட நான் கடமைப்பட்டிருக்கிறேன்.

எரிபொருள் பற்றிப் பேசுகின்றபொழுது எங்களுடைய நாட்டிலே நடந்தேறிய யுத்தத்தை இன்னுமொருமுறை நினைத்துப்பார்க்காமல் இருக்க முடியவில்லை. யுத்தம் நடைபெறாத பகுதிகளுடன் ஒப்பிட்டுப் பார்க்கின்றபோது வடக்கு, கிழக்கு மாகாணத்திலே எரிபொருளின் விலையானது 10 மடங்குக்கும் அதிகமாகக் காணப்பட்ட ஒரு காலம் முன்பு இருந்ததை நாங்கள் கண்டோம். விசேடமாக யாழ்ப்பாணம், மன்னார், கிளிநொச்சி ஆகிய மாவட்டங்கள் மற்றும் வவுனியா மாவட்டத்தின் ஒரு பகுதி அத்துடன் நண்பர் ரங்கா அவர்கள் தற்போது தீவிரமாகச் செயற்பட்டுக்கொண்டிக்கின்ற மாவட்டமான முல்லைத்தீவு போன்ற பகுதிகளில் இந்த விலையேற்றம் மிகவும் அதிகமாக இருந்ததைக் கண்டோம். யுத்த காலப்பகுதியில் இவ்வாறான விலையேற்றங்களுக்கு முகங்கொடுத்து வாழ்ந்த அந்த மக்களின் அன்றைய நிலைமையை நான் இன்று நினைத்துப் பார்க்கின்றேன். யுத்தம் முடிவடைந்துள்ள நிலையில் இன்று வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்கு எரிபொருள் விநியோகம் தாராளமாக நடைபெறுவதற்கேற்றவாறு அனைத்துச் செயற்பாடுகளையும் இந்த அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. யுத்த காலத்துக்கு முன்னர் வடக்கு, கிழக்கிலே காணப்பட்ட எரிபொருள் விநியோக நிலைமையிலும் பார்க்க இன்று சீரானமுறையில் எரிபொருள் விநியோகம் நடைபெறுவதையிட்டு நான் மாண்புமிகு அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கிறேன்.

கடந்த காலங்களில் வட மாகாணத்தில் பரவலாக யாழ்ப்பாணம், முல்லைத்தீவு, கிளிநொச்சி, மன்னார், வவுனியா ஆகிய மாவட்டங்களிலே சிறியளவிலான களஞ்சிய வசதிகளுடனான 170 பதிவுசெய்யப்பட்ட எரிபொருள் விநியோகஸ்தர்கள் இருந்தார்கள். இவர்களில் 50 பேர்வரை பரல்கள்மூலமாக எரிபொருள் விநியோகத்தை மேற்கொண்டிருந்தார்கள். இறுதி யுத்தம் நடைபெற்ற காலத்தில் - 2009ஆம் ஆண்டு மே மாதம் 1ஆம் திகதியளவில் - பல எரிபொருள் நிரப்பு நிலையங்களும் பல களஞ்சியங்களும் அழிவுக்குட்படுத்தப்பட்டிருந்ததுடன், 61 எரிபொருள் நிரப்பு நிலையங்கள் மாத்திரமே எஞ்சியிருக்கக் கண்டோம். இவற்றில் பெரும்பாலானவை யாழ்ப்பாணம், வவுனியா மாவட்டங்களிலேயே காணப்பட்டன. கிளிநொச்சி, முல்லைத்தீவு ஆகிய மாவட்டங்களில் இருந்த எரிபொருள் நிரப்பு நிலையங்களின் எரிபொருள் விநியோகம் அறவே நிறுத்தப்பட்டிருந்தது. ஆனாலும், யுத்தம் நடைபெற்ற காலங்களில் அரசாங்கம் அப்பிரதேசங்களிலுள்ள மக்களுக்கு எரிபொருட்களை விநியோகம் செய்த வண்ணமே இருந்தது.

---

*** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා]

யுத்த காலங்களிலே அன்றைய சூழ்நிலையில் அந்தந்த மாவட்டத்திலுள்ள அரசாங்க அதிபர்களுடைய விதப்புரையின்பேரில் அத்தியாவசிய சேவைகள் ஆணையாளரின் அனுமதியுடன், பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் பிராந்திய முகாமையாளர்களினூடாக அந்தந்தப் பிராந்தியங்களில் வாழ்ந்த மக்களுக்கும் 52 நிறுவனங்களுக்கும் கோட்டாமுறையிலே தொடர்ச்சியாக எரிபொருள் விநியோகம் செய்யப்பட்டு வந்தது. யுத்தம் முடிவடைந்ததன் பின்னர் இந்த அரசாங்கம் எரிபொருள் விநியோக சேவையை மீளமைக்கும் நோக்கத்துடன் புதிதாகப் பத்திரிகை அறிவித்தல்களை விடுத்திருந்தது. கடந்த 2009ஆம் ஆண்டு மே மாதம் 31ஆந் திகதி சிங்கள, தமிழ், ஆங்கில தினசரிப் பத்திரிகைகளில் இது தொடர்பான விளம்பரங்கள் வெளியிடப்பட்டிருந்தன. விசேடமாக கிளிநொச்சி, வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் செயலற்றுப்போயிருந்த எரிபொருள் நிரப்பு நிலையங்களைச் செயற்படுத்துவதற்கான சாத்தியங்கள் தொடர்பாகச் சந்தைப்படுத்தல் முகாமையாளருக்குத் தகவல்களை அனுப்பி வைக்குமாறு எரிபொருள் விநியோகஸ்தர்கள் கோரப்பட்டிருந்தனர். இத்தகவலின் அடிப்படையில், குறித்த பிரதேசங்களில் எரிபொருள் நிரப்பு நிலையங்களை மீளமைத்தல், செயற்படுத்துதல், தரம் உயர்த்துதல், தகுந்த இடங்களில் மீளநிறுவுதல் போன்ற செயற்பாடுகளின் அவசியம் உணரப்பட்டு, இந்த அரசினால் ஆரம்பிக்கப்பட்ட 'வடக்கின் வசந்தம்' வேலைத்திட்டத்தின் அடிப்படையிலே, 2010ஆம் ஆண்டின் முதல் காலாண்டு முடிவடைவதற்குள், செயற்படாதிருந்த எரிபொருள் நிலையங்களில் ஒரு குறிப்பிட்ட தொகை புனரமைப்புச் செய்யப்பட்டு எரிபொருள் விநியோகத்துக்கு வழியேற்படுத்திக் கொடுக்கப்பட்டது. இவ்வாறான வேலைத்திட்டங்களை முறையாகத் திட்டமிட்ட அடிப்படையில் துரிதமாகச் செயற்படுத்துமாறு மாண்புமிகு அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்களும் பிரதி அமைச்சர் அவர்களும் மற்றும் கூட்டுத்தாபனத்தின் தலைவர் ஹரி ஜயவர்தன அவர்களும் வழங்கிய ஆலோசனைகளுக்கமைய வட மாகாணத்தின் பிரதேச, பிராந்திய முகாமையாளர்களுடன் பேச்சுவார்த்தை நடத்தி, பெற்றோலியக் கூட்டுத்தாபனம் மிகவும் சிறப்பாகச் செயற்பட்டது. இதன் அடிப்படையில், மூன்றாம் கட்டமாக இன்னும் 7 எரிபொருள் நிரப்பு நிலையங்களை மாண்புமிகு அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்களும் பிரதி அமைச்சர் மாண்புமிகு சரண குணவர்தன அவர்களும் கூட்டுத்தாபனத்தின் தலைவர் அவர்களும் 2011 யூலை மாதம் 16ஆம், 17ஆம் திகதிகளில் திறந்துவைத்தார்கள். கடந்த செப்ரெம்பர் மாதம் 11ஆம் திகதி யாழ். நகரத்திலும் சுன்னாகத்திலும் நவீனமுறையில் மிகவும் சிறப்பாக ஒழுங்குபடுத்தப்பட்ட இரண்டு எரிபொருள் நிரப்பு நிலையங்களை, அதாவது, ராஜன் உமையாள் பிரைவேட் லிமிரெட் லங்கா எரிபொருள் நிரப்பு நிலையத்தை யாழ்ப்பாணம் மகாத்மா காந்தி வீதியிலும், திருமதி கே. கதிரேசன்பிள்ளை லங்கா எரிபொருள் நிரப்பு நிலையத்தை சுன்னாகத்திலும் பிரதி அமைச்சர் மாண்புமிகு சரண குணவர்தன அவர்களும் நானும் இணைந்து திறந்துவைத்தோம். கஸ்தூரியார் வீதியில் Liverpool Navigation (Pvt.) Limited லங்கா எரிபொருள் நிரப்பு நிலையம் அண்மையில் திறக்கப்பட இருக்கின்றது. யுத்தத்தின் காரணமாக ஏற்பட்ட எரிபொருள் விலையேற்றத்தினைத் தாங்க முடியாமல், வாழ்க்கையில் பல்வேறு கஷ்டங்களை அனுபவித்துவந்த வட மாகாண மக்கள், அதிலிருந்து மீளுவதற்கு இன்று தெற்கிலே விற்பனை செய்கின்ற விலைக்கு எரிபொருளைப் பெறக்கூடிய வகையில், அப்பகுதிகளில் எரிபொருள் நிரப்பு நிலையங்களைத் திறந்துவைக்கும் வைபவங்களில் நானும் பங்குகொண்டதையிட்டு மகிழ்ச்சி யடைகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்த இடத்தில் ஒரு விடயத்தைக் குறிப்பிடவேண்டும். இவ்வமைச்சானது, வடக்கு, கிழக்கு மாகாணங்களிலே எரிபொருள் விநியோகத்தைப் பரவலாக்கும் வகையில், புதிய திட்டமொன்றை அமுல்நடத்த இருக்கின்றது. அதாவது, கிழக்கு மாகாணத்திலே யுத்தம் முடிவடைவதற்கு முன்னர் பல்லாண்டு காலமாகத் தமிழீழ விடுதலைப் புலிகளுடைய கட்டுப்பாட்டின் கீழ் இருந்த பகுதிகளில் எரிபொருள் விநியோகத்தைப் பரவலாக்கும் வகையில், புதிய எரிபொருள் நிரப்பு நிலையங்களைத் திறக்கவேண்டிய அவசியம் இருக்கின்றது. மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை மாவட்டங்கள் விவசாயத்தையும் மீன்பிடியையும் அடிப்படையாகக் கொண்ட மாவட்டங்களாகும். இம்மாவட்டங்களை உள்ளடக்கிய கிழக்கு மாகாணத்திலே ஆயிரக்கணக்கான 'போட்'களையும் 'அலியாபோட்'களையும் பயன்படுத்தி மீன்பிடிக்கின்ற தொழிலாளர்கள் இருக்கின்றார்கள். அவர்கள் சரியான முறையில் எரிபொருளைப் பெறக்கூடிய வகையில், எரிபொருள் விநியோகத்தைப் பரவலாக்கவேண்டுமென்றும் கடலை அண்டிய பகுதிகளிலும் விவசாயம் செய்கின்ற பகுதிகளிலும் முன்பு தமிழீழ விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுக்குள் இருந்த பகுதிகளிலும் புதிய எரிபொருள் நிரப்பு நிலையங்களைத் திறக்கவேண்டுமென்றும் நான் அமைச்சர் அவர்களிடம் வேண்டுகோள்விடுக்க விரும்புகின்றேன். யுத்தத்துக்குப் பிற்பாடு, வட பகுதியில் அபிவிருத்தியானது அவசியப்படுகின்ற ஒரு சூழலில் இடம்பெயர்ந்த மக்களை மீளக்குடியமர்த்துகின்ற நடவடிக்கைகளையும் அப்பிரதேசங்களை நகர மயமாக்கல் செய்கின்ற நடவடிக்கைகளையும் தங்கு தடையின்றி முன்னெடுப்பதற்கு எரிபொருளை சிறந்த முறையில் விநியோகிக்க வேண்டியதன் முக்கியத்துவத்தை உணர்ந்து, அதனைப் பரவலாக்கம் செய்வதற்கு இக்கூட்டுத்தாபனம் பல எதிர்கால வேலைத்திட்டங்களை முன்வைத்துள்ளது. உல்லாசப் பயணத்துறை அபிவிருத்தி, வீதி அபிவிருத்தி, போக்குவரத்து மூலங்கள் அபிவிருத்தி, விவசாய அபிவிருத்தி, குடிநீர் விநியோகத் திட்டங்கள், தொலைத்தொடர்பு மற்றும் மக்கள் தொடர்பாடல் அபிவிருத்தி, உத்தேச கைத்தொழில்பேட்டை நிர்மாணம், மீன்பிடிக் கைத்தொழிலினதும் அதுசார்ந்த நடவடிக்கைகளினதும் அபிவிருத்தி என்பவற்றுக்கு எரிபொருள் விநியோகத்தின் முக்கியத்துவத்தை உணர்ந்து, அதற்கு ஏற்றவாறு இந்த அமைச்சு பல எதிர்காலத் திட்டங்களை வகுத்திருக்கிறது. அதற்காக நான் அமைச்சர் அவர்களுக்கு இவ்விடத்தில் நன்றியையும் பாராட்டுக்களையும் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன்.

அதேபோன்று வடக்குப் பிராந்தியத்தில் தேர்ந்தெடுக்கப்பட்ட பகுதிகளில் புதிய எரிபொருள் நிலையங்களைத் தாபிப்பதற்கு முடிவெடுக்கப்பட்டிருப்பதாக இங்கு சமர்ப்பிக்கப்பட்டுள்ள வெளியீடுகளிலிருந்து நாங்கள் அறிகின்றோம். தலைமன்னார், அடம்பன் சந்தி, விடத்தல்தீவு, பூநகரி, வட்டக்கச்சி, ஒட்டுசுட்டான், தண்ணீரூற்று, முள்ளியவளை, இயக்கச்சி, நாவற்குழி, உடுப்பிட்டி, தாவடிச்சந்தி போன்ற இடங்களில் இந்தப் புதிய எரிபொருள் நிலையங்களைத் தாபிப்பதற்குத் தீர்மானித்திருப்பதையிட்டு நான் அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எரிபொருள் நிரப்பு நிலையங்களைப் பரவலாக்கும் இந்தத் திட்டத்தில் ஏற்கெனவே திறக்கப்பட்டிருக்கின்ற ஏழு புதிய அல்லது சரியாகத் திருத்தியமைக்கப்பட்ட எரிபொருள் விநியோக நிரப்பு

நிலையங்களும் அடங்குகின்றன. அந்த ஏழு நிரப்பு நிலையங்களில் வவுனியாவில் அமைந்துள்ள திரு. எஸ். ஆனந்தராஜா என்பவருக்குரிய லங்கா எரிபொருள் நிரப்பு நிலையமே தனியாருக்குச் சொந்தமானது. மற்றைய ஆறு நிலையங்களும் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களுக்குச் சொந்தமான எரிபொருள் நிரப்பு நிலையங்களாகும். வட மாகாணத்திலே திறக்கப்பட்டிருக்கின்ற இந்த ஆறு நிரப்பு நிலையங்களையும் பொதுமக்களுடைய ஸ்தாபனமாக இருக்கின்ற பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களுக்குக் கையளித்திருப்பதையிட்டு கூட்டுறவு, உள்நாட்டு வர்த்தகப் பிரதி அமைச்சர் என்ற அடிப்படையிலே நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மற்றும் அமைச்சர் அவர்களுக்கும் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
உங்களுக்கு இன்னொரு நிமிடம் பாக்கியாக இருக்கின்றது.

**ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා**
(மாண்புமிகு பசீர் சேகு தாவூத்)
(The Hon. Basheer Segu Dawood)
அந்த ஒரு நிமிடத்துக்குள் இன்னுமொரு முக்கியமான விடயத்தைக் கூறி என்னுடைய உரையை முடிக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தென்னிந்தியாவிலே உள்ள தமிழ் நாட்டுச் சிவில் சமூகத்துக்கும் இந்திய மத்திய அரசுக்கும் இடையில் கூடங்குளம் அணு மின்நிலையம் பற்றி மிகப்பெரிய சர்ச்சைகள் மூண்டிருக்கின்றன. இந்தச் சூழ்நிலையிலே கடந்த பல ஆண்டுகளுக்கு முன்பு மேற்கொள்ளப்பட்ட ஆய்வின்மூலம் மன்னார் வளைகுடாவில் இருக்கின்ற வண்டல் குவியல்கள் பற்றி விஞ்ஞானபூர்வமான கருத்துக்கள் மற்றும் ஆய்வுகள் வெளிவந்து கொண்டிருக்கின்றன. மன்னார் வளைகுடாவின் கடல் தரையிலே 70 கிலோ மீற்றர் மற்றும் 35 கிலோ மீற்றர் நீளம்கொண்ட, உடைந்து சரியும் தன்மையுடைய இரண்டு வண்டல் குவியல்கள் உள்ளன. இந்த வண்டல் குவியல்களுக்கு நிலவியல் அறிஞர்கள் 'கிழக்குக் குமரி' என்றும் 'கொழும்பு வண்டல்' என்றும் பெயரிட்டுள்ளனர். 1982ஆம் ஆண்டுதான் இவை கண்டுபிடிக்கப்பட்டன. வெல்லியம் வெஸ்ராஸ் மற்றும் லவ்ரி என்ற இரு ஆய்வாளர்களே முதலில் இந்த ஆய்வைச் செய்தார்கள். 1994ஆம் ஆண்டும் இது ஆய்வு செய்யப்பட்டது. யுத்த காலத்தில் இந்த ஆய்வு மேற்கொள்ளப்படவில்லை. எனவே, இது சம்பந்தமாகப் புதிய ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும் என்று கேட்டு, என்னுடைய உரையை முடிக்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා - සභාගර්භයේ නැත. ඊළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා - සභාගර්භයේ නැත. එහෙම නම් ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා කථාව කරන්න.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කරන්න සූදානම් වෙලායි ආවේ. නමුත් විපක්ෂයට කථා කරන්න නියමිත වෙලාවේ විපක්ෂය පැත්තෙන් කථා කරන්න මන්ත්‍රීවරුන් නැහැ. එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් නැතුව අපි කථා කරලා වැඩක් නැහැ. එම නිසා ගරු ඇමතිතුමාට එතුමාගේ කථාව කර විවාදය අවසන් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is a consensus of opinion of the Hon. Members of the Government side. Now, I call upon the Minister, Hon. Susil Premajayantha to make the reply.

[අ. භා. 2.31]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය විපක්ෂය සඳහා මිනිත්තු 165කුත්, ආණ්ඩු පක්ෂය සඳහා මිනිත්තු 135කුත් වෙන් කරලා තිබුණා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් විපක්ෂය වෙනුවෙන් එයින් විනාඩි 60ක් කථා කරලා තිබෙනවා. වෙනත් මන්ත්‍රීවරුන් නොමැති නිසා ඔබතුමාගේ නියමය පරිදි මේ විවාදයේ අවසාන කථාව සිදු කරන්න මම සූදානම් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය සඳහා ආණ්ඩු පක්ෂය හැටියට අපේ ඉතාම හොඳ සූදානමක් තිබුණා. විපක්ෂය සමාජය තුළට ගිහිල්ලා පුවත් පත් සාකච්ඡා තියමින්, විවිධ අවස්ථාවල විවිධ චෝදනා අපට එල්ල කළා. ඒ සියල්ලටම මේ විවාදයේදී පිළිතුරු දෙන්න අපි සූදානම් වෙලායි හිටියේ. නමුත් මම කියන්න කනගාටුයි, අද ඔබතුමා නම් කථා කරන අවස්ථාවේදී විනාඩි 165ක් වෙන් වෙලා තිබිච්ච විපක්ෂය වෙනුවෙන් කථා කරන්න කථිකයන් නැහැ. විනාඩි 60යි කථා කළේ. මේකයි තත්ත්වය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද රටේ ජනතාවට දෙන්න හදන පණිවුඩය මේකයි. ඒක නිසා පිළිතුරු දෙන්න තරම් දෙයක් විපක්ෂයෙන් කිව්වේ නැහැ. මම පැහැදිලිව කියනවා, හෙජින් ගනුදෙනුව සම්බන්ධව අවසාන තීන්දුව දීලා නැහැය කියන එක. ඒ නිසා කිසි කෙනෙකු වරදකරු කර ගන්න තරම් නීතිමය ප්‍රතිපාදනයක් නැහැ.

ඊ ළඟ කාරණය තමයි, බාල පෙට්‍රල් සම්බන්ධ කාරණය. සියලු ප්‍රශ්න අපි ඉවර කළා. ඒ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2600ක ප්‍රමාණය පාඩුවක් නොවන්න අපනයනය කරනවා. ඒ සඳහා සංස්ථාව කටයුතු කරලා තිබෙනවා. වන්දි ගෙවීම සඳහාත් යහපත් ප්‍රතිචාරයක් ඒ සමාගමින් දක්වලා තිබෙනවා. සංස්ථාවේ මුදල්වලින් වන්දි ගෙව්වත් ඒවා පියවා ගැනීමේ ක්‍රියා මාර්ගයට ගිහිල්ලා තිබෙනවා.

තෙල් පිරිපහදුව සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මෙයයි; අපි විකල්ප වැඩසටහන් රාශියකට ගිහිල්ලා තිබෙන බවයි. ඒක මේ අවස්ථාවේදී කථා කළ යුතු දෙයක් නොවෙයි. අනිවාර්යෙන්ම රාජ්‍ය ආයතනයක් හැටියට අපි තෙල් පිරිපහදුව ඉදිරියට ගෙන යනවා. ඉරානය සමඟත් සාකච්ඡා අවසන් කරලා නැහැ. මේ සභාවේදී සඳහන් කරපු, ඒ ඇවිත් තිබෙන යෝජනා සම්බන්ධයෙන් අවසාන තීන්දුවලට එළඹීලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරපු කරුණු මේවායි. මීට වඩා පිළිතුරු දෙන්න දෙයක් නැහැ.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලබන ආයතනයක් නොවෙයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලබන්නේ ඉන්ධන සහනාධාරය දීම සහ විදුලි බල අංශයට අඩු මිලට තෙල් සැපයීම නිසා කියන එක අපි ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. විදුලිබල ක්ෂේත්‍රයට බිලියන 23කුත්, ඉන්ධන සහනාධාරය වශයෙන් බිලියන 32කුත් දුන්නා. මේ සියල්ලම දෙන්නේ දෙකෝටියක් වන මේ රටේ ජනතාවටයි. ඒ නිසා සංස්ථාව පාඩුවක් ලබන්නේ නැහැ. මේ සියල්ල ජනතාව වෙනුවෙන් දුන්න නිසයි සංස්ථාව මේ අලාභය ලබලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඡන්දය ගැනීම සඳහා මගේ කථාව අවසන් කරනවා.

"115 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 101,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

115 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 7,450,000

"115 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 7,450,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

115 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 115, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 101,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 115, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 7,450,000

"தலைப்பு 115, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 7,450,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 115, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 101,000,000, for Head 115, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 115, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 7,450,000

Question, "That the sum of Rs. 7,450,000, for Head 115, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 115, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

"මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යිද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 2.36 ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2011 දෙසැම්බර් 09 වන සිකුරාදා.***

*பி. ப. 2.36 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2011 டிசம்பர் 09, வெள்ளிக்கிழமை.*

*At 2.36 p.m., Mr. Presiding Member left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Friday, 09th December, 2011.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. එතුමා පැමිණ නැත.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.37 ට, 2011 නොවැම්බර් 29 දින සභා සම්මුතිය අනුව, 2011 දෙසැම්බර් 09 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 2.37 மணிக்கு பாராளுமன்றம், அதனது 2011 நவம்பர் 29ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2011 டிசம்பர் 09, வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 2.37 p.m. until 9.30 a.m. on Friday, 09th December, 2011, pursuant to the Resolution of Parliament of 29th November, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.